ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ලේඛන

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ලේඛන

පටුන

1.	ළමා හිමිකම් පිළිබඳ සම්මුතිය	05
2.	එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය	29
3.	එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය	37
4.	එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නිවේදන ක්‍රියාපටිපාටියකදී බලපානු ලබන ළමා අයිතිවාසිකම් පිළිබඳ වන වෛකල්පිත සංධානය	49
5.	ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද ඒකාබද්ධ පස්වන සහ හය වන සාමයික වාර්තාවන් සම්බන්ධ අවසන් නිරීක්ෂණ	59
6.	ළමුන් සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධවීම පිළිබඳව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වෛකල්පිත සන්ධානයෙහි 8 වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධ අවසන් නිරීක්ෂණ	79
7.	එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ වෛකල්පික සන්ධානයෙහි වගන්ති අංක 12 (1) යටතේ, ළමුන් විකිනීම, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද වාර්තාව සම්බන්ධ අවසන් නිරීක්ෂණ	89
8.	පොදු ප්‍රකාශ අංක 2 (2002) - ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයේදී හා ආරක්ෂා කිරීමේදී ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනයන්හි කාර්යභාරය	105
9.	පොදු ප්‍රකාශය අංක 5 (2003) - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර (4, 42 හා 44 (6) වැනි ව්‍යවස්ථා)	113

ළමා හිමිකම් පිළිබඳ සම්මුතිය

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය.

පෙළ

පූර්විකාව

මෙම සම්මුතියට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්:-

එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි ප්‍රකාශිත මූලධර්මවලට අනුකූලව, මිනිස් පවුලේ සියලුම සාමාජිකයන්ගේ නෛසර්ගික ගරුත්වය සහ සමානවූ ද අන්සතු කළ නොහැකි වූ ද අයිතිවාසිකම් ලෝකයේ ස්වාධීනත්වයෙහි, යුක්තියෙහි සහ සාමයෙහි අත්තිවාරම බවට සැලකිල්ලට ගනිමින්ද;

එක්සත් ජාතීන්ගේ ජනතාව විසින්, මූලික මානුෂික අයිතිවාසිකම් සහ මිනිසාගේ ගරුත්වය සහ වටිනාකම කෙරෙහි විශ්වාසය, සම්මුතියෙහි නැවතත් තහවුරු කරනු ලැබ, වැඩි නිදහසක් තුළ සාමජ ප්‍රගතිය සහ වඩා හොඳ ජීවන තත්ත්වයක් නංවාලීමට අධිෂ්ඨානය කරනු ලැබ ඇති භව සිහියේ තබා ගනිමින්ද;

මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙහි සහ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි දක්වා ඇති සියලු අයිතිවාසිකම් සහ ස්වාධීනතා, ජන වර්ග, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම දේශපාලන හෝ වෙනත් මතය ජාතික හෝ සමාජීය සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්ත්වය කුමක් වුවද, කිසිදු ආකාරයක ප්‍රභේදයක් නොමැතිව, සෑම තැනැත්තෙකුටම හිමිවිය යුතු බවට එක්සත් ජාතීන් විසින් එම ප්‍රකාශයෙහි සම සම්මුතියෙහි ප්‍රකාශ කර එකඟත්වයට එළඹ බව පිළිගනිමින්ද; සුවිශේෂ සැලකිල්ල සහ ආධාර ළමා වියේ හිමිකමක් බවට එක්සත් ජාතීන් විසින්; මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙහි, ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති බව සිහිපත් කරමින්ද;

පවුලට සමාජයේ මූලික කණ්ඩායම වශයෙන්ද, එහි සියලු සාමාජිකයන්ගේ, විශේෂයෙන්ම ළමයින්ගේ වර්ධනය සහ සුභ සිද්ධිය පිණිස වූ ස්වභාවික පරිසරය වශයෙන්ද ප්‍රජාව ඇතුළත එහි වගකීම් එයට සම්පූර්ණයෙන්ම භාරගත හැකි වන පරිදි, අවශ්‍ය ආරක්ෂාව සහ සහාය සැලකිය යුතු බවට අවබෝධ කර ගනිමින්ද;

ළමයකු සමාජයේ පෞද්ගලික ජීවිතයක් ගත කිරීමට සම්පූර්ණයෙන් ම සුදානම්ව සිටිය යුතු බවද, එක්සත් ජාතීනගේ සම්මුතියෙහි ප්‍රකාශිත පරමාදර්ශනයන්ගේ හරය තුළ, විශේෂයෙන් ම සාමයේ, ගරුත්වයේ, අගතිගාමී නොවීමේ, ස්වාධීනත්යේ, සමානත්වයේ සහ එකමුතුභාවයේ ජීවය තුළ හදාවඩා ගත යුතු බවද සැළකිල්ලට ගනිමින්ද;

ළමයින් වෙත විශේෂ රැකවරණ සැලකිල්ල ව්‍යප්ත කිරීමේ අවශ්‍යතාවය, 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙහි සහ 1959 දී එක්සත් ජාතීන් විසින් සම්මත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ද සඳහන්ව ඇති බවද, මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙහි ද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (විශේෂයෙන් ම 23 වන සහ 24 වන ව්‍යවස්ථාවල), ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (විශේෂයෙන් ම 10 වන ව්‍යවස්ථාවල), ළමා සුබසිද්ධියට සම්බන්ධ

විශේෂිත නියෝජිත ආයතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථාවල සහ අදාළ සාධන පත්‍රවලද පිළිගෙන ඇති බවද සිත්හි දරා ගනිමින්;

1959 නොවැම්බර් මස 20 වන දින පිනිවාහි පැවති එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ දී සඳහන් කර ඇති පරිදි ශාරීරිකව හ මානසිකව නොමේරූ අවධියක සිටීමේ හේතුවෙන්, ළමයකුට උපතට පෙර මෙන්ම උපතින් පසුවද යෝග්‍ය නෛතික රැකවරණය ඇතුලුව, විශේෂ ආරක්ෂාවන් සහ රැකවරණය අවශ්‍ය බව සිත්හි දරා ගනිමින්;

පිළිදැගුම් මව්පියන් පිහිටුවීම සහ ජාතිකව සහ ජාත්‍යන්තර දරුකමට හදා ගැනීම පිළිබඳ වූ 1986 දෙසැම්බර් මස 03 වන දින 41/85 දරන මහා මණ්ඩල යෝජනා සම්මුතිය, බාලයන් සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීම සඳහා එක්සත් ජාතීන්ගේ සම්මත අවම රීති, (බෙයිජිං රීති) 1985 නොවැම්බර් මස 29 වන දින 40/33 දරන මහා මණ්ඩල යෝජනා සම්මුතිය සහ හදිසි අවස්ථාවල දී සහ සන්නද්ධ අරගලවලදී ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ වූ ප්‍රකාශනය (1974 දෙසැම්බර් මස 14 වන දින 3318 (xxix)) දරණ මහා මණ්ඩලයේ යෝජනා සම්මුතිය කෙරෙහි විශේෂ අවධානය ඇතිව, ළමා ආරක්ෂාවට සහ ළමා සුබසිද්ධියට අදාළ සමාජීය සහ නෛතික මූලධර්ම පිළිබඳ වූ ප්‍රකාශනයේ විධිවිධාන සිහිපත් කරමින්;

සුවිශේෂ වශයෙන් දුෂ්කර තත්ත්වයක් යටතේ ජිවත් වන ළමයින් ලෝකයේ සියලුම රටවල ජීවත් වන බව සහ ඒ ළමයින් කෙරෙහි විශේෂ සැලකිල්ල අවශ්‍ය බව පිළිගනිමින්;

ළමා ආරක්ෂාව සහ සාමූහික වර්ධනය සඳහා එක් එක් ජනතාවගේ සම්ප්‍රදායන්හි සහ සංස්කෘතික වටිනාකම්වල වැදගත්කම යථා පරිදි සැලකිල්ලට ගැනීමෙන්;

සෑම රටකම, විශේෂයෙන්ම සංවර්ධනය වන්නාවූ රටවල ළමයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම පිළිගැනීමෙන් පහත සඳහන් ආකාරයට එකඟත්වයකට එළඹී ඇත.

1 වන කොටස

1 වන ව්‍යවස්ථාව

මෙම සම්මුතියේ කාර්යයන් සඳහා ළමයකු යන්නෙන්, එම ළමයාට අදාළ නීතිය යටතේ වයස අවුරුදු 18ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18 ට අඩු සෑම මනුෂ්‍යයකු ම අදහස් වේ.

2 වන ව්‍යවස්ථාව

1. වර්තමාන සම්මුතියේ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ළමයාගේ හෝ ඔහුගේ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුගේ හෝ ජාතිය, වර්ණය, භාෂාව, ආගම, දේශපාලන හො වෙනත් මතය, ජාතික, ජනවාර්ගික හෝ සාමජීය මුලාරම්භය, දේපළ, අබලතාව, උපත හෝ වෙනත් තත්ත්වය කුමක් වුව ද, ඒ නොසලකා, කිසිදු ආකාරයක විශේෂණයක් නොකර එක් එක් ළමයා කෙරෙහි මෙම සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් ස්වකීය අධිකරණ සීමාව තුළදී ගරු කරනු ලැබිය යුතු අතර ඒවා පිළිගන්නා බවට සහතික වනු ලැබිය යුතුය.

2. ළමයාගේ දෙමව්පියන්ගේ, නිත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ පවුලේ සාමාජිකයන්ගේ තත්ත්ව, ක්‍රියාකාරකම්, ප්‍රකාශිත අදහස්, හෝ විශ්වාස පදනම් කර ගත් සියලු ආකාරයේ විශේෂනයන්ට හෝ දඬුවම්වලට හෝ එරෙහිව, ළමයා ආරක්ෂා වන බවට වග බලා ගැනීම පිණිස, සියලු සුදුසු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

3 වන ව්‍යවස්ථාව

1. ළමයින් පිළිබඳ වූ සියලු ක්‍රියාකාරකම්වලදී, ඒවා පොදු හෝ පෞද්ගලික හෝ සමාජ සුභ සාධන ආයතන, නීතිය ක්‍රියාත්මක කරන අධිකරණ, පරිපාලන බලධාරීන් නැතහොත් ව්‍යවස්ථාදායක මණ්ඩල විසින් කරනු ලැබුව ද, ළමයාගේ වැඩිම යහපත එහිදී මූලිකව සැලකිය යුතු කරුණක් විය යුතුය.

2. ඔහු හෝ ඇය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව වගකිව යුතු වන ඔහුගේ හෝ ඇයගේ දෙමාව්පියන්ගේ, නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ වෙනත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් සැලකිල්ලට ගනිමින්, ඔහුට හෝ ඇයට අවශ්‍ය වන්නාවූ රැකවරණ හා භාරය එම ළමයාට ලැබෙන බවට රාජ්‍ය පාර්ශ්වකරුවන් වග බලා ගත යුතු අතර, මේ අරමුණ උදෙසා සියලු යෝග්‍ය ව්‍යවස්ථාදායක හා පරිපාලන පියවරවල් ගනු ලැබිය යුතුය.

3. ළමයින්ගේ භාරය හෝ රැකවරණ හෝ සඳහා වගකිව යුතු වන ආයතන, සේවාවන් සහ පහසුකම්, නිසි බලධාරීන් විසින් පිහිටුවන ලද ප්‍රමිතීන්ට විශේෂයෙන්ම ආරක්ෂාව, සෞඛ්‍ය, සංඛ්‍යාව සහ ඒවායේ කාර්ය මණ්ඩලයේ යෝග්‍යතාව මෙන්ම, නිසි අධීක්ෂණය පිළිබඳ ප්‍රමිතීන්ට ගැලපෙන බවට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් වගබලා ගනු ලැබිය යුතුය.

4 වන ව්‍යවස්ථාව

මෙම සම්මුතියෙහි පිළිගෙන ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පිණිස අදාල වන සියලු ව්‍යවස්ථාදායක, පරිපාලන සහ වෙනත් පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ විට, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් තමන්ට ඇති සම්පත්වල උපරිම ප්‍රමාණයට අනුව ද අවශ්‍ය වන අවස්ථාවල ජාත්‍යන්තර සහයෝගීතාවයේ රාමුව ඇතුළත ද එම පියවරවල් ගනු ලැබිය යුතුය.

5 වන ව්‍යවස්ථාව

වර්තමාන සම්මුතියෙහි පිළිගෙන ඇති අයිතිවාසිකම් ළමයා විසින් ක්‍රියාවේ යෙදවීමේ දී, ළමයාගේ ශක්නුතාවන් වර්ධනයට ගැලපෙන ආකාරයට නිසි විධාන සහ මඟ පෙන්වීම් කිරීමට ළමයා සම්බන්ධයෙන් නීත්‍යානුකූලව වග කියන්නා වූ දෙමාව්පියන්ගේ හෝ අදාළ වන අවස්ථාවල දේශීය චාරිත්‍රවලින් විධිවිධාන සළසනු ලැබ ඇති ව්‍යාප්ත පවුලේ හෝ ජන සමූහයේ සාමාජිකයන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ වෙනත් තැනැත්තන්ගේ වගකීම් වලට අයිතිවාසිකම් වලට සහ කාර්යයන්ට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් ගරු කළ යුතුය.

6 වන ව්‍යවස්ථාව

1. ජිවත්වීම සඳහා නෛසර්ගික අයිතියක් සෑම ළමයකුට ම තිබෙන බව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් පිළිගනිති.

2. ළමයාගේ පැවැත්ම සහ වර්ධනය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් හැකි උපරිම ප්‍රමාණයට සුරක්ෂිත කරනු ලැබිය යුතුය.

7 වන ව්‍යවස්ථාව

1. ළමයකු උපත ලද විගසම ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, උපතෙහි සිට ම නමක් ලැබීමේ අයිතිය ද, ජාතියක් ලබා ගැනීමේ අයිතිය ද ඔහුට ඇත්තේය. එසේම, හැකිතාක් දුරට ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් කවුරුන් ද කියා දැන ගැනීමේ සහ එම දෙමව්පියන් විසින් රැකවරණ භාරය සලසනු ලැබීමේ අයිතිය ද ඔහුට ඇත්තේය.

2. ස්වකීය ජාතික නීතියට සහ මෙම ක්ෂේත්‍රයෙහි අදාළ ජාත්‍යන්තර සන්ධාන යටතේ ස්වකීය වගකීම්වලට අනුකූලව මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීම, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සුරක්ෂිත කරනු ලැබිය යුතු අතර, එසේ නොකළ විට ළමයා රටක් නොමැති තැනැත්තකු වන අවස්ථාවල මෙය විශේෂයෙන්ම කළ යුතු වන්නේය.

8 වන ව්‍යවස්ථාව

1. නීතිය මගින් පිළිගනු ලැබ ඇති රටවැසිභාවය, නම සහ පවුල් සම්බන්ධතා ඇතුළත් ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාවය, අනීතික මැදිහත්වීම්වලින් තොරව ආරක්ෂා කර ගැනීමේ ළමයාගේ අයිතිවාසිකමට ගරු කිරීමට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් බැඳී සිටින්නාහ.

2. ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාවයේ අංග කීපයක් හෝ සියල්ලම හෝ නීති විරෝධී ලෙස ළමයකුට අහිමි කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාව යළිත් කඩිනමින් පිහිටුවීමේ පරමාර්ථයෙන් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් යෝග්‍ය සහාය සහ ආරක්ෂාව සලසනු ලැබිය යුතුය.

9 වන ව්‍යවස්ථාව

1. ළමයාගේ වැඩිම යහපත උදෙසා ඔහුගේ හෝ ඇයගේ හෝ දෙමව්පියන්ගෙන් වෙන් කළ යුතු බවට අදාළ කරගනු ලැබිය යුතු නීතියට සහ කාර්ය පටිපාටියට අනුකූලව, නිසි බලධරයන් විසින් අධිකරණ සමීක්ෂණයට යටත්ව තීරණය කරනු ලබන විට හැර, ඔවුන්ගේ කැමැත්තට එරෙහිව ළමයකු ඔහුගේ හෝ ඇයගේ හෝ දෙමව්පියන්ගෙන් වෙන් නොකරවන බවට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් සහතික විය යුතුය. එවැනි තීරණයක් දෙමව්පියන් විසින් ළමයකුට අනිසි ලෙස සැලකීමක් හෝ නොසළකා හැරීමක් හෝ දෙමව්පියන් වෙන් වී ජීවත්මක් හෝ ඇතුළත් විශේෂ අවස්ථාවක දී ගනු ලැබිය හැකි අතර, ළමයාගේ පදිංචි ස්ථානය පිළිබඳව තීරණයක් කරනු ලැබිය යුතුය.

2. 1 වන ඡේදයේ ප්‍රකාරව පැවැත්වෙන නඩු කටයුතු කිසිවක දී, එම කටයුතුවලට සහභාගි වී තම අදහස් දැක්වීමට අවස්ථාව, ඊට සම්බන්ධතාවන් දක්වන සියලුම පාර්ශ්වකරුවන්ට ලබා දිය යුතුය.

3. දෙමව්පියන්ගෙන් කෙනෙකුගෙන් හෝ දෙදෙනාගෙන්ම හෝ වෙන්වී සිටින ළමයාට ක්‍රමික පදනමක් මත මව්පියන් දෙදෙනාම සමඟ පෞද්ගලික ආශ්‍රය හා සෘජු සම්බන්ධතා පවත්වාගෙන යාමේ අයිතියට ගරු කිරීම, ළමයාගේ වැඩිම යහපතට පටහැනි වන්නේ නම් මිස, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් එම අයිතියට ගරු කරනු ලැබිය යුතුය.

4. දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ දෙමව්පියන් හෝ ළමයා හෝ රඳවා ගැනීම, බන්ධනාගාර ගත කිරීම, රටින් පිටුවහල් කොට තැබීම, රටින් නෙරපීම හෝ (එම තැනැත්තා රාජ්‍ය අත් අඩංගුවෙහි සිටින අතරතුරදී කිනම් හේතුවක් නිසා වුවද උද්ගත වන මරණය ඇතුළත්ව) මිය යාම වැනි, රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ආරම්භ කරන ලද කිසියම් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් එම වෙන්වීම සිදුවී ඇති අවස්ථාවක, දෙමව්පියන් හෝ ළමයා හෝ අදාළ වන්නේ නම්, එම පවුලේ වෙනත් සාමාජිකයකු ඉල්ලා සිටි විට, එම පවුල් නැති වී සිටින සාමාජිකයා (සාමාජිකයන්) කොහි සිටින්නේ ද යන්න පිළිබඳව අවශ්‍ය තොරතුරු එම ළමයාගේ අභිවෘද්ධියට හානිකර වන්නේ නම් මිස, එම දෙමව්පියන් ළමයා හෝ පවුලේ වෙනත් සාමාජිකයා හෝ වෙත සපයනු ලැබිය යුතුය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කළ පමණින්ම, අදාල තැනැත්තාට හෝ තැනැත්තන්ට හානිකර ප්‍රතිඵල ඇති නොවන බවට පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් වැඩිදුරටත් වගබලා ගනු ලැබිය යුතුය.

10 වන ව්‍යවස්ථාව

1. 9 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ පාර්ශ්වකාරුවන් වන රාජ්‍යවල වගකීම්වලට අනුකූලව, පවුලක් නැවත එක්වීමේ කාර්යය සඳහා රාජ්‍ය පාර්ශ්වයකට ඇතුලුවීමට හෝ රාජ්‍ය පාර්ශ්වයකින් පිටව යාමට, ළමයකු හෝ ඔහුගේ නැතහොත් ඇයගේ දෙමව්පියන් හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් නියත, මානුෂික හා කඩිනම් ආකාරයකින් පාර්ශ්වකාරුවන් වන රාජ්‍යයන් කටයුතු කළ යුතුය. එවැනි ඉල්ලීමක් කිරීම, ඉල්ලුම්කරුවන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට හෝ හානිකර ප්‍රතිඵල නොගෙනෙන බවට, පාර්ශ්වකාරුවන් වන රාජ්‍යයන් විසින් වැඩිදුරටත් වගබලා ගනු ලැබිය යුතුය.

2. යම් දරුවකුගේ දෙමව්පියන් විවිධ රාජ්‍යවල පදිංචිව සිටින්නේද, ඒ දරුවාට විශේෂ අවස්ථානුගත කරුණු පවත්නා විට හැර, දෙමව්පියන් දෙදෙනාම සමඟ පෞද්ගලික ආශ්‍රය සහ ඍජු සම්බන්ධතා ක්‍රමික පදනමක් මත පවත්වා ගෙන යාමේ අයිතිය තිබිය යුතුය. ඒ අරමුණ සඳහා ද, 9 වන ව්‍යවස්ථාවේ 2 ඡේදය යටතේ රාජ්‍ය පාර්ශ්වරුවන්ගේ වගකීම්වලට අනුකූලව ද, ළමයාට සහ ඔහුගේ හෝ ඇයගේ දෙමව්පියන්ට තමාගේ රට ඇතලු ඕනෑම රටක් හැර යාමට ද , තම රටට ඇතුලුවීමටද තිබෙන අයිතිය පාර්ශ්වකාරුවන් වන රාජ්‍යයන් විසින් ගරු කරනු ලැබිය යුතුය. නීතිය මගින් නියම කරනු ලැබ ඇති සහ ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය, සදාචාර ධර්ම හෝ මෙම ව්‍යවස්ථාව මගින් පිළිගෙන තිබෙන වෙනත් අයිතිවාසිකම්වලට එකඟ වන්නාවූ වෙනත් තැනැත්තන්ගෙන් අයිතිවාසිකම් සහ ස්වධීනතා හෝ සුරැකීම පිණිස අවශ්‍ය වන්නා වූ සීමාකිරීම්වලට පමණක්, කිසියම් රටක් හැර යාමේ අයිතිය සීමා විය යුතුය.

11 වන ව්‍යවස්ථාව

1. නීති විරෝධී ලෙස ළමයින් පිටරට යැවීම සහ පිටරටවල සිට ආපසු නොඑවීම මර්ධනය කිරීම සඳහා පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

2. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා ද්වි පාර්ශවික හෝ බහු පාර්ශවික හෝ ගිවිසුම් ඇති කර ගැනීම හෝ පවත්නා ගිවිසුම්වලට ආබද්ධ කිරීම හෝ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් කරනු ලැබිය යුතුය.

12 වන ව්‍යවස්ථාව

1. තමාගේ අදහස් ඇති කර ගැනීමේ ශක්නුතාව ඇති ළමයාට, ඒ ළමයාට බලපාන්නා වූ සියලු කාරණා පිළිබඳව ඔහුගේ හෝ ඇයගේ හෝ අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කිරීමේ අයිතිය,

පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, එම ළමයාට ආරක්ෂණය කොට දෙනු ලැබිය යුතු අතර, ළමයාගේ වයසට සහ පරිණතභාවයට අනුකූලව එම ළමයාගේ අදහස්වලට සැළකිල්ල දැක්විය යුතුය.

2. මෙම කාර්යය සඳහා, ළමයාට බලපාන කිසියම් අධිකරණ හෝ පරිපාලන කාර්ය පටිපාටිවල දී ජාතික නීතියේ කාර්ය පටිපාටික රීතිවලට ගැලපෙන්නා වූ ආකාරයට ළමයා විසින් කෙළින් ම හෝ නියෝජිතයෙකු නැතහොත් නිසි මණ්ඩලයක් මගින් හෝ කියනු ලබන කරුණු ඇසීමේ අවස්ථාවක්, විශේෂයෙන්ම ළමයකු වෙත ලබා දෙනු ලැබිය යුතුය.

13 වන ව්‍යවස්ථාව

1. ප්‍රකාශන නිදහස සඳහා අයිතිය ළමයකුට තිබිය යුතුය. මෙම අයිතියට, දේශ සීමා කුමක් වුව ද, සියලුම ආකාරයේ තොරතුරු සහ අදහස් ගවේෂණය කිරීම, ලබා ගැනීම සහ වාචිකව, ලිඛිතව හෝ කලාවක ස්වරූපයෙන් හෝ ළමයා රුචි වෙනත් යම් මාධ්‍යයකින් හෝ ප්‍රකාශයට පත් කිරීම ඇතුළත් වන්නේය.

2. මෙම අයිතිය ක්‍රියාත්මක කිරීම ඇතැම් සීමා කිරීම්වලට යටත් විය හැකිය. එසේ වුව ද එම සීමා කිරීම් නීතියෙන් විධිවිධාන සලසා ඇත්තා වූ ද

(අ) වෙනත් තැනැත්තන්ගේ අයිතීන්ට සහ කීර්තියට ගරු කිරීම පිණිස;

හෝ

(ආ) ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ මහජන සෞඛ්‍ය හෝ සදාචාර ධර්ම හෝ සුරැකීම පිණිස හෝ අවශ්‍ය වූ ද සීමා කිරීම් පමණක් විය යුතුය.

14 වන ව්‍යවස්ථාව

1. ළමයාගේ චින්තනයේ, හෘදය සාක්ෂියේ සහ ආගමික විශ්වාසයේ නිදහස පිළිබඳ අයිතියට, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් ගරු කළ යුතුය.

2. ළමයාගේ වර්ධනය වන්නාවූ ශක්නුතාවයන්ට ගැලපෙන ආකාරයකට ඔහුගේ හෝ ඇයගේ මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමේ දී විධාන සැළසීමේ දෙමව්පියන්ගේ සහ අදාළ අවස්ථාවලදී නිත්‍යානුකූල භාරකරුවන්ගේ අයිතිවාසිකම්වලට සහ යුතුකම්වලට, ගරු කිරීම පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් කරනු ලැබිය යුතුය.

3. නීතියෙන් නියම කරනු ලැබ ඇත්තාවූ ද, මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍ය හෝ සදාචාරධර්ම හෝ වෙනත් තැනැත්තන්ගේ මූලික අයිතිවාසිකම් සහ ස්වාධීනත්වයන් හෝ ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය වන්නාවූ සීමාකිරීම්වලට පමණක් යමකුගේ ආගම හෝ ඇදහීම් හෝ ප්‍රකාශ කිරීමේ නිදහස සීමා විය හැකිය.

15 වන ව්‍යවස්ථාව

1. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ළමයකුගේ සමාගමයේ නිදහස සහ සාමකාමී රැස්වීමේ නිදහස පිළිගනු ලැබේ.

2. නීතියට අනුකූලව පනවා ඇත්තා වූ ද, ජාතික ආරක්ෂාවෙහි හෝ මහජන ආරක්ෂාවෙහි හෝ මහජන සාමයෙහි අභිවෘද්ධිය පිණිස ද, මහජන සෞඛ්‍යය හෝ සදාචාර ධර්ම සුරැකීම පිණිස හෝ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ ස්වාධීනත්වයන් සුරැකීම පිණිස ද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ සීමා කිරීම් හැර, මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමේ දී සීමාකිරීම් කිසිවක් පනවනු නොලැබිය හැකිය.

16 වන ව්‍යවස්ථාව

1. කිසිම ළමයකුට, ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලිකත්වය, පවුල, නිවස හෝ ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් අන්තනෝමතික නැතහොත් අනීතික මැදිහත්වීම්වලට භාජනය කරනු ලැබීමට ද, ඔහුගේ හෝ ඇයගේ ගරුත්වයට සහ කීර්තියට අනීතික ලෙස හානි කරනු ලැබීමට ද යටත් නොකළ යුතුය.

2. එවැනි මැදිහත්වීම්වලට හෝ හානිකිරීම්වලට හෝ විරුද්ධව, නීතියේ ආරක්ෂාව ලැබීමේ අයිතිය ළමයකුට අත්තේය.

17 වන ව්‍යවස්ථාව

පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ජනමාධ්‍ය මගින් ඉටු කරනු ලබන වැදගත් කාර්යය පිළිගනු ලබන අතරම, විවිධ වූ ජාතික සහා ජාත්‍යන්තර සම්භවයන්ගෙන් ලැබෙන්නාවූ, විශේෂයෙන්ම ඔහුගේ හෝ ඇයගේ සමාජීය, අධ්‍යාත්මික සහ සදාචාරත්මක වර්ධනය සහ කායික සහ මානසික සෞඛ්‍යය නංවාලීම අරමුණු කොට ගත් තොරතුරුවලට සහ පුවත්වලට ප්‍රවේශය ළමයාට තිබෙන බවට වගබලා ගනු ලැබිය යුතුය. මෙම අරමුණු උදෙසා, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් -

(අ) ළමයාට සමාජීය සහ සංස්කෘතික වශයෙන් අර්ථදායක වන්නා වූ ද, 29 වන ව්‍යවස්ථාවේ හරයට අනුකූලවූ ද තොරතුරු සහ පුවත් ප්‍රචාරය කිරීමට ජනමාධ්‍යයන් උනන්දු කරලීම;

(ආ) විවිධ සංස්කෘතික ජාතික සහ ජාත්‍යන්තර සම්භවයන් සමඟ එම තොරතුරු සහ පුවත් නිෂ්පාදනය කිරීමෙහි ලා, හුවමාරු කර ගැනීමෙහිලා සහ ප්‍රචාරය කිරීමෙහි ලා, ජාත්‍යන්තර සහයෝගීතාව උනන්දු කරලීම;

(ඇ) ළමා පොත් නිෂ්පාදනය සහ ප්‍රචාරය කිරීම උනන්දු කරලීම;

(ඈ) සුළු කණ්ඩායමකට අයත් වන්නාවූ හෝ දේශිය වූ හෝ ළමයාගේ වාග් විද්‍යාත්මක අවශ්‍යතා ගැන විශේෂ සැලකිල්ලක් දැක්වීමට ජන මාධ්‍යයන් උනන්දු කරලීම;

(ඉ) 13 වන 18 වන ව්‍යවස්ථාවල විධිවිධාන සිත්හි දරගන, ඔහුගේ හේ ඇයගේ යහපත හානිකර වන්නාවූ තොරතුරු වලින් සහ පුවත්වලින් ළමයා ආරක්ෂා කර ගැනීම සඳහා, නිසි මාර්ගෝපදේශ වර්ධනය කර ගැනීමට උනන්දු කරලීම;

පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් කරනු ලැබිය යුතුය.

18 වන ව්‍යවස්ථාව

1. ළමයා හදාවඩා ගැනීම සහ වර්ධනය කිරීම සඳහා පොදු වගකීමක් දෙමව්පියන් දෙදෙනාටම තිබෙන බවට වූ මූලධර්ම පිළිගන්නා බවට සහතික වීම පිණිස තමන්ට හැකි සෑම උත්සාහයක්ම

පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය. ළමයා හදා වඩා ගැනීම සහ වර්ධනය කිරීම සඳහා මූලික වගකීමක් දෙමව්පියන් හෝ අවස්ථාචෝචිත පරිදි නිත්‍යානුකූල භාරකරුවන්ට ඇත්තේය. ඔවුන් මූලිකව සැළකිය යුතු කරුණ වන්නේ ළමයාගේ වැඩිම යහපතයි.

2. මෙම සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් තහවුරු කෙරෙන බවට සහතික වීමේ සහ ඒවා ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා තම දරුවන් හදා වඩා ගැනීමේ වගකීම් ඉටු කිරීමේ දී දෙමව්පියන්ට සහ නීත්‍යානුකූල භාරකරුවන්ට, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සුදුසු ආධාර සලසනු ලැබිය යුතු අතර, ළමයින්ගේ පෝෂණය සහ රැකවරණය සඳහා ආයතන, පහසුකම් හා සේවාවන් සංවර්ධනය කෙරෙන බවට ද වගබලා ගනු ලැබිය යුතුය.

3. වැඩ කරන දෙමව්පියන්ගේ දරුවනට ලබා ගැනීමට සුදුසුකම් ඇති ළමා ආරක්ෂක සේවාවන් සහ පහසුකම් ද, ඒවායින් ප්‍රතිලාභ ලැබීමේ අයිතිය, ඒ ළමයින්ට තිබෙන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු යෝග්‍ය පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

19 වන ව්‍යවස්ථාව

1. ළමයකු, දෙමව්පියන්ගේ හෝ නීත්‍යනුකූල භාරකරුවකුගේ නැතහොත් ළමයාගේ ආරක්ෂාව රැකවරණය භාරව සිටින වෙනත් යම් තැනැත්තකුගේ ආරක්ෂක රැකවරණයෙහි සිටින අතරතුර, සියලු ආකාරයේ ශාරීරික හෝ මානසික හිංසා පීඩාවලින්, අනතුරුවලින්, පරිභවයට පාත්‍ර කිරීමෙන්, නොසළකා හැරීමෙන් හෝ නොසැළකිලිමත් ලෙස සලකනු ලැබීමෙන්, වෙනස්කම් කිරීමෙන් හෝ අයථා ලිංගික සම්බන්ධතා ඇතුලු අයථා ක්‍රියාවන්ට භාජනය කිරීමෙන් හෝ අයුතු ප්‍රයෝජනයට යොදා ගැනීමෙන්, ළමයා ආරක්ෂා කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සියලුම යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජීය සහ අධ්‍යාපනික පියවරවල් ගනු ලැබිය යුතුය.

2. අදාළ වන පරිදි, එම ආරක්ෂක පියවරවලට, ළමයාට සහ ළමයාගේ ආරක්ෂක රැකවරණ දරන තැනැත්තන්ට අවශ්‍ය ආධාරය සලන්නාවූ සමාජ වැඩ පිළිවෙලවල් පිහිටුවීම සඳහා ද, මෙහි කලින් විස්තර කර ඇත්තාවූ ද, අධිකරණයේ මැදිහත්වීම සඳහා යෝග්‍ය වන්නාවූ ද ළමයාට අනිසි ලෙස සැලකීමේ අවස්ථා වැළැක්වීම, ඒ අවස්ථා හඳුනා ගැනීම, වාර්තා කිරීම, අවධානයට යොමු කිරීම, විමර්ශනය කිරීම, ඒ අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පසු විපරම් කිරීම සඳහා ද වෙනත් ස්වභාවයේ ඵලදායී කාර්ය පටිපාටි ඇතුළත් විය යුතුය.

20 වන ව්‍යවස්ථාව

1. ඔහුගේ හෝ ඇයගේ පවුල් පරිසරය තාවකාලිකව හෝ ස්ථිරව හෝ ඔහුට හෝ ඇයට අහිමිව ඇත්තාවූ හෝ තමන්ගේම වැඩිම යහපත පිණිස, ඒ පරිසරයේ රැඳී සිටීමට ඉඩ දෙනු ලැබිය නොහැකි වන්නා වූ හෝ ළමයකුට, රාජ්‍යය විසින් සලසනු ලබන විශේෂ ආරක්ෂාව සහ ආධාර ලැබීමේ අයිතියක් තිබිය යුතුය.

2. ස්වකීය ජාතික නීතිවලට අනුකූලව, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, එවැනි ළමයකුට විකල්ප ආරක්ෂාව රැකවරණය ලැබෙන බවට වගබලා ගනු ලැබිය යුතුය.

3. වෙනත් කරුණු අතර, එවැනි ආරක්ෂක රැකවරණයකට, පිළිදැගුම් භාරයක පිහිටුවීම, ඉස්ලාම් නීතියේ කෆාලා, දරුකමට හදා ගැනීම, හෝ අවශ්‍ය නම්, ළමයින්ගේ ආරක්ෂා රැකවරණ සඳහා වූ සුදුසු ආයතනයක රැඳවීම ඇතුළත් විය යුතුය. විසඳුම් සළකා බැලීමේදී, ළමයා හදා වඩා

ගැනීම දිගටම කරගෙන යාමේ අවශ්‍යතාවය සහ ළමයාගේ ජනවාර්ගික, ආගමික, සංස්කෘතිය සහ භාෂාමය පසුබිම් කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය.

21 වන ව්‍යවස්ථාව

දරුකමට හදා ගැනීමේ ක්‍රමය පිළිගන්නා වූ සහ/හෝ එයට ඉඩ දෙන්නා වූ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, වැඩිම සැලකිල්ල ළමයාගේ වැඩිම යහපත උදෙසා යොමුවන බවට වගබලාගනු ලැබිය යුතු අතර, එම රාජ්‍යයන් විසින්,

(අ) දෙමව්පියන්ට, ඥාතීන්ට සහ නීත්‍යානුකූල භාරකරුවන්ට අදාළව, ළමයාගේ තත්ත්වය ප්‍රකාරව, දරුකමට හදා ගැනීමට අවසර දිය හැකි බවට සියලු අදාළ සහ විශ්වාසනීය තොරතුරු පදනම් කර ගෙන, අදාළ නීතියට සහ ක්‍රියා පටිපාටියට අනුකූලව තීරණ ගන්නා නිසි බලධාරීන් විසින් පමණක් දරුකමට හදා ගැනීමේ අවසරය දී ඇති බවට සහ අවශ්‍ය නම් අවශ්‍ය වන්නා වූ උපදෙස් පදනම් කර ගෙන දරුකමට හදා ගැනීමට එකඟ බවට අදාළ තැනැත්තා විසින් දැනුම් දී ඇති බවට බගබලා ගැනීම ද;

(ආ) ළමයා පිළිදැගුම් භාරයක හෝ හදා වඩා ගන්නා පවුලක භාරයෙහි හෝ තැබිය නොහැකි නම් හෝ කිසියම් සුදුසු ආකාරයකට ළමයා උපත ලද රටෙහිම ආරක්ෂ රැකවරණ සැලසිය නොහැකි නම්, ළමයාගේ ආරක්ෂාව රැකවරණ පිළිබඳ විකල්ප මාර්ගයක් වශයෙන් රටරටවල් අතර දරුකමට හදා ගැනීම සලකා බැලිය හැකි බව පිළිගැනීම ද;

(ඇ) රටරටවල් අතර දරුකමට හදා ගැනීමට භාජනය වන ළමයාට ද, රට තුළ කථාක වශයෙන් දරුකමට හදා ගන්නා අවස්ථාවල පවත්නා ආරක්ෂාවන් සහ තත්ත්වයන් භුක්ති වීඳීමට ලැබෙන බවට වගබලා ගැනීමද ;

(ඈ) රටරටවල් අතර දරුකමට හදා ගැනීමේදී, එසේ පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් එයට සම්බන්ධ වූ තැනැත්තන්ට අයුතු මුල්‍ය වාසියක් නොලැබෙන බවට සහතික වීම පිණිස සුදුසු සියලු පියවරවල් ගැනීම ද;

(ඉ) යෝග්‍ය අවස්ථාවලදී ද්වි පාර්ශ්වික හෝ බහු පාර්ශ්වික වැඩ පිලිවෙලවල් හෝ ගිවිසුම් හෝ ඇති කර ගැනීම මගින් මෙම ව්‍යවස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ ළමයා වෙනත් රටක පිහිටුවීම නිසි බලයලත් අධිකාරීන් නැතහොත් අංශ මගින් සිදුකරන බවට සහතික වීම පිණිස, මෙම රාමුව තුළ ප්‍රයන්ත දැරීම ද කරනු ලැබිය යුතුය.

22 වන ව්‍යවස්ථාව

1. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, අදාළ වන්නාවූ ජාත්‍යන්තර හෝ දේශිය නීතියට සහ කාර්ය පටිපාටියට අනුකුල වූ, සරණාගත තත්ත්වය පතන්නාවූ නැතහොත් සරණාගතයකු ලෙස සලකනු ලබන්නාවූ දරුවකු, ඔහුගේ හෝ ඇයගේ දෙමාව්පියන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ සමඟ ඉදිරිපත් වන්නේ වුව ද නොවුව ද එකී රාජ්‍යයන් පාර්ශ්වකරුවන් වන්නාවූ මෙම සම්මුතියෙහි සහ වෙනත් ජාත්‍යන්තර මානුෂික අයිතිවාසිකම් හෝ මානව දයාව හෝ පිළිබඳ සාධන පත්‍රවල දක්වා ඇති අදාළ අයිතිවාසිකම් භුක්ති විඳිමේ දී, නිසි ආරක්ෂාව සහ මානව දයාව ලැබෙන බවට සහතික කිරීම පිණිස, උචිත පියවරවල් ගනු ලැබිය යුතුය.

2. මෙම කාර්ය සඳහා එවැනි ළමයකු ආරක්ෂා කිරීම සහ එම ළමයාට සහාය වීම පිණිසත් ඔහුගේ හෝ ඇයගේ හෝ පවුල නැවත එකමුතු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කිසියම් සරණාගත ළමයකුගේ දෙමව්පියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයන් හෝ සොයා ගැනීම පිණිසත් එක්සත් ජාතීන් විසින් ද එක්සත් ජාතීන් සමඟ සහයෝගීව කටයුතු කරන නිසි බලැති අන්තර් ආණ්ඩු සංවිධාන හෝ ආණ්ඩුවේ නොවන සංවිධාන විසින් ද දරනු ලබන ප්‍රයත්න කිසිවකදී, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ඒවා සුදුසු යයි සලකන සහාය සළසනු ලැබිය යුතුය. දෙමව්පියන් හෝ පවුලේ සාමාජිකයන් හෝ සොයා ගත නොහැකි අවස්ථාවලදී එම ළමයාට කිසියම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ පවුල් පරිසරය ස්ථිරව හෝ තාවකාලිකව හෝ අහිමිව සිටින වෙනත් ළමයකුට පරිදිම මෙම සම්මුතියෙහි දක්වා ඇති ආරක්ෂාව ම සලසනු ලැබිය යුතුය.

23 වන ව්‍යවස්ථාව

1. මානසික හො ශාරීරිකව හේ අබල ළමයකු ඔහුගේ හේ ඇයගේ ගරුත්වය සහතික කරන, ආත්ම විශ්වාසය ප්‍රවර්ධනය කරන, සහ ප්‍රජාව සමඟ ළමයාගේ ක්‍රියාකාරී සහභාගිත්වය පහසු කරන තත්ත්වයන් මත, පරිපූර්ණ වූ ද විනීත වූ ද පිවිතයක් ගත කළ යුතුබව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ.

2. විශේෂ ආරක්ෂා, රැකවරණය සඳහා අබල ළමයකුගේ අයිතිය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලබන අතර, ඉලලුම් කර ඇත්තාවූ ද ළමයාගේ තත්ත්වය සහ ළමයා රැකබලාගන්නා දෙමව්පියන් හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අවස්ථානුගත තත්ත්වයන්ට උචිත වන්නා වූ ද ආධාරය, පවත්නා සම්පත්වලට යටත්ව, සුදුසුකම් ලබා ඇති ළමයා වෙතද ඔහුගේ හෝ ඇයගේ ආරක්ෂා රැකවරණය සඳහා වගකිව යුතු තැනැත්තන් වෙත ද ව්‍යාප්ත කිරීම, එම රාජ්‍යයන් විසින් උනන්දු කරනු ලැබිය යුතු අතර , එසේ කෙරෙන බවට සහතික විය යුතුය.

3. අබල ළමයකුගේ විශේෂ අවශ්‍යතා ගැන සැළකිලිමත්ව, ඒ ළමයා රැක බලා ගන්නා දෙමව්පියන්ගේ හෝ වෙනත් තැනැත්තන්ගේ මුල්‍ය සම්පත් සැලකිල්ලට ගනිමින්, 2 වන ඡේදයට අනුකූලව ව්‍යාප්ත කරනු ලබන ආධාරය, හැකි සෑම අවස්ථාවකදීම, අයකිරීමක් නොමැතිව ප්‍රදානය කරනු ලැබිය යුතු අතර, ඔහුගේ හෝ ඇයගේ සංස්කෘතිය සහ අධ්‍යාත්මික වර්ධනය ඇතුලුව, ලබාගත හැකි පූර්ණ සමාජ සමෝධානය සහ පෞද්ගලික අභිවෘද්ධිය ළමයා විසින් අත්කර ගනු ලැබීමට හිතකර වන්නා වූ ආකාරයකින් අධ්‍යාපනයට, පුහුණුවට, සෞඛ්‍ය ආරක්ෂක සේවාවන්ට, පුනරුත්ථාපන සේවාවන්ට, සේවා නියුක්තිය සඳහා සූදානම් කිරීම්වලට, සහ විනෝදවීමේ අවස්ථාවලට ළමයාට ඵලදායී ප්‍රවේශය ඇති බවටත්, ඒවා ලැබෙන බවටත් සහතික වන පරිදි ඒවා සැලසුම් කොට තිබිය යුතුය.

4. මෙම ක්ෂේත්‍රවල තම හැකියාවන් සහ නිපුණතා වැඩිදියුණු කර ගැනීමට ද තම අත්දැකීම් පුළුල් කර ගැනීමටද, පාර්ශ්වකරුවන් වන රාජ්‍යවලට හැකියාව සැලසීමේ අරමුණ ඇතිව, පුනරුත්ථාපනය, අධ්‍යාපනය සහ වෘත්තිය සේවා ක්‍රමවලට අදාළ තොරතුරු සැපයීම සහ ඒවාට ප්‍රවේශ ලබාදීම ඇතුලුව, අබල ළමයින් පිළිබඳ වූ නිවාරණ සෞඛ්‍ය සේවා, සහ වෛද්‍ය මානසික සහ ශ්‍රීතිය ප්‍රතිකාර පිළිබඳ ක්ෂේත්‍රවල උචිත තොරතුරු හුවමාරු කර ගැනීම, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ජාත්‍යන්තර සහයෝගීතාවයේ නාමයෙන් ප්‍රවර්ධනය කරනු ලැබිය යුතුය. මේ සම්බන්ධයෙන් සංවර්ධනය වන්නා වූ රටවල අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

24 වන ව්‍යවස්ථාව

1. සෞඛ්‍යය සම්බන්ධයෙන් ලබා ගත හැකි ඉහළම තත්ත්වය භුක්ති විඳීම සඳහා ද, අසනීපවලට ප්‍රතිකාර ගැනීමට සහ සෞඛ්‍යය පුනරුත්ථාපනය කර ගැනීමට පහසුකම් සඳහා ද ළමයාගේ අයිතිය, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ. එම සෞඛ්‍යය ආරක්ෂක සේවාවන්ට ප්‍රවේශය ලැබීමේ ඔහුගේ හෝ ඇයගේ අයිතිය කිසිම ළමයකුට අහිමි නොවන බවට වග බලා ගැනීම පිණිස, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ප්‍රයන්ත දරනු ලැබිය යුතුය.

2. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් මෙම අයිතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරවීමට ක්‍රියා කරනු ලැබිය යුතු අතර, විශේෂයෙන්ම;

(අ) ළදරු සහ ළමා මරණ සංඛ්‍යාව අඩු කිරීමට;

(ආ) ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂාව වර්ධනය කිරීම කෙරෙහි අවධානය ඇතිව සියලුම ළමයින්ට අවශ්‍ය වෛද්‍ය සහාය සහ සෞඛ්‍ය ආරක්ෂාව සැලසෙන බවට සහතික කිරීමට;

(ඇ) පරිසර දූෂණයේ අනතුරු සහ අවදානම් සැලකිල්ලට ගනිමින්, පහසුවෙන් ලබාගත හැකි තාක්ෂණය උපයෝගී කර ගැනීමෙන් සහ ප්‍රමාණවත් පෝෂ්‍යදායී ආහාර සහ පිරිසිදු පානීය ජලය සැපයීම මගින්, ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂාවේ රාමුව තුළ රෝග සහ මන්දපෝෂණය මර්ධනය කිරීමට ;

(ඈ) මව්වරුන් සඳහා යෝග්‍ය ප්‍රාග් ප්‍රසව සහ පශ්චාත් ප්‍රසව සෞඛ්‍ය ආරක්ෂාව ලැබෙන බවට සහතික කිරීමට ;

(ඉ) සමාජයේ සියලුම අංශවලට, විශේෂයෙන්ම දෙමව්පියන්ට හා ළමයින්ට, ළමා සෞඛ්‍යය සහ පෝෂණය, මව්කිරි දීමේ වාසිදායක තත්ත්වයන්, ස්වස්ථතාව සහ පාරිසරික සනීපාරක්ෂාව සහ අනතුරු වැළැක්වීම පිළිබඳ වූ මූලික දැනුම ලැබෙන බවට ද එවැනි අධ්‍යාපනයකට ප්‍රවේශය තිබෙන බවට ද එම දැනුම භාවිතයේදී සහාය වන බවට ද සහතික වීමට ;

(ඊ) නිවාරණ සෞඛ්‍ය ආරක්ෂාව, දෙමව්පියන් සඳහා මඟ පෙන්වීම සහ පවුල් සැළසුම් අධ්‍යාපනය සහ සේවාවන් වර්ධනය කිරීමට සුදුසු පියවරවල් ගනු ලැබිය යුතුය.

3. ළමයින්ගේ සෞඛ්‍යයට හානිකර වන්නාවූ පාරම්පරික සිරිත් නැති කිරීමේ අදහස ඇතිව, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ඵලදායී වූ ද යෝග්‍ය වූ ද සියලු පියවරවල් ගනු ලැබිය යුතුය.

4. මෙම ව්‍යවස්ථාවෙහි පිළිගෙන ඇති අයිතිය සම්පූර්ණයෙන්ම ඉෂ්ඨ කර ගැනීම ප්‍රගාමී ලෙස සාක්ෂාත් කර ගැනීමේ අදහසින්, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමටත් උනන්දු කිරීමටත් භාර ගනු ලැබේ. මේ සම්බන්ධයෙන් සංවර්ධනය වන්නාවූ රටවල අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ සැලකිල්ල යොමුවිය යුතුය.

25 වන ව්‍යවස්ථාව

පෝෂණයේ රැකවරණයේ හෝ ඔහුගේ හෝ ඇයගේ කායික හෝ මානසික සෞඛ්‍යය පිණිස ප්‍රතිකාර ලබාදීමේ හෝ කාර්යයන් සඳහා නිසි බලය ඇති බලධරයකු විසින් ස්ථානගත කරන ලද ළමයකුට, ඒ ළමයාට සළසනු ලබන ප්‍රතිකාර පිළිබඳව සහ ඔහුගේ හේ ඇයගේ ස්ථානගත කිරීමට

අදාළ වෙනත් සියලු අවස්ථානුගත කරුණු පිළිබඳව කලින කලට සමාලෝචනයක් කරනු ලැබීමට තිබෙන්නාවූ අයිතිය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ.

26 වන ව්‍යවස්ථාව

1. සමාජ රක්ෂණය ඇතුලුව සමාජ සුරක්ෂිතතාවයෙන් ප්‍රතිලාභ ලැබීමේ සෑම ළමයකුටම ඇති අයිතිය, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලබන අතර, තම ජාතිය නීතියට අනුකූලව, මෙම අයිතිය සම්පූර්යෙන්ම සාක්ෂාත කර ගැනීම සඳහා අවශ්‍ය පියවරවල් ඒ රාජ්‍යය විසින් ගනු ලැබිය යුතුය.

2. සුදුසු අවස්ථාවලදී, ළමයාගේ සහ ළමයා නඩත්තු කිරීම සඳහා වගකීම දරණ තැනැත්තාගේ සම්පත් සහ අවස්ථානුගත කරුණු ද ප්‍රතිලාභ සඳහා ළමයා විසින් හෝ ළමයා වෙනුවෙන් හෝ කරන ලද ඉල්ලීමකට අදාළ වන්නාවූ වෙනත් සැලකිය යුතු කරුණු ද සැළකිල්ලට ගනිමින් ප්‍රතිලාභ ප්‍රදානය කරනු ලැබිය යුතුය.

27 වන ව්‍යවස්ථාව

1. ළමයාගේ කායික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක සහ සමාජීය වර්ධනය සඳහා ප්‍රමාණවත් වන්නාවූ ජීවන තත්ත්වයකට සෑම ළමයකුගේම ඇති අයිතිවාසිකම, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ.

2. ළමයාගේ වර්ධනයට අවශ්‍ය වන්නාවූ ජීවන තත්ත්වයන් තම තමන්ගේ හැකියාවල් සහ මුදල් පිළිබඳ ශක්‍යතා ඇතුළත සුරක්ෂිත කරදීමේ ප්‍රාථමික වගකීම, දෙමව්පියන් විසින් හෝ ළමයා සඳහා වගකිව යුතු වන වෙනත් තැනැත්තන් විසින් හෝ දරනු ලැබිය යුතුය.

3. මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීම පිණිස දෙමව්පියන්ට සහ ළමයා සම්බන්ධයෙන් වග කියන්නාවූ වෙනත් තැනැත්තන්ට ආධාර කිරීමේ සුදුසු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, ජාතික තත්ත්වයන්ට අනුකූලව සහ තම තමන්ගේ ශක්ති ප්‍රමාණය ඇතුළත ගනු ලැබිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී, විශේෂයෙන්ම පෝෂණය, ඇඳුම්, පැළඳුම් සහ නිවාස සම්බන්ධයෙන්, ද්‍රව්‍යමය ආධාර සළසනු ලැබීම ද ආධාර වැඩ පිළිවෙළවල් ඇති කිරීමද කරනු ලැබිය යුතුය.

4. ළමයා සඳහා මුදල් පිළිබඳව වගකීම දරණ දෙමව්පියන්ගෙන් සහ වෙනත් තැනැත්තන්ගෙන් ළමයා සඳහා නඩත්තු, රාජ්‍ය පාර්ශ්ව ඇතුළතින් වුව ද විදේශයෙන් වුවද අයකර ගැනීම සුරක්ෂිත කිරීම පිණිස, සියලු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය. විශේෂයෙන්ම, ළමයා සඳහා මුදල් පිළිබඳ වගකීම දරන තැනැත්තා ළමයා සිටින රාජ්‍යයෙන් වෙනස් රාජ්‍යයක ජීවත්වන අවස්ථාවක, ජාත්‍යන්තර ගිවිසුම්වලට ආබද්ධ වීම හෝ එවැනි ගිවිසුම් ඇති කර ගැනීම මෙන්ම වෙනත් සුදුසු වැඩ පිළිවෙලවල් යොදා ගැනීම හෝ එම පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ලැබිය යුතුය.

28 වන ව්‍යවස්ථාව

1. අධ්‍යාපනයක් සඳහා ළමයාට ඇති අයිතිවාසිකම පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ. ප්‍රගාමී ලෙස ද සමාන අවස්ථා සැලසීමේ පදනම මත ද මෙම අයිතිවාසිකම ලබා දීමේ අදහසින්, රාජ්‍යයන් විසින් විශේෂයෙන්ම;

(අ) ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු අතර, එය සෑම දෙනාටම නොමිළයේ ලබාගත හැකිවිය යුතුය.

(ආ) සාමාන්‍ය හා වෘත්තිය අධ්‍යාපනය ඇතුලුව, විවිධ අකාරවල ද්විතියක අධ්‍යාපනය නංවාලීම උනන්දු කළ යුතු අතර, ඒවා සෑම ළමයකුටම ලබාගතහැකි සහ සෑම ළමයකුටම ඒවාට ප්‍රවේශයක් තිබෙන තත්ත්වයකට පත් කරනු ලැබිය යුතුය. නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමට සහ අවශ්‍ය අවස්ථාවන්හීදී මුදල් ආධාර පිරිනැමීමට සුදුසු පියවරවල් ගත යුතුය.

(ඇ) සියලු සුදුසු ක්‍රියා මාර්ග මගින් දක්ෂතාවයේ පදනම මත, සෑම දෙනාටම උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සලසා දිය යුතුය.

(ඈ) අධ්‍යාපනය සහ වෘත්තිය තොරතුරු සහ මාර්ගෝපදේශ සියලුම ළමයින්ට ලබා ගැනීමට හැකිවීමටද ඒ සඳහා ඔවුනට ප්‍රවේශය ලැබීමට ද සැලැස්විය.

(ඉ) පාසල්වලට විධිමත් ලෙස පැමිණිම උනන්දු කර ලීමට සහ පාසල් අත්හැර යන්නන්ගේ සංඛ්‍යාව අඩු කරලීමට පියවර ගත යුතුය.

2. පැසල් විනය, පරිපාලනය, ළමයාගේ මානව ගරුත්වය අනුකූල වන අකාරයටත්, වර්තමාන සම්මුතිය අනුකූලවත් කෙරෙන බවට වගබලා ගැනීම සඳහා සුදුසු සියලු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

3. අධ්‍යාපනයට අදාළ කරුණුවලදී, ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරලීම, ර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් කරනු ලැබිය යුතු අතර, විශේෂයෙන් ම, එය නූගත්කම සහ අකුරු නොදැනීම මුලු ලෝකයෙන්ම තුරන් කිරීමට දායකවීමේ සහ විද්‍යාත්මක සහ තාක්ෂන දැනුමට සහ නූතන ඉගැන්වීමේ ක්‍රමවලට ප්‍රවේශය පහසු කිරීමේ අදහසින් විය යුතුය. මේ පිළිබඳව, සංවර්ධනය වන්නා වූ රටවල අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ සැලකිල්ල දැක්විය යුතුය.

29 වන ව්‍යවස්ථාව

1. ළමයාගේ අධ්‍යාපන;

(අ) ළමයාගේ පෞද්ගලිකත්වය, දක්ෂතා සහ මානසික හා ශාරීරික ශක්නුතා, ඒවා යොදා ගත හැකි ප්‍රශස්ත මට්ටමින් වර්ධනය කිරීම;

(ආ) මානුෂික අයිතිවාසිකම් සහ මූලික නිදහස කෙරෙහි ද එක්සත් ජාතීන්ගේ සම්මුතියේ අඩංගු මූලධර්ම කෙරෙහි ද ගරුත්වය වර්ධනය කිරීම;

(ඇ) ළමයාගේ දෙමව්පියන් කෙරෙහි, ඔහුගේ හෝ ඇයගේ සංස්කෘතික අනන්‍යතාව, භාෂාව සහ වටිනාකම් කෙරෙහි, ළමයා ජිවත් වන රටෙහි සහ ඔහු හෝ ඇය සම්භවය ලද රටෙහි ජාතික වටිනාකම් සහ ඔහුගේ හෝ ඇයගේ ශිෂ්ඨාචාරයට වෙනස් වූ ශිෂ්ඨාචාරයන් කෙරෙහි ගරුත්වය වර්ධනය කිරීම;

(ඈ) සියලුම ජනතාව, ජනවාර්ගිකයන්, ජාතික සහ ආගමික කණ්ඩායම් සහ දේශිය සම්භවය ඇති තැනැත්තන් අතර අවබෝධය, සාමය, අගතිගාමී නොවීම, ස්ත්‍රී

පුරුෂයන් අතර සමානත්වය සහ මිත්‍රත්වය හරය වශයෙන් ඇතිව, නිදහස් සමාජයක වගකීම් සහිත ජීවිතයක් සඳහා ළමයා සූදානම් කිරීම;

(ඉ) ස්වාභාවික පරිසරය සඳහා ගරුත්වය වර්ධනය කිරීම, අරමුණු කර ගත යුතු බවට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් එකඟ වනු ලැබේ.

2. අධ්‍යාපන ආයතන පිහිටුවා මෙහෙයවීමට පුද්ගලයින්ට හා මණ්ඩලවලට ඇති නිදහස කෙරෙහි, මෙම ව්‍යවස්ථාවේ හෝ 28 වන ව්‍යවස්ථාවේ හෝ කිසිම කොටසකින් බාධා කෙරෙන්නේ යයි තේරුම් නොගත යුතුය. එසේ වුවද සැමවිටම, මෙම ව්‍යවස්ථාවේ, 1 වන ඡේදයේ දක්වා ඇති මූලධර්ම අනුගමනය කිරීමටද එම ආයතන තුලදීම දෙනු ලබන අධ්‍යාපනය, රාජ්‍යය විසින් නියම කරනු ලබන අවම තත්ත්වයන්ට අනුකූල විය යුතු වීමේ අවශ්‍යතාව යද මෙම නිදහස යටත් වන්නේය.

30 වන ව්‍යවස්ථාව

ජනවාර්ගික, ආගමික හෝ භාෂාමය වශයෙන් සුළු ජන කොටස් හෝ දේශිය සම්භවය දරන තැනැත්තන් හෝ සිටින රාජ්‍යවල, එවැනි සුළු ජන කොට්ඨාශයකට අයත් වන්නාවූ හෝ දේශිය වන්නා වූ හෝ ළමයකුට, ඔහුගේ හෝ ඇයගේ කණ්ඩායමේ සෙසු සාමාජිකයන් ම සමඟ එක්ව, ඔහුගේ හෝ ඇයගේ සංස්කෘතිය දැරීමේ, ඔහුගේ හෝ ඇයගේ ආගම කියා පෑමේ සහ ඇදහීමේ හෝ ඔහුගේ හෝ ඇයගේ භාෂාව භාවිතා කිරීමේ අයිතිය අහිමි කරනු නොලැබිය යුතුය.

31 වන ව්‍යවස්ථාව

1. විවේකය ලැබීමත්, විවේක සුව විඳීමටත්, ළමයාගේ වයසට උචිත වූ ක්‍රීඩා සහ විනෝද කටයුතුවල නිරත වීමටත් සංස්කෘතික ජිවිතයට සහ ශිල්ප කලාවලට නිදහසේ සහභාගීවීමටත් ළමයාට තිබෙන අයිතිවාසිකම, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ.

2. සංස්කෘතිය සහ කලා ජිවිතයට පූර්ණ ලෙසින් සහභාගිවීමට ළමයාට ඇති අයිතියට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගරු කරනු ලැබිම ද එය ප්‍රවර්ධනය කරනු ලැබිම ද කළ යුතු අතර, සංස්කෘතික, කලාත්මක, විනෝදාත්මක සහ විවේකීය කටයුතු සඳහා යෝග්‍ය හා සමාන අවස්ථාවල් සලසා දීම උනන්දු කරනු ලැබිය යුතුය.

32 වන වගන්තිය

1. ආර්ථික සූරා කෑමෙන් ද දුෂ්කර වූ හෝ ළමයාගේ අධ්‍යපනය කෙරෙහි අවහිර ඇති කරන්නා වූ හෝ ළමයාගේ සෞඛ්‍යයට හෝ ශාරීරික, මානසික, අධ්‍යත්මික, සදාචාරාත්මක හෝ සමාජීය වර්ධනයට හානි කරන්නා වූ හෝ යම් වැඩක් කිරීමෙන් ළමයකු ආරක්ෂා කර ගනු ලැබිමට ඒ ළමයාට ඇති අයිතිවාසිකම, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ.

2. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කෙරෙන බවට සහතික වීම සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ව්‍යවස්ථාදායක, පරිපාලන, සමාජීය සහ අධ්‍යාපනික පියවරවල් ගනු ලැබිය යුතුය. මෙම අරමුණ ඇතිව, වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවල අදාළ විධිවිධාන කෙරෙහි සැලකිල්ල දක්වමින් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් විශේෂයෙන්ම;

(අ) සේවා නියුක්තියට ඇතුළත් කර ගැනීම සඳහා අවම වයස් හෝ වයස් සීමා හෝ සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතුය.

(ආ) සේවා නියුක්තියේ යෙදිය යුතු පැය ගණන සහ සේවා කොන්දේසි පිළිබඳ සුදුසු නියෝග සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතුය; තවද

(ඇ) මෙම ව්‍යවස්ථාව ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම, සුදුසු දණ්ඩන සහ වෙනත් තහංචි සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතුය.

33 වන ව්‍යවස්ථාව
අදාළ ජාත්‍යන්තර සන්ධානවල අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ, නිද්‍රාජනක ඖෂධ වර්ග සහ මනස විකෘති කරන ද්‍රව්‍ය නීති විරෝධි ලෙස භාවිතයෙන් ළමයින් ආරක්ෂා කිරීමටත්, එවැනි ද්‍රව්‍ය නීති විරෝධි ලෙස නිෂ්පාදනය කිරීමෙහි සහ රහස් වෙළදාමෙහි ළමයින් යොදා ගැනීම වැළැක්වීමටත් ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජීය සහ අධ්‍යාපනික පියවරවල් ඇතුලු සියලු යෝග්‍ය පියවරවල්, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

34 වන ව්‍යවස්ථාව
සියලුම ආකාරවල, අයුතු ලෙස ලිංගික ක්‍රියාවල යොදවනු ලැබීමෙන් සහ අයුතු ලිංගික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනු ලැබීමෙන් ළමයා ආරක්ෂා කිරීමේ කාර්යය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් භාරගනු ලැබේ. මෙම කාර්යයන් සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, විශේෂයෙන්ම;

(අ) කිසියම් අනීතික ලිංගික ක්‍රියාවලියක යෙදීම සඳහා ළමයකු පෙළඹවීම හෝ එසේ යෙදෙන ලෙස ඒ ළමයාට බල කිරීම;

(ආ) ගණිකා වෘත්තියෙහි හෝ වෙනත් අනීතික ලිංගික චරියාවලදී අයුතු ප්‍රයෝජනය පිණිස ළමයින් යෙදවීම ; සහ

(ඇ) කාමුක රංගනවල සහ ද්‍රව්‍යවල ළමයින් අයුතු ප්‍රයෝජනය උදෙසා යෙදවීම වැළැක්වීම සඳහා සුදුසු සියලු ජාතිත ද්වි පාර්ශ්වික සහ බහු පාර්ශ්වික පියවරවල් ගනු ලැබිය යුතුය.

35 වන ව්‍යවස්ථාව
කිනම් කර්යයන් සඳහ වුවද, කිනම් ආකාරයකින් වුව ද ළමයින් පැහැරගෙන යාම, විකිණීම හෝ රහසේ වෙළදාම් කිරීම වැළැක්වීම පිණිස පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සුදුසු සියලු ජාතික ද්වි පාර්ශ්වික සහ බහු පාර්ශ්වික පියවරවල් ගනු ලැබිය යුතුය.

36 වන ව්‍යවස්ථාව
ළමයාගේ සුභ සාධනයේ කිනම් අංගයකට වුව ද හානිකර වන්නා වූ වෙනත් සියලු ආකාරවල අයුතු ප්‍රයෝජන ලැබීම්වලට එරෙහිව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ළමයා ආරක්ෂා කරනු ලැබිය යුතුය.

37 වන ව්‍යවස්ථාව
පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පහත දැක්වෙන කරුණු ඉටුවන බවට බගබලා ගනු ලැබිය යුතුය.

(අ) කිසිම ළමයකු වදහිංසාවලට හෝ වෙනත් කෲර, අමානුෂික හෝ නොහොබිනා සැලකිල්ලට හෝ දඩුවම්වලට හෝ යටත් කරනු නොලැබිය යුතුය. වසය අවුරුදු දහ අටට අඩු තැනැත්තන් විසින් කරනු ලබන වැරදි සඳහා, මරණීය දණ්ඩනය හෝ

මුදා හැරීමේ හැකියාව නොමැති පිවිතාන්තය දක්වා වූ සිර දඬුවම පනවනු නොලැබිය යුතුය.

(ආ) කිසිම ළමයකුගේ ස්වාධීනත්වය අනීතික ලෙස හෝ අත්තනෝමතික ලෙස හෝ ඔහුට හෝ ඇයට අහිමි නොකළ යුතුය. ළමයකු අත් අඩංගුවට ගැනීම, රඳවා ගැනීම හෝ බන්ධනාගාරගත කිරීම, නීතියට අනුකූලව කරනු ලැබිය යුතු අතර එය අවසාන පියවරක් වශයෙන් සහ සුදුසු කෙටිම කාලසීමාව සඳහා පමණක් යොදාගනු ලැබිය යුතුය.

(ඇ) ස්වාධීනත්වය අහිමි කරනු ලැබූ සෑම ළමයකුටම, මානුෂිකව සහ මිනිසාගේ නෛසර්ගික ගරුත්වයට බුහුමන් ඇතිවද, ඔවුන්ගේ වයස් සීමවේ තැනැත්තන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනු ලබන ආකාරයෙන් ද සළකනු ලැබිය යුතුය. විශේෂයෙන්ම ස්වාධීනත්වය අහිමි කරනු ලැබූ සෑම ළමයකුටම, එම ළමයාගේ වැඩිම යහපත පිණිස එසේ නොකළ යුතු යයි අදහස් කරනු ලබන්නේ නම් මිස, වැඩිහිටියන්ගේ වෙන් කරුනු ලැබිය යුතු අතර, සුවිශේෂ කරුණු පවත්නා අවස්ථාවලදී හැර, ලිපි ගනුදෙනු මගින් ද යෑම් ඊම් මගින් ද ඔහුගේ හෝ ඇයගේ පවුල සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යාමේ අයිතිය ඒ ළමයාට තිබිය යුතුය.

(ඈ) තම ස්වාධීනත්වය අහිමි කරනු ලැබූ සෑම ළමයකුටම නෛතික හෝ වෙනත් සුදුසු ආධාර වහාම ලබා ගැනීම පිණිස ප්‍රවේශය සඳහා අයිතිය මෙන්ම අධිකරණයක හෝ වෙනත් නිසි බලය ඇති, ස්වාධීන සහ අපක්ෂපාත අධිකාරියක් ඉදිරියේ ඔහුගේ හෝ ඇයගේ ස්වාධීනත්වය අහිමි කිරීමේ නෛතික භාවය ගැන ප්‍රශ්න කිරීමේ සහ එවැනි යම් නඩුකරයක දී ඉක්මන් තීරණයක් ලබා ගැනීමේ අයිතියද තිබිය යුතුය.

38 වන ව්‍යවස්ථාව

1. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සන්නද්ධ අරගලවලදී ඒවාට අදාල වන්නාවූ ද ළමයින් සම්බන්ධයෙන් උපයෝගි වන්නා වූ ද ජාත්‍යන්තර මානුෂික නීතියේ රීතිවලට ගරු කිරීමටද ඒවාට ගරු කරන බවට සහතික වීමටද පොරොන්දු වනු ලැබේ.

2. වයස අවුරුදු පහළොවට නොවළඹුනු තැනැතන් මෙම ආරවුල්වලට කෙළින්ම සම්බන්ධ නොවන බවට වගබලා ගැනීම සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය හැකි සියලු පියවරවල් ගනු ලැබිය යුතුය.

3. වයස අවුරුදු පහළොවට එළඹ නොමැති යම් තැනැත්තකු තම සන්නද්ධ හමුදාවලට බඳවා ගැනීමෙන්, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වැළකී සිටිය යුතුය. වයස අවුරුදු පහළොවට එළඹ ඇති නමුත්, වයස අවුරුදු දහඅටට එළඹ නොමැති තැනැත්තන් අතරින් බඳවා ගැනීමේදී, වයසින් වැඩිම තැනැත්තන්ට ප්‍රමුඛත්වය දීමට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් උත්සහ කරනු ලැබිය යුතුය.

4. සන්නද්ධ අරගලවලදී සාමාන්‍ය ජනතාව ආරක්ෂා කිරීමට, ජාත්‍යන්තර මානුෂික නීතිය යටතේ පවත්නා තම වගකීම්වලට අනුකූලව, සන්නද්ධ අරගලයක් මගින් පීඩාවතට පත් ළමයින්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහිතක කිරීම සඳහා ගනු ලැබිය හැකි සියලු පියවරවල්, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය.

39 වන ව්‍යවස්ථාව
කිනම් ආකාරයක වුවද නොසලකා හැරීමකින්, අයුතු ප්‍රයෝජනය පිණිස යොදා ගැනීමකින්, අයුතු ක්‍රියාවකින් හෝ වෙනත් යම් ආකාරයක කෲර, අමානුෂික හෝ නොහොබිනා සැලකීමකින් හෝ දඬුවමකින් හෝ සන්නද්ධ අරගලයකින් පීඩාවට පත් ළමයකු ශාරීරිකව සහ මානසිකව ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සහ ඔහු සම්බන්ධයෙන් යළිත් සමාජ ඒකග්‍රතාවය ඇති කිරීම සඳහා සියලු සුදුසු පියවරවල් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගනු ලැබිය යුතුය. එම සුවපත් කිරීම සහ සමාජ ඒකාග්‍රතාව යලි ඇති කිරීම, ළමයාගේ සෞඛ්‍යය, ආත්ම ගරුත්වය, සහ උදාරත්වය පෝෂණය කරන්නාවූ පරිසරයක සිදුවිය යුතුය.

40 වන වගන්තිය
1. දණ්ඩ නීතිය උල්ලංඝනය කර ඇති බවට චෝදනා කරනු ලැබ, චූදිතයා කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇති සෑම ළමයකුටම, ඔහුගේ ගරුත්වය සහ වටිනාකම පිළිබඳ හැඟීම නංවාලීමට අනුරූප වන ආකාරයට සලසනු ලැබිය යුතු බවට ඇති අයිතිය, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ. මෙය මානුෂික අයිතිවාසිකම් සහ වෙනත් තැනැත්තන්ගේ මූලික නිදහස සඳහා ළමයාගේ ගෞරවය ශක්තිමත් කරන අතර ම ඒ මගින් ළමයාගේ වයස ද ළමයා නැවත පරිපූර්ණ කිරීමේ සහ ළමයා විසින් සමාජයෙහි ප්‍රයෝජනවත් කාර්ය භාරයන් ඉටු කිරීමේ අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනු ලැබේ.

2. මේ අරමුණු උදෙසා, ජාත්‍යන්තර සාධක පත්‍රවල අදාළ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් විශේෂයෙන්ම;

(අ) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, එය සිදු කරන ලද අවස්ථාවේ දී ජාතික හෝ ජාත්‍යන්තර හෝ නීතිය මගින් තහනම් කර නොතිබුනේ නම්, එම ක්‍රියාව හෝ නොකර හැරීම දණ්ඩ නීතියක් උල්ලංඝනය කිරීමක් ලෙස, කිසිදු ළමයකුට චෝදනා කිරීම, කිසිදු ළමයකු චූදිතයෙකු කිරීම හෝ ඒ ළමයා එසේ උල්ලංඝනය කර ඇති බවට පිළිගැනීම හෝ නොකළ යුතු බවටත්;

(ආ) දණ්ඩන නීතිය ඔස්සේ උල්ලංඝනය කර ඇති බවට චෝදනා කරනු ලැබ හෝ චූදිතයා කරනු ලැබ හෝ සිටින සෑම ළමයකුට, යටත් පිරිසෙයින්, පහත සඳහන් ආරක්ෂාවන් තිබෙන බවටත් වගබලා ගනු ලැබිය යුතුය. ඒ ආරක්ෂාව නම් :-

(i) නීතියට අනුව වරදකරු බව ඔප්පු වනතුරු නිර්දෝෂී බවට පූර්වානුමානය කිරීම;

(ii) ඔහුට හෝ ඇයට විරුද්ධව ඇති චෝදනා නොපමාව සහ කෙළින්ම දන්වා සිටීම සහ සුදුසුකම් , ඔහුගේ හෝ ඇයගේ දෙමව්පියන් මගින් හෝ නිත්‍යානුකූල භාරකරු මගින් හෝ දන්වා සිටීම සහ ඔහුගේ හේ ඇයගේ විත්ති වාචකය සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී නීතිමය සහ වෙනත් සුදුසු ආධාර සැලසීම;

(iii) එම කරුණ, ප්‍රමාදයකින් තොරව, නිසි බලය ඇති, ස්වාධීන සහ අපක්ෂපාත අධිකාරියක් විසින් හෝ අධිකරණ මණ්ඩලයක් විසින් හෝ නීතියට අනුකූලව වූ සාධාරණ නඩු විභාගයක දී තීරණය කරනු ලැබීමට විශේෂයෙන්ම ඔහුගේ හෝ ඇයගේ වයස, පිහිටි පරිසරය, ඔහුගේ හෝ ඇයගේ දෙමව්පියන් හෝ නිත්‍යානුකූල භාරකරුවන් ගැන සැලකීමේදී

ළමයාගේ යහපත සඳහා නොවේ යයි සලකනු ලබන්නේ නම් මිස, එය නීති හෝ වෙනත් සහාටකයන් ඉදිරිපිට දී පවත්වනු ලැබීමට ද;

(IV) සාක්ෂි දෙන ලෙස හෝ වරද සම්බන්ධයෙන් අපරාධොච්චාරණය කරන ලෙස හෝ බල නොකිරීමට ප්‍රතිවිරුද්ධ සාක්ෂිකරුවන් විභාග කිරීම හෝ විභාග කරවීම සහ සමාන කොන්දේසි යටතේ ඔහු හෝ ඇය වෙනුවෙන් සාක්ෂිකරුවන්ගේ සහභාගිත්වය ලබා ගැනීමට සහ ඔවුන් පරීක්ෂා කිරීමට;

(V) දණ්ඩන නීතිය උල්ලංඝනය කර ඇති බවට සලකනු ලබන්නේ නම් එම තීරණය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් පනවනු ලැබ ඇති කිසියම් පියවරක් නිසි බලය ඇත්තා වූ ද ස්වාධීන වූ ද අපක්ෂපාත වූ ද ඉහල අධිකාරියක් හෝ අධිකරණ මණ්ඩලයක් විසින් හෝ නීතියට අනුකූලව සමාලෝචනය කරවනු ලැබිය හැකි වීමට;

(VI) භාවිතා කරනු ලබන භාෂාව තේරුම් ගැනීමට හෝ කථා කිරීමට හෝ ළමයාට නොහැකි නම්, භාෂණ පරිවර්තකයකුගේ සහාය නොමිළයේ ලබා ගැනීමට;

(VII) නඩු කටයුත්තේ සියලු අවස්ථාවලදී ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලිකත්වයට සම්පූර්ණ ගරුවත්ව ලැබීමට.

3. දණ්ඩන නීතිය උල්ලංඝනය කර ඇති ලෙසට චෝදනා ලැබ, චූදිතයා කරනු ලැබ නැතහොත් පිළිගනු ලැබ සිටින ළමයින්ට විශේෂයෙන්ම අදාළ වන්නාවූ නීති, කාර්ය පටිපාටි, අධිකාරී සහ ආයතන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීමට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර , විශේෂයෙන්ම -

(අ) දණ්ඩන නීතියක් උල්ලංඝනය කිරීමට ළමයකුට ශන්නුතාවන් නොමැති බවට පූර්වානුමානය කළ යුතු වන්නේ ඔහු යම් වයසකට අඩු වූ විට ද, ඒ අවම වයස නිශ්චය කොට දැක්වීමද ;

(ආ) මානව හිමිකම්වලට සහ නෛතික ආරක්ෂාවට පූර්ණ ගරුත්වය සලසමින්, සුදුසු හා අවශ්‍ය, කිනම් අවස්ථාවලදි වුව ද, එවැනි ළමයින් සම්බන්ධයෙන් අධිකරණ නඩු කටයුතුවල පිළිසරණ නොලබා ගත හැකි පියවර උපයෝගි කර ගැනීම ද කරනු ලැබිය යුතුය.

4. ළමයින් සම්බන්ධයෙන් ඔවුන්ගේ යහපත පිණිස යෝග්‍ය වන්නාවූ ආකාරයටත්, ඔවුනට අදාළ අවස්ථානුගත කරුණුවලට සහ වරදට සමානුපාතික වන ආකාරයටත් කටයුතු කෙරෙන බවට සහතික වීම පිණිස අයතනික රැකවරණය වෙනුවට, රැකවරණය, මාර්ගොපදේශ සහ අධීක්ෂණ නියමයන් උපදේශක සේවා, පරිවාස , පිළිදැගුම් රැකවරණය, අධ්‍යාපන සහ වෘත්තිය අභ්‍යාස වැඩපිළිවෙළවල් වැනි වෙනත් විවිධ වූ විකල්ප තිබිය යුතුය.

41 වන ව්‍යවස්ථාව

ළමයාගේ අයිතවාසිකම් සාක්ෂාත් කිරීමෙහි ලා වඩාත් හිතකර වන්නා වූ ද

(අ) පාර්ශ්වකරුවන රාජ්‍යයේ නීතියෙහි හෝ

(ආ) ඒ රාජ්‍යයෙහි බල පවත්නා ජාත්‍යන්තර නීතියෙහි;
හෝ

අත්අඩංගු විධිවිධාන කිසිවක කෙරෙහි මෙම සම්මුතියෙහි සඳහන් කිසවකින් බලපෑමක් සිදු නොවිය යුතුය.

11 වන කොටස

42 වන ව්‍යවස්ථාව

පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, යෝග්‍ය වන්නා වූ ද ක්‍රියාකාරී වන්නා වූ ද ක්‍රම මගින්, මෙම සම්මුතියේ මූලධර්ම සහ විධිවිධාන වැඩිහිටියන්ට සහ ළමයින්ට එක සමානව පුළුල් ලෙස දැන ගන්නට සැලැස් වීමට භාරගනු ලැබේ.

43 වන ව්‍යවස්ථාව

1. වර්ථමාන ප්‍රඥප්ති මගින් බාර ගන්නා ලද වගකීම් ඉටු කිරීමෙහිලා; පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් අත් කර ගන්නා ලද ප්‍රගතිය පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ පිහිටුවන ලැබිය යුතු අතර, ඒ කමිටුව විසින් මෙහි මතු විධිවිධාන සලසා ඇති කර්තව්‍යයන් ඉටු කරනු ලැබිය යුතුය.

2. උසස් චරිතයකින් යුක්ත වූ ද මෙම සම්මුතියේ ආවරණක ක්ෂේත්‍රයෙහි පිළිගත් දක්ෂතාවයක් ඇත්තාවූ ද විශේෂඥයන් දස දෙනෙකුගෙන් කමිටුව සමන්විත විය යුතුය. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් තම තමන්ගේ ජාතිකයන් අතුරින්, කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගනු ලැබිය යුතුය. සාධාරණ භූගෝලීය බෙදීම කෙරෙහි මෙන්ම ප්‍රධාන නීති ක්‍රම කෙරෙහි සැලකිලිමත් වෙමින් ඔවුන් විසින් තම පුද්ගලික තත්ත්වයෙන් සේවය සලසනු ලැබිය යුතුය.

3. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින්, නම් කරන ලද තැනැත්තන්ගේ ලැයිස්තුවෙන් රහස් ඡන්දය මගින් කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කරන ගනු ලැබිය යුතුය. එක් එක් රාජ්‍ය පාර්ශ්වකරු විසින්, තමන්ගේ ම ජාතිකයන් අතුරින් එක් තැනැත්තකු නම් කරනු ලැබිය හැකිය.

4. වර්තමාන සම්මුතිය බලාන්විත වීම ආරම්භ වූ දිනයට පසු මාස හයක් ගතවීමට පෙර කමිටුව සඳහා ආරම්භක ඡන්ද විමසීම පවත්වනු ලැබිය යුතු අතර, ඉන් ඉක්බිතිව, සෑම දෙවන වර්ෂයේදීම ඡන්ද විමසීම පවත්වනු ලැබිය යුතුය. එක් එක් ඡන්ද විමසීමේ දිනයට යටත් පිරිසෙයන් මාස හතරකට පෙර, එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින්, මාස දෙකක් ඇතුලත දී තම නාම යෝජනා ඉදිරිපත් කරන ලෙසට ආරාධනා කරමින්, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වෙත ලිපියක් යවනු ලැබිය යුතුය. ඉක්බිතිව, එසේ නම් කරනු ලැබ ඇති සියලු තැනැත්තන්, ඔවුන්ගේ නම් යෝජනා කරනු ලැබූ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් සඳහන් කරමින්, ආකාරදියේ පිළිවෙළට වූ ලැයිස්තුවක්, මහ ලේකම්වරයා විසින් සකස් කරනු ලැබිය.

5. මහ ලේකම්වරයා විසින් කැඳවනු ලැබ, එක්සත් ජාතීන්ගේ මුලස්ථානයෙහි පවත්වනු ලබන පාර්ශ්වකරුවන් වන රාජ්‍යවල රැස්වීම්වල දී මෙම ඡන්ද විමසීම් පවත්වනු ලැබිය යුතුය. එම රැස්වීම්වල දී ගණ පූර්ණය සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් තුනෙන් දෙකක් සහභාගි විය යුතුය. පැමිණ සිට ඡන්දය දෙන්නාවූ පාර්ශ්වකරුවන් වන රාජ්‍යවල නියෝජිතයන්ගේ වැඩිම ඡන්ද

සංඛ්‍යාව සහ පරම බහුතර ඡන්ද සංඛ්‍යාව ලබන තැනැත්තන් කමිටුවේ සාමාජිකයන් ලෙස තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තන් විය යුතුය.

6. කමිටුවේ සාමාජිකයන් අවුරුදු හතරක කාලසීමාවක් සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතුය. නැවත නාම යෝජනා කරනු ලැබුවහොත් නැවත තෝරා පත්කර ගැනීම සඳහා ඔවුන් සුදුස්සන් විය යුතුය. පළමුවන ඡන්ද විමසීමේදී තේරී පත් වූ සාමාජිකයන් පස් විමසීම නිම වූ වහාම, එම රැස්වීමේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් මෙම සාමාජිකයන් පස් දෙනාගේ නම් තෝරා ගනු ලැබිය යුතුය.

7. කමිටුවේ සාමාජිකයකු මිය යයි නම් හෝ ඉල්ලා අස්වෙයි නම් හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට හෝ ඇයට කමිටුවේ කාර්යයන් තවදුරටත් ඉටු කළ නොහැකි බව ප්‍රකාශ කරයි නම් හෝ, එම සාමාජිකයා නම් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකු වන රාජ්‍යයන් විසින් ද ඒ රාජ්‍යයන් විසින් ද කමිටුවේ අනුමැතියට යටත්ව ඒ ධූර කාල සීමාවෙන් ඉතිරිව ඇති කාල සීමාව සඳහා සේවය කිරීම පිණිස ස්වකීය ජාතිකයන් අතරින් වෙනත් විශේෂඥයකු පත් කරනු ලැබිය යුතුය.

8. කමිටුව විසින් එහි කාර්ය පටිපාටිය පිළිබඳව කමිටුවෙහි ම රීති පිහිටුවා ගනු ලැබිය යුතුය.

9. කමිටුව විසින් අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා එහි නිලධරයන් තෝරා පත් කර ගනු ලැබිය යුතුය.

10. කමිටුවෙහි රැස්වීම් සාමාන්‍යයෙන් එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි දී කමිටුව විසින් තීරණය කරන ලද වෙනත් කිසියම් පහසු ස්ථානයකදී හෝ පවත්වනු ලැබිය යුතුය. සාමාන්‍යයෙන් වර්ෂයක් පාසා කමිටුව රැස්විය යුතුය. අවශ්‍ය වුවහොත් කමිටුවෙහි රැස්වීම්වල කාලසීමාව වර්තමාන සම්මුතියට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්ගේ රැස්වීමක් මගින් මහා මණ්ඩලයේ අනුමැතියට යටත්ව තීරණය කිරීම සහ සමාලෝචනය කිරීම කරනු ලැබිය යුතුය.

11. වර්තමාන සම්මුතිය යටතේ කමිටුවෙහි කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ පහසුකම් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් සලසනු ලැබිය යුතුය.

12. වර්තමාන සම්මුතිය යටතේ පිහිටුවන ලද කමිටුවේ සාමාජිකයන්ට මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව, එම මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියම සහ කොන්දේසි මත එක්සත් ජාතීන්ගේ සම්පත්වලින් පඩිනඩි ලැබිය යුතුය.

44 වන ව්‍යවස්ථාව

1. මෙහි පිළිගෙන් ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් ගන්නා ලද පියවරවල් සහ එම අයිතිවාසිකම් භුක්ති විඳීමෙහි ලා ලබා ඇති ප්‍රගතියපිළිබඳ වාර්තා -

(අ) අදාළ පාර්ශ්වකරුවන් වන රාජ්‍ය සම්මුතියෙහි බලට යටතට පත්වී අවුරුදු දෙකක් ඇතුළත් දී;

(ආ) ඉන් ඉක්බිතිව සෑම අවුරුදු පහකදී එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා මගින් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට එම රාජ්‍යයේ එකඟ වී බැඳී සිටින්නාහ.

2. වර්තමාන සම්මුතිය යටතේ වගකීම් ඉෂ්ඨ කර ගැනීමේ ප්‍රමාණයට බලපාන සාධක හෝ දුෂ්කරතා කිසිවක් වේ නම් ඒවා මෙම ව්‍යවස්ථාව යටතේ කරනු ලබන වාර්තාවෙහි සඳහන් විය යුතුය. අදාළ රටෙහි මෙම සම්මුතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ පූර්ණ අවබෝධයක් කමිටුව වෙත සැපයීමට ප්‍රමාණවත් වන්නා වූ තොරතුරු ද එම වාර්තාවේ අඩංගු විය යුතුය.

3. කමිටුව වෙත සම්පූර්ණ ආරම්භක වාර්තාවක් සපයනු ලැබූ පාර්ශ්වකරුවකු වන රාජ්‍යයන් විසින් 1 (ආ) ඡේදයට අනුකූලව සපයනු ලබන එහි තදන්තර වාර්තාවල, කලින් සපයන ලද මූලික තොරතුරු නැවත සැපයීම අවශ්‍ය නොවන්නේය.

4. සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩිදුර තොරතුරු, කමිටුව විසින් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

5. කමිටුව විසින්, එහි කටයුතු පිළිබඳ වාර්තා සෑම වසර දෙකකදීම ආර්ථික සහ සමාජ මණ්ඩල මගින් එක්සත් ජාතීන්ගේ මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් තම වාර්තා තම තමන්ගේ රටවල මහජනතාව වෙත පුළුල් ලෙස ලැබෙන්නට සලස්වනු ලැබිය යුතුය.

45 වන ව්‍යවස්ථාව

සම්මුතිය ඵලාදායී ලෙස ක්‍රියාතමක කරවීම හා පෝෂණය කිරීම සඳහාත් ප්‍රඥප්තියෙන් ආවරණ ක්‍රෂේත්‍රයෙහි ජාත්‍යන්තර සහයෝගිතා ව උනන්දු කරලීම සඳහාත්

(අ) විශේෂිත නියෝජ්‍යායතානවලට යුනිසෙෆ්ප් සංවිධානයට සහ එක්සත් ජාතීන්ගේ වෙනත් අංශවලට, ඔවුන්ගේ විධාන භාරයේ ක්ෂේත්‍රය තුළට වැටෙන්නා වූ වර්තමාන සම්මුතියේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම ගැන සළකා බැලීමේ දී නියෝජනය කිරීමේ අයිතිය තිබිය යුතුය. තම තමන්ගේ විධාන භාරයේ ක්ෂේත්‍රය තුළට වැටෙන අංශවල සම්මුතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳව, විශේෂඥ උපදෙස් සපයන ලෙස විශේෂිත නියෝජ්‍යායතනවලට, යුනිසෙෆ්ප් සංවිධානයට සහ කමිටුව සුදුසුයයි සලකන වෙනත් නිසි බල ඇති මණ්ඩලවලට කමිටුව විසින් ආරාධනා කරනු ලැබිය හැකිය.

(අ) ස්වකීය කාර්යයන්ගේ විෂය ක්ෂේත්‍රය තුළට වැටෙන අංශවල සම්මුතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳව වාර්තා සපයන ලෙෂ කමිටුව විසින් විශේෂිත නියෝජ්‍යායතනවලින්, යුනිසෙෆ්ප් සංවිධානයෙන් සහ වෙනත් එක්සත් ජාතීන්ගේ අංශවලින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

(ආ) කිසියම් ඉල්ලීමක් අඩංගු වන්නා වූ නැතහොත් කාර්මික උපදෙස් හෝ ආධාරයක් හෝ පිළිබඳ අවශ්‍යතාවයක් සඳහන් වන්නාවූ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වෙතින් ලැබුණු වාර්තා කිසිවක් එම ඉල්ලීම් හෝ සඳහන් කිරීම් හෝ පිළිබඳව කමිටුවේ නිරීක්ෂණ හෝ යෝජනා කිසිවක් වේ නම් ඒ නිරීක්ෂණ හෝ යෝජනා සමඟ කමිටුව සුදුසුයයි සලකන පරිදි විශේෂිත නියෝජ්‍යායතනවලට, යුනිසෙෆ්ප් සංවිධානයට හෝ වෙනත් නිසි බලය ඇති මණ්ඩලවලට කමිටුව විසින් යවනු ලැබිය යුතුය.

(ඇ) ළමයාගේ අයිතිවාකම්වලට අදාළ නිශ්චිත ප්‍රශ්න පිළිබඳව කමිටුව වෙනුවෙන් අධ්‍යයනයක් කිරීම භාර ගන්නා මෙන් මහ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින ලෙස කමිටුව විසින් මණ්ඩලය වෙත නිර්දේශ කරනු ලැබිය හැකිය.

(ඈ) සම්මුතියේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා ප්‍රකාර ලැබුණු තොරතුරු පදනම් කරගෙන කමිටුව විසින් යෝජනා සහ පොදු නිර්දේශ කරනු ලැබිය හැකිය. එවැනි යෝජනා සහ පොදු නිර්දේශ අදාළ පාර්ශ්වකරුවන් වන යම් රාජ්‍යයකට යැවිය යුතු අතර පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්ගේ අදහස් දැක්වීම් කිසිවක් වේ නම්, ඒවාත් සමඟ ඒ යෝජනා සහ නිර්දේශ මහා මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

111 වන කොටස

46 වන ව්‍යවස්ථාව
සියලු රාජ්‍යයන් විසින් අත්සන් තබනු ලැබිමට මෙම සම්මුතිය විවෘතව තැබිය යුතුය.

47 වන ව්‍යවස්ථාව
මෙම වර්තමාන සම්මුතිය අනුමත කිරීමට යටත් වේ. අනුමත කිරීමේ සාධන පත්‍ර එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතුය.

48 වන ව්‍යවස්ථාව
ඕනෑම රාජ්‍යයකට ආබද්ධ වීම පිණිස, මෙම වාර්තමාන සම්මුතිය විවෘතව තැබිය යුතුය. ආබද්ධ වීමේ සාධන පත්‍ර, එක්සත්ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතුය.

49 වන ව්‍යවස්ථාව

1. අනුමත කිරීමේ හෝ ආබද්ධ වීමේ හෝ විසි වන සාධන පත්‍රය, එක්සත්ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැන්පත් කළ දිනයට පසු තිස් වන දිනයෙහි මෙම වාර්තමාන සම්මුතිය බලාත්මක තත්ත්වය ලැබිය යුතුය.

2. අනුමත කිරීමේ හෝ ආබද්ධ වීමේ හෝ විසි වන සාධන පත්‍රය තැන්පත් කරනු ලැබීමෙන් පසුව අනුමත කරන හෝ ආබද්ධ වන එක් එක් රාජ්‍යය සඳහා ඒ රාජ්‍යය විසින් තම අනුමත කිරීමේ නැතහොත් ආබද්ධ වීමේ සාධන පත්‍රය තැන්පත් කරන ලද දිනයට පසු තිස් වන දිනයෙහි, මෙම සම්මුතිය බලාත්මක තත්ත්වය ලැබිය යුතුය.

50 වන ව්‍යවස්ථාව

1. පාර්ශ්වකරුවකු වන යම් රාජ්‍යයක් විසින් සංශෝධනයක් යෝජනා කර, එය එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එවිට, එම යෝජනා සළකා බලා ඡන්දය දීමේ කාර්ය සඳහා පාර්ශ්වකරුවන් වන රාජ්‍යවල සම්මේලනයට රාජ්‍යයන් එකඟ වන්නේ ද යන්න සඳහන් කරන ලෙසට කරනු ලබන ඉල්ලීමක් ද සමඟ, මහ ලේකම්වරයා විසින් , එම යෝජිත සංශෝධන පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වෙත දන්වා සිටිනු ලැබිය යුතුය. එම දැනුම් දීමේ දිනයෙහි සිට මාස හතරක් ඇතුළත දී, යටත් පිරිසෙයින් පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් තුනෙන් එකක් එවැනි සම්මේම්මලනයකට එකඟක්වය ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, මහ ලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ සම්මේලනයක් කැඳවනු ලැබිය යුතුය. සම්මේලනයට සහභාගි වී ඡන්දය දෙන පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් බහුතරයක් විසින් සම්මත

කර ගනු ලබන සංශෝධනයක්, අනුමැතිය සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2. මෙම ව්‍යවස්ථාවේ (i) වන ඡේදයට අනුකූලව සම්මත කර ගන්නා ලද සංශෝධනයක්, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්ගෙන් තුනෙන් දෙකක බහුතරයක් විසින් පිළිගන්නා ලද විට, බලාන්විත විය යුතුය.

3. සංශෝධනයක් බලාන්විත වූ විට, එය පිළිගෙන ඇති පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් එයින් බැඳී සිටිය යුතු අතර, සෙසු පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් මේ සම්මුතියේ විධිවිධානවලට සහ ඒ රාජ්‍යයන් විසින් පිළිගන්නා ලද පූර්ව සංශෝධනවලට බැඳී සිටිය යුතුය.

51 වන ව්‍යවස්ථාව

1. අනුමත කරන හෝ ආබද්ධ වන හෝ අවස්ථාවේ දී, රාජ්‍යයන් විසින් ඒවාට වෙන් කොට තබා ගන්නා ලද කරුණු පිළිබඳ විස්තර එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා විසින් ලබා ගෙන සියලුම රාජ්‍යයන් වෙත බෙදා හරිනු ලැබිය යුතුය.

2. මෙම වර්තමාන සම්මුතියේ අරමුණුවලට සහ කාර්යයට නොගැලපෙන්නා වූ කරුණු වෙන් කර තබා ගැනීමට ඉඩ දෙනු නොලැබිය යුතුය.

3. එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා අමතා, වෙන්කර තබා ගත් කරුණු ඉවත් කර ගන්නා බවට කරනු ලබන නිවේදනයක් මගින්, ඕනෑම අවස්ථාවකදී, වෙන් කර තබාගත් කරුණු ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි අතර එවිට මහා ලේකම්වරයා විසින් ඒ බව සියලුම රාජ්‍යයන් වෙත දැනුම් දෙනු ලැබිය යුතුය. එවැනි නිවේදනයක් මහා ලේකම්වරයා වෙත ලැබුණු දිනයෙහි, එය ක්‍රියාත්මක විය යුතුය.

52 වන ව්‍යවස්ථාව

එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා වෙත කරනු ලබන ලියවිල්ලකින් වූ නිවේදනයක් මගින්, පාර්ශ්වකරුවකු වන රාජ්‍යයන් විසින් මෙම සම්මුතිය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. මහා ලේකම්වරයා වෙත නිවේදනය ලැබුණු දිනයෙන් එක් අවුරුද්දකට පසුව, එම ප්‍රතික්ෂේප කිරීම ක්‍රියාත්මක වන්නේය.

53 වන ව්‍යවස්ථාව

මෙම සම්මුතියේ තැන්පතුධාරී වන්නේ එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා වේ.

54 වන ව්‍යවස්ථාව

මෙම සම්මුතියේ අරාබි චීන ඉංග්‍රීසි ප්‍රංශ රුසියන් හා ස්පාඤ්ඤ පෙළ සත්‍යවත් පෙළ වන අතර එය එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වෙත තැන්පත්කළ යුතුය. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වරයා මෙම සම්මුතියේ සහතික කළ පිටපත් සියලු රාජ්‍ය වෙත යැවිය යුතුය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධකර ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

2173 වෙළුම, A 27531
(ඉංග්‍රීසි බසින් වන ලියවිල්ලකි)

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය

මෙම ප්‍රකාශනය හා සම්බන්ධ රාජ්‍ය පාර්ශවයන් විසින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට ලැබෙන්නාවූ අතිමහත් සහයෝගයෙන් දිරිමත් වෙමින්, සහ ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට සිය කැපවීම පුළුල් වශයෙන් පෙන්නුම් කරමින්.

ළමුන්ගේ අයිතිවාසිකම් විශේෂ වශයෙන් ආරක්ෂා කල යුතු බව යළි යළිත් තහවුරු කරමින්, සහ කිසිදු භේදයකින් තොරව දරුවන්ගේ තත්ත්වය අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ මෙන්ම සාමය සහ ආරක්ෂාව සහිත තත්ත්වයන් තුළ ඔවුන්ගේ සංවර්ධනය සහ අධ්‍යාපනය තහවුරු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්,

සන්නද්ධ ගැටුම් නිසා ළමුන් හට සිදුව ඇති වඩාත් පුළුල් සහ හානිකර බලපෑම් මෙන්ම ඒ හරහා කල්පවත්නා සාමය, ආරක්ෂාව සහ සංවර්ධනය වෙත බලපා අති දිගුකාලීන ප්‍රතිවිපාක හේතුවෙන් කැළඹීමට පත් වෙමින්,

සන්නද්ධ ගැටුම් පවතින අවස්ථාවන්හිදී, ළමුන්ව ඉලක්ක කර ගැනීම මෙන්ම පාසල් සහ රෝහල් වැනි ස්ථානද ඇතුළුව ජාත්‍යන්තර නීතිය යටතේ ආරක්ෂිත ස්ථාන ලෙස නම්කර ඇති සහ සාමාන්‍යයෙන් ළමුන් වැඩිපුර රැඳීසිටින ස්ථාන වෙත සෘජු ප්‍රහාරයන් එල්ල වීම හෙළා දකිමින්.

ජාත්‍යන්තර අපරාධ අධිකරණ ප්‍රඥප්තිය සම්මත කර ගැනීම මෙන්ම විශේෂයෙන්ම එහිදී, ජාත්‍යන්තර මෙන්ම ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලදී වයස අවුරුදු 15 ට අඩු ළමයින් බඳවා ගැනීම හෝ බලහත්කාරයෙන් බඳවා ගැනීම හෝ ඔවුන්ව යුධ කටයුතු වලදී ක්‍රියාකාරීව සහභාගී කරවා ගැනීම යුද අපරාධයක් ලෙස එය නම්කර එය ප්‍රඥප්තියට ඇතුළත් කිරීම අවධානයට ලක් කරමින්.

එබැවින්, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් පිළිගත් අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ වීමෙන් ළමුන්ව ආරක්ෂා කිරීමේ වැඩි අවශ්‍යතාවයක් පවතින බව සැලකිල්ලට ගනිමින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 1 වන වගන්තියේ සඳහන් වන පරිදි, බහුතර කැමැත්තෙන් සම්මත කරගත් ළමුන්ට අදාළ නීතියෙහි සඳහන් වන්නේ නම් හැර, එම සම්මුතියෙන් අරමුණු කරන කරුණු වලදී, වයස අවුරුදු 18 ට අඩු ඕනෑම මනුෂ්‍යයකු ළමයකු ලෙස සළකන බව අවධාරනය කරමින්,

සම්මුතියට අදාල වෛකල්පික ප්‍රකාශනයක් හරහා සන්නදධ හමුදාවන්ට පුද්ගලයින් බඳවා ගැනීමේ සහ යුධ කටයුතු සඳහා ඔවුන් සහභාගී කරවා ගැනීමේ වයස් සීමාව ඉහළ නැංවීම, ළමුන් වෙනුවෙන් සිදුකරන සියළු කටයුතු වලදී ළමුන්ගේ යහපත මූලික වශයෙන් සලකා බැලිය යුතුය යන මූලධර්මය ක්‍රියාවට නැංවීම සඳහා ඵලදායී ලෙස දායක වන බව වටහා ගනිමින්,

1995 දෙසැම්බරයේ පැවති විසිහයවන රතු කුරුස සහ රතු අඩසඳ ජාත්‍යන්තර සමුළුවේදී, අන්‍යෝන්‍ය වශයෙන්, ගැටුමකට සම්බන්ධ වන පාර්ශ්වයන් විසින් වයස අවුරුදු 18 ට අඩු ළමුන් යුධ කටයුතු සඳහා සහභාගී නොවන බව සහතික වීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගත යුතු බව නිර්දේශ කළ බව අවධානයට ලක් කරමින්,

1999 ජූනි මසදී ඒකමතිකව සම්මත කරගන්නා ලද, නරකම ආකාරයේ ළමා ශ්‍රමිකත්වය තුරන් කිරීම උදෙසා වන තහනම් කිරීම් සහ කඩිනම් ක්‍රියාමාර්ග යටතේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 182 දරන සම්මුතිය මගින්, අදාල කිසිදු පාර්ශවයකට, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ළමුන් සන්නද්ධ සේවය සඳහා බඳවා ගැනීම තහනම් කිරීම පැසසුමින් යුතුව පිළිගනිමින්,

රාජ්‍යයක සන්නද්ධ හමුදාවන් නොවන වෙනත් සන්නද්ධ කණ්ඩායම් විසින් සිය දේශසීමාවන් තුළ සහ ඉන් පිටතදී යුධ කටයුතු සඳහා ළමුන් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ යොදවා ගැනීම බරපතල ලෙස හෙළා දකිමින්, සහ එසේ ළමුන් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ යොදවා ගැනීම සිදු කරන අය ඒ පිළිබඳ පූර්ණ වගකීම භාරගත යුතු බව පිළිගනිමින්,

ජාත්‍යන්තර මානුෂීය නීතියේ විධිවිධානවලට අනුකූලව සන්නද්ධ ගැටුමකට සම්බන්ධ වන එක් එක් පාර්ශ්වයේ වගකීම යළි සිහිපත් කරමින්,

මෙම ප්‍රකාශනය මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය ද ඇතුලත්ව එහි අඩංගු අරමුණු සහ මූලධර්මවලට මෙන්ම මානුෂීය නීතියේ අදාළ ප්‍රතිපාදනයන්ට කිසිදු අගතියක් සිදු නොවන බව අවධාරණය කරමින්,

ප්‍රඥප්තියේ අඩංගු අරමුණු සහ ප්‍රතිපත්ති මත පදනම් වන සාමය සහ ආරක්‍ෂාව සම්බන්ධ කොන්දේසි මෙන්ම අදාළ මානව හිමිකම් කොන්දේසි නිසි පරිදි පිළිපැදීම, විශේෂයෙන්ම සන්නද්ධ ගැටුම් වලදී සහ විදේශ ආක්‍රමණවලදී ළමුන්ගේ පූර්ණ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය බව සිහි තබා ගනිමින්,
තම ආර්ථික හෝ සමාජ තත්ත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හේතුවෙන් මෙම කෙටුම්පතට පටහැනිව, යුධ කටයුතු සඳහා බඳවා ගැනීමේ හෝ යොදවා ගැනීමේ අවදානමකට ලක්විය හැකි ළමුන්ගේ විශේෂ අවශ්‍යතාවන් හඳුනා ගනිමින්,

සන්නද්ධ ගැටුම්වලට ළමුන් සම්බන්ධ වීම සඳහා බලපාන ආර්ථික, සමාජීය සහ දේශපාලනික මූල හේතුන් සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්,

මෙම ප්‍රකාශනය ක්‍රියාවට නැංවීමේදී ජාත්‍යන්තර සහයෝගීතාව වඩාත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මෙන්ම සන්නද්ධ ගැටුම්වල වින්දිතයන් බවට පත් වූ ළමුන්ට අවශ්‍ය ශාරීරික හා මනෝ සමාජීය පුනරුත්ථාපනය ලබාදීමේ සහ ඔවුන් නිසිපරිදි නැවත සමාජගත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවබෝධ කර ගන්මින්,

මෙම ප්‍රකාශනය ක්‍රියාවට නැංවීමට අදාළව තොරතුරු සහ අධ්‍යාපනික වැඩසටහන් ව්‍යාප්ත කිරීමේදී විශේෂයෙන්, ළමුන් සහ ළමා වින්දිතයින් ද ඇතුළුව සමස්ථ ප්‍රජාවගේ සහභාගීත්වය දිරිමත් කරමින්,
පහත එකගතාවන්ට එළඹෙන ලදී:

1 වන වගන්තිය

රාජ්‍ය පාර්ශවයන් විසින් සිය සන්නද්ධ හමුදාවන්හි සේවයේ නියුතු වයස අවුරුදු 18 ට නොඉක්මවූ සාමාජිකයින් කිසිවකු යුධ කටයුතු වලට සෘජුව සම්බන්ධ නොවන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සියළු පියවරයන් ගත යුතුය.

2 වන වගන්තිය

රාජ්‍ය පාර්ශවයන් විසින් වයස අවුරුදු 18 නොඉක්මවන පුද්ගලයින් කිසිවකු සිය සන්නද්ධ හමුදාවන්ට අනිවාර්ය වශයෙන් බඳවා ගැනීම සිදු නොකරන බවට සහතික විය යුතුය.

3 වන වගන්තිය

1. රාජ්‍ය පාර්ශවයන් විසින් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 38 වන වගන්තියේ 3 වන ඡේදයේ දක්වා ඇති පරිදි, එම වගන්තියේ අඩංගු මූලධර්ම සැලකිල්ලට ගනිමින් සහ සම්මුතියට අනුව වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් හට විශේෂ ආරක්ෂාවක් හිමි විය යුතු බව පිළිගනිමින්,තම ජාතික සන්නද්ධ හමුදාවන් වෙත ස්වේච්ඡාවෙන් පුද්ගලයින් බඳවා ගැනීමේ අවම වයස ඉහළ දැමීම සිදුකළ යුතුය.

2. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම මෙම ප්‍රකාශනය අපරානුමත කිරීමෙන් හෝ ප්‍රකාශනය වෙත ප්‍රවේශ වීමෙන් පසුව සිය ජාතික සන්නද්ධ හමුදාවන්ට ස්වේච්ඡාවෙන් බඳවා ගැනීමට අවසර දෙනු ලබන අවම වයස් සීමාව සඳහන් කරමින් සහ එවැනි බඳවා ගැනීම් සිදු වන්නේ කිසිදු ආකාරයක බලහත්කාරයෙන් නොවන බවට සහතික කිරීම සඳහා අනුගමනය කරන ආරක්ෂණ ක්‍රම පිළිබඳ විස්තරයක් ද සහිතව බැඳීම් ප්‍රකාශයක් බලාත්මක කළ යුතුය.

3. වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ව ස්වේච්ඡාවෙන් ජාතික සන්නද්ධ හමුදාවන්ට බඳවා ගැනීමට අවසර ලබා දී ඇති රාජ්‍යයන් එහිදී අවම වශයෙන් පහත සඳහන් ආරක්ෂාවන් සහතික කල යුතුයඃ

(අ) එවන් බඳවා ගැනීම් සැබෑ වශයෙන්ම ස්වේච්ඡාවෙන් සිදු වන බවට;

(ආ) එවන් බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ අදාළ පුද්ගලයාගේ / පුද්ගලයන්ගේ දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන්ව දැනුවත් කර ඔවුන්ගේ නිසි කැමැත්ත ඇතිව බවට;

(ඇ) බඳවා ගනු ලබන එවැනි පුද්ගලයින් හට හමුදා සේවයට අදාළ රාජකාරි පිළිබඳව සම්පූර්ණ දැනුවත් කිරීමක් කරනු ලබන බවට;

(ඈ) බඳවා ගනු ලබන එවැනි පුද්ගලයින් විසින් ඔවුන්ව ජාතික හමුදා සේවයට පිළිගැනීමට පෙර තම වයස පිළිබඳ පිළිගත හැකි සාක්ෂි සපයන බවට.

4. සෑම රාජ්‍ය පාර්ශවයක් හටම එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත දැනුම් දීමක් සිදු කරමින් ඕනෑම අවස්ථාවක තම ප්‍රකාශනය ශක්තිමත් කළ හැකි අතර මහලේකම්වරයා විසින් ඒ බව අනෙකුත් සියළු රාජ්‍ය පාර්ශවයන් වෙත දැනුම්දෙනු ඇත. එවැනි දැනුම්දීමක් මහලේකම්වරයාට ලැබුණු දිනයේ සිට එය බලාත්මක වනු ඇත.

5. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28 සහ 29 වගන්තිවලට අනුකූලව, මෙම වගන්තියේ 1 වන ඡේදයේ දැක්වෙන වයස් සීමාව වැඩි කිරීමේ අවශ්‍යතාවය රාජ්‍ය පාර්ශවයන්ගේ සන්නද්ධ හමුදාවන් විසින් හෝ ඔවුන්ගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන පාසල් සඳහා අදාළ නොවේ.

4 වන වගන්තිය

1. රාජ්‍යයක සන්නද්ධ හමුදාවක් නොවන සන්නද්ධ කණ්ඩායම් විසින් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින්ව කිසිදු තත්වයක් යටතේ බඳවා ගැනීම හෝ යුධ කටයුතු සඳහා යොදවා ගැනීම සිදු නොකළ යුතුය.

2. එවන් ආකාරයේ බඳවා ගැනීම් සහ යොදවා ගැනීම් වැළැක්වීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් හැකි සියලුළුම ක්‍රියාමාර්ග ගත යුතු අතර, එවැනි භාවිතයන් තහනම් කිරීමට සහ ඒවා අපරාධ ලෙස නම් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

3. මෙම ප්‍රකාශනය යටතේ ඇති මෙම වගන්තියෙහි යෙදවීම සන්නද්ධ ගැටුමකට සම්බන්ධ කිසිදු පාර්ශ්වයකට පවත්නා නීතිමය තත්ත්වයට බලපෑමක් එල්ල නොකරනු ඇත.

5 වන වගන්තිය

මෙම ප්‍රකාශනයෙහි ඇති කිසියම් කරුණක් මගින් ළමා අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා වඩාත් හිතකර වන ලෙස කිසියම් රාජ්‍ය නීතියක හෝ ජාත්‍යන්තරව පිළිගත් මෙවලමක මෙන්ම ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි පවත්නා කිසියම් විධිවිධානයකට පටහැනි නොවනු ඇත.

6 වන වගන්තිය

1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම සිය අධිකරණ පද්ධතිය තුළ මෙම ප්‍රකාශනයෙහි සඳහන් විධිවිධානයන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලුළුම නීතිමය, පරිපාලනමය සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගත යුතුය.

2. වත්මන් ප්‍රකාශනයෙහි අඩංගු මූලධර්ම සහ විධිවිධානයන් පිළිබඳ සුදුසු ක්‍රමවේද හරහා වැඩිහිටියන් සහ සහ ළමුන් අතර සමසේ පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම රාජ්‍ය පාර්ශවයන් විසින් සිදු කල යුතුය.

3. මෙම ප්‍රකාශනයට පටහැනිව තම බල සීමාවන් තුළ බඳවා ගනු ලබන හෝ යුධ කටයුතු සඳහා යොදවා ගනු ලබන පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් නැවැත්වීම හෝ එසේත් නැතිනම් සේවයෙන් නිදහස් කිරීම සහතිකකිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් සියලුළු පියවර ගත යුතුය. එමෙන්ම රාජ්‍ය පාර්ශවයන් විසින්, අවශ්‍ය වූ විටක, එම පුද්ගලයින් හට සිය කායික හා මානසික ප්‍රකෘතිමත් භාවය ලබා ගැනීමට සහ ඔවුන්ව නැවත සමාජගත කිරීමට අවශ්‍ය සියලුළු සහයෝගයන් ලබා දිය යුතුය.

7 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනයට පටහැනි ලෙස සිදුකෙරෙන ඕනෑම ක්‍රියාකාරකමක් වළක්වාලීම මෙන්ම මෙම ප්‍රකාශනයට පටහැනි ක්‍රියාවන්හි වින්දිතයන් බවට පත් වූ පුද්ගලයින්ව පුනරුත්ථාපනය කිරීම සහ නැවත සමාජගත කිරීම ඇතුළුව අවශ්‍ය තාක්ෂණික සහයෝගීතාවය සහ මූල්‍ය සහයෝගය ලබාදීමද සමගින් මෙම ප්‍රකාශනයට ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය. එවැනි උපකාරයන් සහ සහයෝගීතාවන් අදාළ රාජ්‍ය පාර්ශවයන් සහ ජාත්‍යන්තර සංවිධාන අතර අන්‍යෝන්‍ය උපදේශන සාකච්ඡා හරහා ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2. ඒ සඳහා හැකියාවන් පවතින රාජ්‍ය පාර්ශවයන් හට දැනට බල පවත්නා බහුපාර්ශ්වික, ද්විපාර්ශ්වික හෝ වෙනත් වැඩසටහන් හරහා එවැනි සහයෝගීතාවන් ලබා දිය හැක. එසේ නොමැති නම්, අන්‍යෝන්‍ය වශයෙන්, මහා මණ්ඩලයේ නීතිරීතිවලට අනුකූලව පිහිටුවන ලද ස්වේච්ඡා අරමුදලක් හරහා එවැනි සහයෝගීතාවන් ලබා දිය හැක.

8 වන වගන්තිය

1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම, මෙම ප්‍රකාශනය බලාත්මක කිරීමෙන් වසර දෙකක් ඇතුළත,සිය රාජ්‍යය විසින් යුධ කටයුතු සඳහා පුද්ගලයන් බඳවා ගැනීම් සහ යොදවා ගැනීම් සම්බන්ධ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ද ඇතුළුව මෙම ප්‍රකාශනයේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් වාර්තාවක් ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටු වෙත ඉදිරිපත් කළ යුතුය.

2. එම සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සම්මුතියේ 44 වැනි වගන්තියට අනුව, සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම තමන් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවලට මෙම ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන වැඩිදුර තොරතුරු ද ඇතුළත් කළ යුතුය. මෙම ප්‍රකාශනයට සම්බන්ධ වන අනෙකුත් රාජ්‍යයන් විසින් සෑම වසර පහකට වරක් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

3. එමෙන්ම, මෙම ප්‍රකාශනය ක්‍රියාවට නැංවීම සම්බන්ධ වැඩිදුර තොරතුරු ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය හැක.

9 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනය ළමා සම්මුතියේ පාර්ශවකරුවන් වන රාජ්‍යයන් හෝ එයට මේ වන විට අත්සන් කර ඇති රාජ්‍යයන් වෙත අත්සන් කිරීම සඳහා විවෘත වේ.

2. මෙම ප්‍රකාශනය අපරානුමත කිරීම අවශ්‍ය වන අතර ඕනෑම රාජ්‍යයකට මෙම ප්‍රකාශනය වෙත ප්‍රවේශ වීමට හැකියාව ද ඇත. එසේ සිදුකරනු ලබන අපරාඅනුමත කිරීම් හෝ ප්‍රවේශවීම් සම්බන්ධ තොරතුරු විධිමත ලෙස එක්සත් ජාතීන්ගේ මහලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

3. සම්මුතියේ සහ මෙම ප්‍රකාශනයේ භාරකරු වශයෙන් මහලේකම්වරයා, සම්මුතියේ 13 වැනි වගන්තියට අනුව, සම්මුතියට අත්සන් කර ඇති සහ සම්මුතියට සම්බන්ධ සියලුම රාජ්‍යයන් වෙත එවන් විධිමත් ප්‍රකාශයන් පිළිබඳ දැනුවත් කරනු ඇත.

10 වන වගන්තිය

1. රාජ්‍යයන් දහයකගෙන් අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදන ලැබීමෙන් මාස තුනකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත.

2. මෙම ප්‍රකාශනය බලාත්මක වූ පසු, එය අපරානුමත කරන හෝ එයට ප්‍රවේශ වන සෑම රාජ්‍යයක් සඳහාම, එම රාජ්‍යය විසින් ප්‍රකාශනය අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදනය ලැබූ දිනෙන් සිට මසකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත.

11 වන වගන්තිය

1. කිසියම් රාජ්‍යයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකර ඕනෑම අවස්ථාවකදී මෙම ප්‍රකාශනය ප්‍රතික්ෂේප කල හැකි අතර, එහිදී මහලේකම් වරයා විසින් සම්මුතියෙහි පාර්ශවකරුවන් වන සහ එයට අත්සන් තබා ඇති සියලුඑම රාජ්‍යයන්ට ඒ බව දැනුම් දෙනු ඇත. එවන් දැනුම්දීමක් මහලේකම්වරයා වෙත ලැබුණු දින සිට වසරක කාලයකට පසුව එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වනු ඇත. කෙසේ වෙතත්, වසරකින් පසු කල් ඉකුත් වන දින වන විට මෙම ප්‍රතික්ෂේප කිරීම කරනු ලබන රාජ්‍යය සන්නද්ධ ගැටුමකට සම්බන්ධව සිටී නම්, එම සන්නද්ධ ගැටුම අවසන් වන තෙක් ඉහත ප්‍රතික්ෂේප කිරීම බලාත්මක නොවනු ඇත.

2. කෙසේ වෙතත් එවැනි ප්‍රතික්ෂේප කිරීමකදී, අදාළ රාජ්‍යය විසින් එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වන දිනට පෙර සිදුකරනු ලබන කිසියම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වත්මන් ප්‍රකාශනයෙහි සඳහන් වගකීම්වලින් නිදහස් කිරීමට බලපෑමක් ඇති නොකරනු ඇත. එසේම එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වන දිනට පෙර කමිටුව විසින් දැනටමත් සලකා බලමින් තිබූ යම් කරුණක් වේනම් එය අඛණ්ඩව සලකා බැලීම සම්බන්ධව කිසිදු අගතිගාමී බලපෑමක් ඇති කිරීමට එවන් ප්‍රතික්ෂේප කිරීමකට නොහැක.

12 වන වගන්තිය

1. ඕනෑම රාජ්‍ය පාර්ශවයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිතව යොමු කිරීම මඟින් මෙම ප්‍රකාශනයට කිසියම් සංශෝධනයක් යෝජනා කළ හැක. එවන් යෝජනාවක් ලද විට මහලේකම්වරයා විසින් එම යෝජිත සංශෝධනය පිළිබඳ අදාළ රාජ්‍ය පාර්ශවයන් වෙත දැනුම් දීමක් කරනු ඇති අතර, එහිදී එම යෝජනාව පිළිබඳ සලකාබලා ඡන්ද විමසීමක් සිදුකිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ගේ සමුළුවක් පැවැත්වීම සම්බන්ධව සිය කැමත්ත සඳහන් කරන ලෙසද ඉල්ලා සිටිනු ඇත. එවන් දැනුම්දීමක් සිදුකර මාස හතරක් ඇතුළත, අවම වශයෙන් අදාළ රාජ්‍ය පාර්ශවයන්ගෙන් තුනෙන් එකක් එවැනි සමුළුවකට කැමත්ත ප්‍රකාශ කරඇත්නම්, මහලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ අනුග්‍රහයද සහිතව එවන් සමුළුවක් කැඳවනු ඇත. සමුළුවේදී ඒ සඳහා සහභාගී වූ රාජ්‍ය පාර්ශවයන් විසින් ඡන්දය ප්‍රකාශ කරන ලදුව, බහුතරය විසින් සම්මත කරන ලද ඕනෑම සංශෝධනයක්

අනුමැතිය සඳහා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.

2. මෙම වගන්තියේ 1 වන ඡේදයට අනුව සම්මත කරන ලද සංශෝධනයක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරන ලදුව රාජ්‍ය පාර්ශවයන්ගේ තුනෙන් දෙකක බහුතරයකින් අනුමත වූ විට එය බලාත්මක වනු ඇත.

3. කිසියම් සංශෝධනයක් එසේ බලාත්මක වන විට, එම සංශෝධනය පිළිගත් රාජ්‍ය පාර්ශවයන් ඒ හා බැඳෙනු ඇත, එසේම අනෙකුත් රාජ්‍ය පාර්ශවයන් මෙම ප්‍රකාශනයේ විධිවිධානවලට සහ ඔවුන් විසින් මෙයට පෙර පිළිගෙන ඇති සංශෝධනයන්ට බැඳී සිටිනු ඇත.

13 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනයෙහි අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා වලින් වන ලියවිලි වලට සමාන පිළිගැනීමක් හිමි වන අතර ඒවා එක්සත් ජාතීන්ගේ ලේඛනාගාරයේ තැන්පත් කර තබනු ඇත.

2. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් ළමා සම්මුතියේ පාර්ශවකරුවන් වන රාජ්‍යයන් සහ සම්මුතියට අත්සන් කර ඇති සියලුම රාජ්‍යයන් වෙත මෙම ප්‍රකාශනයෙහි සහතික කළ පිටපත් ලබා දෙනු ඇත.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ලිංගික ශ්‍රමික සේවයේ යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නිවේදන ක්‍රියාපටිපාටියකදී බලපානු ලබන ළමා අයිතිවාසිකම් පිළිබඳ වන වෛකල්පිත සංධානය

2011

මෙම ප්‍රකාශනය හා සම්බන්ධ රාජ්‍ය පාර්ශවයන් විසින්,

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මඟින් ප්‍රකාශිත මූලධර්මවලට අනුකූලව, මානව පවුලේ සියළුම සාමාජිකයින්ගේ නෛසර්ගික ගෞරවය මෙන්ම සමාන හා අන්සතු කල නොහැකි අයිතිවාසිකම් පිළිගැනීම තුලින් ලෝකයේ නිදහස, යුක්තිය සහ සාමය ඇති කරලීමේ පදනම සැකසෙන බව සැලකිල්ලට ගනිමින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට (මෙතැන් සිට "සම්මුතිය" ලෙසින් හඳුන්වනු ලබයි) සම්බන්ධ රාජ්‍ය පාර්ශවයන් විසින් සිය අධිකරණ බල සීමාවන් තුළ ළමයාගේ මෙන්ම ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුගේ ජාතිය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතිකත්වය, වාර්ගික හෝ සමාජ සම්භවය, දේපළ, ආබාධිතභාවය, උපත හෝ වෙනත් තත්ත්වයන් කුමක් වුවත්, කිසිදු ආකාරයක වෙනස්කොට සැලකීමකින් තොරව සෑම දරුවෙකුටම සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් පවතින බව පිළිගන්නා බව සඳහන් කරමින්,

සියළු මානව හිමිකම් වල සහ මූලික නිදහසේ පවත්නා විශ්වීය බව, නොබෙදිය හැකි බව, එකිනෙක මත රඳා පවත්නා ස්වභාවය මෙන්ම අන්තර් සම්බන්ධිත බව යලි යලිත් තහවුරු කරමින්,

ළමයකු හට අයිතිවාසිකම් සහිත සහ අභිමානයෙන් හා ක්‍රමයෙන් වර්ධනය වන හැකියාවන්ගෙන් යුත් මිනිසකුගේ තත්වය හිමිවන බව යළි යළිත් තහවුරු කරමින්,

ළමුන්ගේ විශේෂ සහ අන් අය මත යැපෙන සුළු තත්ත්වය ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වූ විටක ඒ සඳහා පිළියම් සෙවීමේදී ඔවුන්ව සැබෑ වශයෙන්ම දුෂ්කරතාවන්ට පත්කරවන බව හඳුනා ගන්මින්,

මෙම ප්‍රකාශනය මඟින් ළමුන් හට ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට ඉඩ කඩ සලසමින් ඒ සඳහා ජාතික සහ කලාපීය වශයෙන් පවත්නා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සහ ඌනපූරණය කරනු ඇතැයි සලකමින්,

ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේදී ළමුන්ගේ යහපැවැත්ම වෙත මූලික අවධානය යොමු කළ යුතු බව පිළිගනිමින් සහ, එවැනි ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග වල සෑම මට්ටමකදීම ළමා සංවේදී ක්‍රියා පටිපාටි අනුතමනය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්,

අයිතීන් උල්ලංඝණය වූ ළමයෙකු හට දේශිය වශයෙන් ඵලදායී ප්‍රතිකර්ම සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා අවශ්‍ය වන ජාතික යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීමට රාජ්‍ය පාර්ශවයන් දිරිමත් කරමින්,

ජාතික වශයෙන් ක්‍රියාත්මක මානව හිමිකම් ආයතන වලට සහ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය

කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන අනෙකුත් විශේෂිත ආයතනවලට මේ සම්බන්ධයෙන් ඉටු කළ හැකි වැදගත් කාර්යභාරය සිහිපත් කරමින්,

එවැනි ජාතික මට්ටමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමේදී සහ ධානපූර්ණයන් කිරීමේදී මෙන්ම ළමා සම්මුතියේ මෙන්ම අදාළ වන විට, ළමුන් විකිණීම, ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වෛකල්පික ප්‍රකාශනයේ සහ සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වෛකල්පික ප්‍රකාශනයේ ක්‍රියාත්මක භාවය තවදුරටත් වර්ධනය කිරීමේදී, ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට (මෙතැන් සිට "කමිටුව" ලෙසින් හඳුන්වනු ලබයි) මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා හැකියාව ලබා දීම යෝග්‍ය බව සලකා බලමින්,
පහත එකඟතාවන්ට එළඹෙන ලදී:

පළමු කොටස
සාමාන්‍ය විධිවිධාන

1 වන වගන්තිය
ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ ශක්තතාවය

1.මෙම ප්‍රකාශනයෙහි පාර්ශවකරුවන් වන රාජ්‍ය පාර්ශවයන් මෙම ප්‍රකාශනය මගින් දක්වා ඇති පරිදි කමිටුවේ ශක්තතාවය පිළිගත යුතුය.

2. මෙම ප්‍රකාශනයෙහි පාර්ශවකරුවන් වන රාජ්‍ය පාර්ශවයන් සම්බන්ධව කටයුතු කිරීමේදී අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධව කිසියම් ලේඛනයක දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් එම රාජ්‍යය පාර්ශවය කොටස් කරුවකු නොවන අවස්ථාවකදී අදාළ රාජ්‍ය පාර්ශවය සම්බන්ධයෙන් කමිටුව සිය ශක්තතාවය ක්‍රියාත්මක නොකළ යුතුය.

3. මෙම ප්‍රකාශනයෙහි පාර්ශවකරුවෙකු නොවන රාජ්‍යයක් සම්බන්ධයෙන් කමිටුව වෙත කිසිදු සන්නිවේදනයක් නොලැබිය යුතුය.

2 වන වගන්තිය
කමිටුවේ කාර්යයන් සම්බන්ධව මගපෙන්වන සාමාන්‍ය මූලධර්ම

මෙම ප්‍රකාශනය මගින් කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී, කමිටුව විසින් ළමයාගේ යහපැවැත්ම පිළිබඳ මූලධර්මය මත පිහිටා කටයුතු කල යුතුය. එසේම, එහිදී ළමයාගේ අදහස් සම්බන්ධව ඔහුගේ හෝ ඇයගේ වයස සහ පරිණතභාවයට අනුකූලව නිසි බරතැබීමක් සිදු කරමින්, ළමයාගේ අයිතිවාසිකම් සහ අදහස් සැලකිල්ලට ගත යුතුය.

3 වන වගන්තිය
ක්‍රියාපටිපාටීන් සඳහා වන නීති

1. කමිටුව විසින් මෙම ප්‍රකාශනය මගින් පවරනු ලබන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි සම්බන්ධ නීති සම්මත කරගත යුතුය. එසේ කිරීමේදී, ළමා සංවේදී ක්‍රියාපටිපාටි සහතික කිරීම සඳහා විශේෂයෙන්ම මෙම ප්‍රකාශනයෙහි 2 වැනි වගන්තියෙහි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

2. කමිටුව විසින් සිය ක්‍රියාපටිපාටීන් සඳහා වන නීති වලට ළමයා වෙනුවෙන් ඉදිරිපත්ව ක්‍රියා කරන අය විසින් ඔහු හෝ ඇයව හැසිරවීම වැළැක්වීමට අවශ්‍ය ආරක්ෂණයන් ඇතුළත් කළ යුතු අතර

ළමයාගේ යහපැවැත්මට පටහැනි යයි සැළකෙන ඕනෑම සන්නිවේදනයක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

4 වන වගන්තිය
ආරක්ෂණ පියවර

1. රාජ්‍ය පාර්ශවයක් විසින් තම අධිකරණ බල සීමාවට යටත්ව සිටින පුද්ගලයින් මෙම ප්‍රකාශනයට අනුකූලව කමිටුව සමග කරනු ලබන සන්නිවේදනයන් හෝ සහයෝගීතාවන් හිදී කිසිදු මානව හිමිකම් උල්ලංඝනයකට, වැරදි ලෙස සැලකීමට හෝ බිය ගැන්වීමකට ලක් නොවන බව සහතික කිරීමට සියළු සුදුසු පියවර ගත යුතුය.

2. අදාළ පුද්ගලයින්ගේ හෝ පුද්ගල කණ්ඩායම් වල අනන්‍යතාවය ඔවුන්ගේ ප්‍රකාශිත අවසරයකින් තොරව ප්‍රසිද්ධියේ හෙළි නොකළ යුතුය.

දෙවන කොටස
සන්නිවේදන ක්‍රියාපටිපාටි

5 වන වගන්තිය
තනි පුද්ගල සන්නිවේදනය

1. කිසියම් රාජ්‍ය පාර්ශවයක අධිකරණ බල සීමාව තුළ, පහත සඳහන් කවර හෝ ලේඛනයක දක්වා ඇති ඕනෑම අයිතිවාසිකමක් එම රාජ්‍ය පාර්ශ්වය විසින් කඩකිරීමකට ලක්ව එහි වින්දිතයන් බවට පත්වූවේ යැයි කිසියම් පුද්ගලයකු හෝ පුද්ගලයන් කණ්ඩායමකට හෝ එසේත් නැතිනම් ඔහු හෝ ඔවුන් වෙනුවෙන් සන්නිවේදනය කළ හැකියඃ

(අ) සම්මුතිය
(ආ) සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය
(ඇ) සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය

2. පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් වෙනුවෙන් එවන් සන්නිවේදනයක් ඉදිරිපත් කරන අවස්ථාවක, සන්නිවේදනය ඉදිරිපත් කරන්නා හට අදාළ පාර්ශවයේ අනුමැතියකින් තොරව ඔවුන් වෙනුවෙන් ක්‍රියා කරන හේතුව සාධාරණීකරණය කළ හැකි නම් හැර, එම සන්නිවේදනය ඔවුන්ගේ කැමැත්ත ඇතිව සිදුවිය යුතුය.

6 වන වගන්තිය
අතරමැදි පියවරයන්

1. සන්නිවේදනයක් ලැබීමෙන් පසුව, ඒ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණයකට එළඹීමට පෙර, කමිටුව විසින් අදාළ රාජ්‍ය පාර්ශවය වෙත හදිසි අවධානයක් යොමු කරමින් අදාළ වින්දිතයාට හෝ වින්දිතයින්ට සිදුවිය හැකි ආපසු හැරවිය නොහැකි හානිය වළක්වා ගැනීම සඳහා සුවිශේෂී අවස්ථාවන්හිදී අවශ්‍ය විය හැකි අතරමැදි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. .

2. මෙම වගන්තියේ 1 වන ඡේදය යටතේ කමිටුව සිය අභිමතය ක්‍රියාත්මක කරන විට, අදාළ සන්නිවේදනය පිළිගත හැකිද, නොහැකිද හෝ ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ කිසිවක් අදහස් නොකරයි.

7 වන වගන්තිය
පිළිගතහැකි බව

කමිටුව විසින් පහත සඳහන් ආකාරයේ සන්නිවේදනයන් පිළිගත නොහැකි ලෙස සලකනු ඇතඃ

(අ) එම සන්නිවේදනය නිර්නාමික නම්;

(ආ) එම සන්නිවේදනය ලිඛිතව නොවේ නම්;

(ඇ) එම සන්නිවේදනය එවන් සන්නිවේදනයන් ඉදිරිපත් කිරීමේ අයිතිය අනිසි ලෙස භාවිතා කරමින් ඉදිරිපත් කර ඇත්නම් හෝ සම්මුතියේ සහ/හෝ ඒ සඳහා වන වෛකල්පික ප්‍රකාශන වල එන විධිවිධාන සමඟ නොගැළපේ නම්;

(ඈ) එම සන්නිවේදනය මගින් මතුකරන කාරණය දැනටමත් කමිටුව විසින් විභාග කර ඇත්නම් හෝ වෙනත් ජාත්‍යන්තර විමර්ශන හෝ බේරුම්කරණ ක්‍රියා පටිපාටියක් යටතේ හෝ විභාග කර හෝ විභාග වෙමින් ඇත්නම්;

(ඉ) අදාළ කාරණය සම්බන්ධව යොදාගත හැකි සියලුඑම දේශීය පිළියම් අවසන් වී නැති නම්. කෙසේ වෙතත් එම පිළියම් ක්‍රියාත්මක වීම සාධාරණ හේතුවකින් තොරව කල් ගත වේ නම් හෝ ඒ මගින් ඵලදායී සහනයක් ලබා දීමට නොහැකි වන්නේ නම් මෙම නීතිය අදාළ නොවේ;

(ඊ) එම සන්නිවේදනය පැහැදිළි ලෙසම වැරදි පදනමක් සහිතව වේ නම් හෝ ප්‍රමාණවත් පරිදි සනාථ කර නොමැති නම්;

(උ) එම සන්නිවේදනයෙන් අවධානය යොමු වන කරුණු මෙම ප්‍රකාශනය අදාළ රාජ්‍ය පාර්ශවය සඳහා බලාත්මක වීමට පෙර ඇති වූවක් නම්. කෙසේ වෙතත් එසේ බලාත්මක වූ දිනයෙන් පසුව අදාළ කරුණු නොනවත්වා පැවතුනේ නම් මෙය අදාළ නොවේ;

(ඌ) එම සන්නිවේදනය සඳහා දේශිය වශයෙන් යෙදූ විසඳුම් අවසන් වී වසරක් ඇතුළතදී ඉදිරිපත නොකරන්නේ නම්. කෙසේ වෙතත් අදාල කාල සීමාව තුළ එම සන්නිවේදනය ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව අදාළ ඉදිරිපත් කරන්නාට තහවුරු කර ඉදිරිපත් කල හැකි අවස්ථාවන් හිදී මෙය අදාළ නොවේ.

8 වන වගන්තිය
සන්නිවේදනය යොමු කිරීම

1. කිසියම් සන්නිවේදනයක් අදාළ රාජ්‍ය පාර්ශ්වය වෙත යොමු නොකර එය පිළිගත නොහැකි යැයි කමිටුව සලකන්නේ නම් හැර, කමිටුව විසින් මෙම ප්‍රකාශනය යටතේ එය වෙත ඉදිරිපත් කරන ඕනෑම සන්නිවේදනයක් රහසිගත ලෙස අදාළ රාජ්‍ය පාර්ශවයේ අවධානයට හැකි ඉක්මනින් යොමු කරනු ඇත.

2. මෙහිදී රාජ්‍ය පාර්ශවය විසින් අදාල සන්නිවේදනය පිළිබඳ කරුණු පැහැදිළි කිරීමක් හෝ අදාළ කරුණ සහ ඒ සම්බන්ධව ගෙන ඇති ප්‍රතිකර්ම ඇත්නම් ඒවාද පැහැදිලි කරන ප්‍රකාශයක් කමිටුව වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. මෙම ප්‍රතිචාරය ඉදිරිපත් කිරීම රාජ්‍ය පාර්ශවය විසින් මාස හයක් ඇතුළත හැකි ඉක්මනින් සිදුකල යුතුය.

9 වන වගන්තිය
සුහදශීලී බේරුම්කරණය

1. සම්මුතියේ සහ/හෝ ඒ සඳහා වන වෛකල්පික ප්‍රකාශනයන්හි දක්වා ඇති බැඳීම්වලට ගරු කිරීමේ පදනම මත අදාළ කාරණය සුහදශීලී ලෙස විසඳා ගැනීමේ අරමුණින් කමිටුව විසින් අදාළ පාර්ශවයන් වෙත එහි සහයෝගය ලබා දිය යුතුය.

2. කමිටුවේ අනුග්‍රහය යටතේ ඇති කර ගත් සුහදශීලී විසඳුමක් සම්බන්ධ ගිවිසුමක් මඟින් මෙම ප්‍රකාශනය යටතේ වන අදාළ සන්නිවේදනය පිළිබඳව සලකා බැලීම අවසන් කරනු ඇත.

10 වන වගන්තිය
සන්නිවේදනයේදී සලකා බැලිය යුතු කරුණු

1. සන්නිවේදනයට සම්බන්ධ ලේඛනය අදාළ පාර්ශ්ව වෙත යොමු කර ඇත්නම්, අදාළ සියළුම ලියකියවිලි සැළකිල්ලට ගනිමින් මෙම ප්‍රකාශනය යටතේ ලැබෙන සන්නිවේදනයන් කමිටුව විසින් හැකි ඉක්මනින් සලකා බැලීමට ලක් කරනු ඇත.

2. මෙම ප්‍රකාශනය යටතේ ලැබුණු සන්නිවේදනයන් පරීක්ෂාවට ලක් කිරීමේදී කමිටුව විසින් සංවෘත රැස්වීම් පවත්වනු ඇත.

3. කමිටුව විසින් අතරමැදි පියවර සම්බ්න්ධව ඉල්ලීම් කර ඇති අවස්ථාවක, කඩිනමින් එම සන්නිවේදනය සලකා බැලීම සිදු කළ යුතුය.

4. ආර්ථික, සමාජීය හෝ සංස්කෘතික අයිතීන් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා සහිත සන්නිවේදනයන් පරීක්ෂා කිරීමේදී, සම්මුතියේ 4 වැනි වගන්තියට අනුව රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති පියවරයන්හි සාධාරණත්වය කමිටුව විසින් සලකා බලනු ඇත. එසේ කිරීමේදී, සම්මුතියේ සඳහන් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ රාජ්‍ය පාර්ශවයට විවධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් අනුගමනය කළ හැකි බව කමිටුව විසින් සිහි තබා ගනු ඇත.

5. සන්නිවේදනයක් සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් පසු, කමිටුව විසින් එම සන්නිවේදනයට අදාළව නිර්දේශයන් තිබේ නම් ඒවාද සමඟින්, සිය අදහස අදාල පාර්ශව වෙත ප්‍රමාදයකින් තොරව යොමු කළ යුතුය.

11 වන වගන්තිය
පසු විපරම

1. අදාළ රාජ්‍ය පාර්ශවය විසින් කමිටුවේ නිර්දේශයන් ඇත්නම් ඒවා සහ අදහස් නිසි ලෙස සලකා බැලිය යුතු අතර, එසේ කමිටුව විසින් ලබාදී ඇති අදහස් සහ නිර්දේශ අනුව මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන ඕනෑම ක්‍රියාමාර්ගයක් පිළිබඳ තොරතුරු ද ඇතුළුව ලිඛිත ප්‍රතිචාරයක් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ප්‍රතිචාරය ලබාදීම රාජ්‍ය පාර්ශවය විසින් මාස හයක් ඇතුළත හැකි ඉක්මනින් සිදුකල යුතුය.

2. කමිටුව විසින් සුදුසු යැයි හැඟෙන පරිදි තමන් ලබා දුන් අදහස්වලට හෝ නිර්දේශයන්ට හෝ අදාළ නම් මිත්‍රශීලී බේරුම්කරණ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටියහැක. එසේම මෙහිදී සුදුසු යැයි හැඟෙන පරිදි සම්මුතියේ 44 වැනි වගන්තිය යටතේ ලබා දෙන වාර්තා, සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනයේ 12 වැනි වගන්තිය යටතේ ලබා

දෙන වාර්තා හෝ සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනයේ 8 වැනි වගන්තිය යටතේ ලබා දෙන වාර්තා ද අදාළ විය හැක.

12 වන වගන්තිය
රාජ්‍යයන් අතර සන්නිවේදනය

1. මෙම ප්‍රකාශනයේ පාර්ශවකරුවකු වන රාජ්‍ය පාර්ශවයකට, පහත සඳහන් කවර හෝ ප්‍රකාශනයන් යටතේ වෙනත් රාජ්‍ය පාර්ශවයක් විසින් තම වගකීම් ඉටු නොකරන අවස්ථාවක එකී රාජ්‍ය පාර්ශවයෙන් සන්නිවේදනයන් ලබා ගැනීමට සහ එය සලකා බැලීමට කමිටුවට ඇති ශක්තතාව තමන් පිළිගන්නා බව ඕනෑම අවස්ථාවක ප්‍රකාශ කළ හැකිය.

(අ) සම්මුතිය

(ආ) සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය

(ඇ) සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය

2. එවැනි ප්‍රකාශයක් නිකුත් නොකළ රාජ්‍ය පාර්ශවයක් සම්බන්ධව හෝ එවැනි ප්‍රකාශයක් නිකුත් නොකළ රාජ්‍ය පාර්ශවයකින් ලැබෙන සන්නිවේදන කමිටුව විසින් භාර නොගනු ඇත.

3. සම්මුතියේ සහ ඒ සඳහා වන වෛකල්පික ප්‍රකාශනයන්හි දක්වා ඇති බැඳීම්වලට ගරු කිරීමේ පදනම මත අදාළ කාරණය සුහදශීලී ලෙස විසඳා ගැනීමේ අරමුණින් කමිටුව විසින් අදාළ රාජ්‍ය පාර්ශවයන් වෙත එහි සහයෝගය ලබා දිය යුතුය.

4. රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම වගන්තියේ 1 වන ඡේදය යටතේ සඳහන් වන පරිදි ප්‍රකාශයක් එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත තැන්පත් කළ යුතු අතර, එහිදී මහලේකම් වරයා එහි පිටපත් අනෙකුත් රාජ්‍ය පාර්ශවයන් වෙත යොමු කරනු ඇත. එසේම මහලේකම් වරයා වෙත දැනුම් දීම මඟින් ඕනෑම අවස්ථාවක එසේ කරන ලද ප්‍රකාශයක් ඉල්ලා අස්කර ගත හැක. එවැනි ඉල්ලා අස්කර ගැනීමක් නිසා මෙම වගන්තිය යටතේ දැනටමත් යොමු කර ඇති සන්නිවේදනයක් සම්බන්ධ වන කිසිදු කරුණක් සලකා බැලීමට බාධාවක් නොවිය යුතුය. අදාළ රාජ්‍ය පාර්ශවය අළුතින් ප්‍රකාශයක් කර ඇත්නම් හැර, ප්‍රකාශය ඉල්ලා අස්කර ගැනීමේ දැනුම්දීම මහලේකම්වරයා වෙත ලැබීමෙන් පසුව, මෙම වගන්තිය යටතේ එවන් රාජ්‍ය පාර්ශ්වයකින් වැඩිදුර සන්නිවේදනයක් භාරගනු නොලැ බේ.

තෙවන කොටස
විමර්ශන පටිපාටිය

13 වන වගන්තිය
බරපතල හෝ පද්ධතිමය උල්ලංඝනය කිරීම් සඳහා විමර්ශන ක්‍රියා පටිපාටිය

1. සම්මුතියේ හෝ ඒ හා සම්බන්ධ ළමුන් විකිනීම, ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම හෝ සන්නද්ධ ගැටුම්වලට ළමුන් සම්බන්ධ කිරීම පිළිබඳ වෛකල්පික ප්‍රකාශන වල දක්වා ඇති අයිතිවාසිකම් රාජ්‍ය පාර්ශවයක් විසින් බරපතල ලෙස හෝ පද්ධතිමය වශයෙන් උල්ලංඝනය කිරීම් සම්බන්ධ විශ්වාසදායක තොරතුරු කමිටුව වෙත ලැබුනේ නම්, ඒ සම්බන්දව තොරතුරු විමර්ශනය කිරීමේදී සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරන ලෙසත්, අදාළ තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව සිය නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙසත් කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිනු ඇත.

2. අදාළ රාජ්‍ය පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ මෙන්ම ඒ හා සම්බන්ධ වෙනත් විශ්වාසදායක තොරතුරු ද සැලකිල්ලට ගනිමින්, අදාළ කාරණාව සම්බන්ධව විමර්ශනයක් පැවැත්වීමට සහ කමිටුව වෙත කඩිනමින් වාර්තා කිරීමට කමිටුවට විසින් එහි එක් සාමාජිකයකු හෝ ඊට වැඩි ගණනක් පත් කළ හැකිය. එමෙන්ම මෙහිදී අවශ්‍යතාවය පරිදි, රාජ්‍ය පාර්ශවයේද අනුමැතිය සහිතව, එම රාජ්‍යය වෙත විමර්ශනය සංචාරයක් ද සිදු කළ හැකිය.

3. එවන් විමර්ශනයක් සිදුකිරීමේදී එය රහසිගතව පැවැත්විය යුතු වන අතර, ක්‍රියාපටිපාටියේ සෑම අදියරකදීම අදාළ රාජ්‍ය පාර්ශවයේ සහයෝගීත්වය ඉල්ලා සිටිය යුතුය.

4. එවන් විමර්ශනයකදී සොයාගත් කරුණු අධ්‍යයනය කිරීමෙන් පසු, කමිටුව විසින් එම සොයාගත් කරුණු, ඒ සම්බන්ධ අදහස් සහ නිර්දේශයන් ද සමග අදාළ රාජ්‍ය පාර්ශවය වෙත ප්‍රමාදයකින් තොරව යොමු කළ යුතුය.

5. මෙහිදී අදාළ රාජ්‍ය පාර්ශවය විසින්, හැකි ඉක්මනින් සහ කමිටුව විසින් යොමු කරන කරන ලද සොයාගැනීම්, අදහස් සහ නිර්දේශ ලැබී මාස හයක කාලයක් ඇතුළත සිය නිරීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

6. මෙම වගන්තියේ 2 වැනි ඡේදයට අනුව කරන ලද විමර්ශනයක් සම්බන්ධයෙන් එවන් ක්‍රියාදාමයන් අවසන් වූ පසු, අදාළ රාජ්‍ය පාර්ශවය සමග සාකච්ඡා කිරීමෙන් පසු, කමිටුව විසින් මෙම ප්‍රකාශනයේ 16 වන වගන්තිය ප්‍රකාරව සපයනු ලබන සිය වාර්තාවට අදාළ ක්‍රියාදාමයේ ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් ඇතුළත් කිරීමට තීරණය කළ හැකිය.

7. සෑම රාජ්‍ය පාර්ශ්වයක් විසින්ම, මෙම ප්‍රකාශනයට අත්සන් කරන අවස්ථාවේදී හෝ එය අපරානුමත කරන අවස්ථාවේදී හෝ එයට ප්‍රවේශ වීමේදී, මෙම වගන්තියේ 1 ඡේදයේ ලැයිස්තුගත කර ඇති ප්‍රකාශනයන්ගෙන් කිසිවක හෝ සියල්ලෙහිම සඳහන් අයිතිවාසිකම් සම්බන්ධයෙන් මෙම වගන්තියෙන් කමිටුවට ලබා දී ඇති ශක්තතාවය තමන් විසින් පිළිනොගන්නා බවට ප්‍රකාශ කළ හැකිය.

8. මෙම වගන්තියේ 7 වැනි ඡේදයට අනුකූලව එවන් ප්‍රකාශයක් කර ඇති ඕනෑම රාජ්‍ය පාර්ශවයකට, ඕනෑම අවස්ථාවකදී, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වෙත දැනුම් දීමක් මඟින එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගත හැකිය.

14 වන වගන්තිය
විමර්ශන ක්‍රියාපටිපාටිය පිළිබඳ පසු විපරම

1. කමිටුව විසින්, මෙම ප්‍රකාශනයේ 13 වැනි වගන්තියේ 5 වැනි ඡේදයේ සඳහන් වන මාස හයක කාලය අවසන් වීමෙන් පසුව, අවශ්‍ය නම් මෙම ප්‍රකාශනයේ 13 වැනි වගන්තිය යටතේ පවත්වනු ලැබූ විමර්ශනයකට ප්‍රතිචාර වශයෙන් මේ දක්වා ගෙන ඇති සහ ගැනීමට අපේක්ෂා කරන ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම් දෙන ලෙස අදාළ රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිය හැක.

2. කමිටුව විසින් මෙම ප්‍රකාශනයේ 13 වැනි වගන්තිය යටතේ පවත්වනු ලැබූ විමර්ශනයකට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිය හැක. එසේම මෙහිදී සුදුසු යැයි හැඟෙන පරිදි සම්මුතියේ 44 වැනි වගන්තිය යටතේ ලබා දෙන වාර්තා, සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ලිංගික වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනයේ 12 වැනි වගන්තිය යටතේ ලබා දෙන වාර්තා හෝ සම්මුතියට අදාළව සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනයේ 8 වැනි වගන්තිය යටතේ ලබා දෙන වාර්තා ද අවශ්‍ය වන පරිදි ඉල්ලා සිටිය හැක.

සිව්වන කොටස
අවසන් විධිවිධාන

15 වන වගන්තිය
ජාත්‍යන්තර සහාය සහ සහයෝගීතාව

1. කමිටුව විසින්, අදාළ රාජ්‍ය පාර්ශවයේ ද අනුමැතිය ඇතිව, සිදුකරන ලද සන්නිවේදන සහ විමර්ශන සම්බන්ධව කමිටුවේ අදහස් හෝ නිර්දේශ මෙන්ම ඒ සම්බන්ධව අදාළ රාජ්‍ය පාර්ශවය විසින් ලබාදුන් නිරීක්ෂණ සහ යෝජනා තිබේ නම් ඒවාද සමඟින්, ඒ සම්බන්ධව තාක්ෂණික උපදෙස් හෝ සහයෝගය ලබාදීමේ අවශ්‍යතාවද පෙන්වමින් එම තොරතුරු එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන, අරමුදල් සහ වැඩසටහන් මෙන්ම අනෙකුත් අදාළ ආයතන වෙත යොමු කළ හැකිය.

2.එමෙන්ම, මෙම ප්‍රකාශනය යටතේ සලකා බලනු ලබන කිසියම් සන්නිවේදනයන් හේතුවෙන් පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධව, අදාළ රාජ්‍ය පාර්ශ්වයේ ද කැමැත්ත ඇතිව සම්මුතියේ සහ/හෝ ඒ සඳහා වන වෛකල්පික ප්‍රකාශන මගින් පිළගෙන ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ රාජ්‍ය පාර්ශවයේ ක්‍රියාමාර්ග වලට දායකත්වය දක්වනු වස්, අදාළ එක් එක් සංවිධානයේ නිපුණතා ක්ෂේත්‍රය තුළ, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රියාමාර්ග සම්බන්ධ උපදේශනය ට අදාළ තීරණ ගැනීමට හැකිවන පරිදි අදාළ කරුණු ඉහත ආයතන වල අවධානයට යොමු කිරීමට කමිටුවට හැකිය.

16 වන වගන්තිය
මහා සභාවට වාර්ථා කිරීම

සම්මුතියේ 44 වන වගන්තියේ 5 වන ඡේදයට අනුකූලව, කමිටුව විසින් සෑම වසර දෙකකට වරක් මහා සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මෙම ප්‍රකාශනය යටතේ කමිටුවේ ක්‍රියාකාරකම්වල සාරාංශයක් ඇතුළත් කරනු ඇත.

17 වන වගන්තිය
වෛකල්පික ප්‍රකාශනය සම්බ්න්ධ තොරතුරු සහ ඒවා බෙදා හැරීම

සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම මෙම වෛකල්පික ප්‍රකාශනය පුළුල් ලෙස බෙදා හැරීමට සහ ප්‍රසිද්ධ කිරීමට මෙන්ම විශේෂයෙන් අදාළ රාජ්‍ය පාර්ශවය සම්බන්ධ වන කරුණුද සමඟින් කමිටුවේ අදහස් සහ නිර්දේශ පිළිබඳව වන තොරතුරු වලට, වඩාත් සුදුසු සහ සක්‍රිය ක්‍රමවේද මගින් සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘති හරහා ආබාධ සහිත පුද්ගලයන්ද ඇතුළුව සියළුම වැඩිහිටියන් හා ළමුන් හට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය.

18 වන වගන්තිය
අත්සන් කිරීම, අපරානුමත කිරීම සහ ප්‍රවේශ වීම

1. ළමා සම්මුතිය හෝ ඒ හා සම්බන්ධව මුලින් නිකුත්ව ඇති වෛකල්පික ප්‍රකාශනයන් දෙකෙන් ඕනෑම එකක් අත්සන් කර ඇති රාජ්‍යයන් හට මෙම ප්‍රකාශනය අත්සන් කිරීම සඳහා විවෘත වේ.

2. මෙම ප්‍රකාශනය ළමා සම්මුතිය හෝ ඒ හා සම්බන්ධව මුලින් නිකුත්ව ඇති වෛකල්පික ප්‍රකාශනයන් දෙකෙන් ඕනෑම එකක් අපරානුමත කර හෝ ප්‍රවේශ වී ඇති රාජ්‍යයන් විසින් අපරානුමත කිරීමට යටත්වේ. එසේ සිදුකරනු ලබන අපරාඅනුමත කිරීම් සම්බන්ධ විධිමත් නිවේදනයන් එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ප්‍රකාශනය ළමා සම්මුතිය හෝ ඒ හා සම්බන්ධව මුලින් නිකුත්ව ඇති වෛකල්පික ප්‍රකාශනයන් දෙකෙන් ඕනෑම එකක් අපරානුමත කර හෝ ප්‍රවේශ වී ඇති රාජ්‍යයන් හට ප්‍රවේශ වීම සඳහා විවෘත වේ.

4. එසේ ප්‍රවේශ වීම බලාත්මක වීමට නම් ප්‍රවේශ වීමේ විධිමත් නිවේදනයක් එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

19 වන වගන්තිය
බලාත්මක වීම

1. රාජ්‍යයන් දහයකගෙන් අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදන ලැබීමෙන් මාස තුනකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත.

2. එසේ දසවන විධිමත් නිවේදනය ලැබීමෙන් පසුව මෙම ප්‍රකාශනය අපරානුමත කරන හෝ එයට ප්‍රවේශ වන සෑම රාජ්‍යයක් සඳහාම, එම රාජ්‍යය විසින් ප්‍රකාශනය අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදනය ලැබූ දිනෙන් මාස තුනකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත

20 වන වගන්තිය
බලාත්මක වීමෙන් පසු සිදුවන උල්ලංඝනය වීම්

1. මෙම ප්‍රකාශනය බලාත්මක වීමෙන් පසු ළමා සම්මුතිය හෝ ඊට අදළව මුලින් නිකුත්ව ඇති වෛකල්පික ප්‍රකාශනයන් දෙකෙහි දක්වා ඇති ඕනෑම අයිතිවාසිකමක් කිසියම් රාජ්‍ය පාර්ශවයක් විසින් උල්ලංඝනය කිරීමේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමේ පූර්ණ ශක්තතාව කමිටුව සතුය.

2. කිසියම් රාජ්‍යයක් මෙම ප්‍රකාශනය බලාත්මක වීමෙන් පසුව එහි පාර්ශවකරුවෙකු බවට පත් වන්නේ නම්, එම රාජ්‍යය විසින් වගකිවයුතු වන්නේ සහ කමිටුව විසින් සළකා බලනු ලබන්නේ අදාළ රාජ්‍යය සඳහා මෙම ප්‍රකාශනය බලාත්මක වීමෙන් පසුව සිදුකරනු ලබන ළමා සම්මුතියේ සහ/හෝ ඊට අදළව මුලින් නිකුත්ව ඇති වෛකල්පික ප්‍රකාශනයන් දෙකෙහි දක්වා ඇති අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධව පමණි.

21 වන වගන්තිය
සංශෝධන

1. ඕනෑම රාජ්‍ය පාර්ශවයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිතව යොමු කිරීම මඟින් මෙම ප්‍රකාශනයට කිසියම් සංශෝධනයක් යෝජනා කළ හැක. එවන් යෝජනාවක් ලද විට මහලේකම්වරයා විසින් එම යෝජිත සංශෝධනය පිළිබඳ අදාළ රාජ්‍ය පාර්ශවයන් වෙත දැනුම් දීමක් කරනු ඇති අතර, එහිදී එම යෝජනාව පිළිබඳ සලකා බලා තීරණය කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ගේ රැස්වීමක් පැවැත්වීම සම්බන්ධව සිය කැමත්ත සඳහන් කරන ලෙසද ඉල්ලා සිටිනු ඇත. එවන් දැනුම්දීමක් සිදුකර මාස හතරක් ඇතුළත, අවම වශයෙන් අදාළ රාජ්‍ය පාර්ශවයන්ගෙන් තුනෙන් එකක් එවැනි රැස්වීමකට කැමත්ත ප්‍රකාශ කර ඇත්නම්, මහලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ අනුග්‍රහයද සහිතව එවන් රැස්වීමක් කැඳවනු ඇත. එම රැස්වීමේදී ඒ සඳහා සහභාගී වූ සහ ඡන්දය ප්‍රකාශ කල රාජ්‍ය පාර්ශවයන්ගෙන් තුනෙන් දෙකක බහුතරය විසින් සම්මත කරන ලද ඕනෑම සංශෝධනයක් මහලේකම් වරයා විසින් අනුමැතිය සඳහා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇති අතර පසුව එය සියළු රාජ්‍ය පාර්ශවයන්ගේ එතඟත්වය සඳහා ඉදිරිපත් කරනු ඇත.

2. මෙම වගන්තියේ 1 වන ඡේදයට අනුව සම්මත කරගන්නා ලද සංශෝධනයක් එම සංශෝධනය සම්මත වන දිනෙන් පසු රාජ්‍ය පාර්ශවයන්ගෙන් ලැබෙන එකඟත්වය පළ කිරීමේ විධිමත් නිවේදන සංඛ්‍යාව සමස්ත රාජ්‍ය පාර්ශව සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට ළඟා වූ දින සිට දින තිහක් ගතවූ තැන්

සිට බලාත්මක වනු ඇත. එසේ බලාත්මක වීමෙන් පසුව, කිසියම් රාජ්‍යයක් විසින් එම සංශෝධනය සඳහා තම එකඟත්වය පළ කිරීමේ විධිමත් නිවේදන ලබා දුන් දින සිට දින තිහක් ගතවූ තැන් සිට අදාළ රාජ්‍යය සඳහා බලාත්මක වනු ඇත. කිසියම් සංශෝධනයක් බලපානු ලබන්නේ ඒ සඳහා එකඟත්වය පළකල රාජ්‍යයන් වෙත පමණි.

22 වන වගන්තිය
ප්‍රතික්ෂේප කිරීම

1. කිසියම් රාජ්‍යයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකර ඕනෑම අවස්ථාවකදී මෙම ප්‍රකාශනය ප්‍රතික්ෂේප කිරීම කල හැක. එවන් දැනුම්දීමක් මහලේකම්වරයා වෙත ලැබුණු දින සිට වසරක කාලයකට පසුව එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වනු ඇත.

2. කෙසේ වෙතත්, මෙම ප්‍රතික්ෂේප කිරීම එය බලාත්මක වන දිනට වන විට මෙම ප්‍රකාශනයේ 5 වන හෝ 12 වන වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද ඕනෑම සන්නිවේදනයකට හෝ 13 වැනි වගන්තිය යටතේ ආරම්භ කරන ලද ඕනෑම විමර්ශනයකට අදාළව මෙම ප්‍රකාශනයේ එන විධිවිධානයන් අඛණ්ඩව අදාළ කරගැනීම සඳහා කිසිදු බාධාවක් ඇති නොකල යුතුය.

23 වන වගන්තිය
භාරකාරීත්වය සහ මහලේකම් වරයා විසින් දැනුම් දීම්

1. මෙම ප්‍රකාශනයේ භාරකරු වන්නේ එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයායි.
2. මහලේකම්වරයා විසින් සියලුඑම රාජ්‍යයන් වෙත පහත සඳහන් කාරණා දැනුම් දෙනු ඇතː

(අ) මෙම ප්‍රකාශනය යටතේ සිදුවන අත්සන් කිරීම්, අපරානුමත කිරීම් සහ ප්‍රවේශ වීම් පිළිබඳ තොරතුරු

(ආ) මෙම ප්‍රකාශනය බලාත්මක වන දිනය සහ එහි 21 වන වගන්තිය යටතේ සිදුකරනු ලබන කිසියම් සංශෝධනයන් පිළිබඳ තොරතුරු;

(ඇ) මෙම ප්‍රකාශනයේ 22 වන වගන්තිය යටතේ සිදුකරනු ලබන කිසියම් ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ තොරතුරු.

24 වන වගන්තිය
භාෂා

1. මෙම ප්‍රකාශනයෙහි අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා වලින් වන ලියවිලි වලට සමාන පිළිගැනීමක් හිමි වන අතර ඒවා එක්සත් ජාතීන්ගේ ලේඛනාගාරයේ තැන්පත් කර තබනු ඇත.

2. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් සියඑම රාජ්‍යයන් වෙත මෙම ප්‍රකාශනයෙහි සහතික කළ පිටපත් යොමු කරනු ඇත.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව සන්නිවේදන ක්‍රියාපටිපාටියකදී බලපානු ලබන ළමා අයිතිවාසිකම් පිළිබඳ වන වෛකල්පිත සංධානය

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

2171 වෙළුම, A27531
(ඉංග්‍රීසි බසින් වන ලියවිල්ලකි)

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළව ළමුන් විකිනීම, ළමුන් ලිංගික වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම පිළිබඳ වන වෛකල්පිත සංධානය

මෙම ප්‍රකාශනය හා සම්බන්ධ රාජ්‍ය පාර්ශවයන් විසින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අරමුණු තවදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා මෙන්ම විශේෂයෙන් එහි 1, 11, 21, 32, 33, 34, 35 සහ 36 යන වගන්තිවල සඳහන්වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, ළමුන් විකිනීම, ලිංගික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම යන් ක්‍රියාවන්ගෙන් ළමුන්ව ආරක්ෂාවන බව සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය සලකමින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් ළමුන්ව ආර්ථික වශයෙන් සූරාකෑමට ලක්වීමෙන් සහ ළමයාට අනතුරුදායක වියහැකි හෝ ළමයාගේ අධ්‍යාපනයට බාධා කරන හෝ ළමයාගේ සෞඛ්‍යයට හෝ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හෝ සමාජීය සංවර්ධනයට අහිතකර විය හැකි ඕනෑම ක්‍රියාවකින් ආරක්ෂා වීමට දරුවාට ඇති අයිතිය පිළිගෙන ඇති බව ද සැලකිල්ලට ගනිමින්,

ළමුන් විකිණීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සම්බන්ධව ජාත්‍යන්තර වශයෙන් ඉතා සැලකිළිමත් විය යුතු මට්ටමින් සහ ක්‍රමයෙන් වැඩිවන ආකාරයෙන් සිදුවන සිදුවීම් පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වමින්,

ළමුන් විශේෂයෙන් අවදානමට ලක්විය හැකි මෙන්ම ළමුන් විකිනීම, ලිංගික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම යන කාරණා සෘජුවම ප්‍රවර්ධනය කරනු ලබන ලිංගිකත්වය හා බැඳුනු සංචාරක ව්‍යාපාරය පුළුල්ව පැතිර යාම සහ එහි අඛණ්ඩ භාවිතාවන් පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වමින්,

ගැහැණු ළමුන්ද ඇතුළුව විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ගණනාවක්ම ලිංගික සූරාකෑමට ලක්වීමේ වැඩි අවදානමකට ලක්ව ඇති බව මෙන්ම ලිංගික සූරාකෑමට ලක්වූවන් අතර ගැහැණු ළමයින්ගේ නියෝජනය අසමානුපාතික ලෙස වැඩි බව හඳුනා ගනිමින්,

අන්තර්ජාලය සහ අනෙකුත් විකාශනය වන තාක්ෂණයන් තුල ළමුන් ඇතුලත් වන කාමුක දර්ශන ප්‍රමාණය වර්ධනය වීම සැළකිල්ලට ගනිමින් සහ අන්තර්ජාලය තුල ඇති ළමා කාමුක දර්ශනවලට එරෙහිව සටන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (වියානා, 1999) සිහිපත් කරමින් සහ, විශේෂයෙන්ම එහි අවසන් නිගමනයක් වන ළමුන් ඇතුලත් කාමුක දර්ශන නිෂ්පාදනය, බෙදාහැරීම, අපනයනය, සම්ප්‍රේෂණය කිරීම, ආනයනය, හිතාමතා සන්තකයේ තබා ගැනීම සහ ප්‍රචාරණය කිරීම යන ක්‍රියාවන් ගෝලීය වශයෙන් බලපාන පරිදි සාපරාධී ක්‍රියාවන් බවට නම්කල යුතුය යන්න අවධාරණය කරමින් සහ මෙහිදී රජයන් සහ අන්තර්ජාල කර්මාන්තය අතර සමීප සහයෝගීතාවක් සහ හවුල්කාරිත්වයක් පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරමින්,

ළමුන් විකිනීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම තුරන් කරලීමේදී එම කාරණාවන් සඳහා පාදක වන මූල හේතුන් වන ඌන සංවර්ධිත බව,

දරිද්‍රතාවය, ආර්ථික විෂමතාවන්, අසමාන සමාජ ආර්ථික ව්‍යුහයන්, අකර්මන්‍ය වූ පවුල්, අධ්‍යාපනය නොමැතිකම, නාගරික-ග්‍රාමීය සංක්‍රමණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කොටගත් වෙනස්කොට සැළකීම්, වගකීම් විරහිත වැඩිහිටි ලිංගික හැසිරීම්, හානිකර සාම්ප්‍රදායික පිළිවෙත්, සන්නද්ධ ගැටුම් සහ ළමුන් ජාවාරම ආදි වශයෙන් වන සාධක ආමන්ත්‍රණය කරමින්, සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කිරීම එම පිටුදැකීමේ ක්‍රියාවලිය පහසු කරනු ඇතැයි විශ්වාස කරමින්,

ළමුන් විකිනීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සඳහා වන පාරිභෝගික ඉල්ලුම අඩු කිරීම සඳහා ඒ සම්බන්ධව නිසි පරිදි මහජනතාව දැනුවත් කිරීමේ උත්සාහයන් අවශ්‍ය බව විශ්වාස කරමින්, සහ එහිදී ගෝලීය වශයෙන් සියළු ක්‍රියාකාරී පාර්ශවයන් අතර හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමේ වැදගත්කම මෙන්ම ජාතික මට්ටමින් නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීමේ වැදගත්කමද විශ්වාස කරමින්,

රටවල් අතර ළමුන් දරුකමට හදා ගැනීම සම්බන්ධව ළමුන් ආරක්ෂා කිරීම සහ සහයෝගීතාව සඳහා වන හේග් සම්මුතිය, ජාත්‍යන්තර ළමා අපහරණය (පැහැරගැනීම) සම්බන්ධ සිවිල් නීතිමය කාරණා පිළිබඳ හේග් සම්මුතිය, අධිකරණ බලය පිළිබඳ හේග් සම්මුතිය, දෙමාපිය වගකීම සහ ළමුන් ආරක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධව බලපවත්නා නීතිය, පිළිගැනීම, එය බලාත්මක කිරීම මෙන්ම ඒ සඳහා වන සහයෝගීතාව සහ ළමා ශ්‍රමයේ අනර්ථකාමී ස්වරූපයෙන් තහනම් කිරීම සහ ඒවා පිටුදැකීම උදෙසා වන ක්ෂණික ක්‍රියාමාර්ග පිළිබඳ අංක 182 දරන ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතිය ඇතුළු ළමුන්ගේ ආරක්ෂාවට අදාළව තිබෙන ජාත්‍යන්තර නීතිමය මෙවළම්හි පවත්නා විධිවිධානයන් පිළිබඳ සටහන් කරමින්,

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට ලැබෙන්නාවූ අතිමහත් සහයෝගයෙන් දිරිමත් වෙමින්, සහ ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට සිය කැපවීම පුළුල් වශයෙන් පෙන්නුම් කරමින්.

ළමුන් විකිනීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම වැලැක්වීම සඳහා වූ ක්‍රියාකාරී වැඩසටහන, 1996 අගෝස්තු 27 සිට 31 දක්වා ස්ටොක්හෝම් හි පැවති වාණිජ වශයෙන් ළමුන්ව ලිංගික සූරාකෑමට ලක් කිරීමට එරෙහි ලෝක සම්මේලනයේ දී සම්මත කරන ලද ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශය සහ ඒ සඳහා වන න්‍යාය පත්‍රය මෙන්ම අනෙකුත් අදාළ ජාත්‍යන්තර සංවිධාන වලින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශයන්හි සඳහන් විධිවිධාන ක්‍රියාවට නැංවීමේ වැදගත්කම හඳුනා ගනිමින්,

ළමුන්ගේ ආරක්ෂාව සහ අවිරෝධී සංවර්ධනය සඳහා එක් එක් පුද්ගලයන් අනුගමනය කරන සම්ප්‍රදායන් සහ ඔවුන්ගේ සංස්කෘතික වටිනාකම් වල වැදගත්කම නිසි සැලකිල්ලට ලක් කරමින්, පහත එකඟතාවන්ට එළඹෙන ලදී:

1 වන වගන්තිය

රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම ප්‍රකාශනය මගින් දක්වා ඇති පරිදි, ළමුන් විකිනීම, ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම තහනම් කළ යුතුය.

2 වන වගන්තිය

මෙම ප්‍රකාශනයෙහි සඳහන් අරමුණු සහ කරුණු කාරණා සඳහා:

අ) ළමුන් විකිණීම යනු කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් ළමයකු කිසියම් ගෙවීමක් හෝ වෙනත් ආකාරයක වාසියක්/හුවමාරුවක් සඳහා වෙනත් පාර්ශවයක් වෙත ලබා දෙනු ලබන කිසියම් ක්‍රියාවක් හෝ ගනුදෙනුවකි;

ආ) ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම යනු කිසියම් ගෙවීමක් හෝ වෙනත් ආකාරයක වාසියක්/හුවමාරුවක් සඳහා දරුවෙකු ලිංගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමයි;
ඇ) ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම යනු ඕනෑම ආකාරයකින් සැබෑ හෝ නිර්මාණය කරන ලද ලිංගික ක්‍රියාකාරකමක නියැලී සිටින ළමයකුව නිරූපණය කිරීම හෝ මූලික වශයෙන් ලිංගික අරමුණු සඳහා ළමයකුගේ ලිංගික අවයවයක්/කොටසක් නිරූපණය කිරීමකි.

3 වන වගන්තිය

1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම අවම වශයෙන්, පහත සඳහන් වන ක්‍රියා සහ ක්‍රියාකාරකම් දේශීය වශයෙන් හෝ අන්තර්ජාතික වශයෙන්, නොඑසේ නම් තනි පුද්ගලයකු විසින් හෝ සංවිධානාත්මකව හෝ සිදු කරනු ලැබුවද, එම වැරදි තම රාජ්‍යයේ අපරාධ හෝ දණ්ඩ නීතිය යටතේ සම්පූර්ණයෙන්ම ආවරණය වන බවට සහතික කළ යුතුය:

(අ) 2 වන වගන්තියේ අර්ථ ගන්වා ඇති පරිදි ළමුන් විකිණීම සම්බන්ධ සන්දර්භය තුළ:

(i) පහත අරමුණු සඳහා කුමන ක්‍රමයකින් හෝ ළමයකු පිරිනැමීම, භාරදීම හෝ පිළිගැනීම:
- අ. ළමයා ලිංගිකව සූරාකෑමට ලක්කිරීමට;
- ආ. ලාභ අපේක්ෂාවෙන් ළමයාගේ අවයව හුවමාරු කිරීමට;
- ඇ. ළමයා බලහත්කාරයෙන් ශ්‍රමයේ යෙදවීමට;

(ii) ළමයකු දරුකමට හදා ගැනීමේ දී ඒ සඳහා වන අදාළ ජාත්‍යන්තර නීතිමය ලේඛනවලට පටහැනිව අතරමැදියෙකු ලෙස අනිසි ලෙස කැමැත්ත ඇති කිරීම;

(ආ) 2 වන වගන්තියේ අර්ථ ගන්වා ඇති පරිදි ළමා ලිංගික ශ්‍රමික වෘත්තිය සඳහා ළමයෙකු යෙදවීම, ලබා ගැනීම, මිලදී ගැනීම හෝ ලබා දීම;

(ඇ) 2 වන වගන්තියේ අර්ථ ගන්වා ඇති පරිදි එහි සඳහන් අරමුණු සඳහා ළමුන්ගේ අසභ්‍ය දර්ශන නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ව්‍යාප්ත කිරීම, ආනයනය, අපනයනය, පිරිනැමීම, විකිණීම හෝ සන්තකයේ තබා ගැනීම.

2. කිසියම් රාජ්‍ය පාර්ශවයක ජාතික නීතියේ විධිවිධානවලට යටත්ව, මෙම ඕනෑම ක්‍රියාවක් සිදුකිරීමට උත්සාහ කිරීම මෙන්ම මෙම ඕනෑම ක්‍රියාවකට හවුල් වීමට හෝ සහභාගී වීම සඳහාද එම නීතිය ඒ අයුරින්ම අදාළ විය යුතුය.

3. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම මෙම වැරදිවල බරපතල බව සැලකිල්ලට ගනිමින් එවාට සුදුසු දඬුවම් පැමිණවීමට කටයුතු කළ යුතුය.

4. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම තම ජාතික නීතියේ විධිවිධානයන්ට යටත්ව, මෙම වගන්තියේ 1 වන ඡේදයේ ස්ථාපිත කර ඇති වැරදි සඳහා නීති කටයුතු හා සම්බන්ධ පුද්ගලයින්ගේ වගකීම තහවුරු කිරීමට සුදුසු පරිදි පියවර ගත යුතුය. අදාළ රාජ්‍ය පාර්ශවයේ නෛතික මූලධර්මයන්ට අනුකූලව, නීති කටයුතු හා සම්බන්ධ පුද්ගලයින්ගේ මෙම වගකීම අපරාධමය, සිවිල් හෝ පරිපාලනමය වශයෙන් විය හැකිය.

5. රාජ්‍ය පාර්ශවයන් විසින්, ළමයින් දරුකමට හදා ගැනීමට සම්බන්ධ වන සියළුම පුද්ගලයින් අදාළ ජාත්‍යන්තර නීතිමය ලේඛනවලට අනුකූලව ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සියළුම නීතිමය සහ පරිපාලන ක්‍රියාමාර්ග ගත යුතුය.

4 වන වගන්තිය

1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම, මෙහි 3 වැනි වගන්තියේ, 1 වන ඡේදයේ සඳහන් වැරදි සම්බන්ධයෙන්, එම වැරදි තම භූමිය තුළ හෝ එම රාජ්‍යය යටතේ ලියාපදිංචි කර ඇති නෞකාවක්

හෝ ගුවන් යානයක් තුල සිදු කරන විටදීත්, තම අධිකරණ බලය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2. සෑම රාජ්‍ය පාර්ශවයකටම, මෙහි 3 වන වගන්තියේ 1 වන ඡේදයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන්, පහත සඳහන් අවස්ථාවන් හිදී, තම අධිකරණ බලය ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකියඃ

(අ) චෝදනා ලැබ සිටින වරදකරු තම රාජ්‍යයේ ජාතිකයෙකු හෝ තම රාජ්‍යයට අයත් භූමිය සිය පුරුදු පදිංචිය කොටගෙන ඇති පුද්ගලයෙකු වන විට;

(ආ) අදාළ වින්දිතයා තම රාජ්‍යයේ ජාතිකයෙකු වන විට.

3. එසේම, සෑම රාජ්‍ය පාර්ශවයකටම, ඉහත සඳහන් වන වැරදි වලදී ඒ සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින වරදකරු තම භූමියේ රැඳී සිටින විට එම වරද සිදු කර ඇති විට සහ ඔහු හෝ ඇය වෙනත් රාජ්‍ය පාර්ශවයක් වෙත එම රාජ්‍යයේ ජාතිකයෙකු විසින් සිදු කරන ලද වරදක් යන පදනම මත භාර නොදෙන අවස්ථාවකදී අවශ්‍ය පරිදි තම අධිකරණ බලය තහවුරු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත හැකිය.

4. මෙම ප්‍රකාශනය මගින් කිසිම් රාජ්‍යයක අභ්‍යන්තර නීතියට අනුකූලව ක්‍රියාත්මක වන කිසිදු අපරාධ අධිකරණ බලයක් බැහැර කරනු නොලබයි.

5 වන වගන්තිය

1. රාජ්‍ය පාර්ශවයන් අතර ඇනට පවත්නා සියළු උදර්පන ගිවිසුම් වලට මෙන්ම ඉදිරියේදී අදාළ පාර්ශවයන් අතර එකඟත්වයෙන් එළඹෙන උදර්පන ගිවිසුම් වලට, එම ගිවිසුම් මගින් නියම කර ඇති කොන්දේසි වලට අනුකූලව, මෙම ප්‍රකාශනයේ 3 වන වගන්තියේ, 1 වන ඡේදයේ දක්වා ඇති වැරදි, පිටුවහල් කළ හැකි වරදක් ලෙස ඇතුළත් කළ යුතුය.

2. උදර්පන ගිවිසුමක් සහිතව පුද්ගලයන් උදර්පනය කිරීම කොන්දේසිගත කර ඇති රාජ්‍ය පාර්ශවයකට එසේ උදර්පන ගිවිසුමක් නොමැති වෙනත් රාජ්‍ය පාර්ශවයක් විසින් උදර්පනය සඳහා ඉල්ලීමක් ලැබෙන අවස්ථාවක, මෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන් අදාළ පුද්ගලයාව අනෙක් රට වෙත භාර දීම සඳහා නීතිමය පදනමක් ලෙස මෙම ප්‍රකාශනය සලකා බැලිය හැක. එහිදී, මෙම උදර්පනය කිරීම එසේ ඉල්ලා සිටින රාජ්‍යයේ නීතිය මගින් සපයනු ලබන කොන්දේසි මත පදනම්ව සිදුවිය යුතුය.

3. උදර්පන ගිවිසුමක් මත පදනම්ව පුද්ගලයන් උදර්පනය කිරීම කොන්දේසිගත කර නොමැති රාජ්‍ය පාර්ශවයන්ට, එසේ උදර්පනය කිරීමක් ඉල්ලා සිටින නීතිය මගින් සපයනු ලබන කොන්දේසි මත පදනම්ව, එවැනි වැරදි උදර්පණය කළ හැකි වැරදි බවට තීරණය කල යුතුය.

4. එවැනි වැරදි සම්බන්ධව රාජ්‍ය පාර්ශ්වයන් අතර උදර්පනය කිරීමේදී, එම වැරදි සිදු වූ ස්ථානය මත පදනම්ව පමණක් නොව, මෙම ප්‍රකාශනයේ 4 වැනි වගන්තියට අනුව අදාළ රාජ්‍යයන්ගේ අධිකරණ බලය ස්ථාපිත කිරීමට අවශ්‍ය වන භූමි සීමාවන්ද පදනම්කොට ගෙන සලකා බැලිය යුතුය.

5. මෙම ප්‍රකාශනයේ 3 වන වගන්තියේ 1 වන ඡේදයේ විස්තර කර ඇති වරදක් සම්බන්ධයෙන් උදර්පනය කිරීමක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම් සහ එසේ ඉල්ලීමක් කරනු ලබන රාජ්‍ය පාර්ශවය වැරදිකරුගේ ජාතිකත්වය මත පදනම්ව එවන් උදර්පනය කිරීමක් සිදු නොකරන්නේ නම් හෝ එසේ කිරීමට බලාපොරොත්තු නොවන්නේ නම්, එම රාජ්‍යය විසින් ඒ සම්බන්ධව නඩු පැවරීමේ දී ඒ සඳහා නිසි හැකියාවක් සහිත බලයලත් පාර්ශවයක් වෙත එම කරුණ ඉදිරිපත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

6 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනයේ 3 වැනි වගන්තියේ 1 වන ඡේදයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයන් හෝ අපරාධ හෝ උදර්පන ක්‍රියාදාමයන් හීදී රාජ්‍ය පාර්ශ්වයන් විසින් අදාළ නඩු කටයුතු සඳහා අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම සඳහා සහාය දැක්වීම ද ඇතුළුව එකිනෙකා හට උපරිම වශයෙන් තම සහයෝගය ලබා දිය යුතුය.

2. රාජ්‍ය පාර්ශවයන් විසින් ඔවුන් අතර අන්‍යෝන්‍ය වශයෙන් නෛතික සහය ලබාදීම පිළිබඳ පැවතිය හැකි ඕනෑම ගිවිසුමකට හෝ වෙනත් විධිවිධානවලට අනුකූලව මෙම වගන්තියේ 1 වන ඡේදයේ සඳහන් පරිදි ඔවුන්ගේ වගකීම් ඉටු කළ යුතුය. එවන් ගිවිසුමක් හෝ විධිවිධානයන් නොමැති විට, රාජ්‍ය පාර්ශ්වයන් විසින් තම දේශීය නීතියට අනුකූලව එකිනෙකා වෙත උපකාර කළ යුතුය.

7 වන වගන්තිය

රාජ්‍ය පාර්ශවයන් විසින් තම ජාතික නීතියේ විධිවිධානයන්ට යටත් වඃ

(අ) පහත සඳහන් දේ පරිග්‍රහණය කිරීම සහ රාජසන්තක කිරීම සඳහා සුදුසු පියවර ගැනීමඃ
  (i) මෙම ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සිදු කිරීමට හෝ ඒ සඳහා පහසුකම් සැලසීමට භාවිතා කරන ලද ද්‍රව්‍ය, වත්කම් සහ වෙනත් උපකරණ ආදිය;
  (ii) එවැනි වැරදි ක්‍රියාවන් වලින් ලබාගත් ආදායම්;

(ආ) ඉහත (අ) (ස) උප ඡේදයේ දක්වා ඇති භාණ්ඩ හෝ ආදායම් පරිග්‍රහණය කිරීම සහ රාජසන්තක කිරීම සඳහා වෙනත් රාජ්‍ය පාර්ශවයකින් ඉල්ලා සිටීම;

(ඇ) එවන් වැරදි ක්‍රියාවන් සිදු කිරීමට භාවිතා කරන ලද පරිශ්‍රයන් තාවකාලිකව හෝ නිශ්චිත පදනමින් වසා දැමීම සඳහා වන පියවර ගැනීම. සිදුකල යුතුය.

8 වන වගන්තිය

1. අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම මෙම ප්‍රකාශනය යටතේ තහනම් කර ඇති වැරදිවල වින්දිතයන් බවට පත් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය, මෙහිදි විශේෂයෙන් පහත කරුණු සම්බන්ධව අවධානය යොමු කල යුතුයඃ

(අ) වින්දිතයන් බවට පත් වූ ළමුන්ගේ අවදානමට ලක් වීමට ඇති හැකියාව හඳුනා ගැනීම සහ සාක්ෂිකරුවන් ලෙස කටයුතු කිරීමේදී ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා ඇතුළුව ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රියා පටිපාටි යොදවා ගැනීම;

(ආ) වින්දිතයන් බවට පත් වූ ළමුන්ව ඔවුන්ගෙ අයිතිවාසිකම් පිළිබඳව, ඔවුන් සම්බන්ධවන නඩු කටයුතු වලදී ඔවුන් සතු කාර්යභාරය සහ විෂය පථය, නඩු කටයුතු සඳහා ගතවන කාලසීමාව සහ ඒවාහි ප්‍රගතිය මෙන්ම එම නඩුවල ස්වභාවය පිළිබඳව දැනුවත් කිරීම;

(ඇ) ජාතික නීතියේ ක්‍රියාපටිපාටීන්ට අනුකූල වන පරිදි, වින්දිතයන් බවට පත් වූ ළමුන්ගේ අදහස්, අවශ්‍යතා සහ ඕනෑකම් ඉදිරිපත් කිරීමට ඔවුන්ට ඉඩ ලබා දීම සහ ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතාවන්ට බලපාන ක්‍රියාදාමයන්හිදී ඒවා සලකා බැලීම;

(ඈ) නීතිමය ක්‍රියාවලිය පුරාවට වින්දිතයන් බවට පත් වූ ළමුන් හට සුදුසු උපකාර සේවා ලබා දීම;

(ඉ) වින්දිතයන් බවට පත් වූ ළමුන්ගේ පෞද්ගලිකත්වය සහ අනන්‍යතාවය සුදුසු පරිදි ආරක්ෂා කිරීම සහ වින්දිතයින්ගේ අනන්‍යතාව හඳුනා ගැනීමට තුඩු දිය හැකි පරිදි තොරතුරු නුසුදුසු ලෙස බෙදා හැරීම වැළැක්වීම සඳහා ජාතික නීතියට අනුකූලව අවශ්‍ය පියවර

ගැනීම;

(ඊ) සුදුසු අවස්ථාවන්හිදී වින්දිතයන් බවට පත් වූ ළමුන් හට මෙන්ම ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන් වෙනුවෙන් සාක්ෂි ලබාදෙන්නන් හට සිදුවන බිය ගැන්වීම් සහ පළිගැනීම් වලින් ආරක්ෂාව සැළසීම;

(උ) නඩු විභාග කිරීමේදී සහ වින්දිත ළමුන් හට වන්දි ලබා දීම සඳහා නියෝග ලබාදීම හෝ එම නියෝග ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම.

2. වින්දිතයාගේ සැබෑ වයස පිළිබඳ අවිනිශ්චිතතාවයක් වින්දිතයාගේ වයස තහවුරු කිරීම අරමුණු කරගත් පරීක්ෂණ ඇතුළුව අපරාධ පරීක්ෂණ ආරම්භ කිරීම වළක්වා නොගන්නා බවට රාජ්‍ය පාර්ශවයන් සහතික කළ යුතුය.

3. මෙම ප්‍රකාශනය මගින් විස්තර කර ඇති වැරදිවල වින්දිතයන් බවට පත් වූ ළමුන් හට අදාළ අපරාධ යුක්ති විනිශ්චයන් සිදුකිරීමේදී, එම ළමුන්ගේ යහපැවැත්ම ප්‍රධාන කොට සළකන බවට රාජ්‍ය පාර්ශවයන් සහතික කළ යුතුය.

4. මෙම ප්‍රකාශනය යටතේ තහනම් කර ඇති වැරදිවල වින්දිතයන් බවට පත් වූ පුද්ගලයන් සමඟ කටයුතු කරන පුද්ගලයින් සඳහා විශේෂයෙන් නීතිමය හා මනෝවිද්‍යාත්මක පුහුණුවද ඇතුලත්ව සුදුසු පුහුණු පහසුකම් ලබාදීම සහතික කිරීමට රාජ්‍ය පාර්ශවයන් විසින් පියවර ගත යුතුය.

5. එවන් වැරදිවල වින්දිතයන් බවට පත් වූ පුද්ගලයන්ව ආරක්ෂා කිරීම සහ/හෝ රැකවරණ සැළසීම සහ පුනරුත්ථාපනය කිරීම හා සම්බන්ධව කටයුතු කරන පුද්ගලයින්ගේ සහ/හෝ සංවිධානවල ආරක්ෂාව සහ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා සුදුසු අවස්ථාවන්හිදී අවශ්‍ය පියවර ගැනීමට රාජ්‍ය පාර්ශවයන් කටයුතු කල යුතුය.

6. සාධාරණ සහ අපක්ෂපාතී නඩු විභාගයක් තුල විත්තිකරුගේ අයිතිවාසිකම්වලට කිසියම් අගතියක් හෝ අනනුකූලතාවක් ඇතිවන ලෙස මෙම වගන්තියේ එන කිසිදු කරුණක් අර්ථ ගැන්විය යුතු නැත.

9 වන වගන්තිය

1. රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම ප්‍රකාශනයෙහි සඳහන් වන වැරදි ක්‍රියාවන් වැළැක්වීම සඳහා නීති රෙගුලාසි, පරිපාලන පියවර, සමාජීය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්මත කරගැනීම හෝ ශක්තිමත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාප්ත කිරීම සිදු කළ යුතුය. මෙහිදී විශේෂයෙන්ම එම වැරදි ක්‍රියාවන්හි වින්දිතයන් බවට පත්වීමේ අවධානමක් සහිත ළමුන් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.

2. රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම ප්‍රකාශනයෙහි සඳහන් වන වැරදි ක්‍රියාවන් වැලැක්වීම සඳහා වන පියව මෙන්ම ඒවාහි හානිකර බලපෑම් පිළිබඳව, සුදුසු පරිදි තොරතුරු බෙදා හැරීම මෙන්ම අධ්‍යාපනය සහ පුහුණුව මගින් ළමුන්ගේද ඇතුලත්ව පුළුල් වශයෙන් මහජනතාවගේ දැනුවත් භාවය ප්‍රවර්ධනය කළ යුතුය. මෙම වගන්තිය යටතේ ඔවුන් සතු වගකීම් ඉටු කිරීමේදී, රාජ්‍ය පාර්ශවයන් විසින් ජාත්‍යන්තර මට්ටමින්ද ඇතුළුව එවැනි තොරතුරු බෙදාහැරීම් මෙන්ම අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් වලදී ප්‍රජාවගේ, විශේෂයෙන් ළමුන්ගේ සහ ළමා වින්දිතයින්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම කළ යුතුය.

3. රාජ්‍ය පාර්ශවයන් විසින් එවැනි වැරදිවල වින්දිතයන් බවට පත් වූවන් හට ඔවුන්ව පූර්ණ වශයෙන් නැවත සමාජගත කිරීම මෙන්ම ඔවුන්ගේ පූර්ණ ශාරීරික හා මානසික ප්‍රකෘතිමත් බව ළඟාකර දීම ඇතුළුව අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම සහතික කිරීම සඳහා හැකි සියළු ක්‍රියාමාර්ග ගත යුතුය.

4. රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම ප්‍රකාශනයෙහි විස්තර කර ඇති වැරදිවල වින්දිතයන් බවට පත්වූ සියළුම ළමුන් හට කිසිදු වෙනස් කොට සැලකීමකින් තොරව නීත්‍යානුකූලව එම වැරදි සඳහා වගකිව යුතු අයගෙන් සිදුවූ හානි සඳහා වන්දි ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිසි ප්‍රවේශය ඇති බවට සහතික කළ යුතුය.

5. රාජ්‍ය පාර්ශවයන් විසින් මෙම ප්‍රකාශනයෙහි විස්තර කර ඇති වැරදි පිළිබඳ ප්‍රචාරණයක් ලබාදෙන දෑ නිෂ්පාදනය සහ බෙදා හැරීම ඵලදායී ලෙස තහනම් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

10 වන වගන්තිය

1. රාජ්‍ය පාර්ශවයන් විසින් ළමුන් විකිනීම, ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සහ ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය සම්බන්ධ ක්‍රියාවන් සඳහා වගකිව යුතු පුද්ගලයින් එම ක්‍රියාවන් වලින් වැළැක්වීම, ඔවුන්ව හඳුනා ගැනීම, විමර්ශනය, නඩු පැවරීම සහ දඬුවම් කිරීම යන කටයුතු සඳහා බහුපාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික විධිවිධාන මගින් ජාත්‍යන්තර සහයෝගීතාවය ශක්තිමත් කිරීමට අවශ්‍ය සියළු පියවර ගත යුතුය. එමෙන්ම, රාජ්‍ය පාර්ශවයන් විසින් තම රාජ්‍යය තුල ක්‍රියාත්මක බලයලත් ආයතන, ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ විවිධ බාහිර ජාත්‍යන්තර සංවිධාන අතර පවත්නා ජාත්‍යන්තර සහයෝගීතාව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහාද කටයුතු කල යුතුය.

2. රාජ්‍ය පාර්ශවයන් විසින් ළමා වින්දිතයින් හට ඔවුන්ගේ ශාරීරික හා මානසික ප්‍රකෘතිමත් භාවය ළඟාකරගැනීම, ඔවුන්ව නැවත සමාජගත කිරීම සහ යළි සිය රටට ගෙන්වා ගැනීම යන කාරණා සඳහා සහාය ලබාගැනීමේදී අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගීතාවය ප්‍රවර්ධනය කළ යුතුය.

3. රාජ්‍ය පාර්ශවයන් විසින් ළමුන් විකිනීම, ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම මෙන්ම ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය සම්බන්ධව ළමුන්ගේ අවදානම් සහගතබව වැඩිකිරීම සඳහා දායක වන දරිද්‍රතාවය සහ ඌන සංවර්ධිතභාවය වැනි මූල හේතූන් ආමන්ත්‍රනය කිරීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.

4. හැකියාව පවතින රාජ්‍ය පාර්ශවයන් විසින් දැනට පවත්නා බහුපාර්ශ්වික, කලාපීය, ද්විපාර්ශ්වික හෝ වෙනත් වැඩසටහන් හරහා මේ සඳහා අවශ්‍ය මූල්‍ය, තාක්ෂණික හෝ වෙනත් ආකාරයේ සහයෝගයන් ලබාදීමට කටයුතු කල යුතුය.

11 වන වගන්තිය

මෙම ප්‍රකාශනයෙහි සඳහන් කිසිවක් ළමුන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහාඃ

(අ) කිසියම් රාජ්‍ය පාර්ශවයක නීතියෙහි;
(ආ) එම රාජ්‍යය සඳහා බලාත්මක වන ජාත්‍යන්තර නීතියෙහි එන වඩාත් හිතකර වන ලෙස අඩංගු වී ඇති කිසිදු විධිවිධානයකට බලපෑමක් ඇති නොකරයි.

12 වන වගන්තිය

1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම, තම රාජ්‍යය සඳහා මෙම ප්‍රකාශනය බලාත්මක කිරීමෙන් වසර දෙකක් ඇතුළත, මෙම ප්‍රකාශනයේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් වාර්තාවක් ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

2. එම සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සම්මුතියේ 44 වැනි වගන්තියට අනුව, සෑම රාජ්‍ය පාර්ශවයක් විසින්ම තමන් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවලට මෙම ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන වැඩිදුර තොරතුරු ඇතුළත් කළ යුතුය. මෙම ප්‍රකාශනයට සම්බන්ධ වන අනෙකුත් රාජ්‍යයන් විසින් සෑම වසර පහකට වරක් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

3. එමෙන්ම, මෙම ප්‍රකාශනය ක්‍රියාවට නැංවීම සම්බන්ධ වැඩිදුර තොරතුරු ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය හැක.

13 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනය ළමා සම්මුතියේ පාර්ශවකරුවන් වන රාජ්‍යයන් හෝ එයට මේ වන විට අත්සන් කර ඇති රාජ්‍යයන් වෙත අත්සන් කිරීම සඳහා විවෘත වේ.

2. මෙම ප්‍රකාශනය අපරානුමත කිරීම අවශ්‍ය වන අතර ඕනෑම රාජ්‍යයකට මෙම ප්‍රකාශනය වෙත ප්‍රවේශ වීමට හැකියාව ද ඇත. එසේ සිදුකරනු ලබන අපරාඅනුමත කිරීම් හෝ ප්‍රවේශවීම් සම්බන්ධ තොරතුරු විධිමත් ලෙස එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

14 වන වගන්තිය

1. රාජ්‍යයන් දහයකගෙන් අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදන ලැබීමෙන් මාස තුනකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත.

2. මෙම ප්‍රකාශනය බලාත්මක වූ පසු, එය අපරානුමත කරන හෝ එයට ප්‍රවේශ වන සෑම රාජ්‍යයක් සඳහාම, එම රාජ්‍යය විසින් ප්‍රකාශනය අපරානුමත කිරීමේ හෝ ප්‍රවේශවීමේ විධිමත් නිවේදනය ලැබූ දිනෙන් මසකට පසුව සිට මෙම ප්‍රකාශනය බලාත්මක වනු ඇත

15 වන වගන්තිය

1. කිසියම් රාජ්‍යයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකර ඕනෑම අවස්ථාවකදී මෙම ප්‍රකාශනය ප්‍රතික්ෂේප කිරීම කල හැකි අතර, එහිදී මහලේකම් වරයා විසින් සම්මුතියෙහි පාර්ශවකරුවන් වන සහ එයට අත්සන් තබා ඇති සියලුම රාජ්‍යයන්ට ඒ බව දැනුම් දෙනු ඇත. එවන් දැනුම්දීමක් මහලේකම්වරයා වෙත ලැබුණු දින සිට වසරක කාලයකට පසුව එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වනු ඇත.

2. කෙසේ වෙතත් එවැනි ප්‍රතික්ෂේප කිරීමකදී, අදාළ රාජ්‍යය විසින් එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වන දිනට පෙර සිදුකරනු ලබන කිසියම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වත්මන් ප්‍රකාශනයෙහි සඳහන් වගකීම්වලින් නිදහස් කිරීමට බලපෑමක් ඇති නොකරනු ඇත. එසේම එම ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වන දිනට පෙර කමිටුව විසින් දැනටමත් සලකා බලමින් තිබූ යම් කරුණක් වේනම් එය අඛණ්ඩව සලකා බැලීම සම්බන්ධව කිසිදු අගතිගාමී බලපෑමක් ඇති කිරීමට එවන් ප්‍රතික්ෂේප කිරීමකට නොහැක.

16 වන වගන්තිය

1. ඕනෑම රාජ්‍ය පාර්ශවයකට එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා වෙත ලිඛිතව යොමු කිරීම මඟින් මෙම ප්‍රකාශනයට කිසියම් සංශෝධනයක් යෝජනා කළ හැක. එවන් යෝජනාවක් ලද විට මහලේකම්වරයා විසින් එම යෝජිත සංශෝධනය පිළිබඳ අදාළ රාජ්‍ය පාර්ශවයන් වෙත දැනුම් දීමක් කරනු ඇති අතර, එහිදී එම යෝජනාව පිළිබඳ සලකා බලා ඡන්ද විමසීමක් සිදුකිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ගේ සමුළුවක් පැවැත්වීම සම්බන්ධව සිය කැමත්ත සඳහන් කරන ලෙසද ඉල්ලා සිටිනු ඇත. එවන් දැනුම්දීමක් සිදුකර මාස හතරක් ඇතුළත, අවම වශයෙන් අදාළ රාජ්‍ය පාර්ශවයන්ගෙන් තුනෙන් එකක් එවැනි සමුළුවකට කැමත්ත ප්‍රකාශ කර ඇත්නම්, මහලේකම්වරයා විසින් එක්සත් ජාතීන්ගේ අනුග්‍රහයද සහිතව එවන් සමුළුවක් කැඳවනු ඇත. සමුළුවේදී ඒ සඳහා සහභාගී වූ රාජ්‍ය පාර්ශවයන් විසින් ඡන්දය ප්‍රකාශ කරන ලදුව, බහුතරය විසින් සම්මත කරන ලද ඕනෑම සංශෝධනයක් අනුමැතිය සඳහා මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.

2. මෙම වගන්තියේ 1 වන ඡේදයට අනුව සම්මත කරන ලද සංශෝධනයක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරන ලදුව රාජ්‍ය පාර්ශවයන්ගේ තුනෙන් දෙකක බහුතරයකින් අනුමත වූ විට එය බලාත්මක වනු ඇත.

3. කිසියම් සංශෝධනයක් එසේ බලාත්මක වන විට, එම සංශෝධනය පිළිගත් රාජ්‍ය පාර්ශවයන් ඒ හා බැඳෙනු ඇත, එසේම අනෙකුත් රාජ්‍ය පාර්ශවයන් මෙම ප්‍රකාශනයේ විධිවිධානවලට සහ ඔවුන් විසින් මෙයට පෙර පිළිගෙන ඇති සංශෝධනයන්ට බැඳී සිටිනු ඇත.

17 වන වගන්තිය

1. මෙම ප්‍රකාශනයෙහි අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා වලින් වන ලියවිලි වලට සමාන පිළිගැනීමක් හිමි වන අතර ඒවා එක්සත් ජාතීන්ගේ ලේඛනාගාරයේ තැන්පත් කර තබනු ඇත.

2. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් ළමා සම්මුතියේ පාර්ශවකරුවන් වන රාජ්‍යයන් සහ සම්මුතියට අත්සන් කර ඇති සියළුම රාජ්‍යයන් වෙත මෙම ප්‍රකාශනයෙහි සහතික කළ පිටපත් ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද ඒකාබද්ධ පස්වන සහ හය වන සාමයික වාර්තාවන් සම්බන්ධ අවසන් නිරීක්ෂණ

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

CRC/C/LKA/CO/5-6
එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

2018 මාර්තු 02
මුල් ලියවිල්ල ඉංග්‍රීසි භාෂාවෙනි
ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව

ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද ඒකාබද්ධ පස්වන සහ හය වන සාමයික වාර්තාවන් සම්බන්ධ අවසන් නිරීක්ෂණ.*

I.) හැඳින්වීම

1. කමිටුව විසින් 2018 ජනවාරි 15 සහ 16 වන දින පවත්වන ලද සිය 2254 වන සහ 2255 වන කමිටු රැස්වීම් වලදී (CRC/C/SR.2254 සහ 2255 බලන්න* ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ පස්වන සහ හය වන සාමයික වාර්තාවන් (CRC/C/LKA/5-6) සළකා බැලීමෙන් අනතුරුව 2018 පෙබරවාරි 02 වන දින පැවති 2282 වන කමිටු රැස්වීමේදී මෙම අවසන් නිරීක්ෂණ සම්මත කර ගන්නා ලදී.

2. ළමා අයිතිවාසිකම් සම්බන්ධව රට තුල පවත්නා තත්වය පිලිබඳ වඩාත් පැහැදිළි අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සළසා දෙමින් රජයේ පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ පස්වන සහ හය වන සාමයික වාර්තාවන් මෙන්ම පෙර මතුකරන ලද කරුණු වලට ලබාදුන් ලිඛිත ප්‍රතිචාරයන්ද (CRC/C/LKA/Q/5-6/Add.1) කමිටුව විසින් සාදරයෙන් පිළිගනු ලබයි. එමෙන්ම රජයේ පාර්ශවය නියෝජනය කළ බහු ආංශික නියෝජිත කණ්ඩායම සමග සිදුකරන ලද ධනාත්මක සංවාදය සම්බන්ධවද කමිටුවේ පැසසුම හිමි වේ.

II.) රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති අනුගාමී ක්‍රියාමාර්ග සහ අත්පත් කරගෙන ඇති ප්‍රගතිය

3. 2016 වසරේදී සිදුකරන ලද, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීම ඇතුළුව විවිධ ක්ෂේත්‍රයන්හිදී රාජ්‍ය පාර්ශවය විසින් අත්පත් කරගෙන ඇති ප්‍රගතිය සම්බන්ධව කමිටුව සිය ප්‍රසාදය පළකර සිටියි. එමෙන්ම, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020), ළමුන් සඳහා සමාජ ආරක්ෂණය සැළසීම පිළිබඳ ක්‍රියාකාරී සැළැස්ම (2016-2019) සහ ලිංගික ප්‍රචණ්ඩත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැළැස්ම ද ඇතුළුව සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා දායක වනු වස්, ගෙන ඇති ව්‍යවස්ථාදායක, ආයතනික සහ ප්‍රතිපත්තිමය පියවරයන් පිළිබඳව කමිටුවේ පැසසුම හිමිවේ. තවදුරටත්, මේ වන විට සංහිඳියාව ඇතිකරලීම උදෙසා රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති උත්සාහයන් මෙන්ම ළමා හා මාතෘ මරණ අවම කිරීම සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය ද කමිටුවේ අගය කිරීමට ලක්වේ.

III.) ප්‍රධාන වශයෙන් සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර සහ නිර්දේශයන්

4. සම්මුතියේ සඳහන් සියළුම අයිතිවාසිකම්වල ඇති එකිනෙකින් වෙන් කොට සැළකිය නොහැකි බව මෙන්ම එකිනෙක අතර පවත්නා අන්තර් සබඳතාව පිළිබඳව කමිටුව විසින් රාජ්‍ය පාර්ශවය වෙත නැවත මතක් කර දෙනු ලබන අතර මෙහි සඳහන් අවසන් නිරීක්ෂණවල අඩංගු සියළුම නිර්දේශවල ඇති වැදගත්කම ද අවධාරණය කර සිටියි. මෙහිදී, පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධව ඉදිරිපත් කර ඇති නිර්දේශ කෙරෙහි රාජ්‍ය පාර්ශවයේ අවධානය යොමු කරන අතර, ඒ සම්බන්ධයෙන් ඉක්මන් පියවර ගත යුතු බව කමිටුව අවධාරණය කර සිටියිඃ ශාරීරික වශයෙන් දඬුවම් කිරීමද ඇතුලත් වන ප්‍රචණ්ඩත්වය (21 ඡේදය), ලිංගික සූරාකෑම සහ අපයෝජනය (23 ඡේදය), ළමුන් ශ්‍රමිකයන් වශයෙන් යොදවා ගැනීමද ඇතුලත් ආර්ථික සූරාකෑම (41 ඡේදය), බාල වයස්කරුවන් සම්බන්ධව යුක්තිය පසිඳලීම (45 ඡේදය) සහ සංහිඳියාව, සත්‍යය සහ යුක්තිය පසිඳලීම (47 ඡේදය).

* කමිටුව විසින් සිය හැත්තෑ හත් වන සැසි වාරය (2018 ජනවාරි 14 සිට පෙබරවාරි 02 දක්වා) අතර තුර දී සම්මත කර ගන්නා ලදී

අ. අනුගමනය කළයුතු සාමාන්‍ය පියවර (වගන්ති අංක 4, 42 සහ 44 (6))

නීති සම්පාදනය

5. කමිටුව විසින් රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) සම්මුතියේ සඳහන් සියළුම මූලධර්ම සහ විධිවිධානයන් අධිකරණමය සහ පරිපාලනමය බලධාරීන් හට භාවිතයට ගත හැකි බව තහවුරු කරමින් සම්මුතියෙහි සඳහන් කරුණු ජාතික නීති පද්ධතිය වෙතට පරිවර්තනය කිරීම;

(ආ) ළමුන් සඳහා වන අධිකරණ ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කිරීම කඩිනම් කිරීම;

(ඇ) සියළුම ප්‍රාදේශීය හෝ සාම්ප්‍රදායික නීති ද ඇතුලත්ව දේශීය නීති පද්ධතිය සම්මුතියට අනුකූලව පවති බවට සහතික කිරීම.

පුළුල් ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

6. කමිටුව විසින් රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020) ක්‍රියාත්මක කිරීමට ගනුලබන පරිශ්‍රමයන් තීව්‍ර කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වන මානව, තාක්ෂණික සහ මූල්‍ය සම්පත් වෙන් කිරීම;

(ආ) ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය සම්මත කර ගැනීම, එය සම්මුතියට අනුකූල වන බවට සහතික කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් වෙන් කිරීම.

සම්බන්ධීකරණය

7. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්වාධීන ආයතනයක් වන බවටත්, එය වෙනත් ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවකට වඩා ඉහළ මට්ටමක් වෙත වාර්තා කරන බවටත්, ඕනෑම තත්වයක් යටතේ එහි කාර්යයන් සම්පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක කිරීමට හැකි වන බවටත් මෙන්ම ඒ සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන්කොට ඇති බවටත් රාජ්‍ය පාර්ශවය විසින් සහතික කළ යුතු බව කමිටුව නිර්දේශ කරයි.

සම්පත් වෙන් කිරීම

8. ළමා අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා වන රාජ්‍ය අයවැයකරණය සම්බන්ධව කමිටුවේ (2016) අංක 19 දරන සාමාන්‍ය නිර්දේශ අනුකූලව, කමිටුව රාජ්‍ය පාර්ශවය වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) වඩාත් අවාසි සහගත සහ අවදානමට ලක්විය හැකි තත්වයන්හි සිටින ළමුන් කෙරෙහි විශේෂ අමතර අවධානයක් යොමු කරමින්, ළමුන් සඳහා වන අයවැය අවශ්‍යතා පිළිබඳ පුළුල් තක්සේරුවක් සිදු කිරීම සහ ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා සම්මුතියේ 4 වන වගන්තියට අනුකූලව ප්‍රමාණවත් පරිදි අයවැය සම්පත් වෙන් කිරීම;

(ආ) විශේෂයෙන් සෞඛ්‍ය සහ අධ්‍යාපනය ආදී සමාජීය අංශ සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදනයන් වැඩි කිරීම, ළමා අයිතිවාසිකම් සම්බන්ධ දර්ශක මත පදනම්ව, පවත්නා විෂමතාවයන් ආමන්ත්‍රණය කිරීම සහ වඩාත් අවාසි සහගත හෝ අවදානමට ලක්විය හැකි තත්වයන් වල සිටින ළමුන් වෙනුවෙන්, අර්බුදකාරී අවස්ථා මෙන්ම ආපදා හෝ හදිසි අවස්ථාවන්හිදීද භාවිතයට ගත හැකිවන පරිදි ස්ථාවර අයවැය වෙන්කිරීම් නිර්වචනය කිරීම;

(ඇ) ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති සම්පත් නිසි අයුරින් බෙදී යාමේ ප්‍රමාණවත් බව මෙන්ම එහි කාර්යක්ෂමතාව සහ සාධාරණත්වය තක්සේරු කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ දූෂණය වැළැක්වීම මෙන්ම දූෂණ ක්‍රියාවන්ට එරෙහිව නඩු පැවරීම සඳහා වන ක්‍රියාමාර්ග වඩාත් ශක්තිමත් කිරීම.

දත්ත එක්රැස් කිරීම

9. කමිටුව මින් පෙර ඉදිරිපත් කර ඇති නිර්දේශ (CRC/C/LKA/CO/3-4) හි 21 වන ඡේදය බලන්න) නැවත අවධාරණය කරන අතර, විවිධ හවුල්කරුවන්ගේ ද සහායෝගය ඇතිව පුළුල් දත්ත රැස් කිරීමේ පද්ධතියක් පිහිටුවා ගන්නා ලෙස මෙන්ම ළමා අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට සහ සම්මුතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැලසුම් කිරීමට අවශ්‍ය සහායක පදනමක් සැපයෙන පරිදි, එකතු කරගන්නා දත්ත නිසි පරිදි විශ්ලේෂණය කිරීමට නිසි වැඩ පිළිවලක් සකස් කර ගන්නා ලෙසද රාජ්‍ය පාර්ශවය දිරිමත් කරයි. එමෙන්ම ජාතික දත්ත පද්ධතීන්හි ලියාපදිංචි වී ඇති සියළුම ළමුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කර එය ක්‍රියාත්මක කරන ලෙසද කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී.

ස්වාධීන පසුවිපරම

10. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ශක්තිමත් කිරීම මෙන්ම 2016-2019 සඳහා නව උපාය මාර්ගික ලේඛනයක් සකස් කිරීම කමිටුවේ පැසසුමට ලක් වන අතරම, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනවල කාර්යභාරය පිළිබඳ කමිටුවේ පොදු විවරණ අංක 2 (2002)ට අදාළව, පහත සඳහන් පරිශ්‍රමයන් රාජ්‍ය පාර්ශවය විසින් දිගින් දිගටම පවත්වා ගත යුතු බව කමිටුව නිර්දේශ කරයිඃ

(අ) මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව සඳහා වන ජාතික ආයතනවල ස්වභාවය සම්බන්ධ මූලධර්මවලට (පැරිස් මූලධර්ම) අනුකූලව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය සහතික කිරීම;

(ආ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය මානව, මූල්‍ය හා තාක්ෂණික සම්පත් වෙන් කිරීම;

(ඇ) ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය මෙන්ම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව, එම ආයතන මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ඇති පිළිගැනීම (ප්‍රතීතනය) සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඈ) ළමා අයිතිවාසිකම් නිරීක්ෂණය කිරීම සඳහා විශේෂිත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

ව්‍යාප්තිය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ පුහුණුව

11. කමිටුව විසින් රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) ළමා අයිතිවාසිකම්වල වැදගත්කම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ සම්මුතියේ සියළුම මූලධර්ම සහ විධිවිධාන සම්බන්ධව වැඩිහිටියන් සහ ළමුන් අතර පුළුල් දැනුමක් සහ අවබෝධයක් ඇති බව සහතික කිරීම සඳහා සියළු භාෂාවලින් සිදුකරන දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වැඩි කිරීම;

(ආ) අධිකරණ නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන සහ හමුදා නිලධාරීන්, ගුරුවරුන්, සෞඛ්‍ය සේවා නිලධාරීන්, සමාජ සේවකයින් සහ මාධ්‍යකරුවන් ඇතුළුව අදාළ වෘත්තික කණ්ඩායම් සඳහා සම්මුතිය මෙන්ම එහි වෛකල්පික ප්‍රකාශනයන් පිළිබඳ විශේෂිත පුහුණු සැසි පැවැත්වීම;

(ඇ) සමාජය තුළ ළමා අයිතිවාසිකම් සඳහා ඇති අඩු පිළිගැනීම මෙන්ම ළමා අයිතිවාසිකම් සම්බන්ධව කටයුතු කරන ක්‍රියාකාරීන් සංඛ්‍යාව අඩුවීම යන කරුණු ඉතා ප්‍රබල ලෙස ආමන්ත්‍රණය කිරීම.

සිවිල් සමාජය සමඟ සහයෝගීතාවය

12. ඇතැම් ක්ෂේත්‍රයන්හි රාජ්‍ය නොවන සංවිධාන (හයධි) සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම කමිටුව පැසසුමට ලක් කරන අතරම, වධහිංසාවන්ට එරෙහිව කමිටුව විසින් 2017 ඉදිරිපත් කර ඇති අවසන් නිරීක්ෂණ (AT/C/LKA/CO/5" ඡේද 39-40 බලන්න) සිහිපත් කරමින්, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා කටයුතු කරන ක්‍රියාකාරීන්හට ප්‍රජාතන්ත්‍රවාදී සමාජ මූලධර්මයන්ට අනුකූලව ඔවුන්ගේ කටයුතු ආරක්ෂිතව කරගෙන යා හැකි වන බව සහතික කරන ලෙසත්, එවන් ක්‍රියාකාරීන්ව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, බිය ගැන්වීම සහ හිරිහැර කිරීම ආදී සියළු සිදුවීම් සම්බන්ධව කඩිනමින් සහ ස්වාධීනව විමර්ශන කටයුතු සිදුකරන ලෙසත්, එවැනි අකටයුතුකම් සඳහා වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී.

ළමා අයිතිවාසිකම් සහ ව්‍යාපාර ක්ෂේත්‍රය

13. තේ වතු මෙන්ම ඉදිකිරීම්, ඇඟළුම් සහ සංචාරක කර්මාන්ත ඇතුළුව දේශීය හා විදේශීය වශයෙන් පුද්ගලික ව්‍යාපාර සහ කර්මාන්ත ආශ්‍රිතව ළමුන් හට අඛණ්ඩව සිදුවන ඍණාත්මක බලපෑම පිළිබඳව කනස්සල්ලෙන් යුතුව සඳහන් කරන කමිටුව, ව්‍යාපාර අංශය ළමා අයිතිවාසිකම් කෙරෙහි ඇති කරන බලපෑම සම්බන්ධයෙන් වන රාජ්‍ය වගකීම පිළිබඳ කමිටුවේ පොදු විවරණ අංක 16 (2013) සහ 2011 වසරේදී මානව හිමිකම් කවුන්සිලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර සහ මානව හිමිකම් සම්බන්ධ මාර්ගෝපදේශන මූලධර්ම පදනම් කර ගනිමින්, රාජ්‍ය පාර්ශවය වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) විශේෂයෙන් ළමා අයිතිවාසිකම්වලට අදාළ වන පරිදි, ව්‍යාපාරයන් නීත්‍යානුකූලව වගකිව යුතු බවත්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මානව හිමිකම්වලට අහිතකර ලෙස බල නොපාන බවත් හෝ පාරිසරික හා අනෙකුත් ප්‍රමිතීන් උල්ලංඝනය නොකරන බවත් තහවුරු වන පරිදි දේශීය හා විදේශීය ව්‍යාපාර සඳහා පැහැදිලි නියාමන රාමුවක් ස්ථාපිත කිරීම;

(ආ) සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගනිමින්, ප්‍රවාහන හා සංචාරක ක්ෂේත්‍රයන්හි ළමා ලිංගික සූරාකෑම වැළැක්වීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම සහ සංචාරක නියෝජිතයින් අතර සහ සමස්ත සංචාරක ක්ෂේත්‍රය තුල සංචාරක ක්ෂේත්‍රය සඳහා වන බුහුමන් ප්‍රඥප්තිය මෙන්ම ලෝක සංචාරක සංවිධානයේ ගෝලීය සංචාරක ආචාර ධර්ම සංග්‍රහය පුළුල් ලෙස ප්‍රචාරය කිරීම;

(ඇ) ප්‍රවාහන හා සංචාරක ක්ෂේත්‍රයේ ළමා ලිංගික සූරාකෑම් සිදුකරන අපරාධකරුවන් සහ අන්තර්ජාල වැටි රෑම් හරහා ළමා අපයෝජන සිදුකරන්නන් හඳුනා ගැනීමට මෙන්ම එසේ ප්‍රවාහන හා සංචාරක ක්ෂේත්‍රයේ ළමා ලිංගික සූරාකෑම් සිදුකරන අපරාධකරුවන් නීතිය හමුවට පැමිණුවීම සහතික කිරීම සඳහා අවශ්‍ය විමර්ශන සිදුකිරීමේ සහ පරිගණක සාක්ෂි රැස් කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳව පොලිසිය වෙත ලබාදෙන පුහුණු වැඩසටහන් ශක්තිමත් කිරීම. එමෙන්ම මෙහිදී ළමුන් ලිංගිකව අපයෝජනය කරවන සංචාරක ව්‍යාපාර වැළැක්වීම සහ තුරන් කිරීම උදෙසා අවශ්‍ය පරිදි බහුපාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික වශයෙන් අතිකර ගන්නා සබඳතා සහ ක්‍රමවේද හරහා ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කරගන්නා ලෙස ද රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී;

(ඈ) සිය ක්‍රියාකාරකම් හරහා සිදුවන පාරිසරික, සෞඛ්‍ය සහ මානව හිමිකම් ආශ්‍රිත බලපෑම් පිළිබඳ තක්සේරු අධ්‍යයනයන් සිදු කර ඒ පිළිබඳ තොරතුරු පොදු මහජනතාවට වෙත හෙළි කරන ලෙස සමාගම් වලින් ඉල්ලා සිටීම.

ආ. ළමයා යන්න අර්ථ දැක්වීම (1වන වගන්තිය)

14. ළමයා යන පදය සම්බන්ධව පුළුල් අර්ථ දැක්වීමක් ස්ථාපිත කර පූර්ණ වයස් සීමාව සම්බන්ධව පවත්නා නොගැලපීම් ඉවත් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවය විසින් අවශ්‍ය නීතිමය සංශෝධනයන් සිදු කළ යුතු බවත්, එහිදී සෑම නීති කෙටුම්පතකම එම වයස් සීමාව අවුරුදු 18 දක්වා ඉහළ නැංවිය යුතු අතර ඒ සම්බන්ධව කිසිදු ව්‍යතිරේකයකට ඉඩක් නොතැබිය යුතු බවත් කමිටුව නිර්දේශ කරයි.

15. මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ, වයස අවුරුදු 12 ට අඩු ගැහැණු ළමයින් ක්වාසිවරයෙකුගේ (පවුල් කටයුතු සම්බන්ධයෙන් තීරණ ලබාදෙන මුස්ලිම් විනිසුරුවරයෙකුගේ) අවසරය ඇතිව විවාහ කර ගත හැකි බවට සඳහන්ව අති බව පෙන්වා දෙන කමිටුව, කිසිදු ව්‍යතිරේකයකින් තොරව, සියළු දෙනාගේම විවාහ වීමේ අවම වයස අවුරුදු 18 දක්වා වැඩි කිරීම ඉතා කඩිනම්ව සිදුකරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඇඩිව ඉල්ලා සිටී. මේ සම්බන්ධව පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම ද මෙයට ඇතුලත් වේ.

ඇ. පොදු මූලධර්ම (2, 3, 6, සහ 12 වන වගන්ති)
වෙනස්කොට නොසැළකීම

16. වැඩිහිටියන්ට සාපේක්ෂව ළමුන්ව පහත් කොට සැළකීමේ මතය වෙනස් කරලීම සඳහා මෙන්ම ළමුන්ව අයිතිවාසිකම් දරන්නන් වශයෙන් පිළිගැනීම ප්‍රචලිත කිරීම සඳහා වැඩිහිටියන් සහ ළමුන් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී. එමෙන්ම, රාජ්‍ය පාර්ශවය විසින් පහත සඳහන් පියවරයන් ගත යුතු බවද කමිටුව නිර්දේශ කරයිඃ

(අ) නීතියේ සහ එහි භාවිතවේදී කිසිදු ආකාරයක වෙනස් කොට සැළකීමක් සිදු නොවන බව සම්පූර්ණයෙන්ම සහතික කිරීම සඳහා, දේශීය නීති පද්ධතියට වෙනස්කොට නොසැළකීමේ මූලධර්මය ඇතුළත් කිරීම මගින් සහ නීති පද්ධතියේ අවශ්‍ය ගැඹුරු සංශෝධනයන් සිදු කිරීම මගින් එය සම්මුතියේ 2 වන වගන්තියට අනුකුල වන බවට සහතික කිරීම;

(ආ) ගැහැණු ළමුන්, වාර්ගික හෝ වාර්ගික-ආගමික හෝ ආදිවාසී සුළුතර කණ්ඩායම්වලට අයත් ළමුන්, කුලය පදනම්ව වෙනස් කොට සැළකීම් වලට ලක් වූ ළමුන්, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ළමුන්, සරණාගත සහ අභ්‍යන්තරිකව අවතැන් වූ ළමුන්, වීදිවල ජීවත්වන ළමුන්, විදෙස්ගත සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ දරුවන්, ආයතනික රැකවරණය ලබන ළමුන්, ආබාධ සහිත ළමුන් සහ ස්ත්‍රී ලිංගික, පුරුෂ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්තික ලිංගික සහ අන්තර්ලිංගික ළමුන් ද ඇතුළුව ආන්තික හෝ අවදානමට ලක්විය හැකි තත්වයන්හි සිටින ළමුන්ට එරෙහිව සිදුවන සෑම ආකාරයකම වෙනස්කොට සැළකීම් පිටුදැකීම සඳහා අවශ්‍ය ස්ථිරසාර සමාජීය ක්‍රියාමාර්ගද අ ැ තු ු ල ත් නිශ්චිත සහ නිසි පරිදි ඉලක්කගත ක්‍රියාමාර්ග වලින් සමන්විත වන පූර්වගාමී සහ සවිස්තරාත්මක උපාය මාර්ගයක් සකස් කිරීම කිරීම;

(ඇ) කැමැත්ත සහිතව සමලිංගිකයන් අතර සිදුවන ලිංගික ක්‍රියාකාරකම් සාපරාධී නොවන බවට පත් කිරීම, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් සංක්‍රාන්තික ලිංගික දරුවන් හට සිදුකරන හිරිහැර තහනම් කිරීම මෙන්ම ස්ත්‍රී සමලිංගික, පුරුෂ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්තික ලිංගික සහ අන්තර්ලිංගික ළමුන්ව ලිංගිකව අපයෝජනය කරන්නන් ඇතුළු ඔවුන් වෙත ප්‍රචණ්ඩත්වය මුදා හරින අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවීම ආදී ක්‍රියාකාරකම් මගින් ස්ත්‍රී සමලිංගික, පුරුෂ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්තික ලිංගික සහ අන්තර්ලිංගික ළමුන්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැළකීම් පිටු දැකීමට කටයුතු කිරීම;

(ඈ) මුස්ලිම් නීතිය මගින් ආවරණය වන ගැහැණු ළමුන් හට, පාරම්පරික උරුමයට ඇති අයිතිය ද ඇතුලත්ව පිරිමි ළමුන් හා සමාන අයිතිවාසිකම් ලැබෙන බව සහතික කිරීම;

(ඉ) අවාසි සහගත සහ ආන්තික තත්ත්වයන් යටතේ සිටින ළමුන් ද ඇතුළුව සමස්තයක් ලෙස ළමුන් හට වෙනස් කොට සැලකීමේ ආකල්ප සහ ක්‍රියාකාරකම් වලට එරෙහි වීම මෙන්ම ඒවා ධනාත්මක ලෙස වෙනස් කිරීම සඳහා ජනමාධ්‍ය, සමාජීය ජාලයන් මෙන්ම ප්‍රජා සහ ආගමික නායකයින්ගේද සහයෝගය සහිතව ක්‍රමවත් වැඩසටහන් දියත් කර විවධ ප්‍රජාවන් සහ සමස්ත මහජනතාව බලමුළු ගැන්වීම;

(ඊ) සියළුම වයස් කාණ්ඩ ආවරණය වන පරිදි පාසල් අනිවාර්ය විෂය මාලාව තුලට වෙනස් කොට නොසැළකීම සහ සමානාත්මතාවය යන මාතෘකා ඇතුළත් කර, ඒ අනුව අදාළ ඉගැන්නුම් උපකාරක අනුවර්තනය කිරීම සහ නිරන්තර ගුරු පුහුණු ලබාදීම.

ජීවත්වීම, පැවැත්ම සහ සංවර්ධනය සඳහා වන අයිතිය

17. රාජ්‍ය පාර්ශවය විසින් කරගෙන යනු ලබන බිම් බෝම්බ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ බෝම්බ හේතුවෙන් වින්දිතයින් බවට පත් ළමුන් සඳහා වන සහාය සහ පුනරුත්ථාපන සේවාවන් අඛණ්ඩව තීව්‍ර කරන ලෙස කමිටුව ඉල්ලා සිටියි.

ළමුන්ගේ අදහස් වලට ගරු කිරීම

18. ළමුන්හට අන් අය විසින් තමාට ඇහුම් කන් දීමට ඇති අයිතිය පිළිබඳ කමිටුවේ පොදු විවරණ අංක 12 (2009) පිළිබඳ යලි සිහිපත් කරමින් සහ මෙම අයිතිය ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කනස්සල්ල පළ කරමින්, අදාළ සියළුම නීති ප්‍රතිපාදනයන්හිදී ළමුන්හට අන් අය විසින් තමාට සවන් දීමට ඇති අයිතිය නිසි ලෙස ඇතුළත් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවය වෙත නිර්දේශ කරයි. ළමුන්ට බලපාන සියළුම අධිකරණ සහ පරිපාලන කටයුතුවලදී මෙන්ම පවුල, පාසල සහ ප්‍රජාව තුළ මෙම අයිතිය තහවුරු වීම අඛණ්ඩව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අදාළ වෘත්තිකයන්ව පුහුණු කිරීමේ මෙන්ම අවශ්‍ය දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය පාර්ශවය විසින් ගත යුතුය.

ඈ. සිවිල් අයිතිවාසිකම් සහ නිදහස (7, 8, සහ 13-17 දක්වා වගන්ති)

උපත් ලියාපදිංචිය/නම සහ ජාතිකත්වය

19. රට තුල උපත් ලියාපදිංචි කිරීමේ ඉහළ අනුපාතයක් තිබියදීත්, ඇතැම් ආන්තික කණ්ඩායම් වල සැලකිය යුතු උපත් සංඛ්‍යාවක් තවමත් ලියාපදිංචි නොවී පවතී. උපත් ලියාපදිංචි කිරීම ඇතුළුව සැමට නෛතික අනන්‍යතාවයක් ලබා දීම සම්බන්ධව තිරසාර සංවර්ධන ඉලක්කවල ඇති 16.9 වන ඉලක්කය සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය පාර්ශවය විසින් විශේෂයෙන් ලබාදී ඇති කාල සීමාවන් තුළ ලියාපදිංචි නොවූ ළමුන්ව ඉලක්ක කර ගනිමින් උපත් ලියාපදිංචි කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය තවදුරටත් ඉහළ නැංවීම මෙන්ම ජංගම ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරීම ද ඇතුලත්ව ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය සරළ කිරීම සිදු කරන ලෙස කමිටුව නිර්දේශ කරයි,

කණ්ඩායම්ගත වීමේ නිදහස

20. ළමා අයිතිවාසිකම් ප්‍රමිතීන්ට අනුකුල වන ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කරන ලෙසත්, විශේෂයෙන් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලට සම්බන්ධ බවට සැක කෙරෙන ළමුන් හට එකිනෙකා ඇසුරු කිරීමට හා කණ්ඩායම්ගත වීමට ඇති නිදහස සීමා කිරීම සඳහා මෙම නීති මෙවලම භාවිතා කිරීමෙන් වැළකී සිටින ලෙසත් කමිටුව රාජ්‍ය පාර්ශවය වෙත නිර්දේශ කරයි.

ඉ. ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය (19, 24(3), 28(2), 34, 37(අ), සහ 39 වන වගන්ති)
ශාරීරික දඬුවම් පැමිනුවීම ඇතුළු ප්‍රචණ්ඩත්වය

21. 2017 නොවැම්බර් මාසයේ සිදුකල සාමයික විශ්වීය සමාලෝචනයේදී නිකුත් කරන ලද පරිදි, සියලුම අවස්ථාවන් සහ ව්‍යුහයක් තුල ශාරීරික දඬුවම් පැමිණවීම තහනම් කළ යුතු බවට වන නිර්දේශය රාජ්‍යය පාර්ශවය විසින් පිළිගැනීම කමිටුව පැසසුමින් යුතුව සඳහන් කරන අතරම, විශාල ළමුන්සංඛ්‍යාවක් තව දුරටත් ශාරීරික දඬුවම් පැමිණවීමද ඇතුළත්ව අපයෝජනයට හා ප්‍රචණ්ඩත්වය ලක්වන බවත්, මෙහිදී නිවසේදී, විකල්ප රැකවරණ මධ්‍යස්ථාන/ව්‍යුහයන් තුල, දඬුවම් ලබාදෙන ආයතන වල මෙන්ම පාසල්වල ශාරීරික දඬුවම් තවදුරටත් නීත්‍යානුකූල බවට පිළිගැනෙන බවත් ඇඩි

කනස්සල්ලෙන් යුතුව දන්වා සිටී.

22. කමිටුව, එය විසින් මින් පෙර ලබාදී නිර්දේශ සිහිපත් කරමින් (CRC/C/LKA/CO/3-4. 41 ඡේදය, සහ CRC/C/15/Add.207, 29 ඡේදය බලන්න), සහ ශාරීරික දඬුවම් සහ අනෙකුත් කුරිරු හෝ පහත් ආකාරයේ දඬුවම් වලින් ආරක්ෂා වීමට ළමුන්ට ඇති අයිතිය පිළිබඳ කමිටුවේ පොදු විවරණ අංක 8 (2006) මෙන්ම සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස් වීමට ළමුන්ට ඇති අයිතිය පිළිබඳ පොදු විවරණ අංක 13 (2011) වෙත අවධානය යොමු කරමින් සහ අපයෝජනය, සූරාකෑම, ජාවාරම සහ ළමුන්ට එරෙහි සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වය සහ වධහිංසා පැමිණවීම් තුරන් කරලීම පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්කවල 16.2 වන ඉලක්කය සැලකිල්ලට ගනිමින්, ළමුන්ට එරෙහි සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටින අතර පහත නිර්දේශයන් ද ඉදිරිපත් කරයි:

(අ) ශාරීරික දඬුවම් පැමිණුවීම, එය කොතරම් සැහැල්ළු වුවත්, සියළු ව්‍යුහයන් හා සැකසුම් වලදී, එය භාවිතා කිරීම සම්බන්ධව පැවතිය හැකි ඕනෑම නීතිමය ආරක්ෂාවක් අවලංගු කරමින්, තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව නීතියෙන් නිසැක වශයෙන්ම තහනම් කිරීම මෙන්ම, එහිදී එම නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවටත් ඒවා උල්ලංඝනය කිරීමක් සිදු වූ අවස්ථාවකදී අදාළ නීතිමය ක්‍රියාමාර්ග නිසි පරිදි ආරම්භ කර පවත්වාගෙන යන බවටත් සහතික කිරීම;

(ආ) ගෘහස්ථ ළමා අපයෝජනයන් සම්බන්ධ නීති කටයුතු ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත යටතේ ඉදිරියට ගෙන යාමට අදාළ ධාරිතාව වර්ධනයද ඇතුලත්ව, ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නීති කටයුතු නිසි පරිදි හැසිරවීම සඳහා, විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, සෞඛ්‍ය නිලධාරීන්, සමාජ සේවකයින් සහ ක්වාසි වරුන්ද ඇතුලත්ව අධිකරණ නිලධාරීන් යනාදී වශයෙන් වන අදාළ වෘත්තික කණ්ඩායම්වල ධාරිතාව වර්ධනය කිරීම;

(ඇ) ශාරීරික දඬුවම් පැමිනුවීමේ ඇති හානිකර බලපෑම් පිළිබඳව ළමුන්, පවුල්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ ආගමික නායකයින් සම්බන්ධ කර ගනිමින් තිරසාර මහජන අධ්‍යාපන, දැනුවත් කිරීමේ සහ සමාජ බලමුළු ගැන්වීමේ වැඩසටහන් හඳුන්වා දීම. මෙහිදී මෙම පිළිවෙත සම්බන්ධව පවත්නා පොදු ආකල්පය වෙනස් කිරීම, අදාළ වැළැක්වීමේ උපාය මාර්ග සැලසුම් කිරීමේදී ළමුන්ගේ සහභාගීත්වය සහතික කිරීම මෙන්ම ශාරීරික දඬුවම්වලට විකල්පයක් වශයෙන් වඩාත් ධනාත්මක, අවිහිංසාවාදී, සහභාගීත්ව ප්‍රවේශයකින් දරුවන් ඇති දැඩි කිරීමේ සහ ඔවුන් විනයගරුක කරවීමේ ක්‍රමවේදප්‍රවර්ධනය කිරීම සම්බන්ධව සළකා බැළිය යුතුය;

(ඈ) සියළුම රැඳවුම් මධ්‍යස්ථානවල ළමුන්ගේ තත්ත්වය නිතිපතා නිරීක්ෂණයට ලක් කිරීම, ළමුන් හට තමන් රැඳවුම් භාරයේ සිටින විට සිදු වන වධහිංසා හෝ අනිසි සැළකිලි පිළිබඳව රහසිගත ලෙස පැමිණිලි කළ හැකි වන පරිදි බන්ධනාගාර, පොලිස් ස්ථාන සහ රිමාන්ඩ් නිවාසවල සංවෘත පැමිණිලි පෙට්ටි සවි කිරීම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පොලිස් ස්ථාන සහ රැඳවුම් මධ්‍යස්ථානයන් වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඇති හැකියාව සහතික කිරීම;

(ඉ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 සිට) ක්‍රියාත්මක කිරීමට ගන්නා පරිශ්‍රමයන් සඳහා අවශ්‍ය සියළු සම්පත් වෙන් කිරීම සහ උපකාරක දුරකථන මාර්ග හරහා ළමා අපයෝජන සිද්ධීන් වාර්තා වන විට ඒ සම්බන්ධව කාර්යක්ෂම පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.

ලිංගික සූරාකෑම සහ අපයෝජනය.

23. ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනයට එරෙහිව සටන් කිරීමට ගෙන ඇති උත්සාහයන් ධනාත්මකව නිරීක්ෂණය කළද, කමිටුව පහත සඳහන් කරුණු පිළිබඳව සිය දැඩි කනස්සල්ල පලකර සිටී:

(අ) විකල්ප රැකවරණ මධ්‍යස්ථාන, ආගමික ආයතන, ප්‍රජාව මෙන්ම නිවෙස් යනාදී ස්ථානයන් වලදී, ළමුන් ලිංගික ශ්‍රමික වෘත්තිය සඳහා යොදවා ගැනීම මෙන්ම මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනය, ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීමද ඇතුළුව ළමා

ලිංගික සූරාකෑම සහ අපයෝජන හා සම්බන්ධ සිද්ධීන් ඉහළ සංඛ්‍යාවක් වාර්තා වන අතර, එහිදීඑවන් වැරදි සඳහා නිසි දඬුවම් නොලැබීමේ වාතාවරණයක් පැවතීමද ඒ සඳහා බලපාන බැව්පෙනී යයි;

(ආ) පිරිමින් දූෂණයට ලක් වීම සම්බන්ධව නීතිමය පිළිගැනීමක් නොමැති වීම සහ සමලිංගික ක්‍රියාවකට සම්බන්ධ වීම නිසා අපකීර්තියට පත් වනු ඇති බවට හෝ අපරාධයකට සම්බන්ධ යැයි සළකනු ඇති බවට වන බිය සහ වැරදි පිළිගැනීමක් වන ඒ සම්බන්ධව දැන ගැනීම නිසා සිය ත්වය නැතිවීම" සිදු වේ යයි වන ලැජ්ජාව හේතුවෙන් පිරිමි ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන අඩුවෙන් වාර්තා කිරීම;

(ඇ) ළමා ලිංගික අපයෝජන සම්බන්ධ සිද්ධින් වලදී නඩු කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත වීම නිසා අදාළ වින්දිතයන් යළි යළිත් වින්දිතයන් බවට පත් වීම සහ ලිංගික සූරාකෑම සහ අපයෝජනයට ලක් වූ ළමා වින්දිතයින් හට ලැබිය යුතු මූලික නීතිමය ඇපවීම්/රැකවරණය නොමැතිවීම සහ ඒ සම්බන්ධව නිසි ක්‍රියා පටිපාටියකට ප්‍රවේශය නොමැතිකම;

(ඈ) හයිටියේ එක්සත් ජාතීන්ගේ ස්ථායිකරණ (මිනුස්ටා -MINUSTAH) මෙහෙයුමේ එක් කොටසක් ලෙස යොදවා ඇති ශ්‍රී ලංකා හමුදා හට පිරිස්වල සාමාජිකයින් ළමුන් ලිංගිකව අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදකරුවන් බවට පත් වීමේ අනුපාතය අඩු වීම.

24. ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීමද ඇතුළුව, ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනය වැළැක්වීම සඳහා මෙන්ම ළමා වින්දිතයින්ගේ සුවපත් භාවය ළඟාකර දීම සහ ඔවුන්ව නැවත සමාජගත කිරීම නිසි පරිදි ප්‍රවර්ධනය කිරීම සඳහා, ළමුන් අවදානමට ලක් කරන මූලික හේතූන් ද සැලකිල්ලට ගනිමින්, ඵලදායී හා පුළුල් ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටින අතර තවදුරටත් රාජ්‍ය පාර්ශවයෙන් මෙලෙස ඉල්ලා සිටියි:

(අ) ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම අපරාධයක් බවට සලකන ලෙස නීති ශක්තිමත් කිරීම මෙන්ම 2007 පරිගණක අපරාධ පනත යටතේ එය අපරාධයක් බවට පත්කරන බව තහවුරු කිරීම;

(ආ) පිරිමි ළමුන්ට එරෙහි ව්‍යවස්ථාපිත දූෂණය අපරාධයක් ලෙස සැලකීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තිය සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගැනීම සහ පිරිමි ළමුන්ට සිදුවන දූෂණයන් වාර්තා කිරීම දිරිමත් කිරීම සඳහා මහා පරිමාණ දැනුවත් කිරීමේ පියවර ගැනීම මෙන්ම ඒ ආශ්‍රිතව පවත්නා තමා අපකීර්තිය පත් වේ යයි ඇති අනියත බිය තුරන් කිරීමට කටයුතු කිරීම සහ එවැනි උල්ලංඝනයන් වාර්තා කිරීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි, රහසිගත, ළමා හිතකාමී සහ ඵලදායී මාර්ග ඇති බව සහතික කිරීම;

(ඇ) දෙමාපියන්, දරුවන් මෙන්ම ප්‍රජා සාමාජිකයින්ව ඉලක්ක කර ගනිමින් ළමා ගණිකා වෘත්තිය ඇතුළු ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජන වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන් සහ විශේෂිත ප්‍රයත්නයන් දියත් කිරීම;

(ඈ) ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑම් සම්බන්ධ පැමිණිලි ක්‍රමානුකූලව හා කාලෝචිත ලෙස විමර්ශනය කිරීම සහතික කිරීම, එහිදී සිදුවියහැකි පළිගැනීමේ ක්‍රියාවන්ගෙන් වින්දිතයින්ව ආරක්ෂා කිරීම සහ ළමා ලිංගික අපයෝජන සහ සූරාකෑමේ නඩු වලදී සංවෘත අධිකරණ ක්‍රියාමාර්ග භාවිතා කිරීම ආදී ක්‍රියාමාර්ගද ඇතුලත්ව ළමා වින්දිතයින්ගේ රහස්‍යභාවය සුරැකීම පිළිබඳ පූර්ණ සැළකිලිමත් භාවය සහතික කිරීම සහ අදාළ වැරදිකරුවන්ව නීතිය හමුවට පමුණුවීම;

(ඉ) මිනුස්ටා (MINUSTAH) මෙහෙයුමෙහි සේවය කරන අතරතුර ළමුන් ලිංගිකව අපයෝජනයට සහ සූරාකෑමට ලක් කළ සන්නද්ධ හමුදා සාමාජිකයින්ව කඩිනමින් යුක්තිය ඉදිරියට පැමිනුවීමට කටයුතු කිරීම මෙන්ම එම ළමා වින්දිතයින් හට අදාළ වන්දි ලබා දීම සහතික කිරීම.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

25. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020), පොලිස් ස්ථාන සැහෙන ප්‍රමාණයක කාන්තා හා ළමා ඒකක පිහිටුවීම සහ රෝහල් සැහෙන ප්‍රමාණයක ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඒකක පිහිටුවීම වැනි ගැහැණු ළමුන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති මූලපිරීම් අගය කරන අතරම, ගැහැණු ළමුන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම පිළිබඳව කමිටුව දැඩි කනස්සල්ලට පත්ව සිටී. මේ සම්බන්ධව කමිටුව රාජ්‍ය පාර්ශවය වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට දඬුවම් කිරීම සඳහා වන නීති ශක්තිමත් කිරීම, ඕනෑම අවස්ථාවක කලත්‍රයාගේ කැමැත්ත නොමැතිව ලිංගික සංසර්ගයෙහි යෙදීම විවාහක දූෂණයක් වශයෙන් සළකා අපරාධයක් ලෙස නම් කිරීම සහ අධිකරණයේ එවන් නඩුවක් පවත්වාගෙන යාමට පෙර සමථකරණය සඳහා සහභාගී වීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම;

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ 363 (ඩ) වගන්තියෙහි සඳහන් වන, ව්‍යවස්ථාපිත දූෂණය සම්බන්ධයෙන් වන, වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයින්ගේ විවාහක තත්ත්වය පිළිබඳ ව්‍යතිරේක ඉවත් කිරීම;

(ඇ) වින්දිතයින් සහ සාක්ෂිකරුවන් වන ගැහැණු ළමුන්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් වාර්තා කිරීමෙන් වළක්වන, ඔවුන් පළිගැනීමට ලක් වනු ඇතැයි පවත්නා දැඩි බිය තුරන් කිරීම සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ට ප්‍රධාන මූල හේතුවක් වන සහ ඒ ආශ්‍රිත වරදවල් වලට දඬුවම් නොලැබෙන මට්ටමේ සංස්කෘතියක් ඇති වීමට හේතුපාදක වූ, පුරුෂාධිපත්‍ය ආකල්පයන් වෙනස් කිරීම සහ වෙනස් කොට සැලකීම සඳහා හේතුවන ඒකාකෘතික අදහස් ඉවත් කිරීම සඳහා, පාසල් විෂය මාලාවේ අනිවාර්ය විෂය කොටස් හරහා මෙන්ම, ප්‍රජා සහ ආගමික නායකයින් සහ ජනමාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය සමඟ සහයෝගීතාවයෙන් යුතුව මහා පරිමාණ දැනුවත් කිරීමේ පියවරයන් ක්‍රියාවට නැංවීම;

(ඈ) අභ්‍යන්තරිකව අවතැන් වූ කාන්තාවන් සහ ගැහැණු ළමුන් වෙනුවෙන් අවශ්‍ය රැකවරණය සැපයීම තහවුරු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, කාන්තාවන් සහ ළමා වින්දිතයින් සඳහා ආරක්ෂිත නිවාස සංඛ්‍යාව වැඩි කිරීම;

(ඉ) ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත සම්බන්ධව සහ වින්දිතයින් සමඟ කටයුතු කිරීම සඳහා යොදාගන්නා ප්‍රමිතිගත, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට මෙන්ම ළමුන්ට සංවේදී වන ක්‍රියා පටිපාටි සම්බන්ධව සහ ඒ සම්බන්ධ අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවන බවට සහතික කිරීම සම්බන්ධව අධිකරණ නිලධාරීන්, පොලිසිය සහ අනෙකුත් අදාළ වෘත්තික කණ්ඩායම් සඳහා නිතිපතා ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීම;

(ඊ) ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට තම පැමිණිලි සියළුම භාෂාවලින් ඉදිරිපත් කළ හැකි බවට සහ ඒහා සම්බන්ධ සියළු සහාය සේවාවන් සියළුම භාෂාවලින් ලබා ගත හැකි බවට සහතික වීම.

හානිකර පිළිවෙත්

26. කමිටුව විසින් රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) දැනට සාකච්ඡාවට භාජනය වෙමින් පවත්නා පරිදි, ඩාවුඩි බෝරා ප්‍රජාව විසින් සිදු කරනු ලබන ලිංගික ඡේදන ක්‍රමයක් වන ගැහැණු ළමුන් සඳහා කාන්තා (චර්මච්ඡේදනය) තහනම් කිරීම සහ මෙම ක්‍රියාවේ පවත්නා පුරුෂාධිපත්‍ය ස්වභාවය සහ ඒ මගින් සෞඛ්‍යයට වන අහිතකර බලපෑම් සම්බන්ධව විශේෂිත වැඩසටහන්ද ඇතුලත්වන දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම;

(ආ) ආදිවාසී වැදි ප්‍රජාවද ඇතුලත්ව, ළමා විවාහවල ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින්, වයස අවුරුදු 18 ට අඩු විවාහ පිළිවෙත මුළුමනින්ම තුරන් කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම.

ඊ. පවුල් පරිසරය සහ විකල්ප රැකවරණය (5, 9-11, 18(1) සහ(2), 20, 21, 25 සහ 27(4) වගන්ති) පවුල් පරිසරය

27. සියළුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කමිටුව සමඟ ඒකාබද්ධව නිකුත් කරන ලද, ජාත්‍යන්තර සංක්‍රමණ සන්දර්භය තුළ ළමුන්ගේ මානව හිමිකම් පිළිබඳ පොදු මූලධර්ම සම්බන්ධව අංක 22 (2017) දරන පොදු විවරණය සැලකිල්ලට ගන්නා අතරම, තම දරුවන් අතහැර දමා රැකියා සඳහා විදේශගත වන දෙමාපියන්ගේ සංඛ්‍යාව සාපේක්ෂව ඉහළ වන බව සළකමින්, කමිටුව රාජ්‍ය පාර්ශවයට වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) අවාසි සහගත සහ ආන්තික තත්ත්වයන්හි වෙසෙන පවුල් සඳහා ප්‍රමාණවත් සහයෝගයන් සහ රැකියා අවස්ථා ලබා දීම සඳහා වන ප්‍රයත්නයන් වේගවත් කිරීම;

(ආ) රැකියා සඳහා විදෙස්ගත වීමට තීරණය කරන දෙමාපියන්ගේ දරුවන් ආයතනගත කිරීම වැළැක්වාලමින් ඔවුන්ගේ රැකවරණය සඳහා ප්‍රමාණවත් විකල්ප ක්‍රමවේද ස්ථාපනය කිරීම සහ බොහෝ විට දුෂ්කරතාවයන්ට මුහුනදෙන මෙම ළමුන් හට සහාය වීම සඳහා නිශ්චිත පියවරයන් ගැනීම;

(ඇ) විදෙස්ගතව සිටින දෙමාපියන් හට නැවත පැමිණීම සඳහා දිරිගැන්වීම් ලබාදීම මෙන්ම, ඔවුන්ට තම රැකියා ස්ථානයෙන් නිදහසේ පිටව ගොස් තම දරුවන් බැලීමට සහ ඔවුන් සමඟ නැවත එක්වීමට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා අදාල ගමනාන්ත රටවල් වල රජයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට එළඹීම.

පවුල් පරිසරය අහිමි වූ දරුවන්

28. ළමුන් සඳහා විකල්ප රැකවරණයන් සැළසීම පිළිබඳ මාර්ගෝපදේශ කෙරෙහි රාජ්‍ය පාර්ශවයේ අවධානය යොමු කරන කමිටුව, දෙමාපිය රැකවරණයෙන් දරුවෙකු ඉවත් කිරීම සඳහා, විකල්ප රැකවරණයක් වෙත ළමයකු යොමු කිරීම සඳහා හෝ ළමයකු නැවත සමාජගත වීම වළකාලන එකම හේතුව ලෙස කිසි විටෙකත් මූල්‍යමය හා භෞතික වශයෙන් වන දරිද්‍රතාවය සාධාරණීකරණය නොකල යුතු බව අවධාරණය කරන අතර, රාජ්‍ය පාර්ශවය පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) අසරණ පවුල්වලට තම දරුවන් රැකබලා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සහ සහාය ලබා දීම සහතික කිරීම;

(ආ) රැකවරණය සඳහා ළමුන් වැඩි වශයෙන් ආයතනගත වීම අඩු කිරීමේ අරමුණින්, තනි මාපිය පවුල් ඇතුළුව තමා අයත් පවුල තුළදීම අවශ්‍ය රැකවරණය ලබා ගැනීම සඳහා එවන් අවශ්‍යතා සහිත පවුල් වලට අවශ්‍ය සහය සහ පහසුකරණය සැලසීම මෙන්ම තම පවුල් සමඟ රැඳී සිටිය නොහැකි ළමුන්හට රැකවරණ සැළසීම සඳහා සුදුසු ක්‍රමයක් ස්ථාපිත කිරීම සහ ළමුන් ඔවුන්ගේ පවුල් සමඟ නැවත ඒකාබද්ධ වීම වඩාත් ව්‍යාප්ත කිරීම සහ දිරිගැන්වීම උදෙසා යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ළමුන් විකල්ප රැකවරණය සඳහා යොමුකිරීමේ තීරණ ගැනීමේදී අදාළ ළමයාගේ අවශ්‍යතා සහ යහපත මත පදනම්ව ප්‍රමාණවත් ආරක්ෂණ විධිවිධාන පවතින බවට සහ ඒ සඳහා පැහැදිලි නිර්ණායක පවතින බවට සහතික කිරීම සහ ළමුන් විකල්ප රැකවරණය සඳහා යොමුකිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ වරින් වර සිදුකරන සමාලෝචනයන් ශක්තිමත් කිරීම;

(ඈ) විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ළමුන් සඳහා රැකවරණ සළසන ආයතන සඳහා ලියාපදිංචිය අනිවාර්ය කිරීම; නියමිත බලපත්‍රයක් නොමැතිව ළමුන් සඳහා රැකවරණ සළසන

ආයතනයක් පවත්වාගෙන යාම අපරාධයක් බවට පත් කිරීම; රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම ස්වේච්ඡාවෙන් පවත්වාගන යන නිවාස සඳහා එක සේ බලපාන ප්‍රමිති මාලාවක් ස්ථාපිත කිරීම; එම ආයතනයන්හි පවතින පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම; පෙර දැනුම්දීමකින් තොරව සිදුකරනු ලබන නිරීක්ෂණ චාරිකා, අදාළ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් තොරව ළමුන්ගේ අදහස් වලට සවන් දීම, ආදී ක්‍රියාමාර්ග මගින් සපයනු ලබන රැකවරණ සේවා වල ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම; ළමුන්ට සිදුවන හිංසනයන්, ලිංගික අපයෝජනයන් සහ සූරාකෑම් වාර්තා කිරීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාර්ග ඇතිකිරීම; සහ ඒ සම්බන්ධ අපරාධකරුවන්ව නීතිය හමුවට පමුණුවන බව සහතික කිරීම;

(ඉ) රැකවරණය අවශ්‍ය ළමුන් කිසිදු තත්වයක් යටතේ නීතියට පටහැනි ක්‍රියාවන්ට සම්බන්ධ ළමුන් සමඟ එකට තබා නොගන්නා බවට සහතික වීම;

(ඊ) රැකවරණය සඳහා ආයතනගත කරන ලද ළමුන් හට හොඳ තත්ත්වයේ අධ්‍යාපනයක් සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් ලබා ගත හැකි බවට සහතික වීම.

ඌ. ආබාධ සහිතභාවය, මූලික සෞඛ්‍ය පහසුකම් සහ සුභසාධනය (6, 18(3), 23, 24, 26, 27(1)-(3) සහ 33 වගන්ති)

ආබාධ සහිත ළමුන්

29. ආබාධ සහිත ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සිය පොදු විවරණ අංක 9 (2006) වෙත අවධානය යොමුකරන කමිටුව පහත සඳහන් නිර්දේශ රාජ්‍ය පාර්ශවය වෙත ඉදිරිපත් කරයි:

(අ) ආබාධ සහිත භාවය සඳහා මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීම සහ සියළුම රාජ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් වලදී ආබාධ සහිත ළමුන්ව අන්තර්ග්‍රහණය කරගැනීම සඳහා පුළුල් උපාය මාර්ගයක් සකස් කිරීම;

(ආ) ආබාධ සහිත ළමුන්ට එරෙහිව පවත්නා වැරදි මත හා පූර්ව නිගමනයන්ට එරෙහිව සටන් කිරීම, එවැනි ළමුන් පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ව හුදෙක් අධාර ලබා දියයුතු කණ්ඩායමක් ලෙස නොව, අයිතිවාසිකම් සහිත කණ්ඩායමක් ලෙස සළකන බව සහතික කිරීම අරමුණු කර ගනිමින් රජයේ නිලධාරීන්, මහජනතාව සහ පවුල් ඒකක ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම;

(ඇ) සියළුම වයස් කාණ්ඩ වල ආබාධ සහිත ළමුන් පිළිබඳ උප කොටස් වලට වෙන් කරන ලද දත්ත එක් රැස් කිරීම සහ ඔවුන්ව හඳුනාගන්නා මුල් අවස්ථාවන් වලදීම අදාළ මැදිහත්වීම් සිදුකිරීම වැඩිදියුණු කිරීම;

(ඈ) සියළුම ආබාධ සහිත ළමුන් හට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ සියල්ලන් අන්තර්ග්‍රහණය වූ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.

සෞඛ්‍යය සහ සෞඛ්‍ය සේවා

30. සියළුම පුරවැසියන් හට නොමිලේ සෞඛ්‍ය සේවා සැපයීම අගය කරන කමිටුව, ළමුන්ට ඉහළම ප්‍රමිතියෙන් යුතු සෞඛ්‍ය සේවාවක් භුක්ති විඳීමට ඇති අයිතිය පිළිබඳ සිය පොදු විවරණ අංක 15 (2013) සම්බන්ධයෙන් අවධානය යොමුකරමින්, රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් ප්‍රාදේශීය වශයෙන් පවත්නා විෂමතා ආමන්ත්‍රණය කිරීම, විශේෂයෙන් ග්‍රාමීය හා දුරස්ථ ප්‍රදේශවල සෞඛ්‍ය සේවකයින් සංඛ්‍යාව වැඩි කිරීම සහ මානසික, ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා ආදී වර්තමානයේ ධාරිතාවය අඩු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අදාළ විශේෂඥයින් දැනුවත් කිරීම;

(ආ) සෑම ළමයකුටම ගුණාත්මක මහජන සෞඛ්‍ය සේවාවක් සඳහා සමාන ප්‍රවේශයක් සහිත වන බව සහතික කිරීමේ අරමුණින්, පුද්ගලිකව තම අතින් දැරීමට සිදුවන ඉහළ සෞඛ්‍ය වියදම්, ඖෂධවල අධික මිල ගණන් සහ මිල අධික පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර සේවා අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

මානසික සෞඛ්‍යය

31. නව යොවුන් වියේ සියදිවි නසාගැනීම් වැළැක්වීම සඳහා රාජ්‍ය පාර්ශවය විසින් ගනු ලබන පරිශ්‍රමයන් වඩාත් ශක්තිමත් කළ යුතු බව කමිටුව නිර්දේශ කරයි. මෙහිදී, මානසික උපදේශන සේවා සහ ඒ සම්බන්ධව කටයුතු කරන සමාජ සේවා සපයන්නන් වැඩි කිරීම මෙන්ම මානසික සෞඛ්‍ය ගැටළු සහ සියදිවි නසාගැනීමේ ප්‍රවණතා හඳුනා ගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා ළමුන් සමඟ කටයුතු කරන වෘත්තිකයන්ව පුහුණු කිරීම සහ මෙම ගැටළුව පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා විශේෂිත පරිශ්‍රමයන් දියත් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.

නව යොවුන් වියේ සෞඛ්‍යය

32. සම්මුතියේ සන්දර්භය තුළ නව යොවුන් වියේ සෞඛ්‍යය හා සංවර්ධනය පිළිබඳ සිය පොදු විවරණ අංක 4 (2003) සම්බන්ධයෙන් අවධානය යොමු කරන කමිටුව, රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) අඩු වයසින් සිදුවන ගැබ් ගැනීම් මෙන්ම ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනයන් වැළක්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් එක් එක් වයස් කාණ්ඩයන්ට ගැළපෙන පරිදි ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය පාසල් අනිවාර්ය විෂය මාලාවේ කොටසක් බවට පත් කිරීම තහවුරු කිරීම;

(ආ) නව යොවුන් වියේ ගැහැණු ළමුන් සඳහා, ඔවුන්ගේ අදහස් වලට සැමවිටම නිසි සැලකිල්ලකින් යුතුව සවන් දෙන බවට වග බලා ගනිමින්, අනවශ්‍ය බියකින් හෝ අපකීර්තියට පත් වීමකින් තොරව ආරක්ෂිත සහ රහසිගත ගබ්සා කිරීමේ සේවාවන් මෙන්ම පසු ගබ්සා සත්කාරක සේවා සඳහා ප්‍රවේශය සහතික කිරීම;

(ඇ) විශේෂයෙන් පිරිමි ළමුන් කෙරෙහි අවධානය යොමු කරමින්, වගකිවයුතු දෙමාපිය භාවය මෙන්ම වගකිවයුතු ලිංගික හැසිරීම් ප්‍රවර්ධනය කිරීම.

මත් කුඩු සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය

33. කමිටුව රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) නව යොවුන් වියේ පසුවන්නන් විසින් සාපේක්ෂව අධික වශයෙන් දුම්කොළ සහ මධ්‍යසාර භාවිතා කිරීම ආමන්ත්‍රනය කිරීම සඳහා ගන්නා ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම, මෙහිදී ඒවා සියළු ආකාරයන් වලින් ළමුන් අතර ප්‍රචාරණය කිරීම සහ ළමුන් හට ඒවා විකිණීම දැඩි ලෙස තහනම් කිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් පාසල් පද්ධතිය තුළ දැනුවත්භාවය වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය;

(ආ) ජනමාධ්‍ය සහ සමාජ ජාලයන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම පිළිබඳ නිවැරදි හා ඉලක්ක ගත තොරතුරු සහ ඉන් මිදීමට අවශ්‍ය ජීවන කුසලතා අධ්‍යාපනය ළමුන් හට ලබා දීම;

(ඇ) පාසල් පරිශ්‍රයන් තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට ගුරුවරුන් පුහුණු කිරීම;

(ඇ) විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල තරුණයින්ට හිතකර සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි වන මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් සඳහා ප්‍රතිකාර සේවා මෙන්ම හානි අවම කිරීමේ සේවාවන් සංවර්ධනය කිරීම. එමෙන්ම, මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ වරදට ළමුන්ව රඳවා නොගන්නා බව සහතික කිරීම සඳහා අවශ්‍ය නීති සංශෝධන සිදු කිරීම.

පෝෂණය

34. සියළු ආකාරයේ මන්දපෝෂණ තත්වයන් අවසන් කිරීම සඳහා වන තිරසාර සංවර්ධන ඉලක්කවල 2.2 වන ඉලක්කය සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය පාර්ශවය විසින් විශේෂයෙන් කුරු වීම, ක්ෂය වීම, අඩු බර සහිත වීම සහ රක්තහීනතාවය ආදී මන්දපෝෂණය තත්වයන් සම්බන්ධයෙන් ඵලදායී ලෙස කටයුතු කළ යුතු බවත්, නිවැරදි ළදරු සහ ළමා පෝෂණ පිළිවෙත් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවත් කමිටුව නිර්දේශ කරයි.

පාරිසරික සෞඛ්‍යය

35. ළමුන්ගේ සෞඛ්‍යයට අහිතකර වන කෘෂි රසායන ද්‍රව්‍ය ඉතා අධික වශයෙන් භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමකින් අඩු කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඵලදායී අධීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපනය කරන ලෙසත් කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී.

දේශගුණික විපර්යාස හේතුවෙන් ළමා අයිතිවාසිකම්වලට සිදුවන බලපෑම

36. දේශගුණික විපර්යාස ආශ්‍රිත සැලසුම්කරණ සහ කළමනාකරණ ධාරිතාවන් ඉහළ නැංවීම සඳහා යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව තිරසාර සංවර්ධන ඉලක්කවල ඉලක්ක 13.ආ ඉලක්කය වෙත අවධානය යොමු කරන කමිටුව, එම මාතෘකාව පාසල් විෂය මාලාවට මෙන්ම ගුරු පුහුණු වැඩසටහන්වලට ඇතුළත් කිරීම තුලින් දේශගුණික විපර්යාස සහ ස්වාභාවික විපත් පිළිබඳ ළමුන්ගේ දැනුවත්භාවය සහ සූදානම වැඩි කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පාර්ශවය වෙත නිර්දේශ කර සිටී.

ජීවන තත්ත්වය

37. දරිද්‍රතා අනුපාතයන්හි සිදුව ඇති සාමාන්‍ය අඩුවීම පැසසුමට ලක්කරන අතරම, ජාතික වශයෙන් සුදුසු සමාජ ආරක්ෂණ පද්ධති සහ සැමට සාධාරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්කවල 1.3 වන ඉලක්කය සැලකිල්ලට ගන්නා කමිටුව, පවත්නා ඉහළ දරිද්‍රතා අනුපාත සහ අසමානතාවයන්ට මුහුණ දීම සඳහා රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති පරිශ්‍රමයන් තවදුරටත් වර්ධනය කළ යුතු බව නිර්දේශ කරයි. මෙහිදී රාජ්‍ය පාර්ශවය විසින් පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කල යුතුයඃ

(අ) ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ළමුන් සහ ඔවුන්ගේ පවුල්, ළමා ශ්‍රමිකයන් සහ තනි මාපිය පවුල්වල දරුවන් ඇතුළු වඩාත්ම අවාසි සහගත කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ජීවන තත්වය උසස් කිරීම සඳහා වන ළමා කේන්ද්‍රීය පියවර ශක්තිමත් කිරීම;

(ආ) කාන්තා මූලික පවුල් සඳහා සහාය ලබාදීම සහ බලගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම;

(ඇ) බලහත්කාරයෙන් ඉවත් කිරීමට එරෙහිව අවශ්‍ය ආරක්ෂාව සැපයීමට ප්‍රමාණවත් නීතිමය රාමුවක් අනුගමනය කිරීම.

ඍ. අධ්‍යාපනය, විවේකය සහ සංස්කෘතික ක්‍රියාකාරකම් (28-31 වගන්ති)

වෘත්තීය පුහුණුව සහ මාර්ගෝපදේශනය ද ඇතුලත් අධ්‍යාපනය

38. ප්‍රාථමික අධ්‍යාපනයට ගැහැණු සහ පිරිමි ළමුන් 100% ආසන්න ප්‍රතිශතයකින් ඇතුළත් කර ගැනීම සහ ළමුන් අධ්‍යාපනයේ රැඳී සිටිය යුතු වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම අගය කරන කමිටුව, අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ සිය පොදු විවරණ අංක 1 (2001) ට අදාළව, රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

(අ) අවශ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම මගින්, පාසල් යටිතල පහසුකම් සහ ගුණාත්මක ඉගැන්වීම් සම්බන්ධව ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා ආමන්ත්‍රණය කිරීම. මෙහිදී සුදුසුකම් ලත් පාසල් කාර්ය මණ්ඩල, සියළු භාෂාවලින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම, විෂයමාලා අන්තර්ගතය පෙළගැස්වීම සහ තාක්ෂණික හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ආදී කාරණා පිළිබඳ අවධානය යොමු කල යුතුය;

(ආ) පාසල් තුළ මෙන්ම පාසලට යන අතරමගදී සිදුවන හිරිහැර, අපයෝජන සහ ප්‍රචණ්ඩත්වයන්ගෙන් ළමුන්, විශේෂයෙන් ගැහැණු ළමුන් ආරක්ෂා කිරීම සහ අධ්‍යාපන වැඩසටහන් තුළ වෙනස් කොට සළකන සුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘති වලට එරෙහිව සටන් කිරීම;

(ඇ) ගැබිනි තත්වයට පත් ගැහැණු ළමුන් මෙන්ම නව යොවුන් වියේ පසුවන මව්වරුන් කිසිදු තත්වයක් යටතේ පාසලෙන් ඉවත් වීමේ පීඩනයට ලක් නොවන බවටත්, ප්‍රධාන ධාරාවේ පාසල්වල ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නොකඩවා කරගෙන යාමට අවශ්‍ය සහාය ලැබෙන බවටත් සහතික වීම;

(ඈ) ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් ලබා දීම ආදිය මගින් ග්‍රාමීය ප්‍රදේශවල පවතින සැලකිය යුතු මට්ටමේ පාසල් හැරයාමේ අනුපාතයට සහ දිගු කාලීන ලෙස පාසල් නොපැමිණීම් වලට පිළියම් යෙදීම, සහ විශේෂයෙන් පාසල් හැර යන දරුවන්ගේ සහ වීදි තත්වයන් යටතේ සිටින දරුවන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක වෘත්තීය පුහුණු විසඳුම් සංවර්ධනය කර එය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) විශේෂයෙන් ප්‍රායෝගිකව අනියමින් ලබා ගන්නා අල්ලසක් ලෙස සැළකෙන පාසල් ප්‍රවේශය සඳහා පරිත්‍යාග ලබාගැනීමේ ක්‍රියාවලිය ඇතුළුව, පාසල් අධ්‍යාපනය ආශ්‍රිතව පවතින සියලු සැඟවුණු වියදම්, මුලිනුපුටා දැමීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම;

(ඊ) ළමා විවාහවල වින්දිතයන් බවට පත් වූ ළමුන් සඳහා පාසල වෙත නැවත ඇතුළත් වීමට අවස්ථාව සළසන වැඩසටහන් හඳුන්වා දීම.

එ. විශේෂ ආරක්ෂණ විධිවිධාන (22, 30, 32, 33, 35, 36, 37(ආ)-(ඈ) සහ 38-40 වගන්ති)

අභ්‍යන්තරිකව අවතැන් වූ ළමුන්

39. අභ්‍යන්තරිකව අවතැන් වූ ළමුන් සහ ඔවුන්ගේ පවුල් සඳහා තිරසාර විසඳුම් සෙවීම සඳහා රාජ්‍ය පාර්ශවය අඛණ්ඩව උත්සාහ කළ යුතු බව නිර්දේශ කරන කමිටුව එහිදී පහත ක්‍රියාමාර්ග යෝජනා කරයි:

(අ) අභ්‍යන්තරිකව අවතැන් වූ ළමුන් හට සහ ඔවුන්ගේ පවුල් වලට සිය මුල් බිම් වෙත නැවත පැමිණීමට හෝ නැවත පදිංචි වීමට බාධා ඇති කරන සියළු සාධක ආමන්ත්‍රණය කිරීම;

(ආ) අභ්‍යන්තරිකව අවතැන් වූ පවුල් සඳහා සුදුසු වන්දි සහ ආධාර ලබා දීම සහ ඔවුන් නැවත පදිංචි කිරීමේදී පාසල් සහ රෝහල් වෙත ප්‍රවේශය ඇතුළුව ඔවුන්ට අවශ්‍ය මූලික යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීමට වග බලා ගැනීම;

(ඇ) කඳවුරුවල ජීවත් වන අභ්‍යන්තරිකව අවතැන් වූ ළමුන් සහ ඔවුන්ගේ පවුල්වලට ප්‍රමාණවත් සහ ආරක්ෂිත ලෙස ජලය සහ සනීපාරක්ෂක පහසුකම් මෙන්ම විදුලිය, පාසල් සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම;

(ඈ) උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන් වූ මුස්ලිම් ළමුන් සහ ඔවුන්ගේ පවුල්, මුල් බිම් වෙත නැවත පැමිණීමේ හෝ නැවත පදිංචි කිරීමේ වැඩසටහන්වලට සම්පූර්ණයෙන්ම ඇතුළත් කර ගැනීම සහතික කිරීම.

සුළුතර හෝ ආදිවාසී කණ්ඩායම්වලට අයත් ළමුන්

40. වාර්ගික, වාර්ගික-ආගමික සහ ආදිවාසී සුළුතර කණ්ඩායම්වලට අයත් ළමුන්ට එරෙහිව සිදුවන සියළු ආකාරයේ වෙනස්කොට සැළකීම් වලට එරෙහිව සටන් කිරීම සඳහා වන පියවර සැලකිය යුතු ලෙස ශක්තිමත් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටින අතර, එහිදී පහත නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) ආදිවාසී වැදි දරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම්, සම්ප්‍රදායන් සහ ඉඩම් ආරක්ෂා කර දීම සහ ඔවුන් මුහුණ පා ඇති සමාජ-ආර්ථික ආන්තිකකරණයන් සහ වෙනස්කොට සැළකීම් වලට නිසි පිළියම් යෙදීම;

(ආ) කුලය පදනම් කරගත් වෙනස්කොට සැළකීම් වලට එරෙහිව සටන් කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, උපාය මාර්ග සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම සහ යොදවා ගැනීම මෙන්ම ඊට අනුකූලව අධිකරණ සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ව පුහුණු කිරීම;

(ඇ) වාර්ගික, වාර්ගික-ආගමික සහ ස්වදේශික සුළුතර කණ්ඩායම්වලට එරෙහිව සිදුවන වෛරී ප්‍රකාශ, ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම්, කැරලි සහ ප්‍රචණ්ඩ ප්‍රහාරයන් වැළැක්වීමට ගන්නා උත්සාහයන් වැඩි කිරීම.

ළමා ශ්‍රමය ඇතුළු ආර්ථික සූරාකෑම

41. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඇතුළුව, ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවය විසින් ගෙන ඇති උත්සාහයන් ධනාත්මකව සටහන් කරන කමිටුව, වීදි වෙළෙන්දන් ලෙස සහ ගෘහ සේවා සැපයීම් වලදී මෙන්ම කෘෂිකර්මාන්තය, පතල් කැණීම්, ඉදිකිරීම්, නිෂ්පාදන, ප්‍රවාහන සහ ධීවර ඇතුළු ක්ෂේත්‍ර ගනනාවක ම සැලකිය යුතු ළමුන් සංඛ්‍යාවක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරීව කටයුතු කරන බවත්, බලහත්කාරයෙන් ගෘහ සේවය සඳහා ළමුන්ව යොදවා ගැනීම් වාර්තා වන බවත් දැඩි කනස්සල්ලෙන් යුතුව සටහන් කරයි.

42. කමිටුව පහත නිර්දේශ රාජ්‍ය පාර්ශවය වෙත දැඩිව ඉදිරිපත් කරයි

(අ) වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා බලපාන සියළුම ආකාරයේ අනතුරුදායක හෝ අපයෝජන ශ්‍රම ආකාර තහනම් කිරීමේ අරමුණින්, පවතින නීති තවදුරටත් ශක්තිමත් කර ක්‍රියාත්මක කිරීම සහ ළමුන් ගෘහ සේවකයින් ලෙස යොදවා ගැනීමේ තත්ත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා නිශ්චිත පියවර ගැනීම;

(ආ) ළමුන් ශ්‍රමිකයන් වශයෙන් යොදවා ගන්නා අවස්ථාවන් නිරීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු ශක්තිමත් අංශයක් කම්කරු පරීක්ෂක කාර්යාලය තුල ස්ථාපනය කිරීම;

(ඇ) ළමා ශ්‍රමය සූරාකෑම් හා සම්බන්ධ අපරාධකරුවන් සහ ශ්‍රමය සූරාකෑමේ අරමුණු සඳහා ළමුන් ජාවාරම් කිරීම සිදු කරන අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවන බව සහතික කිරීම සඳහා ගන්නා උත්සාහයන් වැඩි කිරීම.

වීදි තත්වයන් තුළ සිටින ළමුන්

43. වීදි තත්වයන් තුල ළමුන් පිළිබඳ සිය පොදු විවරණ අංක 21 (2017) සම්බන්ධයෙන් අවධානය යොමු කරන කමිටුව, රාජ්‍ය පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) මිනිස් ජාවාරමට එරෙහි නීති ශක්තිමත් කිරීම සහ ළමා ජාවාරම සඳහා ප්‍රමාණවත් සම්බාධක පැනවීම;

(ආ) ළමුන් ජාවාරම් කිරීම සම්බන්ධ සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා වෙන් කර ඇති සම්පත් වැඩි කිරීම සහ වැරදිකරුවන් නීතිය හමුවට පමුණුවන බවට සහතික වීම;

(ඇ) අවශ්‍ය වන වැළැක්වීමේ සහ දැනුවත් කිරීමේ යාන්ත්‍රණ පිහිටුවීම සඳහා අසල්වැසි රටවල් සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම;

(ඈ) විකිණීම් හෝ ජාවාරම් වල ගොදුරු බවට පත් වූ සියළුම ළමා වින්දිතයින්ගේ ශාරීරික හා මානසික සුවය ලබා ගැනීමට සහය වීම සඳහා වෙන් කර ඇති සම්පත් වැඩි කිරීම.

බාල වයස්කරුවන් සඳහා යුක්තිය පසිඳලීම.

45. පහත කරුණු සම්බන්ධයෙන් කමිටුවේ දැඩි අවධානය යොමුව ඇත

(අ) වයස අවුරුදු 8 ක් වන වත්මන් වයස් සීමාවේදී, අපරාධ පිළිබඳ වගකීම් ගැනීමේ හැකියාව අතිශයින් අඩු වීම;

(ආ) වයස අවුරුදු 16 ට වැඩි ළමුන්ව ළමා හා තරුණ පුද්ගල ආඥා පනතේ ලබා දී ඇති ආරක්ෂාවෙන් බැහැර කිරීම දිගටම කරගෙන යාම;

(ඇ) නඩු විභාගයට පෙර ළමුන්ව රඳවා තබා ගැනීමේ කාල සීමාවන් ඉතා දිගු වීම සහ එවැනි රඳවා ගැනීම් අතරතුර ළමුන්ට බොහෝ විට පොලිසිය විසින් අයහපත් ලෙස සලකනු ලබන අතර එහිදී ඔවුන්ට අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශයක් නොමැති වීම;

(ඈ) ළමුන් වෙනුවෙන් වෙන් වූ අධිකරණ සංඛ්‍යාව විශේෂයෙන් අඩු වන අතර, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සිදු කළද, ළමා හිතකාමී ප්‍රවේශයන් අධිකරණ තුළ ක්‍රියාත්මක නොවීම සහ බාල වයස්කරුවන් සඳහා යුක්තිය පසිඳලීමේ විශේෂිත පද්ධතියක අවශ්‍යතාව සහ ඉන් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් නොමැති වීම;

(ඉ) දේශීයව පවතින නීති මගින් ළමුන් හට නීතිමය නියෝජනයක් සඳහා ඇති අයිතිය සහතික නොවීම;

(ඊ) ළමුන්ව රඳවා තබා ගැනීම සඳහා වන විකල්ප හිඟ වීම;

(උ) අධිකරණ ක්‍රියාවලියේ සෑම අදියරකදීම ළමුන් වැඩිහිටියන්ගෙන් වෙන් කිරීම සිදු නොවීම;

(ඌ) නීතිය සමග ගැටුණු දරුවන් පිළිබඳ දත්ත ඉතා අඩු හා දුර්ලභ වීම.

46. බාල වයස්කරුවන් සඳහා යුක්තිය පසිඳලීමේදී පවතින ළමා අයිතිවාසිකම් පිළිබඳ සිය පොදු විවරණ අංක 10 (2007) සම්බන්ධයෙන් අවධානය යොමු කරන කමිටුව, සිය බාල වයස්කරුවන් සඳහා යුක්තිය පසිඳලීමේ පද්ධතිය පූර්ණ වශයෙන් සම්මුතියට සහ අනෙකුත් අදාළ ප්‍රමිතීන්ට අනුකූල වන තත්වයට ගෙන එන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටියි. එහිදී කමිටුව විශේෂයෙන්ම පහත නිර්දේශ ඉදිරිපත් කරයිඃ

(අ) අපරාධ පිළිබඳ වගකීම් දැරීමේ වයස ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතියට අනුව කඩිනමින් ඉහළ නැංවීම සහ ළමයාගේ වයස සම්බන්ධව කිසියම් ගැටුම්කාරී, අවසන් නිගමනයකට එළඹිය නොහැකි හෝ අවිනිශ්චිත සාක්ෂි ඇති විට දඬුවම් ලබා දීමේදී ළමයා හට සැකයේ වාසිය ලබා දීම;

(ආ) වයස අවුරුදු 18 දක්වා සියළුම ළමුන්ට අදාළ වන පරිදි ළමා (අධිකරණ ආරක්ෂණ) පනත් කෙටුම්පත සම්මත කර ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගැනීම;

(ඇ) නිසි ප්‍රතිස්ථාපන පිළිවෙත් මත පදනම් වූ සහ සලකා බලනු ලබන මූලිකම සාධකය වන්නේ ඔහුගේ හෝ ඇයගේ යහපත වන බවට වන ළමයා සතු අයිතිය ට අනුකූල වූ, බාල වයස්කරුවන් සඳහා යුක්තිය පසිඳලීම සඳහා වන පුළුල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම;

(ඈ) ප්‍රමාණවත් මානව, තාක්ෂණික සහ මූල්‍ය සම්පත් සහිතව, විශේෂිත බාල වයස්කරුවන් සඳහා වන අධිකරණ පහසුකම් සහ ක්‍රියා පටිපාටි කඩිනමින් ස්ථාපිත කිරීම මෙන්ම ළමුන් සඳහා විශේෂිත විනිසුරුවන් පත් කිරීම සහ ඔවුන් වෙත ප්‍රමාණවත් පුහුණුවීම් ලැබෙන බව සහතික කිරීම;

(ඉ) නීතිමය කටයුතුවල මුල් අවධියේදී සිට සමස්ථ කාලය පුරාම නීතිය සමග ගැටෙන ළමුන් හට සුදුසුකම් ලත්, ස්වාධීන සහ අවශ්‍ය නම් නොමිලේ නීති ආධාර සැපයෙන බවට සහතික වීම;

(ඊ) අපරාධ චෝදනා එල්ල වී ඇති ළමුන් සම්බන්ධයෙන්, ඔවුන්ව වෙනතකට යොමු කිරීම, සමථකරණය සහ උපදේශනය වැනි අධිකරණමය නොවන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සහ හැකි සෑම විටම, දඬුවම් නියම කිරීමේදී පරිවාසකරණය හෝ ප්‍රජා සේවයේ යෙදවීම වැනි විකල්ප භාවිතා කිරීම;

(උ) නඩු විභාගයට පෙර සිදුකරන රඳවා තබා ගැනීම ඇතුළුව ළමුන් රඳවා තබා ගැනීම අවසාන විසඳුම ලෙස පමණක් සහ හැකි කෙටිම කාලයක් සඳහා එය භාවිතා කරන බවටත්, එය ඉවත් කර ගැනීමේ අරමුණින් එය නිතිපතා සමාලෝචනය කරන බවටත්, සුළු වැරදි සඳහා එසේ රඳවා තබා ගැනීම භාවිතා නොකරන බවටත් සහතික කිරීම;

(ඌ) රඳවා තබා ගැනීම වැළැක්විය නොහැකි අවස්ථා වලදී සහ අධිකරණය වෙත සහ ඉන් පිටතට ළමුන් ප්‍රවාහනය කිරීමේදී, ඔවුන්ව වැඩිහිටියන් සමග රඳවා නොගන්නා බවටත්, එසේ සිදුකරන රඳවා තබා ගැනීම් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා වලට ප්‍රවේශය සහිතව සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව සිදුකරන බවටත් සහතික වීම;

(එ) නීතිය සමග ගැටෙන ළමුන් පිළිබඳ දත්ත රාජ්‍ය පාර්ශවයේ ඊළඟ සාමයික වාර්තාව සමගින් ලබා දීම.

සංහිඳියාව, සත්‍යය සහ යුක්තිය පසිඳලීම

47. ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාව යටතේ සඳහන් කර ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මෑතකදී කරන ලද විශ්වීය සාමයික සමාලෝචන ක්‍රියාවලියේදී රාජ්‍ය පාර්ශවය විසින් සිදුකරන ලද පොරොන්දුව පැසසුමින් යුතුව පිළිගන්නා අතර, එම බැඳීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අති මන්දගාමී ප්‍රගතිය පිළිබඳව කමිටුව කමිටුව සිය අවධානය යොමුකර සිටී. එහිදී කමිටුව පහත කරුණු සම්බන්ධව විශේෂයෙන් සැලකිලිමත්ය:

(අ) යුද්ධයේදී යටත් වී පුනරුත්ථාපනය සඳහා යොමුකරන ලද ළමුන් ද ඇතුළුව, අතුරුදහන් වූ හෝ ගැටුම අතරතුර ඊට මැදිවුන ළමුන්ගේ සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින අතර, 2016 දී පිහිටුවන ලද අතුරුදහන් වූවන්ගේ කාර්යාලය තවමත් ක්‍රියාත්මක වී නොමැති වීම;

(ආ) සන්නද්ධ ගැටුම අතරතුරදී ඒ සඳහා ළමුන් බඳවා ගත් සහ භාවිතා කළ බොහෝ

පුද්ගලයින් තවමත් දඬුවම් නොලබා සිටින අතර, ඝාතන, පැහැරගැනීම් සහ පුළුල් ලෙස ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු යැයි කියන සන්නද්ධ නායකයින් තවමත් ප්‍රසිද්ධ තනතුරු වල රැඳී සිටීම.

48. මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවෙන් පැන නගින බැඳීම් වඩාත් ඵලදායී හා කාලෝචිත ආකාරයකින් ඉටු කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටින අතර, මෙහිදී ළමුන්ට සහ සන්නද්ධ ගැටුම සිදුවන අවස්ථාවේ ළමුන්ව සිටි අයට ජාතික සංහිඳියා සහ සංක්‍රාන්ති යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලීන්හි දී හඬක් හිමිවන බවටත් වින්දිතයින්, සාක්ෂිකරුවන් හෝ හිමිකම් සහිත වූවන් ලෙස සළකා අදාළ සහාය ලබා දෙන බවටත් සහතික කල යුතුය. කමිටුව විශේෂයෙන්, රාජ්‍ය පාර්ශවයෙන් පහත සඳහන් කරුණු ඉල්ලා සිටියිः

(අ) සන්නද්ධ ගැටුම පැවති සමයේ ළමුන් ලෙස අතුරුදහන් වූ සහ තවමත් අතුරුදහන් වී සිටින පුද්ගලයින් සම්බන්ධ සිද්ධීන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, පූර්ණ වශයෙන් ස්වාධීන වන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක වැඩකටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වන උත්සාහයන් ශක්තිමත් කිරීම; සහ

(ආ) සන්නද්ධ ගැටුම අතරතුර ළමුන් බඳවා ගැනීම සහ ගැටුම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු සියළු පුද්ගලයින් නීතිය හමුවට පමුණුවන බව සහතික කිරීම.

සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය සම්බන්ධයෙන් කමිටුව විසින් පෙර නිකුත් කල අවසන් නිරීක්ෂණ සහ නිර්දේශයන් අනුගමනය කිරීම.

49. තමන් විසින් පෙර ලබා දුන් නිර්දේශය (CRC/C/OPAC/LKA/CO/1, 39 වන ඡේදය බලන්න) සිහිපත් කරන කමිටුව පහත සඳහන් කරුණු රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටීः

(අ) ළමුන්ට හෝ ළමුන් ලෙස සන්නද්ධ ගැටුමට සම්බන්ධ වූ පුද්ගලයින්ට එරෙහිව නඩු නොපැවරීමට ලබා දි ඇති බැඳීම විධිමත් කිරීම පිළිබඳ සලකා බැලීම;

(ආ) හිටපු ළමා සටන්කරුවන් හට ඇති කම්පනයන් සහ අනෙකුත් මානසික සෞඛ්‍ය ගැටළු විසඳීම සඳහා මෙන්ම ප්‍රචණ්ඩත්වය සහ/හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම හේතුවෙන් අභ්‍යන්තරව අවතැන් වූ සහ/හෝ තම පවුල් පරිසරය අහිමි වූ ළමුන් හට අවශ්‍ය මානසික සහාය ලබා දීමට කටයුතු කිරීම;

(ඇ) හමුදාව විසින් දැනට පවත්වාගෙන යනු ලබන සියළුම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනය යටතට නැවත මාරු කරන බව සහතික කිරීම;

(ඈ) ජාතික ශිෂ්‍යභට බලකායේ පුහුණුව තුලට ක්‍රියාකාරී සේවය ඇතුළත් නොවන බව සහතික කිරීම;

(ඉ) ජිනීවා සම්මුතීන්ට සහ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තියට අතිරේකව පවත්නා ප්‍රකාශනයන්ට එකඟ වීම පිළිබඳ සලකා බැලීම.

ඒ. සම්මුතියට අදාළව සන්නිවේදන ක්‍රියාපටිපාටිය පිළිබඳ වෛකල්පික ප්‍රකාශනය අපරානුමත කිරීම

50. ළමා අයිතිවාසිකම් ඉටු කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, සම්මුතියට අදාළව සන්නිවේදන ක්‍රියාපටිපාටියකදී බලපානු ලබන ළමා අයිතිවාසිකම් පිළිබඳ වන වෛකල්පික ප්‍රකාශනය රාජ්‍ය පාර්ශවය විසින් අපරානුමත කළ යුතු බව කමිටුව නිර්දේශ කරයි.

ඔ. ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන අපරානුමත කිරීම.

51. ළමා අයිතිවාසිකම් සපුරාලීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, රාජ්‍ය පාර්ශවය විසින් තමන් තවමත්

පාර්ශව කරුවකු නොවන පහත සඳහන් මූලික මානව හිමිකම් ලේඛන අපරානුමත කිරීම සලකා බැලිය යුතු බවට කමිටුව නිර්දේශ කරයි:

(අ) මරණ දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ දෙවන වෛකල්පික ප්‍රකාශනය;

(ආ) ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පික ප්‍රකාශනය;

(ඇ) ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වෛකල්පික ප්‍රකාශනය.

III) ක්‍රියාත්මක කිරීම සහ වාර්තා කිරීම

අ. පසු විපරම සහ ව්‍යාප්තිය

52. මෙම අවසන් නිරීක්ෂණවල අඩංගු නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශවය විසින් සියළු සුදුසු පියවර ගත යුතු වන බවට කමිටුව නිර්දේශ කරයි. එමෙන්ම ඒකාබද්ධ පස්වන සහ හයවන සාමයික වාර්තා, පෙර මතුකරන ලද කරුණු වලට ලබාදුන් ලිඛිත ප්‍රතිචාරයන් සහ මෙම අවසන් නිරීක්ෂණ රටේ පවත්නා සියළු භාෂාවලින් පුළුල් ලෙස ලබා ගත හැකි වන පරිදි සකස් කළ යුතු බව ද කමිටුව නිර්දේශ කරයි.

ආ. වාර්තාකරණය සහ පසු විපරම් කටයුතු සඳහා ජාතික යාන්ත්‍රණය

53. ජාත්‍යන්තර හා කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම සහ ඒ සම්බන්ධ වාර්තාකරණය සහ එම යාන්ත්‍රනයන් හා සම්බන්ධ වීම මෙන්ම එවැනි යාන්ත්‍රණයන්ගෙන් පැන නගින ගිවිසුම් හා බැඳීම් මෙන්ම නිර්දේශ සහ තීරණ සම්බන්ධව සිදුකරන ජාතික පසු විපරම් කටයුතු සහ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධීකරණය කිරීම සහ නිරීක්ෂණය කිරීම සඳහා බලයලත් ස්ථාවර රාජ්‍ය ව්‍යුහයක් ලෙස වාර්තාකරණය සහ පසු විපරම් කටයුතු සඳහා වන ජාතික යාන්ත්‍රණයක් රාජ්‍ය පාර්ශවය විසින් ස්ථාපිත කළ යුතු බව කමිටුව නිර්දේශ කරයි. එසේම එවැනි ව්‍යුහයක් පැවතීමේදී ඒ වෙනුවෙන්ම වෙන්වූ කාර්ය මණ්ඩලයක් මගින් ප්‍රමාණවත් පරිදි සහ අඛණ්ඩව සහායලබාදීමක් සිදුවිය යුතු බවත්, එම ව්‍යුහයට ජාතික මානව හිමිකම් ආයතනය සමගින් මෙන්ම සිවිල් සමාජය සමගද ක්‍රමානුකූල ලෙස සාකච්ඡා කිරීමේ හැකියාව පැවතිය යුතු බවත් කමිටුව අවධාරණය කරයි.

ඇ. මීළඟ වාර්තාව

54. 2023 අගෝස්තු 10 වන දිනට පෙර තම හත්වන සාමයික වාර්තාව ඉදිරිපත් කරන ලෙසත්, මෙම අවසන් නිරීක්ෂණවල පසු විපරම් කටයුතු පිළිබඳ තොරතුරු එම වාර්තාවට ඇතුළත් කරන ලෙසත් කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනා කර සිටියි. එසේම එම වාර්තාව 2014 ජනවාරි 31 වන දින සම්මත කරන ලද කමිටුවේ සුසංයෝගී සහ ගිවිසුම් වලට විශේෂිත වූ වාර්තාකරණ මාර්ගෝපදේශවලට (CRC/C/58/Rev.3) අනුකූල විය යුතු අතර වචන 21,200 නොඉක්මවිය යුතුය (මහා සභා යෝජනාව 68/268, 16 ඡේදය බලන්න). එසේ නිශ්චිතකරන ලද වචන සීමාව ඉක්මවා යන වාර්තාවක් ඉදිරිපත් කරන අවස්ථාවක, ඉහත සඳහන් යෝජනාවට අනුකූලව වාර්තාව කෙටි කරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිනු ඇත. එහිදී රාජ්‍ය පාර්ශවයට වාර්තාව සමාලෝචනය කර නැවත ඉදිරිපත් කිරීමට නොහැකි වේ නම්, ගිවිසුම් ආයතනය විසින් සලකා බැලීම සඳහා එහි පරිවර්තනයක් යොමු වනු ඇති බවට සහතික කළ නොහැක.

55. එසේම, පොදු මූලික ලේඛනයන් පිළිබඳ මාර්ගෝපදේශය සහ ගිවිසුම් වලට විශේෂිත වූ ලේඛන පිළිබඳ මාර්ගෝපදේශ (RI/GEN/2/Rev.6, පරිච්ඡේදය බලන්න) සහ මහා සභා යෝජනාව 68/268 හි 16 වන ඡේදය ඇතුළුව, ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් යටතේ වාර්තා කිරීම පිළිබඳ සුසංයෝගී මාර්ගෝපදේශවල අඩංගු පොදු මූලික ලේඛනයේ අවශ්‍යතාවලට අනුකූල වන පරිදි, වචන 42,400 නොඉක්මවන යාවත්කාලීන කරන ලද මූලික ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසද කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනා කර සිටියි.

ළමුන් සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධවීම පිළිබඳව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වෛකල්පිත සන්ධානයෙහි 8 වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධ අවසන් නිරීක්ෂණ

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

එක්සත් ජාතීන්ගේ සංවිධානය
ළමා අයිතිවාසිකම් සම්මුතිය

බෙදාහැරීම : පොදු
2010 ඔක්තෝබර් 19
මුල් පිටපත : ඉංග්‍රීසි භාෂාවෙනි

ළමා අයිතිවාසිකම් කමිටුව
පනස් පස්වෙනි සැසිය
සැප්තැම්බර් 13 - 2010 ඔක්තෝබර් 1

ළමුන් සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධවීම පිළිබඳව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විකල්ප සන්ධාන පත්‍රයෙහි 8 වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සලකා බැලීම.
අවසන් නිරීක්ෂණ : ශ්‍රී ලංකාව

1. කමිටුව ශ්‍රී ලංකාවේ ආරම්භක වාර්තාව (CRC/C/OPAC/CKA) සහ 2010 ඔක්තෝබර් මස 1 වන දින පැවති එහි 157 වැනි රැස්වීම (සීආර්සී/සී/එස්.571) සලකා බලා 2010 ඔක්තෝබර් මස 1 වන දින පැවති එහි 1583 වැනි රැස්වීමේදී පහත සඳහන් සමාප්ති නිරීක්ෂණ සම්මත කරගන්නා ලදී.

හැඳින්වීම

2. රාජ්‍ය පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරන ලද ආරම්භක වාර්තාව මගින් විකල්ප සන්ධාන පත්‍රය (සීආර්සී/සී/ඕපීඒසී/2) යටතේ කමිටුවේ වාර්තාකරණ මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම කණගාටුදායක තත්ත්වයක් වුවද කමිටුව විසින් රජයේ පාර්ශ්වකරුවන් එම වාර්තා ඉදිරිපත් කිරීම සාදරයෙන් පිළිගනියි. එමෙන්ම ගැටළු ලැයිස්තුව සඳහා රාජ්‍ය පාර්ශ්වය ලබා දෙන ලිඛිත පිළිතුරු (CRC/C/OPAC/Q/1/ADD.1) කමිටුව විසින් සතුටින් පිළිගන්නා අතර බහුආංගික නියෝජිතයින් සමඟ පවත්වන ලද ව්‍යුහාත්මක සංවාදය ඇගයීමට ලක් කරනු ලැබේ.

3. වර්තමාන සමාප්ති නිරීක්ෂණ 2010 ඔක්තෝබර් මස 1 වන දින සම්මත කරන ලද රාජ්‍ය පාර්ශ්වයේ ඒකාබද්ධ තෙවන සහ සිව්වන කාර්තුමය වාර්තා (CRC/C/LKA/CO/3-4) පිළිබඳව සමාප්ති නිරීක්ෂණ සමඟ කියවිය යුතු බව කමිටුව රාජ්‍ය පාර්ශ්වයට සිහිපත් කර දෙයි.

I. ධනාත්මක ලක්ෂණ

4. පහත අවස්ථා ධනාත්මක බව කමිටුව සඳහන් කරයි :
   - (අ) සන්නද්ධ හමුදා සඳහා ස්වෙච්ඡාවෙන් බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 18ක් බව දක්වන විකල්ප සන්ධාන පත්‍රිකාව සහතික කිරීම පිළිබඳව රාජ්‍ය පාර්ශ්වය විසින් ප්‍රකාශයක් සිදු කර තිබේ ;
   - (ආ) රජයේ පාර්ශ්වය විසින් සන්නද්ධ හමුදාවට බලහත්කාරයෙන් බඳවා නොගන්නා අතර ව්‍යතිරේඛයකින් තොරව ස්වෙච්ඡාවෙන් බඳවා ගැනීමේ වයස අවුරුදු 18ක් වේ ;
   - (ඇ) සන්නද්ධ ගැටුම් වලදී සේවය ලබාගැනීම සඳහා ළමුන් සම්බන්ධ කරගැනීම හෝ බඳවාගැනීම සඳහා දඬුවම් පැමිණවීමට දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන ලදී. (2006 අංක 18 දරන සංශෝධන පනත) ;

5. කමිටුව විසින් 2001 මාර්තු 01 දරන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 1999 අංක 182 ළමා ශ්‍රමයේ වඩාත් අනර්ථකාරී ස්වරූපයන් තුරන් කිරීම සඳහා එය තහනම් කිරීමේ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් සම්මුතියේ සහතිකකිරීම කමිටුව සතුටින් පිළිගනියි;

II. පොදු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

ස්වාධීන නිරීක්ෂණය

6. ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව සතුව පවතින ස්වාධීනත්වය අඩු බවත් එහි වගකීම් ඵලදායී ආකාරයෙන් ඉටුකිරීම සඳහා අවශ්‍ය මානව, මූල්‍ය සහ තාක්ෂණික සම්පත් සපයා නොමැති බවත්

කමිටුව සඳහන් කරයි. ළමුන්ගේ ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාව තුළ ළමා අයිතිවාසිකම් කාර්යාංශයක් ස්ථාපනය කිරීම සලකා බැලීම සඳහා රාජ්‍ය පාර්ශ්වය වෙත කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කිරීම අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් කමිටුව තවදුරටත් කනස්සල්ල ප්‍රකාශ කරයි.

7. මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම (පැරිස් ගිවිසුම) සඳහා වන ජාතික ආයතනයන්හි තත්ත්වය ආශ්‍රිත මූලධර්මවලට අනුකූලව ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කමිටුව රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරයි. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයේදී සහ ආරක්ෂා කිරීමේදී ස්වාධීන මානව හිමිකම් ආයතනයන්හී කාර්යභාරය පිළිබඳව එහි දෙවන පොදු ප්‍රකාශයේදී (2002) අවධානය යොමු කරමින් ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට ස්වකීය වගකීම් ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය මානව,
මූල්‍ය හා තාක්ෂණික සම්පත් සපයා ඇති බව තහවුරු කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයට දන්වනු ලැ බේ.. කොමිෂන් සභාව තුළ ළමා අයිතිවාසිකම් සඳහා කාර්යාංශයක් පිහිටුවීමට හෝ ළමුන් සඳහා ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කිරීමට සලකා බලන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වය වෙත තවදුරටත් දන්වා සිටියි. මෙම කාර්යාංශය හෝ ඔම්බුඩ්ස්මන්වරයා සතුව සියලුම ළමුන්ට ප්‍රවේශ විය හැකි ප්‍රමාණවත් මානව, තාක්ෂණික මෙන්ම මූල්‍ය සම්පත් පවතින බවටත්, බවටත්, එය සතුව ළමුන්ගේ විශේෂයෙන්ම ගැටුම් හේතුවෙන් බලපෑමට ලක් වූ ළමුන්ගේ පැමිණිලි ලබාගැනීමට, විමර්ශනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලතල පවතින බවටත් රාජ්‍ය පාර්ශ්වය සහතික විය යුතුය.

ප්‍රචාරණය සහ දැනුවත් කිරීම

8. රාජ්‍ය පාර්ශ්වය විසින් විකල්ප සන්ධාන පත්‍රය විශාල වශයෙන් ජනතාව අතර විශේෂයෙන්ම ළමුන් අතර ප්‍රචාරණය සඳහා ගනු ලබන සීමිත ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව සැලකිලිමත්ව වේ.

9. විකල්ප සන්ධාන පත්‍රයේ 6 වන සහ 2 වන ඡේද සැලකිල්ලට ගෙන විකල්ප සන්ධාන පත්‍රයේ මූලධර්ම සහ විධිවිධාන පුළුල් ලෙස පොදු ජනතාව යළි ළමුන් අතර ප්‍රචාරය වී ඇති බවට රාජ්‍ය පාර්ශ්වකරුවන් සහතික විය යුතු බව කමිටුව නිර්දේශ කරයි.

පුහුණුව

10. මේ සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වය විසින් සුළු වශයෙන් තොරතුරු සැපයීමෙන් පිළිබිඹු වූ පරිදි අදාළ වෘත්තීය කාණ්ඩ විශේෂයෙන් හමුදාව, පොලිසිය සහ වෙනත් ආරක්ෂක නිලධාරීන් සහ නෛතික පරිපාලනය සම්බන්ධයෙන් නිරත තැනැත්තන් විකල්ප සන්ධාන පත්‍රයේ විධිවිධාන පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් නොලැබීම පිළිබකමිටුව සැලකිලිමත් වේ.

11. රාජ්‍ය පාර්ශ්වය විසින් සන්නද්ධ හමුදාවල සාමාජිකයින් පොලීසිය සහ වෙනත් ආරක්ෂක නිලධාරීන් හා නෛතික පරිපාලනයෙහි නිරත තැනැත්තන්ගේ මානව හිමිකම් පුහුණුව ශක්තිමත් කිරීම සහ ඔවුන් විකල්ප සන්ධාන පත්‍රයේ විධිවිධාන පිළිබඳව විශේෂ පුහුණුවක් ලබන බව ඔවුන් සහතික කරයි. තවද, ළමුන් සමඟ කටයුතු කරන අදාළ වෘත්තීය කණ්ඩායම්, විශේෂයෙන්ම නීතිය බලාත්මක කරන නිලධාරීන්, සමාජ ක්‍රියාකාරීන්, වෛද්‍ය වෘත්තිකයින්, ගුරුවරුන්, මාධ්‍ය වෘත්තිකයින් සහ දේශීය සහ දිස්ත්‍රික් නිලධාරීන් සඳහා විකල්ප සන්ධාන පත්‍රයේ විධිවිධාන පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීම, අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සංවර්ධනය කිරීම කමිටුව නිර්දේශ කරයි. එහි ඊළඟ වාර්තාව සඳහා තොරතුරු සැපයීමට රාජ්‍ය පාර්ශ්වයට ආරාධනා කරනු ලබයි.

ළමුන් මරණයට පත් කිරීම්

12. 2009 වර්ෂයේදී යුධ ගැටුමෙහි අවසන් මාස පහ තුළ ළමුන් සිය ගණන් මරණයට පත්වීම පිළිබඳව රාජ්‍ය පාර්ශ්වය විසින් දරන ලද උත්සාහය ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් කමිටුව වැඩි සැලකිල්ලක් දක්වයි. මෙම ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන්ම සිවිල් ජනතාව සිටින ප්‍රදේශ රෝහල්, පාසල් සහ මානුෂීය මෙහෙයුම් පැවති ස්ථාන වෙත ෂෙල් වෙඩි සහ බෝම්බ හෙළීම සහ ආහාර, වෛද්‍ය ප්‍රතිකාර සහ මානුෂීය ආධාර හිතාමතාම අහිමි කිරීම ආදිය ඇති විය.

13. මේ සම්බන්ධයෙන් නියමිත වේලාවට, ස්වාධීනව අපක්ෂපාතී ලෙස විමර්ශන සිදු කිරීම හා ළමුන් මරණයට පත් කිරීම් සඳහා වගකිවයුතු පුද්ගලයින්ට විරුද්ධව නියමිත පරිදි නඩු පැවරීම සුදුසු දණ්ඩන සහිතව දඬුවම් පැමිණවීම හා ළමුන් මරණයට පත්වීම තවදුරටත් සිදු නොවීමට කටයුතු කිරීම රාජ්‍ය පාර්ශ්වය සහතික විය යුතු බවට කමිටුව රාජ්‍ය පාර්ශ්වය දැඩි ලෙස උනන්දු කරයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමට මේ සම්බන්ධයෙන් විශ්වාසදායි මෙන්ම කාර්යක්ෂම වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමේදී මෙන් ම කරන ජාත්‍යන්තර විශිෂ්ට භාවිතයන් යොදා ගනු ලැබීමේදී රාජ්‍ය පාර්ශ්වයේ උගත් පාඩම් සහ සංහිඳියාව පිළිබඳ කොමිෂන් සභාවට සහයෝගය දක්වන මහ ලේකම්ගේ ශ්‍රී ලංකාව පිළිබඳ වගවීම් දරන විශේෂඥ උපදේශන කමිටුව සමඟ පූර්ණ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට කමිටු රාජ්‍ය පාර්ශ්වය දැඩිලෙස උනන්දු කරයි.

අතුරුදහන් වූ ළමුන් සහ දත්ත රැස් කිරීම

14. සන්නද්ධ අරගලයේ බලපෑමට ලක් වූ ළමුන්ගේ දත්ත පිළිබඳව අවධානය යොමු කරමින් කමිටුව දක්වන්නේ එම දත්ත සම්පූර්ණයෙන්ම 2003 ස්ථාපනය කරන ලද එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් රැස්කරගත් බවයි. පවුල් හඳුනාගැනීම සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් පැවතිය ද අතුරුදහන් වූ සියගණන් ළමුන් පිළිබඳ තොරතුරු පැහැදිලි කර නොමැති අතර කඳවුරු, සංක්‍රමණ, ආපසු පැමිණීම සහ නැවත පදිංචිකිරීමේ ප්‍රදේශ ඇතුළත්ව පවුල් හඳුනාගැනීම සහ නැවත ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් විශේෂඥතාවක් පවතින ආයතන ඇතුළත්ව ප්‍රධාන වශයෙන් සහයෝගීත්ව හඳුනාගැනීමේ ව්‍යුහයක් ප්‍රමාණවත් ලෙස නොපැවතීම සහ මානුෂීය ක්‍රියාකාරකම්වල නිරත ආයතන මුහුණ දෙන බාධක හේතුවෙන් ළමුන් විශාල ප්‍රමාණයක් හඳුනාගෙන නොමැතිවීම පිළිබඳව කමිටුව විසින් වැඩි සැලකිල්ලක් දක්වයි. ගැටුම හේතුවෙන් මිය ගිය ළමුන් පිළිබඳ නිවැරදි දත්ත නොමැතිවීම සහ මරණ සහතික ලබා ගැනීමේදී පවුල් විසින් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳවද කමිටුව තවදුරටත් සැලකිලිමත් වේ.

15. තම මරණය පිළිබඳ තොරතුරු හෙළිදරව් නොවී පවතින ළමුන්ගේ විස්තර නිශ්චිතව දැන ගැනීමට සහ මෙම අරමුණ ඉටුකර ගැනීමට සේවයේ යෙදවූ සහ සන්නද්ධ ගැටුම සඳහා යෙදවූ ළමුන්, අතුරුදහන් වූ ළමුන්, භාරකරුවන් නොමැති සහ වෙන්වුණු ළමුන් සහ නැවත එක්වුණු ළමුන් ඇතුළත්ව සන්ධාන පත්‍රය මඟින් ආවරණය කරනු ලබන සියලුම ක්ෂේත්‍රයන් පිළිබඳව නිවැරදි තොරතුරු රැස් කිරීමට කමිටුව, රාජ්‍ය පාර්ශ්වය දිරි ගන්වයි. එමෙන්ම කමිටුව, දිවයිනේ උතුරු නැගෙනහිර පළාත්වල පවුල් හඳුනාගැනීමේ සහ නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන්වල සුවිශේෂී විශේෂඥතාවයකින් හෙබි දේශීය මෙන්ම විදේශීය මානුෂීය ක්‍රියාකාරකම්ද නිරත නියෝජිතායතන හෝ හවුල්කරුවා වෙත පූර්ණ ප්‍රවේශය ලබාදීම සහතික කිරීමට රාජ්‍ය පාර්ශ්වය තවදුරටත් උනන්දු කරයි. එමෙන්ම කමිටුව විසින් රැස්කරගත් දත්ත මත පදනම්ව මරණ සහිත නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම හෝ අවශ්‍ය අවස්ථාවන්හිදී ඩීඑන්ඒ (DNA) පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරනු ලැබේ.

III. වැළැක්වීම

රාජ්‍ය නොවන බලවේග විසින් සිදුකරන බඳවා ගැනීම් වැලැක්වීම

16. සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් බඳවාගැනීම සහ භාවිතා කිරීම වැළැක්වීම සඳහා ගන්නා ලද පියවර සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වකරුවන් සපයනු ලබන තොරතුරු ප්‍රමාණවත් නොවිම පිළිබඳව කමිටුව සැලකිලිමත් වේ. ළමුන් සහ සන්නද්ධව අරගලය සඳහා වන මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාගේ විශේෂ රාජ්‍ය දූතයාගේ නවතම වාර්තාවෙහි සඳහන් තොරතුරු අනුව හිටපු අණදෙන නිලධාරියෙකු වන තමිල් මක්කල් විඳුතලෛ පුලිගල් (TMVP) විසින් අම්පාර දිස්ත්‍රික්කයේ ළමුන් නැවත බඳවා ගැනීම කළ නොහැකි වීම සහ එලෙස බඳවාගැනීමේ අවශ්‍යතාවය තවදුරටත් නොපැවතීම හේතුවෙන් සිදු කළ හැකි නැවත බඳවාගැනීම් වැළැක්වීමට සහ විමර්ශනය කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ග යොදා ගැනීමට බාධාවක් වේ. අනතුරට බඳුන්විය හැකි දහස් ගණන් ළමුන් සමඟ කටයුතු කිරීමට යුද්ධයෙන් විනාශයට පත් වූ ප්‍රදේශවල ළමා ආරක්ෂණය හා ළමා සුභසාධක සේවා හිඟවීම, සුදුසුකම් ලත් සීමිත නිලධාරීන් ප්‍රමාණයක් සේවයේ යෙදවීම, ඔවුන්ට පහසුකම් සැලසීම සහ අරමුදල් සැපයීම හේතුවෙන් වැළැක්වීමේ උත්සාහයන්ට බාධා එල්ල වී තිබේ.

17. සන්ධාන පත්‍රයේ 4 වන ව්‍යවස්ථාවට අනුකූලව කමිටුව, රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් විසින් අවුරුදු 18ට අඩු තැනැත්තන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ සේවය ලබාගැනීම වැළැක්වීම සම්බන්ධව ප්‍රධාන හේතු මුලිනුපුටා දැමීමට රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරයි. කමිටු වාර්තාවේ (CRC/C/OPAC/CKA/1,95 ඡේදය) සඳහන් පරිදි කමිටුව, සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් බඳවාගැනීම සමීප නිරීක්ෂණය සහ වැළැක්වීම සඳහා ග්‍රාමීය මට්ටමෙන් කමිටු කඩිනමින් ස්ථාපනය කිරීමට රාජ්‍ය පාර්ශ්වය දිරිගන්වනු ලැබේ.

යුද්ධයෙන් බලපෑමට ලක් වු ප්‍රදේශවල ළමා ආරක්ෂණය සහ ළමා සුබසාධන සේවා පිළිබඳව පවතින දැඩි අවශ්‍යතාවය හේතුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල ප්‍රතිසංස්කරණ සැලසුම්වල ප්‍රමුඛ කරුණක් වශයෙන් ළමා සුභසාධනය සහ ආරක්ෂණය ඇතුළත් කිරීමට කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන් තවුරටත් උනන්දු කරනු ලැ බේ.

මානව හිමිකම් සහ සාම අධ්‍යාපනය

18. 2003 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සාම අධ්‍යාපනය ආවරණය කරන ලද හෙයින් ගැටුම්වලින් බලපෑමට පත් ප්‍රදේශවල අධ්‍යාපන අංශයේ තක්සේරුවක් සිදු කිරීම අවශ්‍ය නොවන අතර සාම අධ්‍යාපනය ඇතුළත්ව සියලු මට්ටම්වලට අදාලව සියලු පාසල්වල විෂය මාලාවන්හි විශේෂ මානව හිමිකම් අධ්‍යාපනය පිළිබඳව රාජ්‍ය පාර්ශ්වය විසින් තොරතුරු ඇතුළත් කර නොතිබීම පිළිබඳ කමිටුව සැලකිලිමත් වේ.

19. ළමුන් අතර සහ විශාල සමාජය තුළ අවිහිංසාවාදී සංස්කෘතියක් තහවුරු වන පරිදි සාමකාමී සංස්කෘතියක් වැඩිදියුණු කිරීමට සහ සුසංවාදී සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමට අත්‍යවශ්‍ය වන අතර මානව හිමිකම් හා සාම අධ්‍යාපනය පිළිබඳ සලකා බලා ගැටුම් නිරාකරණය සහ සම වයස් කණ්ඩායම් මැදිහත්කරණය පිළිබද පුහුණු තුළින් ශිෂ්‍යයින්ට ගැටුම් නිරාකරණයට සහයෝගය දැක්වීම සඳහා මානව හිමිකම් අධ්‍යාපනය ලබා දීම තහවුරු කිරීම, විශේෂයෙන්ම පාසල්වල සියලුම ශිෂ්‍යයින් සඳහා සාම අධ්‍යයනය ලබාදීම සහ ගුරුවරුන් සහ වෙනත් වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වය කඩිනම් මෙන් ම ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ග ගත යුතු බවට කමිටුව නිර්දේශ කරයි.

බිම් බෝම්බ

20. බිම් බෝම්බ ඉවත් කිරීම සහ බිම් බෝම්බ අවදානම පිළිබඳ අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වය විසින් උත්සාහ දැරුවද පුද්ගල නාශක බිම් බෝම්බ සහ නොපිපිරුණු ද්‍රව්‍ය හේතුවෙන් ළමුන් මරණයට පත්වීමේ, ආබාධිත තත්ත්වයට පත්වීමේ අවදානමක සිටින බව කමිටුව සඳහන් කරයි. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ සියලුම පවුල් තම නිජබිමට පැමිණීමට ප්‍රථම බිම් බෝම්බ අවදානම පිළිබඳ අධ්‍යාපනය ලබා නොමැති බවත් බිම් බෝම්බවලට ගොදුරු වූවන්ට සහාය දැක්වීම නොදියුණු තත්ත්වයේ පවතන බවත් කමිටුව විසින් විශේෂයෙන් දක්වනු ලැ බේ.

21. රාජ්‍ය පාර්ශ්වය පහත කාර්යයන් ඉටු කළ යුතු බව කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.

අ) මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකක සහ ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීත්වයෙන් විශේෂයෙන්ම බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා අරමුදල් සැපයීම ශක්තිමත් කිරීම මඟින් බිම් බෝම්බ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා ශක්තිමත් කිරීම.

ආ) බිම් බෝම්බ පිපිරීම සහ සන්නද්ධ ගැටුමේ වෙනත් ප්‍රතිවිපාක හේතුවෙන් බලපෑමට ලක් වූ ළමුන් සඳහා විශේෂ පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීම පිළිබඳව සලකා බැලීම සහ සමාජ සේවා ඉටුකරන මධ්‍යස්ථාන වෙත සම්පත් වෙන් කිරීම ඉහළ නැංවීම සහ පෞද්ගලික ආබාධ සඳහා ලබාදෙන ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමයෙහි වැඩි වශයෙන් ආවරණය කිරීම ආදී වශයෙන් එබඳු වැඩසටහන් සඳහා බලපෑමට ලක් වූ සියලුම ළමුන්ට ප්‍රවේශය පවතින බව සහතික කිරීම්

ඇ) ගැටුමට පෙර, ගැටුම අතරතුර හා ආපසු පැමිණීමෙන් පසු අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පවුල් වෙත බිම් බෝම්බ අවදානම පිළිබඳ අධ්‍යාපනය ලබා දීම සහ විශේෂයෙන්ම බිම් බෝම්බ අවදානම පවතින බවට හඳුනාගත් හා එසේ පවතියි යැයි සැක කෙරෙන නාගරික ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශවල සිවිල් සමාජය සමඟ සම්බන්ධීකරණයෙන් ළමුන්ව හිතකර අධ්‍යාපනික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන බවට සහතික වීම.

ඈ) පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, තොග වශයෙන් රැස් කිරීම, නිෂ්පාදනය සහ හුවමාරුව සහ ඒවා විනාශ කිරීම තහනම් කිරීම පිළිබඳව සම්මුතියට එකඟවීම සම්බන්ධයෙන් සලකා බැලීම.

IV. තහනම් කිරීම සහ ආශ්‍රිත කරුණු

නීති සම්පාදන කටයුතු

22. 2006 ජනවාරි මස (1) වන දිනැති අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත මඟින් සන්නද්ධ ගැටුමේදී සේවය ලබාගැනීම සඳහා ළමුන් යොදවා ගැනීම් හා බඳවා ගැනීම් සාපරාධී තත්ත්වය පිළිගනු ලබන අතර නව නීතිය යටතේ ස්වකීය දණ්ඩන මුක්තිය උදෙසා අඛණ්ඩව ළමුන් බඳවාගත් හා සේවයේ යෙදවූ පුද්ගලයින්ට විරුද්ධව මේ වනතෙක් නඩු පැවරීමෙන් වැළකී සිටීම පිළිබඳව කමිටුව විසින් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. තමිල් මක්කල් විදුතලෛ පුලිගල් ඃඔඑඩඡ* හා සම්බන්ධ ළමුන්ගේ ඉදිරි නඩුවල තොරතුරු පරික්ෂා කිරීමේ මන්දගාමීභාවය පිළිබඳව කමිටුව විශේෂ සැලකිල්ලක් දක්වයි.

23. ළමුන් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාගේ විශේෂ රාජ්‍ය දූතයා විසින් ඔහුගේ 2009 දෙසැම්බර් මස වාර්තාවෙහි නිර්දේශ කර ඇති පරිදි තමිල් මක්කල් විදුතලෛ පුලිගල් ඃඔඑඩඡ* හා සම්බන්ධ ළමුන්ගේ ඉතිරි නඩු පිළිබඳ තොරතුරු සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙස කමිටුව, රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරයි. වගකිවයුතු අපරාධකරුවන්ගේ නඩු ක්‍රියාමාර්ග සහ දඬුවම් නියම කිරීම සඳහා හේතුවන වාර්තා කරන ලද සෑම නඩුවක් සඳහාම ක්‍රමානුකූල මෙන්ම ප්‍රබල විමර්ශන ඇතුලත්ව ළමුන් බඳවා ගැනීම පිළිබඳ 'ශුන්‍ය සාධාරණත්වය' යන තත්ත්වය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සහ ළමුන් පැහැරගැනීම සහ බඳවාගැනීම් සම්බන්ධයෙන් රජයේ නිලධාරින්ගේ මැදිහත්වීම පිළිබඳව අන්තර් අමාත්‍ය කමිටුව සිදු කරන ලද විමර්ශන සම්පූර්ණ කිරීම සඳහා (5/2004/320 58 සී) පරිච්ඡේදයහි දැක්වෙන මහ ලේකම්වරාගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වඩාත් ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වය දිරි ගන්වනු ලැ බේ.

යුධමය කටයුතු සඳහා පාසල් උපයෝගී කර ගැනීම

24. ඇතැම් පාසල් රාජ්‍ය පාර්ශ්වය විසින් යුධමය කටයුතු සඳහා යොදා ගැනීම හෝ 'යුධ සේවයෙන් ඉවත් වීමට සිටින තැනැත්තන් " සඳහා අනුග්‍රහය දැක්වීමට භාවිතා කිරීම සම්බන්ධයෙන් කමිටුව වැඩි සැලකිල්ලක්
දක්වයි.

25. කමිටුව විසින් පහත කාර්යයන් ඉටු කරන ලෙෂ රාජ්‍ය පාර්ශ්වය වෙතින් ඉල්ලුම් කරනු ලැ බේ.

(අ) යුධමය කටයුතු සඳහා පාසල් භාවිතය වහාම නැවැත්වීම සහ මානුෂීය නීතියට හා විශිෂ්ඨත්වයේ මූලධර්මයට අනුකූලතාවය දැක්වීම සහ යුධ සේවයෙන් ඉවත් වීමට සිටින තැනැත්තන් සඳහා දායකත්වය දැක්වීමට වන්නි දෙමළ මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශය සහ ඕමන්තේ මධ්‍ය මහා විද්‍යාලය භාවිතා කිරීම නැවැත්වීම.

(ආ) යුධමය කටයුතු සඳහා යොදා ගැනීම හේතුවෙන් හානියට පත් වූ යටිතල පහසුකම් ඉතා ඉක්මනින් සම්පූර්ණයෙන් පිළිසකර කරන බව සහතික වීම.

පාසල්වල ක්‍රියාත්මක වන යුධමය ක්‍රියාකාරකම්

26. කැඩෙට් කණ්ඩායම්වල පරිපාලනය, අධ්‍යයන පරිපාටි සහ ක්‍රියාකාරිත්වය අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ පාලනය වන බවට රාජ්‍ය පාර්ශ්වය නිශ්චිත වශයෙන් ප්‍රකාශ කිරීම කමිටුව විසින් සතුටින් පිළිගනියි. නමුත් පෙළපාලි පුහුණුවීම්වලදී කැඩෙට් කණ්ඩායම් විසින් ගිනි අවි භාවිතය පුහුණුවීම පිළිබඳව කමිටුව සැලකිලිමත් වේ.

27. කැඩෙට් කණ්ඩායම්වල පුහුණුවීම්වලදී යුධමය ක්‍රියාකාරකම් ඇතුළත් නොකරන බවට සහතික කර ගැනීමට කමිටුව රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරයි. තවද අතිරේක සන්ධාන පත්‍රයේ ස්වභාවයට අනුව සියලුම ළමුන් විසින් ගිනි අවි හැසිරවීම සහ භාවිතා කිරීම තහනම් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලුම් කරයි.

V. ආරක්ෂා කිරීම, ප්‍රතිසාධනය සහ ප්‍රත්‍යනුකලනය

ළමුන් සඳහා වන මානුෂීය ප්‍රවේශය පිළිබඳ සීමාවන්

28. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පවුල් විශේෂයෙන්ම කඳවුරුවල රැඳී සිටින පවුල් ආහාර හිඟයට මුහුණ දී සිටින කඩිනමින් සහනය අවශ්‍ය අවස්ථාවේදී එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර සංවිධාන සහ ජාත්‍යන්තර හා ජාතික රාජ්‍ය නොවන සංවිධාන වලින් ලබා දෙන මානුෂීය ප්‍රවේශය පාලනය කරමින් ආරක්ෂක සේනාංකවල සියලුම අණදෙන නිලධාරීන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේදී නිකුත් කරන ලද විධාන පිළිබඳව කමිටුව බලවත් ලෙස සැලකිලිමත් වේ.

29. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් වෙත සහයෝගය දැක්වීම සඳහා ජාත්‍යන්තර මානුෂීය සංවිධාන හා වෙනත් සුදුසු ක්‍රියාකාරීන්ට සිය සේවය ලබාදීමට රාජ්‍ය පාර්ශ්වය වෙත අයිතිය පවතින බව කමිටුව රාජ්‍ය පාර්ශ්වයට සිහිපත් කරදෙයි. මානුෂීය සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා පවතින අනවශ්‍ය සීමාවන් වහාම ඉවත් කරන ලෙසත් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පවුල් සහ සහාය අවශ්‍ය ළමුන් වෙත බාධාවකින් තොරව සහාය දැක්වීම සහතික කරන ලෙසත් කමිටුව තවදුරටත් රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටියි.

අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

30. අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන්ට සහයෝගය දැක්වීමේ හා ආරක්ෂා කිරීමේ කෙටුම්පත උපයෝගී කර ගැනීමේදී 2008 වර්ෂයේ එහි ප්‍රගතියක් නොතිබුණු බව කමිටුව මහත් සැලකිල්ලෙන් යුතුව දක්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සන්නද්ධ අරගලයේදී ළමුන් බඳවාගැනීමේ හා භාවිතා කිරීමේ අවස්ථාවන්හිදී සාධනීය පරීක්ෂණවලට බාධා පමුණුවන ආකාරයේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ විධිවිධාන රාජ්‍ය පාර්ශ්වයෙහි නොමැත. සන්නද්ධ අරගලය සඳහා ළමුන් බඳවාගැනීම හා එහිදී ළමුන් භාවිතා කිරීම වාර්තා කරනු ලබන තැනැත්තනගෙන් පලිගැනීම, ඔවුන් බියගැන්වීම සහ තර්ජනවලට ලක්වන අවස්ථා පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතු බව කමිටුව ප්‍රකාශ කරයි. ළමුන් සම්බන්ධයෙන් විශේෂිත අවශ්‍යතා පිළිබඳ පූර්ණ වශයෙන් සැලකිලිමත් වීමේදී කෙටුම්පත්වල අඩුපාඩු කිහිපයත් පවතින බව හා විධිවිධාන පමාණවත් නොවීම කෙරෙහි කමිටුව විශේෂ සැලකිල්ලක් දක්වයි

31. අපරාධවලට ගොදුරු වූවන් හා සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමට කඩිනම් කිරීම සඳහා අදාළ ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන චර්යාධර්ම යන විශිෂ්ඨ භාවිතයන්ට අනුකූල නීතිය සහතික කරගැනීමට සහ එය උපයෝගී කරගැනීම කඩිනම් කිරීමට අපරාධවලට ගොදුරු වන ළමුන් හා සාක්ෂිකරුවන් සාධනීය ලෙස ආරක්ෂා කිරීම යටපත් කරනු ලබන සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීතියේ අඩුපාඩු පරික්ෂාකාරීව සමාලෝචනය සඳහා කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරනු ලැබේ. තර්ජන තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම සහ සහයෝගය දැක්වීම අනුව ළමුන් සම්බන්ධයෙන් විශේෂිත වූ අවශ්‍යතා නෛතික වශයෙන් සලකා බැලීම සහතික කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලු කරයි. ළමුන් සමඟ කටයුතු කිරීමට පළපුරුද්ද සහිත විශේෂයෙන් පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයක් විශේෂයෙන්ම වැඩසටහනේ ආරක්ෂක අංශයන්ට ඇතුලත් කර සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් සියලු සම්පත් සහිතව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව කමිටුව තවදුරටත් නිර්දේශ කරයි.

හදිසි රෙගුලාසි යටතේ ළමුන් රඳවා තබා ගැනීම

32. ආරක්ෂාව සම්බන්ධ වැරදි කළේ යැයි සැක කෙරෙන ළමුන් 2005 අංක 1 දරන හදිසි අවස්ථා රෙගුලාසි සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මේ දක්වා රඳවා තබා ගැනීම හා රඳවා තබා ගැනීමට හැකි වීම සම්බන්ධයෙන් කමිටුව වැඩි සැලකිල්ලක් දක්වයි. මෙම ළමුන් අප්‍රසිද්ධ ස්ථානයන්හි වසරක් රඳවාගෙන ඔවුන්ගේ රඳවා ගැනීම සම්බන්ධයෙන් වන නීත්‍යානුකූලභාවයට අභියෝග කිරීම පිණිස නීතිඥවරයෙකු, පවුලේ සාමාජිකයින්, විනිසුරුවරයෙකු හෝ වෙනත් නිසි අධිකාරයක් වෙත යොමු කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ද කමිටව විසින් වැඩි සැලකිල්ලත් දක්වනු ලැ බේ.

33. ළමුන් තවදුරටත් ආරක්ෂාව යටතේ රඳවා තබා ගැනීම හෝ ත්‍රස්ත විරෝධී නීතිකරණ කටයුතුවලට යොදවා ගැනීම හෝ තවදුරටත් සිදු නොකරන බවට සහතික කිරීම සඳහා තවදුරටත් කඩිනම් විමර්ශන කරන බවට කමිටුව රාජ්‍ය පාර්ශ්වය උනන්දු කරයි. සාමාන්‍ය නෛතික පද්ධතියේ බාහිරව ළමුන් රඳවා ගැනීම සඳහා භාවිතා කළ හැකි හදිසි රෙගුලාසි අවලංගු කිරීමට අප්‍රමාදීව කටයුතු කළ බව කමිටුව රාජ්‍ය පාර්ශ්වයට දන්වයි

34. ළමුන්ට හිතකර පුනරුත්ථාපනය හා නැවත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේදී නෛතික මැදිහත්වීම හඳුන්වාදෙනු ලබන සන්නද්ධ කණ්ඩායම් හා සම්බන්ධ ළමුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන නැවත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2008 අංක 1580/5 දරණ හදිසි අවස්ථා රෙගුලාසි සම්මත කර ගැනීම පිළිබඳව කමිටුව විශේෂයෙන් සඳහන් කරයි. කෙසේවෙතත් මෙම ක්‍රියාවලිය නීති උපදේශකවරයෙකු විසින් සහාය ලබා දිය යුතු විශේෂයෙන්ම ළමා අයිතිවාසිකම් සම්බන්ධව කරුණු හා ආරක්ෂිත නවාතැන්පල සඳහා යොමු කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ළමා අධිකරණ සම්මුතීන් සමග අනුගත නොවන බව කමිටුව සැලකිලිමත් වේ. හදිසි අවස්ථා රෙගුලාසි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන වෙතින් සහාය ලබා නොමැත.

35 පහත කරුණු සහතික කර ගැනීමට ළමා පුනරුත්ථාපනය හා නැවත ඒකාබද්ධ කිරීමට අදාළ නෛතික රාමුව සමාලෝචනයට කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන් දිරිමත් කරනු ලැ බේ.

අ) ළමුන්ගේ තමාට අදාළ කරුණු සම්බන්ධයෙන් මත ඉදිරිපත් කිරීමට ඇති අයිතිය භුක්ති විදීටම් අයිතිය තහවුරු කිරීමල සමාජ විමර්ශන වාර්තාවේ පිටපතක් ලබාදීම හා මහේස්ත්‍රාත්වරුන් විසින් පරීක්ෂා කරන ලද සාක්ෂි පිළිබඳව දැනුම් දීම.

ආ) නෛතික උපදේශක සහාය ලබා ගැනීමට අවස්ථාව ලැබීම

ඇ) ඉහළ අධිකාරියක් ඉදිරියේ ඔවුන් රඳවා ගැනීම පිළිබඳ නීත්‍යානුකූලභාවයට අභියෝග කළ යුතු අතර ඔවුන් වෙනුවෙන් අතිරේක සාක්ෂි සැපයීම

පුනරුත්ථාපන මධ්‍යස්ථාන

36. පුනරුත්ථාපනය වූ ළමුන් 667 දෙනෙකු සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වයන් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කමිටුව පිළිගනියි. එම තොරතුරු අනුව ළමුන්ගෙන් පිරිසක් ඔවුන්ගෙන් පවුල්වලින් වෙන්කර දීර්ඝ කාලයක් පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රඳවා තබාගෙන සිට මේ වනවිට නිදහස් කර ඔවුන්ගේ පවුල් සමග නැවත සම්බන්ධ කර තිබේ. පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හමුදා නිළධාරින්ගේ මැදිහත්වීම පිළිබඳව කමිටුව සැලකිලිමත් වේ.

37. හදිසි අවස්ථා රෙගුලාසි 1580/5 හි දක්වා ඇති පරිදි කඩිනමින් පවුල් හා සමාජ මත පදනම් වූ පුනරුත්ථාපන වැඩසටහන් ස්ථාපනය කිරීමට හා අවසන් විසඳුම වශයෙන් මධ්‍යස්ථානය පදනම් කරගත් පුනරුත්ථාපනය සිදු කිරීමට කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වයන් උනනදූ කරනු ලැ බේ. සන්නද්ධ සේවා හෝ සන්නද්ධ කණ්ඩායම් හා සම්බන්ධ ළමුන් පිළිබඳ මූලධර්ම හා උපදෙස්වලට අනුකූලව විශේෂයෙන්ම පුනරුත්ථාපන මධ්‍යස්ථාන මෙහෙයවීම හා තවදුරටත් හමුදා නිලධාරීන් සම්බන්ධ නොවන පුනරුත්ථාපන මධ්‍යස්ථාන කළමනාකරණය වන්නේද යන්න සහතික කිරීමට කමිටුව රාජ්‍ය පාර්ශ්වකරුවන් වෙතින් ඉල්ලුම් කරනු ලැබේ

සන්නද්ධ කණ්ඩායම් සමඟ කලින් සම්බන්ධ වී සිටි ළමුන්ගේ අපරාධ සම්බන්ධ වගකීම

38. සන්නද්ධ අරගලයට කලින් සම්බන්ධව සිටි සහ ආරක්ෂාව හා ත්‍රස්තවාදය සම්බන්ධ චෝදනා හේතුවෙන් රඳවාගෙන සිටි ළමුන් කිසි දිනක නඩු පැවරීමකට මුහුණ නොදෙන බවට රාජ්‍ය පාර්ශ්වයන් විසින් ලබාදෙන ලද සහතිකය ධනාත්මක බව කමිටුව දක්වයි. නමුත්, සන්නද්ධ කණ්ඩායම් සමඟ කලින් සම්බන්ධ වී සිටි ළමුන්ගේ අපරාධ සම්බන්ධ වගකීම පැහැදිලි කෙරෙන ලේඛනයක් නොමැතිවීම හේතුවෙන් 2006 සැප්තැම්බර් මස අංක 1462/8 දරන හදිසි අවස්ථා රෙගුලාසි සහ ළමුන් හා වැඩිහිටියන් සම්බන්ධයෙන් සමානව අදාල කරගත හැකි වෙනත් ආරක්ෂක සහ ත්‍රස්ත විරෝධී නීති අදාළ කර ගැනිමේදී ළමුන් සම්බන්ධයෙන් නඩු පැවරීම් පිළිබඳව තවදුරටත් අපේක්ෂා කළ හැකිවීම කමිටුව සැලකිල්ලක් දක්වයි.

39. ළමුන් සන්නද්ධ කණ්ඩායම් සමඟ සම්බන්ධවීම සඳහා ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමේ ක්‍රියාකාරකම් නොපැවරිය යුතු බවට අධිකරණ බලධාරින් වෙත නියෝග කරමින් සන්නද්ධ අරගලයේ නිරත ළමුන්ට විරුද්ධව නඩු කඩිනමින් නොපැවරීමට එහි කාර්යය විධිමත් කිරීම සම්බන්ධයෙන් ෂලකා බලන ලෙස කටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන් උනන්දු කරනු ලැ බේ.

අධි ආරක්ෂිත ප්‍රදේශ

40. යුද්ධයෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරිමේ කටයුතු සිදු කිරීම සඳහා ඉහළ ආරක්ෂාවක් සහිත කලාප පවත්වාගෙන යන බව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්ගේ නියෝජිත කණ්ඩායම සමඟ වන සංවාදයේදී පැහැදිලි කර ඇතිබව කමිටුව දක්වයි. කෙසේ නමුත් අධි ආරක්ෂිත කලාප, විශේෂයෙන්ම ශාන්තපුරම් සහ ඉන්දුපුරම් (මුලතිව් සහ කිලිනෝච්චි දිස්ත්‍රික්ක), සිල්වතුරෙයි සහ මුල්ලිකුලම් (පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්ක) සහ සාම්පූර් (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය) සහ වෙනත් ප්‍රදේශවල අධි ආරක්ෂිත කලාප පිහිටුවනු ලැබීම හේතුවෙන් දහස් ගණන් පවුල්වලට සහ ඔවුන්ගේ ළමුන්ට දීර්සකාලීනව අවතැන්ව සිටීමට, ඇතැමුන්ට සංක්‍රමන කඳවුරුවල ජීවත්වීමට, අනෙක් අයට සත්කාරක පුවල් සමඟ ජීවත් වීමට හෝ තම ඉඩම් වෙත ප්‍රවේශයකින් තොරව ජීවත්වීමට සිදුවීම සම්බන්ධයෙන් කමිටුව සැලකිල්ල දක්වා තිබේ.

41. සරණාගත සහ අවතැන්වූ පුද්ගලයින් සඳහා නිවාස සහ දේපළ ප්‍රතිස්ථාපනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලධර්ම කෙරෙහි අවධානය යොමු කිරිමේදී සියලුම සරණාගත හා අවතැන් වූ පුද්ගලයින්ට තමන්ව අත්තනෝමතික ලෙස හෝ නීතිවිරෝධීව අහිමි වූ ඕනෑම නිවසක්, ඉඩමක් සහ/ හෝ දේපළක් ප්‍රතිස්ථාපනය කර ගැනීමේ අයිතිය පවතින බව කමිටුව පාර්ශ්වකරුවන වන රාජ්‍යයන් වෙත සිහිගන්වන අතර අවතැන්වීමට සම්බන්ධ යම් උචිත පියවරක් වශයෙන් සහ ප්‍රතිස්ථාපන යුක්තියේ ප්‍රධාන මූලිකාංගයක් වශයෙන් ප්‍රතිස්ථාපනය අයිතිය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් පැහැදිලි ලෙස ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු බව දක්වයි. විශේෂ අධි ආරක්ෂිත කලාප කඩිනමින් විසුරුවා හැරීම සඳහා යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ පවුල් වලට තම මුල් වාසස්ථාන වෙත ආපසු පැමණිම සහතික කරන ලෙස රාජ්‍ය පාර්ශ්වකරුවන් වෙතින් ඉල්ලුම් කරනු ලැ බේ.

මනෝ විද්‍යාත්මක සහාය

42. ළමා සටන්කාමීන් වශයෙන් සිටි තැනැත්තන් ගැන ගැඹුරෙන් තොරතුරු දැනගෙන මනෝ විද්‍යාත්මක සහාය ලබා දීම හා ළමා සටන්කාමීන් ආරක්ෂා කිරීම, පුනරුත්ථාපනය හා නැවත ඒකාබද්ධ කිරීම සඳහා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ බහු විෂයිත සාමාජිකත්වය සහිත උපකමිටුවක් ස්ථාපනය කිරීමේ සාධනීය බව කමිටුව සඳහන් කරයි. ළමා සොල්දාදුවන්ව සිටි දහස් ගනණක් ළමුන් සඳහා වහාම අවශ්‍ය මනෝ විද්‍යාත්මක සහාය සැපයීමේ ප්‍රගතියෙහි මන්දගාමීබව පිළිබඳව කමිටුව සැලකිලිමත් වේ.

43. ළමුන් සඳහා දැනට පවතින මනෝවිද්‍යාත්මක සහාය ශක්තිමත් කිරීම සහ ගැටුමට ගොදුරු වූ ළමුන් සමඟ කටයුතු කිරීමට මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් කටයුතු කරනන්න් සහ ඒ සම්බන්ධව විශේෂඥතාව දක්වන වෘත්තිකයින් වැඩිපුර සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා කමිටුව පාර්ශ්වකරුවන්

වශයෙන් කටයුතු කරන රාජ්‍යයන් මේ කාර්යයේදී තාක්ෂණික කඩිනමින් සහාය ලබා ගැනීමට කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන් උනන්දු කරනු ලැබේ.

කුඩා අවි

44. සියලුම ආකාරයේ කුඩා අවි හා සැහැල්ලු අවි නීති විරෝධි වෙළඳාම වැළැක්වීමට, ඒ සම්බන්ධයෙන් සටන් කිරීමට හා මුලිනුපුටා දැමීමට රාජ්‍ය පාර්ශ්වය කැපවී සිටින බවත් 2004 වර්ෂයේදී කුඩා අවි පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවන ලද බවත් කමිටුව සඳහන් කරන අතර රාජ්‍ය පාර්ශ්වය තුළ ළමා ආරක්ෂාව හා ආරක්ෂණය සඳහා ප්‍රධාන තර්ජනයක් වන නීති විරෝධී කුඩා අවි ව්‍යාප්තිය පිළිබඳව කමිටුව අවධානය යොමු කරයි.

45. කුඩා අවි ඇතුළත්ව අවි ලබා ගැනීමට ඇති හැකියාව නැති කිරීම හා පාලනය සඳහා ප්‍රතිපත්තියක් හැකි ඉක්මනින් ස්ථාපනය කිරීමට හා ඒවා අලෙවිය රජයේ දැඩි පාලනය යටතේ සිදුවන බව තහවුරු කර ගැනීමට කමිටුව රාජ්‍ය පාර්ශ්වකරුවන් වශයෙන් කටයුතු කරන රාජ්‍යයන් උනන්දු කරවයි.

VI. ජාත්‍යන්තර සහාය සහ සහයෝගීත්වය

46. 1882 (2009) ආරක්ෂක කවුන්සිලය පදනම් කරගෙන විශේෂයෙන්ම මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය සහ යුනිසෙෆ් (ඔහෂකෑත) සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත්ව එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ වැඩසටහන් සමග සහයෝගීත්වය අඛණ්ඩව පවත්වාගැනීම සහ ළමුන් සහ සන්නද්ධ අරගලය සඳහා වන මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිතයා සමග එහි දායකත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට කමිටුව විසින් රාජ්‍යය පාර්ශ්වය උනන්දු කරනු ලැ බේ.

47. ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම නීතිය පාර්ශ්වකරුවන් වශයෙන් කටයුතු කරන රාජ්‍යයන් විසින් අනුමත කරන බවට කමිටුව නිර්දේශ කරයි.

VII. පසු විපරම හා ව්‍යාප්තිය

48. පවත්නා නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීම සහතික කර ගැනීමට ඒවා සුදුසු පරිදි සලකා බැලීම සහ ඉදිරි කටයුතු සඳහා එම නිර්දේශ ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රේෂ්ඨාධිකරණය, අමාත්‍ය මණ්ඩල, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අදාළ සියලුම පළාත් පාලන ආයතන වෙත යොමු කිරීමට රාජ්‍ය පාර්ශ්වයන් අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගන්නා බවට කමිටුව නිර්දේශ කරයි

.

49. විකල්ප සාධන පත්‍රය එහි ක්‍රියාකාරිත්වය සහ නිරීක්ෂණය පිළිබඳව විවාදයක් ගොඩනැගීමට මෙන් ම දැනුවත්කිරීමට රාජ්‍ය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද ආරම්භ වාර්තාව සහ ලිඛිත පිළිතුරු සහ කමිටුව විසින් සම්මත කරන ලද ආශ්‍රිත සමාප්ති නිරීක්ෂණ සඳහා අන්තර්ජාලය (අන්තර්ජාලය පමණක් නොව), සිවිල් සමාජ සංවිධාන, තරුණ කණ්ඩායම්, වෘත්තීය කණ්ඩායම්, සමාජ ක්‍රියාකාරීන් ඇතුළත්ව මාධ්‍ය සහ ළමුන් ඔස්සේ පුළුල් ලෙස මහජනතාවගේ පරිශීලනය උදෙසා පැවතිය යුතු බව කමිටුව විසින් දක්වනු ලැ බේ.

VIII. ඉදිරි වාර්තාව

50. 8 වන ව්‍යවසථාව හා 2 වන ඡේදය අනුකූලව 2015 ඔක්තෝබර් මස 1 වන දින ඉකුත් වීමට නියමිත සම්මුතිය යටතේ එහි මීළඟ නියමිත අවස්ථාවන්හිදී ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ මෙම සන්ධාන පත්‍රයෙහි ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු හා සමාප්ති නිරීක්ෂණ ඇතුලත් කරන ලෙස කමිටුව විසින් රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලීම් කරනු ලැබේ. 2008 ඔක්තෝබර් නිකුත් කරන ලද ළමුන් අලෙවි කිරීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමුන් ලිංගික කාර්යයන්හි යෙදවීම පිළිබඳ විකල්ප සන්ධාන පත්‍රය යටතේ මූලික වාර්තාව හැකි ඉක්මණින් ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලීම් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ වෛකල්පික සන්ධානයෙහි වගන්ති අංක 12 (1) යටතේ, ළමුන් විකිණීම, ළමුන් ලිංගික ශ්‍රමික වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද වාර්තාව සම්බන්ධ අවසන් නිරීක්ෂණ

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

CRC/C/OPSC/LKA/CO/1

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය
2019 ජූලි 03
මුල් ලියවිල්ල ඉංග්‍රීසි භාෂාවෙනි
ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ වෛකල්පික ප්‍රකාශනයෙහි වගන්ති අංක 12 (1) යටතේ, ළමුන් විකිණීම, ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත්කරන ලද වාර්තාව සම්බන්ධ අවසන් නිරීක්ෂණ.

අ.) හැඳින්වීම

1. 2019 මැයි 21 වන දින පවත්වන ලද 2384 වන කමිටු සැසිවාරයේදී (CRC/C/SR.2384 බලන්න) ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද (wxl CRC/C/OPSC/LKA/1 දරන) වාර්ථාව සළකා බැලූ කමිටුව 2019 මැයි 31 දින පැවති 2400 වන කමිටු රැස්වීමේදී මෙම අවසන් නිරීක්ෂණ සම්මත කර ගන්නා ලදී.

2. රජයේ පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාර්ථාව මෙන්ම මතුකරන ලද කරුණු වලට ලබාදුන් ප්‍රතිචාරයන්ද (CRC/C/OPSC/LKA/Q/1/Add.1) කමිටුව විසින් සාදරයෙන් පිළිගනු ලබන අතර එහිදී රජයේ පාර්ශවය නියෝජනය කළ බහු ආංශික නියෝජිත කණ්ඩායම සමග සිදුකරන ලද ධනාත්මක සංවාදය ද කමිටුවේ පැසසුමට ලක් වේ.

3. එමෙන්ම මෙම අවසන් නිරීක්ෂණ, සම්මුතිය යටතේ 2018 පෙබරවාරි මස 02 දින සම්මත කරගන්නා ලද ඒකාබද්ධ කරන ලද පස්වන සහ හයවන කමිටු වාර්ථාවන් හි සඳහන් වන අවසන් නිරීක්ෂණ හා සම්බන්ධ කරගන්මින් කියවාගත යුතු බව කමුටුව විසින් රජයේ පාර්ශවය වෙත මතක් කර සිටියි.

ආ.) සාමාන්‍ය නිරීක්ෂණ

ධනාත්මක ලක්ෂණ

4. අන්තර්ජාතික වශයෙන් සිදුවන සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට පරිපූරක වශයෙන් හඳුන්වාදුන්, පුද්ගලයන් (විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්) ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සඳහා වූ ප්‍රකාශනය, රජයේ පාර්ශවය විසින් 2015 ජූනි 15 වන දින අපරානුමත කිරීම සම්බන්ධව කමිටුවේ පැසසුම හිමිවේ.

5. 2015 දී අපරාධවලට ගොදුරුවූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට උපකාර කිරීම සඳහා වූ පනත සම්මත කර ගැනීම සහ 2017 නොවැම්බර් මසදී රජය නියෝජනය කරන රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල වලට විදේශයන්හි සිටින වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි සටහන් කර ගැනීමට හැකියාව ලැබෙන පරිදි අවශ්‍ය නීති සංශෝධන සිදුකිරීම ආදී වශයෙන් වෛකල්පික ප්‍රකාශනයෙහි විධිවිධාන ක්‍රියාවට නැංවීම සම්බන්ධව රජයේ පාර්ශවය විසින් ගත් විවිධ ක්‍රියාමාර්ගයන්ට කමිටුවේ පැසසුම හිමිවේ.

6. එමෙන්ම වෛකල්පික ප්‍රකාශනයෙහි විධිවිධාන ක්‍රියාවට නැංවීම සම්බන්ධව අවශ්‍ය ආයතනික ව්‍යුහයන් ස්ථාපනය කිරීම සහ ජාතික මට්ටමේ සැළසුම් සහ වැඩසටහන් සම්මත කරගැනීම යන අංශයන්හි ළබාගෙන ඇති ප්‍රගතියද කමිටුවේ පැසසුමට ලක්වේ. මෙහිදී පහත සඳහන් ව්‍යුහයන්, සැළසුම් හා වැඩසටහන් නිරීක්ෂණයට ලක්ව ඇත

- මානව හිමිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2017-2021)
- ළමුන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020)
- ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ප්‍රචන්ඩත්වය පිටුදැකීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020)

- මිනිස් ජාවාරම් නිරීක්ෂණය සහ පිටුදැකීම සඳහා වූ ජාතික ක්‍රමෝපායික සැළැස්ම (2015-2019)
- ළමා ශ්‍රමිකභාවය තුරන් කරලීමේ ජාතික ප්‍රතිපත්තිය (2016) සහ නරකම ආකාරයේ ළමුන් ශ්‍රමයේ යෙදවීම් තුරන් කරලීම සඳහා වූ 2016 මාර්ග සිතියම.
- දිවයින පුරා විහිදුනු පොලිස් කොට්ඨාශ 42ක සහ පොලිස් ස්ථාන 492ක ළමුන් හා සම්බන්ධ පැමිණිලි සළකා බැලීම සඳහා කාන්තා සහ ළමා කාර්යංශ පිහිටුවීම.
- 2015 දී පිහිටුවන ලද අපරාධ වල වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂාකරලීම සඳහා වූ ජාතික අධිකාරිය.
- 2010 දී පිහිටුවන ලද මිනිස් ජාවාරම් පිටුදැකීමේ කාර්ය සාධක බලකාය.

ඇ.) දත්ත

දත්ත එකතුකිරීම

7. ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ පොලිසියේ කාන්තා සහ ළමා කාර්යංශ යන ආයතනයන්හි ඒවාට ලැබෙන පැමිණිලි වලට අදාළ දත්ත සංචිත පවත්වාගෙන යන බව කමිටුවට නිරීක්ෂණය වී ඇත. කෙසේ වෙතත් වෛකල්පික ප්‍රකාශනයෙහි සඳහන් වන වැරදි සම්බන්ධව මධ්‍යගත සහ ප්‍රමාණවත් පරිදි උප කොටස් වලට වෙන් වූ දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදයක් රජයේ පාර්ශවය සතු නොවීම සැළකිල්ලට ලක් විය යුතු කරුණක් ලෙස හඳුනාගෙන ඇති අතර එම හේතවෙන් අදාළ ගැටළුවෙහි විශාලත්වය පිළිබඳ ප්‍රමාණාත්මක ඇයිමක් සිදුකිරීම අපහසු වී ඇත. එමෙන්ම මෙසේ ප්‍රමාණවත් දත්ත නොමැති වීම, ඉහත සඳහන් ආකාරයේ වැරදි වළක්වාගැනීමට මෙන්ම සුදුසු නීති, ප්‍රතිපත්ති සහ සේවාවන් හරහා ළමා වින්දිතයන්හට අවශ්‍ය රැකවරණය සහ පුනරුත්ථාපන පහසුකම් සැපයීමට රජයේ පාර්ශවය සතු හැකියාවට බළපෑමක් එල්ල වීමද කමිටුවේ අවධානයට ලක් වී ඇත.

8. රජයේ පාර්ශවය විසින් දරුවන් විකිනීම, ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම ද ඇතුලත්ව වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන සියළු අංශයන්ට අදාළව උප කොටස් වලට වෙන් කර දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා මනා සම්බන්ධිකරණයකින් යුත්, සවිස්තරාත්මක ක්‍රමවේදයක් නිර්මාණය කර ක්‍රියාත්මක කරන මෙන් කමිටුව නිර්දේශ කර සිටියි. එහිදී කමිටුව විසින් පහත නිර්දේශ රජයේ පාර්ශවය වෙත ඉදිරිපත් කරනු ලබයි.

- වරදේ ස්වභාවය, සමාජ-ආර්ථික මට්ටම, භූගෝලීය පිහිටුම, ආගමික සම්භවය, ජාතිකත්වය, වයස, ලිංගිකත්වය ආදීවශයෙන් උපකොටස් වලට දත්ත වෙන් කිරීම

- ඩිජිටල් සහ සමාජ මාධ්‍ය වෙත ළමුන්ට ඇති ප්‍රවේශය සහ ඔවුන් ඒවා භාවිත කරන ආකාරය පිළිබඳ දත්ත එක්රැස් කිරීම, මෙහිදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වෙත ඔවුන් පිවිසීමේදී සහ ඒවා භාවිත කිරීමේදී ඇතිවිය හැකි අවදානම් වලට මුහුනදීමට ළමුන් සතු හැකියාවන් කෙරෙහි බලපාන්නා වූ කාරණා මෙන්ම ළමුන්ගේ ජීවිත වලට ඩිජිටල් සහ සමාජ මාධ්‍ය වලින් ඇති බලපෑම සම්බන්ධව දත්ත රැස් කිරීමද වැදගත් වනු ඇත.

- මාර්ගගත හා මාර්ගගත නොවන ආදී වශයෙන්, වරදේ ස්වභාවය මෙන්ම, චූදිතයා/වරදකරු ගේ විස්තර, ලිංගිකත්වය, වයස, ජාතිකත්වය, ආගමික සම්භවය, භූගෝලීය පිහිටුම, සමාජ-ආර්ථික මට්ටම ආදීවශයෙන් වන වින්දිතයන්ගේ විස්තර ලෙස උප කොටස් වලට වෙන්කර ගනිමින් වාර්තා වූ සිද්ධි, නඩු පැවරීම්, දඬුවම් ලබා දීම් සහ ළමා වින්දිතයන්ට සහන සැළසීම් පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කිරීම.

- දත්ත එක්රැස් කිරීමේදී, විශ්ලේෂණය කිරීමේදී සහ ගබඩා කිරීමේදී ළමුන්ගේ අයිතිවාසිකම් මෙන්ම පුද්ගලික රහස්‍යභාවය පිළිබඳ නිසි අවධානයක් යොමු කිරීම.

- එක්රැස් කරගත් දත්ත නිසිපරිදි විශ්ලේෂණය කර, ඒවා පදනම් කරගනිමින් වෛකල්පික ප්‍රකාශනයෙහි

අඩංගු කරුණු ක්‍රියාවට නැංවීම උදෙසා සහය වන ප්‍රතිපත්ති සහ ක්‍රමවේද නිර්මාණය කිරීම. මෙහිදී මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතිය නිරන්තරව තක්සේරු කිරීම ද වැදගත් වේ.

ඈ.) ක්‍රියාත්මක කිරීමේ පොදු පියවරයන්

නීති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම

9. ළමා සම්මුතියේ සහ වෛකල්පික ප්‍රකාශනයෙහි ඇතුලත් ප්‍රතිපාදනයන් බොහොමයක්ම (1992 එළිදැක්වුනු) ළමා ප්‍රඥප්තියට ඇතුලත් කිරීම මෙන්ම (1982 සිට බලපැවැත්වෙන) දණ්ඩනීති සංග්‍රහය වෛකල්පික ප්‍රකාශනයෙහි සඳහන් වරදවල් වළක්වාලන පරිදි පසුකාලීනව සංශෝධනය කිරීම සම්බන්ධව කමිටුවේ පැසසුම හිමිවේ. කෙසේ වෙතත් වෛකල්පික ප්‍රකාශනයෙහි 2 හා 3 වගන්තීන් යටතේ සඳහන් වන වැරදි සියල්ලම ඵලදායි ලෙසින් ආවරණය කිරීමට දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදනයන් අපොහොසත් වීම කමිටුවේ කනස්සල්ලට හේතු වී ඇත. මෙහිදී විශේෂයෙන්ම පහත කරුණු සම්බන්ධව කමිටුවේ අවධානය යොමු වී ඇත.

- ළමුන් විකිනීම සම්බන්ධව සමාන සංකල්පයක් සඳහන් වුවත් වෛකල්පික ප්‍රකාශනයෙහි සඳහන් සංකල්පයට සර්ව සම නොවේ, එමෙන්ම ළමුන් ජාවාරම් කිරීම ද පැහැදිළිව නිර්වචනය කර එය අපරාධයක් බවට ප්‍රකාශ කර නොමැත.

- ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම පැහැදිළිව නිර්වචනය කර නොමැති අතර එම වරදට අදාළ සියළු ක්‍රියාකාරකම් අපරාධයන් බවට ප්‍රකාශ කර නොමැත.

- ජාතික නීති රාමුව මගින් සංචාරක ක්ෂේත්‍රයේදී සිදුවන ළමා ලිංගික සූරාකෑම ආවරණය කර නොමැත

10. සියළුම ආකාරයේ ළමුන් විකිනීම්, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම් සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම් මෙන්ම සංචාරක කර්මාන්තයේදී සිදුවන ළමා ලිංගික සූරාකෑම් ද ඇතුළුව වෛකල්පික ප්‍රකාශනයෙහි ලැයිස්තු ගත කර ඇති සියළු ක්‍රියාකාරකම් දේශීය අපරාධ නීතිය යටතේ ආවරණය වන බවට වගබලාගන්නා ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටී.

සවිස්තරාත්මක ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග

11. ළමුන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020), මානව හිමිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2017-2021), ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ප්‍රචන්ඩත්වය පිටුදැකීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2016-2020) යන ලේඛනයන්හි ළමා ලිංගික සූරාකෑම අවරණය කිරීම සඳහා ප්‍රතිපාදන අඩංගු වන බව කමිටුව නිරීක්ෂණය කරයි. එමෙන්ම බහු ආංශික නියෝජිත කණ්ඩායම සමඟ සිදුකරන ලද සංවාදයේදී ප්‍රත්‍යක්ෂ කරනලද පරිදි, රජයේ පාර්ශවය ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීමේ අවසන් අදියරෙහි පසුවන බවත්, ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා වූ ජාතික හවුල්කාරීත්වය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැළැස්මක් කෙටුම්පත් කර ඇති බවත්, මාර්ගගත ආරක්ෂණය ද ඇතුලත්ව ළමා අපචාර සහ ලිංගික සූරාකෑම පිටුදැකීමේ ජාතික ක්‍රියාකාරී සැළැස්මක් කොටුම්පත් කර ඇති බවත් කමිටුවේ නිරීක්ෂණයන්ට ඇතුලත් වේ. එපමණක්ද නොව ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ ගෝලීය හවුල්කාරීත්වය විසින් ශ්‍රී ලංකාව එහි පෙර ගමන්කාර නියමු රටක් වශයෙන් හඳනාගෙන ඇති බවද නිරීක්ෂණයන්ට ඇතුලත් වේ. ඒ කෙස්වෙතත් වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන්නා වූ සියළුම කාරණා ආමන්ත්‍රණය වන කෙරෙන සවිස්තරාත්මක සැළැස්මක් නොමැති වීම කමිටුවේ කනස්සල්ලට හේතු වී ඇත.

12. ඒ අනුව කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයි

- වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන්නා වූ සියළුම කාරණා ආමන්ත්‍රණය කිරීම විශේෂයෙන්ම අරමුණු කර ගත් ජාතික ක්‍රියාකාරී සැළැස්මක් නිර්මාණය කර එම සැළැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සහ මානව සම්පත් වෙන් කිරීම. මෙහිදී රජයේ පාර්ශවය විසින් වාණිජ වශයෙන් ළමුන්ව ලිංගික සූරාකෑමට එරෙහි ලෝක සමුළුවේ දීර්ඝකාලීන ප්‍රතිපල දෙස අවධානය යොමු කරමින් වෛකල්පික ප්‍රකාශනයෙහි එන සියළු ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම සඳහා සිය අවධානය යොමු කළ යුතුය.

- මේ දක්වා ක්‍රියාත්මක නොවූ ප්‍රතිපත්තිමය මුලපිරීම් තව දුරටත් පමා නොකොට, ළමා සම්මුතිය සහ එහි වෛකල්පික ප්‍රකාශනයට අනුකූල වන පරිදි සම්මත කොට ක්‍රියාත්මක කිරීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සම්පත් නිසිපරිදි වෙන් කිරීමටත් කටයුතු කිරීම.

සම්බන්ධීකරණය

13. ළමා සම්මුතිය සහ එහි විකල්ප විධිවිධානයන්ට අදාළ කාරණා සම්බන්ධ ක්‍රියාකාරකම් වල සම්බන්ධිකරණ වගකීම පැවරී ඇත්තේ ළමා සහ කාන්තා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යංශය යටතේ ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත බව කමිටුවේ නිරීක්ෂණයයි. කෙසේ වෙතත් වාර්ථා වී ඇති පරිදි එම වගකීම ඉටු කිරීමෙහිලා අධිකාරිය සතු සීමිත ධාරිතාව සහ සම්පත් ප්‍රමාණය පිළිබඳ කමටුවේ කනස්සල්ල ප්‍රකාශ කෙරේ. එමෙන්ම, ජාතික ළමා ප්‍රඥප්තියට අදාළ සම්බන්ධිකරණ සහ අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පිහිටුවා ඇති ජාතික අධීක්ෂණ කමිටුව මෙන්ම ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකාය යන ආයතන හේතුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතු කාර්යය සහ වගකීම් අතිපිහිත වීම සහ පුනර්කරණය වීම මෙන්ම අධිකාරිය සතු බලතල තවදුරටත් දුර්වල වීම කමිටුවේ සැළකිල්ලට භාජනය වී ඇත.

14. සම්මුතිය යටතේ මීට පෙර ලබාදී ඇති (CRC/C/LKA/CO/5-6, 7 වන ඡේදය) අවසන් නිරීක්ෂණයන්හි සඳහන් වන පරිදි ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ළමා සම්මුතියේ සඳහන් අයිතිවාසිකම් සහ වෛකල්පික ප්‍රකාශනයට අදාළව සියළු ආංගික අමාත්‍යංශ මෙන්ම මධ්‍යම රජයේ සහ පළාත්පාලන ආයතන මට්ටමින් සිදුවන ක්‍රියාකාරකම් වලට අවශ්‍ය නායකත්වය සැපයීමටත්, අධීක්ෂණය සහ ඇගයීම ඇතුළු පොදු නියාමනයන් සිදු කිරීමටත් හැකිවන අයුරින් ප්‍රමාණවත් පරිදි සම්පත් ලබාදීම ඇතුළුව අධිකාරියේ ධාරිතා වර්ධනය සිදුකරන මෙන් කමිටුව විසින් නිර්දේශ කරයි.

තොරතුරු බෙදා හැරීම, දැනුවත් කිරීම සහ පුහුණුව

15. රජයේ පාර්ශවය මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් විසින් ක්‍රියාත්මක කරන ලද විවිධාකාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන් කමිටුවේ නිරීක්ෂණයට ලක්ව ඇති නමුත් වෛකල්පික ප්‍රකාශනයෙහි ඇතුලත් කරුණු සම්බන්ධව මහජනයාව නිසි පරිදි දැනුවත් කිරීමට තරම් එම වැඩසටහන් ප්‍රමාණවත් ලෙස නිසි සම්බන්ධීකරණයකින්, ක්‍රමානුකූලව සහ අඛණ්ඩව සිදු නොවීම කමිටුවේ කනස්සල්ලට හේතු වී ඇත. එසේම වෛකල්පික ප්‍රකාශනය සම්බන්ධව අධිකරණ පද්ධතිය තුල ඇති සීමිත දැනුවත්භාවය මෙන්ම වෛකල්පික ප්‍රකාශනයට අදාළ කාරණා සම්බන්ධව ළමුන් වෙනුවෙන් සහ ළමුන් සමගින් කටයුතු කරන වෘත්තිකයන්ව පුහුණුකිරීමට අදාළ තොරතුරු සීමිත වීමද කමිටුවේ සැළකිල්ලට බඳුන් වී ඇත.

16. සිවිල් සමාජයේ සහ අනෙකුත් පාර්ශව කරුවන්ගේ ද සහයෝගය ලබා ගනිමින්, වෛකල්පික ප්‍රකාශනයෙහි සඳහන් ප්‍රතිපාදන සම්බන්ධව ළමුන්ද ඇතුළත්ව මහජනයාගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සහ තොරතුරු බෙදාහැරීම සම්බන්ධ රජයේ පාර්ශවයේ ක්‍රියාකාරකම් කඩිනම් කර ක්‍රියාවට නංවන මෙන් කමිටුව විසින් නිර්දේශ කර සිටී. එමෙන්ම අධිකරණ විනිසුරුවන්, නඩු ගොනුකරන්නන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ ආගමන විගමන නිලධාරීන්, සෞඛ්‍ය සේවා සහ සමාජ සේවා නිලධාරීන්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විශේෂඥයන් සහ සංචාරක අංශයේ සේවයේ නියුතු පුද්ගලයන් ද ඇතුළත් වන පරිදි, ළමුන් වෙනුවෙන් සහ ඔවුන් සමගින් කටයුතු කරන වෘත්තිකයන් හට

වෛකල්පික ප්‍රකාශනය සම්බන්ධව වඩාත් ක්‍රමානුකූල, බහුවිධ විෂයපථයන් ආවරණය කරන, අනිවාර්ය වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසද රජයේ පාර්ශවය වෙත කමිටුව නිර්දේශ කර සිටී.

සම්පත් වෙන් කිරීම

17. ළමා සහ කාන්තා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයට සහ ඒ යටතේ ඇති පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වෙන්කර ඇති සම්පත් ප්‍රමාණය සැළකිල්ලට ගැනීමේදී එම වෙන් කිරීම් විශේෂයෙන්ම වෛකල්පික ප්‍රකාශනයට අදාළ වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහාම සිදුකර ඇතිද යන්න පිළිබඳ තොරතුරු නොමැති වීම කණගාටුවට කරුණකි. එමෙන්ම වාර්ථා වී ඇති පරිදි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වෙන්කර ඇත්තේ ඉතා සීමිත මූල්‍ය ප්‍රතිපාදනයක් වීමද කනස්සල්ලට හේතුවකි.

18. විශේෂයෙන්ම වෛකල්පික ප්‍රකාශනයෙහි අඩංගු කරුණු ක්‍රියාත්මක කිරීමට අදාළ වන තීරණාත්මක අංශයන් වන දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය, ප්‍රතිපත්ති සහ උපායමාර්ග නිර්මාණය කිරීම, දැණුවත් කිරීම, වළක්වාලීම, නඩු පැවරීම සහ ආරක්ෂාව සැළසීම ආදී අංශ වෙත ප්‍රමාණවත් පරිදි මූල්‍ය හා මානව සම්පත් වෙන් වන බව තහවුරු කරන ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත නිර්දේශ කර සිටී.

ඉ.) ළමුන් විකිනීම, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම වැළැක්වීම (9 වන වගන්තිය (1) සහ (2) උප වගන්ති)

වෛකල්පික ප්‍රකාශනය යටතේ තහනම් කර ඇති වරදවල් වළක්වාලීම සඳහා ගෙන ඇති පියවර

19. ළමුන් ලිංගික සූරාකෑම් වලට ලක්වීම වැළැක්වීමට ගෙන ඇති පියවරයන් ධනාත්මකව නිරීක්ෂණය කරන අතර, පහත සඳහන් කාරණා සම්බන්ධව කමිටුවේ දැඩි අවධානය යොමු වී ඇත.

■ විදේශිකයන්ද ඇතුලත්ව විවිධ පුද්ගලයන් විසින් පිරිමි ළමුන් ද ඇතුලත්ව ළමුන් විශාල සංඛ්‍යාවක් ලිංගික සූරාකෑම් වලට ලක්ව තිබීම මෙන්ම උපකොටස් වලට වෙන්වූ දත්ත නොමැති වීම සහ ප්‍රමිතිගත දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් ළමා ලිංගික සූරාකෑම් වල වපසරිය පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා ගත නොහැකි වීම.

■ විශේෂයෙන් ගැහැනු ළමුන් හට දෙමාපියන් විසින් ලිංගික කර්මාන්තයට පිවිසීමට දිරිමත් කිරීම සහ ලිංගික සූරාකෑම් වලට ලක්වීම සඳහා සිය පවුල් විසින් පිරිමි ළමුන්ව විකිනීම සම්බන්ධව වාර්ථා වී ඇති සිද්ධීන්.

■ අන්තරජාල ප්‍රවේශයට වැඩි වීම හේතුවෙන් මාර්ගගත ක්‍රම හරහා ළමුන් කාමුක දර්ශන වලට යොදවා ගැනීම සහ යොමු වීම ව්‍යාප්ත වී ඇති පසුබිමක රජයේ පාර්ශවය විසින් සන්නිවේදන තාක්ෂණ අංශය ප්‍රමාණවත් පරිදි නියාමනය නොකිරීම.

■ ළමුන් ජාවාරම් කිරීම හරහා මෙන්ම විවධ ක්‍රම හරහා බලහත්කාර ශ්‍රමය සඳහා අබණ්ඩව දරුවන් යොදවා ගැනීම.

■ විශේෂයෙන්ම දරිද්‍රතාවය සහ සමාජ පීඩනය යනාදී වශයෙන් වන, ළමුන් විකිනීම, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීමට බලපාන මූලික හේතුන් ඵලදායී ලෙස ආමන්ත්‍රනය කිරීමට දැනට බල පවත්නා ප්‍රතිපත්ති සහ වැඩසටහන් අපොහොසත් වීම.

■ වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන වැරදි වල වින්දිතයන් වීමට අවධානමක් ඇති ළමුන් අනාවරණය කොටගෙන, ඔවුන් නිසි පරිදි හඳුනාගෙන අධීක්ෂණය කිරීමට සමත් විධිමත් යාන්ත්‍රනයක් නොමැති වීම.

20. වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන වැරදි වලට බලපාන මූලික හේතූන් ආමන්ත්‍රනය වන පරිදි වඩාත් අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින දරුවන් සහ පවුල් ඉලක්ක කරගනිමින් වඩාත් පුළුල් සහ සවිස්තරාත්මක ප්‍රවේශයක් අනුගමනය කරන ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවයට බල කර සිටී. මෙහිදී රජයේ පාර්ශවය වෙත පහත සඳහන් විශේෂ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

- සංචාරක ක්ෂේත්‍රයද ඇතුලත්ව ගැහැණු සහ පිරිමි ළමුන් ලිංගික සූරාකෑමට ලක් වීම, ළමුන් විකිනීම, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ මාර්ගගත ක්‍රමයන් ද ඇතුලත්ව ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම ආදියෙහි ව්‍යාප්තිය මෙන්ම ඒ සඳහා බලපාන මූලික හේතූන් හඳුනාගැනීමට පර්යේෂණයක් සිදුකිරීම සහ ඒ හරහා අවධානමට ලක්ව ඇති ළමුන් හඳුනාගෙන, ගැටළුවේ වපසරිය නිසිපරිදි හඳුනාගෙන ඒ සඳහා ඉලක්කගත ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් නිර්මාණය කිරීම. මෙහිදී විශේෂයෙන්ම ළමුන් ලිංගික සූරාකෑම වැළැක්වීමට අවශ්‍ය ආරක්ෂණ ක්‍රමවේද සැකසීමේදී ඒවා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ දිළිඳුකම අවම කිරීමේ ක්‍රියාකාරකම් සමඟ සමීපව සම්බන්ධ විය යුතුය.

- දෙමාපියන් ලෙස තම දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සම්බන්ධව සිය වගකීම් වඩාත් හොඳින් ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය ළබා දීම සඳහා ළමුන් කේන්ද්‍ර කරගත් මූලික මැදිහත්වීමේ වැඩසටහන් ද ඇතුළුව වඩාත් අවදානමට සහ ආන්තික තත්වයන්ට මුහුණ දී ඇති පවුල් සඳහා වන සමාජ ආරක්ෂක වැඩසටහන් සහ දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම.

- ළමා ලිංගික සූරාකෑම සම්බන්ධව පවත්නා ආකල්ප වෙනස් කිරීම අරමුණු කර ගත් දැනුවත් කිරීමේ වැඩසටහන් වඩා තීව්‍ර කිරීම සහ මාර්ගගත ළමා ලිංගික සූරාකෑම් සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම් හි ඇති අවධානම පිළිබඳ විශේෂයෙන් ළමුන් සහ ඔවුන්ගේ පවුල්ද ආවරණය වන පරිදි පොදු මහජනතාව දැනුවත් කිරීම.

- ළමුන් ශ්‍රමයේ යෙදවීම තුරන් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම.

- වෛකල්පික ප්‍රකාශනය මගින් ආවරණය වන වැරදි වල වින්දිතයන් බවට පත් වී ඇති හෝ එසේ වින්දිතයන් වීමට අවධානමක් ඇති ළමුන් සහ ඔවුන්ගේ පවුල් හඳුනාගැනීමට, අධීක්ෂණයට සහ අවශ්‍ය සහයෝගයන් ලබා දීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සැකසීම.

ළමා විවාහ

21. විවාහ විය හැකි අවම වයස් සීමාව අවුරුදු 18 ලෙස නීත්‍යානුකූලව ප්‍රතිපාදන සකසා තිබියදීත්, රට තුල ළමා විවාහ ව්‍යාප්තව පැවතීම සහ සමහරක් අවස්ථාවන්හිදී එය සිදුවන ආකාරය අනුව ළමුන් වෙළඳාමට සමාන ලෙස ක්‍රියාත්මක වීම කමිටුවේ දැඩි අවධානයට යොමුව ඇත.

22. සම්මුතිය යටතේ මීට පෙර ලබාදී ඇති (CRC/C/LKA/CO/5-6, 15 වන ඡේදය) අවසන් නිරීක්ෂණයන් යලි සිහි කැඳවමින් වයස 18ට අඩු විවාහයන් කිසිදු ව්‍යතිරේකයකින් තොරව සම්පූර්ණයෙන්ම නීතියෙන් තහනම් කිරීමට පියවර ගන්නා ලෙස කමිටුව රජයේ පාර්ශවයට බල කර සිටී.

සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම

23. වසර 2020 වන විට සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම තුරන් කරලීමට රජයේ පාර්ශවය කැපවී සිටීම කමිටුවේ පැසසුමට හේතු වේ. එමෙන්ම, විශේෂයෙන් කළුතර සහ බෙන්තොට ප්‍රදේශයන්හි විදේශිකයන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක ළමා ලිංගික සූරාකෑම් වලට 'කිසිදු සමාවක් නොදීමේ' වැඩසටහන මෙන්ම ළමා ලිංගික සූරාකෑම සම්බන්ධව වගකීම් සහගත ව්‍යාපාරික පුරුදු ප්‍රචලිත කිරීම උදෙසා ජාතික මට්ටමේ උපදේශන වැඩසටහන් ඇතුළුව ළමා ලිංගික සූරාකෑම පිටුදැකීම උදෙසා රජයේ පාර්ශවයෙන් ගෙන ඇති පියවරයන් ධනාත්මක ඒවා ලෙස කමිටුව විසින් හඳුනාගෙන ඇත. ඒ කෙසේ වෙතත් පහත සඳහන් කරුණු සම්බන්ධව කමිටුවේ දැඩි අවධානය යොමු වී ඇත.

- සංචාරක ක්ෂේත්‍රය තුල පිරිමි ළමුන් වැඩිවශයෙන් ලිංගික අපයෝජනයන්ට සහ සූරාකෑම් වලට ලක් වන බවට පැමිණිලි ලැබී තිබීම.

- සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම් සම්බන්ධ සිද්ධීන් වළක්වාලීම, අධීක්ෂණය සහ වාර්ථාකරණය ද ඇතුළුව ළමා ලිංගික සූරාකෑම් වළක්වාලීම සහ එරෙහි වීම සඳහා විශේෂයෙන් සංචාරක ව්‍යාපාර, හෝටල් සහ ප්‍රවාහන සේවා සපයන පුද්ගලික අංශයේ ආයතන සහ පුද්ගලයන් සමඟ කටයුතු කිරීම සහ ඒම කටයුතු නියාමනය කිරීම රජයේ පාර්ශවයෙන් ප්‍රමාණවත් පරිදි සිදු නොවීම.

- සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම් හි වපසරිය සහ එවන් ක්‍රියාවන් සඳහා වරදකරුවන් වන අය කොතෙක් දුරට දඬුවම් නොවිඳ සිටීද යන්න පිළිබඳ නිසි ඇගයීමක් කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත නොමැති වීම.

24. සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම තුරන් කරලීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් හා එක්ව කටයුතු කරන ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටී. මෙහිදී, ලෝක වෙළඳ සංවිධානය විසින් හඳුන්වා දී ඇති සංචාරක ක්ෂේත්‍රය සඳහා වන ගෝලීය අචාරධර්ම සංග්‍රහය ප්‍රවාහන සේවා සපයන ඒජන්තවරුන් සහ සංචාරක ආයතන අතර පුළුල් වශයෙන් බෙදා හැරීම සහ එම ආයතනයන්ට සංචාරක ක්ෂේත්‍රය තුල ළමුන් ලිංගිකව සූරාකෑමට ලක්වීමෙන් ආරක්ෂා කිරීමේ අචාරධර්ම සංග්‍රහයට අත්සන් කිරීමට පෙළඹවීම ද වැදගත් වේ. මීට අමතරව රජයේ පාර්ශවයට පහත නිර්දේශ යොමු වේ.

- විශේෂයෙන් දුප්පත්කම සහ සමාජ පීඩනය හේතුවෙන් ඒ සඳහා යොමුවන පිරිමි ළමුන් ද ඇතුළුව සංචාරක ක්ෂේත්‍රය තුල ලිංගික සූරාකෑමකට ලක් වීමේ අවධානමකට මුහුණ පා ඇති ළමුන් හඳුනාගැනීම තුලින් එම ගැටළුවේ වපසරිය හඳුනාගෙන එම අවබෝධය, කාලානුරූපී දැනුවත් කිරීමේ වැඩසටහන්, දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සහ ළමා ආරක්ෂක වැඩසටහන් සංවිධානය කිරීමේදී නිසි පරිදි යොදවා ගැනීම.

- සංචාරකයන්ගේ පැමිණීම සහ ලියාපදිංචි නොකළ සංචාරක නවාතැන් සපයන ස්ථාන පිළිබඳ සොයා බැලීම සම්බන්ධව දැණුම වර්ධනය කිරීම.

- විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලික අංශයේ ආයතන සහ පුද්ගලයන් සමඟ කටයුතු කරමින් සහ ඔවුන්ව නිසි නියාමනයකට ලක් කරමින් සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම වැලැක්වීම, අධික්ෂණය සහ නිසි වාර්ථාකරණය තහවුරු කිරීම. එමෙන්ම සංචාරක ක්ෂේත්‍රය තුල ළමා ලිංගික සූරාකෑම තහනම් කිරීම සම්බන්ධව ඇති කරුණුද ඇතුලත්ව ළමා ලිංගික සූරාකෑම සම්බන්ධව වන ප්‍රතිපත්තීන් කෙතෙක් දුරට පිළිපදිනවාද යන්න පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් සිදු කිරීම.

- ළමා ලිංගික සූරාකෑම් සම්බන්ධ සිදුවීම් නිසි පරිදි වාර්ථා කිරීම දිරිමත් කරමින්, ඒවාහි වැරදි කරුවන්ට නිසි ආකාරයෙන් නඩු පැවරීම් සිදු කර, වරදේ ස්වභාවයට ගැළපෙන පරිදි නිසි දඬුවම් ලබාදීමට පියවර ගැනීම.

මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන් වැලැක්වීම සහ ආමන්ත්‍රනය සඳහා වූ පියවරයන්

25. ළමුන් සඳහා වන අන්තර්ජාල ආරක්ෂණ වැඩසටහන් සහ සමහරක් ළමා කාමුක දර්ශන ඇතුලත් වෙබ් පිටු සඳහා ප්‍රවේශය තහනම් කිරීම ආදී වශයෙන් රජයේ පාර්ශවය විසින් මේ සම්බන්ධව ගෙන ඇති විවිධ පියවරයන් ධනාත්මකව නිරීක්ෂණය කරන අතර පහත සඳහන් කරුණු සම්බන්ධව කමිටුවේ අවධානය යොමු වී ඇත.

- විශේෂයෙන්ම විදේශිකයන් විසින් ළමුන්ව විවිධ ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන්ට ලක්කර ඇති බව වාර්ථා වීම.

- ගැටළුවේ ස්වභාවය සහ එහි වපසරිය නිසි ලෙස ඇගයීමට ප්‍රමාණවත් තරම් දත්ත නොමැති වීම.

- මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් නිසි පරිදි ආමන්ත්‍රනය කිරීම සඳහා ක්‍රමානුකූල සහ තිරසාර වූ ප්‍රවේශයක් නොමැති වීම සහ මේ දක්වා ගෙන ඇති පියවරයන් ද ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක නොවීම.

- ළමා ලිංගික සූරාකෑම් වැළැක්වීම සහ තහනම් කිරීමේදී රජයේ පාර්ශවය විසින් සන්නිවේදන තාක්ෂණ අංශය සමඟ කටයුතු කිරීම සහ ඔවුන් නිසි නියාමනයන්ට ලක් කිරීම සීමිත මට්ටමක පැවතීම.

26. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා බැඳුනු ළමා ලිංගික සූරාකෑම ආවරණය කරමින් මානව හිමිකම් කවුන්සිලයේදී සම්මත කර ගත් 31/7 යෝජනාව සහ 2014 දී ලන්ඩන්හිදී මෙන්ම 2015 ඩුබායිහිදී පවත්වනු ලැබූ උැජරදඑැජඑ (අපි සුරකිමු) ගෝලීය සන්ධානයේ සමුළු වල අවසන් ප්‍රතිඵල නැවත සිහිකැඳවමින්, අදාළ කර්මාන්ත ක්ෂේත්‍ර සහ සංවිධානයන්ගේද සහයෝගීතාව සමගින් මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන් වැලැක්වීම සහ ආමන්ත්‍රනය කිරීම සඳහා ජාතික ප්‍රතිචාර ක්‍රමවේදයක් සකසා ගන්නා ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවයට නිර්දේශ කර සිටී. මෙහිදී අවම වශයෙන් පහත සඳහන් කරුණු ඇතුලත් කර ගැනීම වැදගත්ය.

- සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා වෙන්වූ විශේෂිත ආයතනයක්, මෙන්ම විශේෂිත විශ්ලේෂණ, සමීක්ෂණ සහ අධීක්ෂණ ධාරිතාවන්ගෙන් සමන්විත වූ මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන් වැලැක්වීම සහ ආමන්ත්‍රනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නිසි නීතිමය රාමුවක් ඔස්සේ සකසා ගැනීම.

- මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන් වැලැක්වීම සඳහා පහත අංගයන්ගෙන් සමන්විත උපාය මාර්ගයක් සකසා ගැනීම.

- මාර්ගගත හැසිරීම් සහ ආරක්ෂාව මෙන්ම මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජන සම්බන්ධ වැරදි නිසි පරදි වාර්ථා කරන්නේ කෙසේද යන කරුණු පිළිබඳ පොදු මහජනයා දැනුවත් කිරීම සහ එම කරුණු පාසල් අධ්‍යාපනය තුල අනිවාර්ය අංග බවට පත් කිරීම.

- ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් සම්පාදනයේදී ළමා සහභාගීත්වය තහවුරු කිරීම.

- මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන්ට අදාළ අන්තර්ගතයන් ඉවත්කිරීමට සහ අවහිර කිරීමට, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත අදාළ උල්ලංඝනය වීම් නිසි පරිදි වාර්ථා කිරීමට මෙන්ම ඒ සඳහා නව්‍ය විසඳුම් ලබා දීමට කර්මාන්ත ක්ෂේත්‍රයේ සහභාගීත්වය ලබා ගැනීම.

- මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම් තුරන් කිරීම සඳහා වැඩකටයුතු කරන ආයතන සමගින් සමීප සහයෝගීතාවක් පවත්වා ගැනීම.

- සදාචාරාත්මක සහ දැනුවත්භාවයෙන් යුත් මාධ්‍ය වාර්ථාකරණය.

- ළමා වින්දිතයන් සඳහා, විමර්ශන කටයුතු වලදී, නඩු පැවරීමේදී මෙන්ම පසු රැකවරණ සැළසීමේදී ඒකාබද්ධ සේවා සැපයීම, ළමුන් සමගින් මෙන්ම ළමුන් වෙනුවෙන් කටයුතු කරන වෘත්තිකයන් සඳහා නිසි පුහුණුවීම් මෙන්ම පැමිණිලි භාර ගැනීමේදී, වන්දි ලබා දීමේදි සහ ප්‍රතිකර්ම කටයුතු වලදී රහස්‍යභාවය සුරැකෙන, වඩා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ළමා මිතුරු ක්‍රමවේදයන්ගෙන් සමන්විත වූ නිසි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

■ පුහුණුව ලත් පොලිස් බලකායක්, නිසි පරිදි නඩු පැවරීමේ සහ අධිකරණ ක්‍රමවේදයක් මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් යලියලිත් වරදවල් නොකිරීමට වරදකරුවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ද ඇතුලත් ඒ වෙනුවෙන්ම කැපවූ, ක්‍රියාශීලී, ප්‍රතිචාරාත්මක මෙන්ම වින්දිතයන් කේන්ද්‍රකරගත් අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ අන්තර්ජාතික අපරාධ පොලිස් සංවිධානය ඃෂහඹැඝෂඡධඞ* හා සම්බන්ධ වූ ජාතික දත්ත පද්ධතියක් පැවතීම.

ඊ.) ළමුන් විකිනීම, අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම සහ ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම තහනම් කිරීම සහ ඒ හා බැඳුනු කරුණු (3 වන වගන්තිය, 4 (2) සහ (3) උප වගන්ති) සහ 5-7 වගන්ති)

බලපැවැත්වෙන අපරාධ නීතිය දණ්ඩ නීතිය සහ අනෙකුත් රෙගුලාසි

27. සංශෝධනය කරන ලද දණ්ඩ නීති සංග්‍රහය මගින් ළමා ලිංගික සූරාකෑම, අසභ්‍ය නිර්මාණ සඳහා ළමුන් යොදවා ගැනීම, ගනිකා වෘත්තිය සඳහා ළමුන් යොමුකිරීම, ළමුන් ජාවාරම් කිරීම මෙන්ම ළමයකු හදා වඩා ගැනීමට පෙළඹවීම ඇතිකිරීම යන කාරණා තහනම් කර ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි. කෙසේ වෙතත් වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් ළමුන් ජාවාරම් කිරීමට අදාළ වැරදි සම්බන්ධව ඇති නොපැහැදිළි තාවය සහ එම සියළු වැරදි අපාරාධ ලෙස නම් කිරීමේ ඇති හිදැස් කෙරෙහි කමිටුවේ අවධානය යොමුව ඇත. එහිදී පහත කාරණා සම්බන්ධව කමිටුවේ අවධානය යොමු වේ.

■ ළමුන් විකිනීම පැහැදිළිව නිර්වචනය කර නොමැති අතර එය ළමා ජාවාරමට සමාන සංකල්පයක් ලෙස සඳහන් වුවත් සර්ව සම නොවේ, කෙසේ වෙතත් එය අපරාධයක් ලෙස නම්කර ඇත.

■ බලහත්කාර ශ්‍රමය සඳහා ළමයකු ලබාදීම, ගෙන ගොස් භාර දීම සහ භාර ගැනීම හෝ අවයව ඉවත් කිරීම ජාවාරමක් ලෙස සළකා අපරාධයක් බවට හඳුන්වා ඇති නමුත් එය සළකා ඇත්තේ ළමයින් විකිණීම ලෙස නොවේ.

■ ළමුන් ගණිකා වෘත්තියෙහි යෙදවීඹ සහ ළමුන් අසභ්‍ය දර්ශන සඳහා යොදවා ගැනීම වෛකල්පික ප්‍රකාශනහෙි 2 සහ 3 වගන්තිවල අර්ථ ගන්වා ඇති පරිදි අපරාධයක් බවට හඳුන්වා දී නොමැත.

■ දණ්ඩ නීති සංග්‍රහයේ 360 (සම්පාදනය කිරීම) සහ 365 (ස්වාභාවික නොවන වරද) යන වගන්තිවල සඳහන් පරිදි ළමුන් ගණිකා වෘත්තිය සඳහා බඳවා ගැනීම සහ කැමැත්ත ඇතිව හෝ නැතිව සමලිංගික ක්‍රියාකාරකම්වල යෙදවීම යන ක්‍රියාවලින් ආරක්ෂා කර ඇත්තේ වයස අවුරුදු 16 දක්වා ළමුන් පමණි.

28. වෛකල්පික ප්‍රකාශනහෙි සඳහන් ප්‍රතිපාදන සමග සම්පූර්ණයෙන්ම අනුගත වීම අරමුණු කරගනිමින් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති නැවත සමාලෝචනය කරන මෙන් කමිටුව රජයේ පාර්ශවයෙන් ඉල්ලා සිටී. මෙහිදී විශේෂයෙන්ම, පහත සඳහන් කරුණු වෙත රජයේ පාර්ශවයේ අවධානය යොමු කෙරේ.

■ ළමුන් විකිනීම, ළමුන් ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ ළමුන් අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සම්බන්ධව, වෛකල්පික ප්‍රකාශනහෙි 2වන සහ 3වන වගන්ති යටතේ තහනම් කර ඇති සියලු􀀀ම ක්‍රියාවන් සහ ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි, එම ඕනෑම ක්‍රියාවක් කිරීමට උත්සාහ කිරීම හෝ ඒවාට සහය වීම වීම හෝ සහභාගී වීම යන ක්‍රියාවන්ද ඇතුලත්ව ඒ සම්බන්ධ සියළු වැරදි නිසි ආකාරයෙන් අර්ථනිරූපනය කර ඒවා අපරාධ වැරදි බවට පත් කිරීම.

■ ළමා විවාහ මෙන්ම බලහත්කාරයෙන් විවාහ කරවීමද තහනම් කිරීම.

■ වයස අවුරුදු 18 ට අඩු සියළුම පිරිමි සහ ගැහැණු ළමයින් ගණිකා වෘත්තියෙහි යෙදවීම ඇතුළු සියළුආකාරයේ ලිංගික සූරාකෑම් වලින් සම්පූර්ණයෙන්ම ආරක්ෂා කර ඇති බවට සහතික වීම.

දණ්ඩ මුක්තිය

29. ළමුන් හට පැමිණිලි ලබාදීම සඳහා ගාස්තු අයකිරීමකින් තොර දුරකථන උපකාරක සේවාවන් ස්ථාපනය කිරීම සහ විකල්ප විධිවිධාන යටතේ ආවරණය වන වැරදි සඳහා දඩ මුලක්ද ඇතුලත්ව අවම මාස 06 සිට අවුරුදු 20 දක්වා සිරදඬුවම් නියම කිරීමේ හැකියාව පැවතීම කමිටුවේ පැසසුමට හේතු වේ. කෙසේ වෙතත් පහත සඳහන් කරුණු කමිටුවේ සැළකිල්ලට බඳුන් වී ඇත.

- ළමා ලිංගික සූරාකෑමට අදාළව පවතින නීති නීති නිසිපරිදි ක්‍රියාත්මක නොවීම.

- සමාජ අපකීර්තියට ඇති බිය, සමලිංගිකත්වය සහ දූෂණය වැනි අපරාධයන්ට නතු වීම හේතුවෙන්, විශේෂයෙන්ම පිරිමි ළමුන් ලිංගිකව සූරාකෑමට ලක්වීම සම්බන්ධව වෛකල්පික ප්‍රකාශනය යටතේ එන වැරදි සත්‍ය ලෙසම සිදුවන ප්‍රමාණයට අඩුවෙන් වාර්තා වීම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ එන වැරදි නිසි පරිදි විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය සම්පත් සහ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ එන වැරදි සම්බන්ධව නඩු පැවරීමේ ප්‍රමාණය අඩු වීම සහ අවසන් නොවූ නඩු විශාල ප්‍රමාණයක් පැවතීම.

- ළමුන් විකිනීම, ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සම්බන්ධව නිල වශයෙන් සිදුවන අනවශ්‍ය මැදිහත්වීම්, ඇප සහ දඩ මුදල් නියම කිරීම සම්බන්ධ දිග්ගැස්සුනු ක්‍රියාදාමයන් මෙන්ම අත්හිටවූ සිරදඬුවම් පිළිබඳ වාර්තා වීම.

- ළමුන් විකිණීම සහ ජාවාරම් කිරීම සම්බන්ධ සිද්ධීන්ට නඩු පැවරීම සිදුවන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 360 ් වගන්තිය යටතේ මිස 360ඝ වගන්තිය යටතේ සඳහන් පරිදි ළමා ජාවාරමක් ලෙස සළකා නොවන බවට වාර්තා වීම.

- බොහෝ වැරදි සඳහා අවම දඬුවම් ලබා දෙන අතර, සමහර අවස්ථාවල අධිකරණය අවම දඬුවම් සීමා වලින් බැහැරව දඬුවම් නියමකරන බවත්, එහිදී සමහර අවස්ථා වලදී වරදේ බරපතළකම හා නොගැළපෙන දඬුවම් නියම වන බවත්, එවැනි දඬුවම් නීතිපති කාර්යාලය මගින් අභියාචනයන් ලෙස ඉහළ උසාවියක් වෙත ඉදිරිපත් කරනු ලබන බවත් රජයේ පාර්ශවය විසින් සාධනීය සංවාදයේදී පැහැදිළි කිරීම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ එන වැරදි සම්බන්ධව වාර්තා වූ සිද්ධීන් සංඛ්‍යාව පිලිබඳ ඇති තොරතුරු වල ඇති නොගැළපීම් සහ එම සිද්ධීන්ට අදාළව නඩු පවරන ලද චූදිතයන්ගේ සහ අපරාධකරුවන් ලෙස දඬුවම් නියම වූවන්ගේ සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු ද ඇතුලත්ව ඒවාහි ප්‍රතිඵල සම්බන්ධ දත්ත නොමැති වීම.

30. කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි

- නිසි අධීක්ෂණ සහ ඇගයීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමද ඇතුලත්ව ළමා ලිංගික සූරාකෑමට අදාළ නීති නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම සහ ඉදිරි ප්‍රතිපත්ති සහ නීතිමය සංශෝධනයන් සිදු කිරීමේදී එම අධීක්ෂණ සහ ඇගයීම් වල ප්‍රතිඵල නිසි පරිදි භාවිතා කිරීම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි නිසි පරිදි වාර්තා කිරීම සඳහා පිරිමි සහ ගැහැණු ළමුන්ද ඇතුලත්ව පොදු මහජනතාව දිරිමත් කිරීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීම.

- වෛකල්පික ප්‍රකාශනයට අදාළව වාර්තා වී ඇති වැරදි සම්බන්ධව කඩිනමින් විමර්ශනයන් සිදුකර, නඩු පැවරීම් සිදුකර, අපරාධකරුවන්ට ඔවුන් විසින් සිදු කල අපරාධයන්ගේ බරපතලකමට සරිලන සුදුසු දණ්ඩනයන් සමගින් දඬුවම් ලබාදෙන බව සහතික කිරීම.

- අභියාචනා කටයුතු ද ඇතුලත්ව, වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධව අධිකරණය විසින් නියම කර ඇති අවම දණ්ඩන සීමාවන්ගෙන් පරිභාහිරව ළබාදී ඇති දඬුවම් සම්බන්ධව කටයුතු කිරීම නොනවත්වා කරගෙන යෑම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි ඵලදායි ලෙස විමර්ශනය කර, අවශ්‍ය නඩු කටයුතු සිදු කිරීමට සහ එම වැරදි සඳහා දණ්ඩමුක්තියකින් තොරව නීතිය ක්‍රියාත්මක කිරීමට, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගේ, චෝදනා ගොනුකරන්නන්ගේ සහ අධිකරණ පද්ධතියේ ධාරිතාව වර්ධනය කර ඔවුනට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම.

- නිල මට්ටමින් සිදුකරන අනවශ්‍ය මැදිහත්වීම් සහ දූෂණය ඵලදායී ලෙස වැළක්වාලමින් අදාළ නිලධාරීන්හට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

- වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධව සිදුකරන විමර්ශන කටයුතු, නඩු පැවරීම් සහ වැරදිකරුවන්ට දඬුවම් ළබාදීම් පිළිබඳව ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කළ දත්ත එක් රැස් කිරීම.

නීතිය හා සම්බන්ධ පුද්ගලයින්ගේ වගකීම

31. සංචාරක ක්ෂේත්‍රය තුල පිරිමි ළමුන්ද ඇතුලත්ව ළමා ලිංගික සූරාකෑම ඉහළ මට්ටමක පවතින බව වාර්තා වන තත්වයක් යටතේ සහ, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට රජයේ පාර්ශවයෙන් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයත් සමගින් සංචාරක ව්‍යාපාරය වර්ධනය වන පසුබිමක, වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි වලට අදාළව නීතිය හා සම්බන්ධ පුද්ගලයින්ගේ වගකීම නිසි පරිදි ස්ථාපනය කර හෝ පුරෝකථනය කර නොතිබීම කමිටුවේ සළකිල්ලට බඳුන් වේ.
32. වෛකල්පික ප්‍රකාශනයෙහි 3 (4) වගන්තියට අනුකූලව, ප්‍රමාදයකින් තොරව, වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධව නීතිය හා සම්බන්ධ පුද්ගලයින්ගේ අපරාධමය, සිවිල් හෝ පරිපාලනමය වගකීම් රජයේ පාර්ශවය විසින් නිසි පරිදි ස්ථාපනය කළ යුතු බවට කමිටුව නිර්දේශ කර සිටී.

පාරභෞම අධිකරණ බලය

33. දණ්ඩ නීති සංග්‍රහයේ 2 (2) වගන්තිය මගින් රජයේ පාර්ශවය විසින් රටේ ජාතිකත්වය දරන්නන් විසින් වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි ක්‍රියාවක් සිදුකරන අවස්ථාවකදී සිය පාරභෞම අධිකරණ බලය ස්ථාපිත කර ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි. කෙසේ වෙතත් රජයේ පාර්ශවය වසින් මෙම විධිවිධානය තම භූමිය තුල පුරුද්දක් වශයෙන් පදිංචිව සිටින පුද්ගලයන් හට අදාළ කර නොගැනීම කම්ටුවේ කනස්සල්ලට හේතු වී ඇත.

34. වෛකල්පික ප්‍රකාශනයෙහි 4 (2) වගන්තියට අනුකූලව, වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධයෙන් පාරභෞම අධිකරණ බලය භූමිය තුල පුරුද්දක් වශයෙන් පදිංචිව සිටින පුද්ගලයන් හටද අදාළ වන පරිදි දීර්ඝ කිරීම උදෙසා දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ සංශෝධනයන් සිදුකරන ලෙස කමිටුව රජයේ පාර්ශවය වෙත නිර්දේශ කරයි.

පිටුවහල් කිරීම

35. ජාතික නීති පද්ධතිය සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් වලට හැර අනෙකුත් රටවල් වලට පිටුවහල් කිරීම බලාත්මක කිරීම සඳහා ගිවිසුමක අවශ්‍යතාව පැවතීම කමිටුවේ අවධානය යොමුකරවයි. එසේම මෙම අවස්ථා දෙක සඳහාම, පිටුවහල් කිරීම සඳහා ද්විත්ව අපරාධකරණය සහ (වසරක සිරදඬුවමක් වන) අවම බරපතලකම/දඬුවම යන අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතු වීම සහ, පොදුරාජ්‍ය මණ්ඩලීය රටවලට පිටුවහල් කිරීම සඳහා, පිටුවහල් කිරීමේ නීතියට අදාළ ලැයිස්තුවට නියමිත වරද ඇතුළත් කිරීම කළයුතු වීමද කම්ටුවේ කනස්සල්ලට හේතු වී ඇත.

36. වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධයෙන් වැරදිකරුවෙක් පිටුවහල් කිරීමේදී පවතින ද්විත්ව අපරාධකරණය, අවම බරපතලකම/දඬුවම සහ පිටුවහල් කිරීමේ නීතියට අදාළ ලැයිස්තුවට නියමිත වරද ඇතුළත් කළයුතු වීම යන අවශ්‍යතාවයන් ඉවත් කරන මෙන් කමිටුව රජයේ පාර්ශවයට නිර්දේශකර සිටී. එසේම, පිටුවහල් කිරීම සඳහා විශේෂ ගිවිසුමක් නොමැති අවස්ථාවකදී, වෛකල්පික ප්‍රකාශනයෙහි පාර්ශවකරුවන් වන පොදුරාජ්‍ය මණ්ඩලීය නොවන රටවල් සඳහා වෛකල්පික ප්‍රකාශනය යටතේ සඳහන් වන වැරදි සම්බන්ධයෙන් පිටුවහල් කිරීම සඳහා නීතිමය පදනමක් ලෙස වෛකල්පික ප්‍රකාශනයයේ ප්‍රතිපාදන සලකා බලන ලෙස කමිටුව නිර්දේශ කරයි.

උ.) ළමා වින්දිතයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම (වගන්ති අංක 8 සහ 9 (3) සහ (4) උප වගන්ති)

වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට පත්ව ඇති ළමුන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග

37. අපරාධවල වින්දිතයන් බවට පත්වූවන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීම සඳහා වූ පනතේ අපරාධවල වින්දිතයන් බවට පත්වූ ළමුන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ යහපත සහතික කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන අඩංගු වීම මෙන්ම අපරාධවල වින්දිතයන් බවට පත්වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් ස්ථාපනය කිරීම කමිටුව ධනාත්මක පියවර ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට පත්වූවන් හඳුනාගැනීමේ ක්‍රමවේදය ඒ සඳහා ප්‍රමාණවත් නොවීම සහ එහි ඇති අකාර්යක්ෂම බව කමිටුවේ සැලකිල්ලට බඳුන් වී ඇත.

38. වෛකල්පික ප්‍රකාශනයෙහි 9 වැනි වගන්තිය ප්‍රකාරව, කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

- ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීමට කටයුතු කිරීම සහ අදාළ බලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමද ඇතුලත්ව, වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට පත්වූ ළමුන් කල්තියා හඳුනා ගැනීම සඳහා වන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.

- අපරාධවල වින්දිතයින් බවට පත්වූවන් සියළුදෙනාට අවශ්‍ය ප්‍රතිකාරයන් සිදු කිරීම සහ වන්දි ගෙවීම, ඔවුන්ව ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධ ජාතික මාර්ගෝපදේශ කෙටුම්පතක් සම්මත කර එය ක්‍රියාත්මක කිරීම.

- වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට පත්වූ ළමුන්හට වැරදිකරුවන් ලෙස සැලකනු ලැබීමට හෝ දණ්ඩනයන්ට ලක් වීමට ඉඩ නොතබා ඔවුන්ට නිසි උපකාරයන් ලබා දෙන බවට සහතික වීම.

- සියලුළු ළමුන් හට නොමිලේ නීතිමය ආධාර සහ විශේෂීකරණය වූ ළමා මනෝවිද්‍යාඥයින්ගේ සහ සමාජ සේවකයින්ගේ සහය ලබා දීම, ළමා බව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී අයුරින් ක්‍රියාත්මක වන පැමිණිලි යාන්ත්‍රණයන් වෙත ඇති ප්‍රවේශය සහතික කිරීම සහ ඔවුන් හට වෙනස්කොට සැළකීමකින් තොරව වන්දි ලබා ගැනීමට සහ සුදුසු පිළියම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටීන් සැකසීම.

වින්දිතයන් ප්‍රතිසාධනය සහ නැවත සමාජගත කිරීම

39. ළමා අපචාර සහ ළමුන්ව නොසලකා හැරීම කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශනය (2014) නිර්මාණය කිරීම මෙන්ම ළමුන් සඳහා වන "ආරක්ෂිත ස්ථාන" පැවතීම කමිටුව නිරීක්ෂණය කරන අතර, එවැනි ආයතන වල ළමා වින්දිතයින් සහ ළමා සැකකරුවන් යන දෙපාර්ශවයටම රැකවරණ සැළසීම සහ වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට

පත්වූ ළමුන්හට ගැලපෙන පරිදි සැකසූ සේවාවන් ලබා නොදීම පිළිබඳ කමිටුවේ සැලකිල්ල යොමුව ඇත.

40. වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද වැරදිවල වින්දිතයන් බවට පත්වූ ළමුන්ව ළමා සැකකරුවන්ගෙන් වෙන් කර, ඔවුනට විශේෂිත වූ නවාතැන් පහසුකම් සහ ඔවුන් වෙනුවෙන්ම සැකසූ සහය සේවාවන් ද ඇතුළුව එම ළමුන්ගේ පූර්ණ සමාජීය ප්‍රතිසංවිධානය සහ කායික හා මනෝවිද්‍යාත්මක සුවපත් භාවය සහතික කරන ඵලදායී යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලෙස කමිටුව විසින් රජයේ පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටී.

උපකාරක සේවා

41. ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන "ළමා උපකාරක" දුරකථන සේවාව සහ පොලිසිය විසින් ක්‍රියාත්මක කරන සාමාන්‍ය උපකාරක සේවාව ඇතුළු ගාස්තු රහිත උපකාරක දුරකථන සේවා කිහිපයක් පවතින බව කමිටුව හඳුනාගෙන ඇත කෙසේ වෙතත් එම සේවාවාන්හි ක්‍රියාකාරිත්වය ඒවායේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ඒවායින් සපයනු ලබන සේවාවන් සහ අදාළ ආයතන හා සේවාවන් වෙත යොමු කිරීම් මෙන්ම එම උපකාරක දුරකථන සේවා වල ගුණාත්මකභාවය සහ ස්ථිරභාවය සහතික කිරීම සඳහා වෙන් කර ඇති සම්පත් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු නොමැතිවීම සම්බන්ධව කමිටුව සිය කනස්සල්ල පළ කර සිටී.

42. කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි

- පවත්නා උපකාරක දුරකථන සේවාවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් වෙන් කිරීම සහ එම සේවාවාන් පිළිබඳ සියළු ළමුන්ව දැනුවත් කිරීම මෙන්ම ඔවුනට ඒ සඳහා පූර්ණ ප්‍රවේශය පවතින බව සහතික කිරීම.

- ළමුන් විකිනීම, ගනිකා වෘත්තියෙහි යෙදවීම සහ අසභ්‍ය නිර්මාණ සඳහා යොදවා ගැනීම සම්බන්ධ සිද්ධීන් ඵලදායි ලෙස වැළැක්වීම සහ ඒවාට නිසි ප්‍රතිචාර දැක්වීම සඳහා එම උපකාරක දුරකථන සේවා සපයනු ලබන වෘත්තිකයන් හට ක්‍රමානුකූල පුහුණුවක් ලබාදීම.

- උපකාරක සේවා මඟින් සපයනු ලබන සහාය සහ උපදෙස්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ඵලදායී නිතිපතා සිදුකරනු ලබන අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

ඌ.) ජාත්‍යන්තර සහාය සහ සහයෝගීතාව (10 වන වගන්තිය)

43. වෛකල්පික ප්‍රකාශනයේ 10 (1) වගන්තිය ප්‍රකාරව, විශේෂයෙන්ම අසල්වැසි රටවල් සමඟ බහුපාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික ගිවිසුම් ඇති කර ගැනීම හරහා ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කර ගැනීමේ කටයුතු නොකඩවා සිදුකිරීමට කමිටුව විසින රජයේ පාර්ශවය දිරිමත් කරනු ලබයි. මෙහිදී වෛකල්පික ප්‍රකාශනය මඟින් තහනම් කරන ලද ඕනෑම වරදක් වැලැක්වීම සහ එවැනි වැරදිවලට වගකිවයුත්තන් හඳුනා ගැනීම, විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් කිරීම සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා, වෛකල්පික ප්‍රකාශනයෙහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීමේ ක්‍රියා පටිපාටීන සහ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සළකා බැලීම වටී.

එ.) සන්නිවේදන ක්‍රියාපටිපාටිය පිළිබඳ වෛකල්පික ප්‍රකාශනය අපරානුමත කිරීම

44. ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම තවදුරටත් ශක්තිමත් කරනු වස්, සන්නිවේදන ක්‍රියාපටිපාටිය පිළිබඳ වෛකල්පික ප්‍රකාශනය අපරානුමත කරන මෙන් කමිටුව විසින් රජයේ පාර්ශවය වෙත නිර්දේශ කර සිටී.

ඒ.) ක්‍රියාත්මක කිරීම සහ වාර්ථාකරණය

පසු විපරම සහ බෙදා හැරීම

45. මෙම අවසන් නිරීක්ෂණයන්හි අඩංගු නිර්දේශ නිසි ලෙස සලකා බලා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලබාදීමද ඇතුලත්ව එම නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස රජයේ පාර්ශවය වෙත කමිටුව නිර්දේශ කරයි.

46. වෛකල්පික ප්‍රකාශනයෙහි අඩංගු කරුණු මෙන්ම එය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය පිළිබඳ දැනුවත් භාවයක් ඇති කිරීම සහ ඒ සම්බන්ධව ඵලදායී කතිකාවක් නිර්මාණය කිරීම සඳහා, රජයේ පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සහ ගැටළු ලැයිස්තුවට අදාළ ලිඛිත පිළිතුරු මෙන්ම මෙම අවසන් නිරීක්ෂණයන්, අන්තර්ජාලය ඇතුළු සුදුසු ක්‍රමවේදයන් හරහා, සිවිල් සමාජ සංවිධාන, තරුණ කණ්ඩායම්, වෘත්තීය කණ්ඩායම් සහ ළමුන් ද ඇතුලත්ව සමස්ථ මහජනතාව වෙත පුළුල් වශයෙන් බෙදා හැරීමට කටයුතු කරන ලෙස කමිටුව නිර්දේශ කරයි.

ඊළඟ සාමයික වාර්ථාව

47. වෛකල්පික ප්‍රකාශනයෙහි 12 (2) වගන්තියට අනුව, සම්මුතියෙහි 44 වැනි වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කිරීමට නියමිත මීළඟ සාමයික වාර්තවට වෛකල්පික ප්‍රකාශනය සහ මෙම අවසන් නිරීක්ෂණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වැඩිදුර තොරතුරු ඇතුළත් කරන මෙන් කමිටුව විසින් රජයේ පාර්ශවයෙන් ඉල්ලා සිටී.

පොදු ප්‍රකාශ අංක 2 (2002) - ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයේදී හා ආරක්ෂා කිරීමේ දී ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනයන්හි කාර්යභාරය

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය බෙදාහැරීම : පොදු

CRC/C/GC/2002/2

2002 නොවැම්බර් 15

මුල් පිටපත : ඉංග්‍රීසි භාෂාවෙනි

ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව

තිස් දෙවන සැසිය

2003 ජනවාරි 13-31

පොදු ප්‍රකාශ අංක 2 (2002)

ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයේදී හා ආරක්ෂා කිරිමේදී ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනයන්හි කාර්යභාරය

1. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 4 වන ව්‍යවස්ථාව මගින් "වර්තමාන සම්මුතියේ හඳුනාගන්නා ලද අයිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු සියලුම නෛතික, පරිපාලන හා වෙනත් ක්‍රියාමාර්ග ගැනීම" සඳහා රාජ්‍ය පාර්ශ්වයන්ට දන්වා සිටියි. ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන සම්මුතිය ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වන වැදගත් යාන්ත්‍රණයක් වන අතර සම්මුතිය ක්‍රියාත්මක කිරීම සහ ළමා අයිතිවාසිකම් විශ්වීය වශයෙන් සහතික කිරීම ප්‍රගමනය සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් වගකීමට යටත් වන එබඳු ආයතන ස්ථාපනය කිරීම පිළිබඳව සලකා බලයි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වකරුවන් සම්මුතිය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම හා අධීක්ෂණය සඳහා ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන සහ ළමුන් සඳහා වන ඔම්බුඩ්ස්මන්වරුන් / ළමා කොමසාරිස්වරුන් සහ සමාන තත්ත්වයේ ස්වාධීන ආයතන පිහිටුවීම කමිටුව සතුටින් පිළිගනියි.

2. සම්මුතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ නිරීක්ෂණය සඳහා සුදුසු ස්වාධීන ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් උනන්දු කිරීමට සහ ඊට සහයෝගය දැක්වීමට කමිටුව විසින් මෙම පොදු ප්‍රකාශය නිකුත් කරනු ලබන අතර එබඳු ආයතනවල අත්‍යවශ්‍ය මූලිකාංග සහ එමඟින් ඉටු කළ යුතු කාර්යයන් කමිටුව විසින් දක්වනු ලැබේ. එබඳු ආයතන මේ වනවිට ස්ථාපනය කර ඇති අවස්ථාවන්හිදී ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සහ වෙනත් ජාත්‍යන්තර නෛතික ලේඛනවල සඳහන් කර ඇති පරිදි ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීම සඳහා ඒවායේ තත්ත්වය ඵලදායීව සමාලෝචනය කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශ්වකරුවන් වෙතින් ඉල්ලා සිටියි.

3. 1993 වර්ෂයේ දී පැවැත්වුණු මානව හිමිකම් පිළිබඳ ලෝක සමුළුවේදී, වියානා ප්‍රකාශනයේදී හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ දී "මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වන ජාතික ආයතන විසින් වැදගත් මෙන්ම අර්ථවත් භූමිකාවක නිරත වීම ...." නැවත තහවුරු කරන ලද අතර "ජාතික ආයතන පිහිටුවීම හා ශක්තිමත් කිරීම" දිරි ගන්වන ලදී. මානව හිමිකම් පිළිබඳ මහා සභාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සහ එම අයිතිවාසිකම් සම්බන්ධයෙන් මහජන දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැදගත්කම අවධාරණය කරමින් ජාතික මානව හිමිකම් ආයතන ස්ථාපනය කිරීමට පුන පුනා ඉල්ලුම් කරන ලදී. එහි විධිමත්ව වරින් වර ඉදිරිපත් කරනු ලබන වාර්තා සඳහා වන පොදු උපදේශනයන්හි, "ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා ස්ථාපනය කරන ලද ඕනෑම ස්වාධීන ආයතනයක් ...."1 පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස රාජ්‍ය පාර්ශ්වකරුවන්ගෙන් කමිටුව ඉල්ලා සිටින අතර එමඟින් රාජ්‍ය පාර්ශ්වකරුවන් සමඟ සංවාදය තුළදී මෙම ගැටලුව පිළිබඳව ස්ථිර වශයෙන් අවධානය යොමු කරනු ලැබේ.

4. 19923 මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් විකාශනය කරන ලද 19932 මහා සම්මේලනයේදී සම්මත කරන ලද මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වන ජාතික ආයතන හා සම්බන්ධ මූලධර්මවලට (පැරිස් මූලධර්ම) වලට අනුකූලව ජාතික මානව හිමිකම් ආයතන ස්ථාපනය කළ යුතුය. බහුත්වවාදය, ස්වාධීනත්වය, මෙහෙයුම් ක්‍රම සහ ක්වාසි අධිකරණ කටයුතු ඇතුළත්ව මෙම අවම ප්‍රමිතීන් එබඳු ජාතික ආයතන සංස්ථාපනය, නීත්‍යානුකූල බලය, වගකීම් සහ සංයුතිය සඳහා මඟපෙන්වයි.

5. වැඩිහිටියන් සහ ළමුන් යන දෙපාර්ශ්වය සඳහාම තම මානව හිමිකම් ආරක්ෂා කිරීමට ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන සමාන වශයෙන් අවශ්‍ය අතර මානව හිමිකම් සඳහා විශේෂ අවධානය යොමුකර ඇති බව තහවුරු කිරීමට අතිරේක සාධාරනීකරණ පවතියි. ළමුන්ගේ සංවර්ධන අවධිය ඔවුන් මානව හිමිකම් උල්ලංඝනයවීමේ අවදානමට විශේෂයෙන්ම ගොදුරු වීම; ඔවුන්ගේ මත මේ වනවිටත් කලාතුරකින් සැලකිල්ලට ගැනීම, මානව හිමිකම් සඳහා රජයේ ප්‍රතිචාරය තීරණය කෙරෙන දේශපාලන ක්‍රියාවලිය තුළ අර්ථවත් කාර්යභාරයක් ඉටුකිරීමට ළමුන් සතුව ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැති වීම; ළමුන් ස්වකීය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට හා ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය විම සම්බන්ධයෙන් පිළියම් සෙවීමට නීති පද්ධතිය භාවිතයේදී ළමුන් මුහුණදෙන සුවිශේෂී ගැටළු සහ තම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට ඉදිරිපත් වන සංවිධාන වෙත ළමුන්ගේ ප්‍රවේශය සාමාන්‍යයෙන් සීමා වී තිබීම ආදිය මීට හේතු වේ.

6. රාජ්‍ය පාර්ශ්වකරුවන් වැඩි ප්‍රමාණයක් ළමුන් සඳහා විශේෂ ස්වාධීන මානව හිමිකම් ආයතන ඔම්බුඩ්ස්මන්වරුන් හෝ ළමුන් සඳහා කොමසාරිස්වරුන් යන තනතුරු ස්ථාපනය කර තිබේ. සීමිත සම්පත් පවතින අවස්ථාවන්හිදී ළමා අයිතිවාසිකම් ඇතුළුව සෑම තැනැත්තකුගේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවත්නා සම්පත් උපරිම ඵලදායිත්වයෙන් භාවිතා වන බව සහතික කිරීම සම්බන්ධයෙන් සැලකිලිමත්වීම අනිවාර්ය වන අතර මෙම සන්දර්භය තුළ පුළුල් පදනමේ ජාතික මානව හිමිකම් ආයතන සංවර්ධනය කිරීමට ළමුන් පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම අන්තර්ගත වන අතර එමඟින් හොඳම ප්‍රවේශය නිර්මාණය කරනු ඇත. පුළුල් පදනමෙන් යුත් ජාතික මානව හිමිකම් ආයතනයක ව්‍යුහය තුළ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂයෙන් වගකියනු ලබන හඳුනාගත හැකි කොමසාරිස්වරයකු හෝ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වගකියන විශේෂිත අංශයක් හෝ ඒකකයක් පැවතිය යුතුය.

7. සෑම රාජ්‍යයක් සතුවම ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන ස්වාධීන මානව හිමිකම් ආයතනයක් තිබීම අවශ්‍ය වේ. කමිටුවේ අවධානයට ලක්වන කරුණ වන්නේ එම ආයතනය කවර ආකාරයේ ආකෘතියකින් යුතු වුවද එයට ස්වාධීනව ඵලදායී අන්දමෙන් ළමා අයිතිවාසිකම් නිරීක්ෂණයට, ප්‍රවර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට හැකියාව පැවතීමයි. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම "ප්‍රධාන කාර්යය" විය යුතු අතර මෙම අරමුණ කරා ළඟා වීමට රටක පවතින සියලුම මානව හිමිකම් ආයතන සක්‍රීයව එක්ව කටයුතු කරයි.

බලය පැවරීම හා බලතල

8. හැකියාව පවතියි නම් ජාතික මානව හිමිකම් ආයතන ව්‍යවස්ථානුකූලව ස්ථාපනය කළයුතු අතර නීත්‍යානුකූලව බලය පැවරිය යුතුය. එම ආයතන වෙත බලය පැවරීමට හැකිතාක් දුරට මානව හිමිකම් ආරක්ෂා කිරීම, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, එහි විකල්ප සන්ධාන පත්‍ර සහ වෙනත් අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ නෛතික ලේඛන ඒකාබද්ධ කිරීමේ පුළුල් ක්ෂේත්‍රයක් ඊට අන්තර්ගත විය යුතු අතර ඒ ආකාරයෙන් මානව හිමිකම් විශේෂයෙන්ම මිනිසුන්ගේ සිවිල්, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අයිතිවාසිකම් සාධනීය අන්දමෙන් ආවරණය කළ යුතුය. මෙහි ව්‍යස්ථාදායක බලයට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ එහි විකල්ප සාධන පත්‍රවලට සම්බන්ධ කළ ළමුන් හා සම්බන්ධ සුවිශේෂි කාර්යයන්, බලතල යන කර්තව්‍යයන් දැක්වෙන විධිවිධාන ඇතුළත් විය යුතුය. සම්මුතියෙහි පැවැත්මට පෙර හෝ ප්‍රමාණාත්මක ලෙස ඒ සමඟ ඒකාබද්ධ කිරීමෙන් .ජාතික මානව හිමිකම් ආයතනය පිහිටුවන ලද්දේ නම් ඒ වෙනුවෙන් ව්‍යවස්ථාදායක නීති කෙටුම්පත්කරණය හා සංශෝධනය ඇතුළත්ව සම්මුතියෙන් මූලධර්ම හා විධිවිධාන සමඟ ආයතනයේ විධිනියෝගයේ අනුකූලතාව සහතික කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

9. ජාතික මානව හිමිකම් පිළිබඳ ආයතන ඕනෑම තැනැත්තකුට සවන් දීමට සහ ස්වකීය ශක්‍යතාවය ඇතුළත පවතින සිදුවීම් තක්සේරු කිරීමට අදාළ ඕනෑම තොරතුරක් හෝ ලේඛනයක් ලබා ගැනීමට අවශ්‍ය බලය ඇතුළුව තමන් වෙත පැවරුණු බලය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලතලවලට අනුකූල විය යුතුය. මෙම බලතලවලට රජයට පමණක් නොව සියලුම අදාළ රජයේ හා පෞද්ගලික ආස්ථිත්‍යයන්ට සම්බන්ධ හවුල්කාර රාජ්‍යයේ අධිකරණපාත්‍රතාව යටතේ සියලුම ළමුන්ගේ අයිතීන් ප්‍රවර්ධනය හා අධීක්ෂණය ඇතුළත් විය යුතුය.

ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය

10. ජාතික මානව හිමිකම් ආයතන පිහිටුවීමේ ක්‍රියාවලිය උපදේශක, අන්තර්ගත, විනිවිදභාවයෙන් යුතු, ආරම්භක විය යුතු අතර රජයේ, ව්‍යවස්ථාදායකයේ හා සිවිල් සමාජයේ අදාල සියලුම මූලිකාංගවලින් සමන්විත විය යුතුය. ඒවායේ ස්වාධීනත්වය සහ සාධනීය ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ජාතික මානව හිමිකම් සංවිධාන සතුව ප්‍රමාණවත් යටිතල පහසුකම්, අරමුදල් (විශේෂයෙන්ම පුළුල් පදනම්ගත ආයතන තුළ ළමා අයිතිවාසිකම් සඳහා), කාර්ය මණ්ඩලය, පරිශ්‍ර සහ එම ආයතනවල ස්වාධීනත්වයට බලපාන සියලුම ආකාරයේ මූල්‍ය පාලනයෙන් නිදහස් වීම අනිවාර්ය වේ.

සම්පත්

11. මෙය රාජ්‍ය පාර්ශ්වකරුවන් විවිධ මට්ටම්වල සම්පත් සමග කටයුතු කරන ඉතා සංවේදී කරුණක් වශයෙන් කමිටුව පිළිගන්නා අතර සම්මුතියෙහි 4 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික මානව හිමිකම් ආයතනවල මෙහෙයවීම සඳහා සාධාරණ ලෙස මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම රාජ්‍යයන්ගේ කාර්යය බව කමිටුව විශ්වාස කරයි. ජාතික ආයතනය සතුව එහි බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රම නොතිබුණහොත් එම ආයතන වෙත පැවරුණු බලය සහ බලතල නිෂ්ඵල වීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම සීමා වීම සිදු වේ.

බහුත්ව නියෝජනය

12. මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම හා සම්බන්ධ සිවිල් සමාජයේ විවිධ මූලිකාංග බහුත්ව නියෝජනය තම සංයුතියට ඇතුළත් වන බවට ජාතික මානව හිමිකම් ආයතන සහතික විය යුතුය. එම ආයතන සම්බන්ධ විය යුතු වෙනත් ආයතන හා තැනැත්තන් අතර අතර මානව හිමිකම්, වෙනස් ලෙස නොසැලකීම සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ රාජ්‍ය නොවන සංවිධාන, (වෛද්‍යවරුන්, නීතීඥවරුන්, මාධ්‍යවේදීන්, විද්‍යාඥයින්); විශ්වවිද්‍යාල සහ විශේෂඥයින්, ළමා අයිතිවාසිකම් පිළිබඳ විශේෂඥයින් ආදීන් ඇතුළත්ව ළමා සහ තරුණ ප්‍රජාව විසින් මෙහෙයවන සංවිධාන, වෘත්තීය සංගම්, සමාජ හා වෘත්තීය සංවිධාන වේ. රාජ්‍ය දෙපාර්තමේන්තු සම්බන්ධ විය යුත්තේ උපදේශක මට්ටමෙන් පමණි. ජාතික මානව හිමිකම් ආයතන සතුව විවෘත මෙන්ම තරගකාරී තේරීම් ක්‍රියාවලියක් ඇතුළත්ව වඩාත් යෝග්‍ය මෙන්ම විනිවිදභාවයෙන් යුතු පත්වීම් ක්‍රියාවලියක් පැවතිය යුතුය.

ළමා අයිතිවාසිකම් කඩවීම් වෙනුවෙන් පිළියම් යෙදීම

13. ළමුන් වෙනුවෙන් හෝ ළමුන් විසින් සෘජුවම ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ පෙත්සම් ඇතුළත්ව පුද්ගලයින් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සහ පෙත්සම් සලකා බලා විමර්ශන ක්‍රියාත්මක කිරීමේ බලය ජාතික මානව හිමිකම් ආයතන සතුව අනිවාර්යයෙන් පැවතිය යුතුය. එබඳු විමර්ශන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සාක්ෂිකරුවන් වෙත බල කර සිටීමට සහ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමට, අදාළ ලේඛනමය සාක්ෂි සහ රැඳවුම් මධ්‍යස්ථාන කරා ප්‍රවේශ වීමට එම ආයතන සතුව බලතල තිබිය යුතුය. ළමා අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් ළමුන්ට සාධනීය පිළියම් ස්වාධීන උපදෙස්, පක්ෂව කථා කිරීම සහ පැමිණිලි ක්‍රියාමාර්ග පවතින බව සහතිකකිරීම එම ආයතන සතු තවත් කර්තව්‍යයකි. අවශ්‍ය අවස්ථාවන්හිදී ජාතික මානව හිමිකම් ආයතන පැමිණිලි බේරුම් කිරීම හා සමාදාන කිරීම කළ යුතුය.

14. ළමුන්ගේ ගැටළු සම්බන්ධයෙන් වන ජාතික මානව හිමිකම් ආයතන නමින් (ආ) ගොනු කර ඇති අධිකරණ නඩුවලට මැදිහත් වී එම නඩුව සම්බන්ධයෙන් පවතින මානව හිමිකම් ගැටළු පිළිබඳව අධිකරණයට දැනුම් දීමේ බලය (අ) ඇතුළත්ව අධිකරණය වෙත රැගෙන යන ළමුන්ට සහාය දීමේ බලය ජාතික මානව හිමිකම් ආයතන සතුව බලය තිබිය යුතුය.

ප්‍රවේශවීමේ හැකියාව හා සහභාගීත්වය

15. ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන භූගෝලීය වශයෙන් මෙන්ම භෞතික වශයෙන් සියලුම ළමුන් වෙත ප්‍රවේශ විය යුතුය. සම්මුතියේ 2 වන ව්‍යවස්ථාව අනුසාරයෙන් එම ආයතන විශේෂයෙන්ම වැඩි වශයෙන් අනතුරට බඳුන්වීමට හැකියාව ඇති මෙන්ම වරප්‍රසාද නොලත් එනම් රැකවරණයේ සිටින හෝ රඳවාගෙන සිටින, සුළු ජාතික හෝ දේශීය සම්භවයක් සහිත ළමුන්, ආබාධ වලින් පෙළෙන ළමුන්, දරිද්‍රතාවයෙන් පෙළෙන ළමුන්, සරණාගත මෙන්ම සංක්‍රමණික ළමුන්, වීදි දරුවන්ගෙන් හෝ සංස්කෘතිය, භාෂාව, සෞඛ්‍ය හෝ අධ්‍යාපන යන අංශයන්ගෙන් විශේෂ අවශ්‍යතා පවතින දරුවන් ආදී වශයෙන්

සියලුම කණ්ඩායම්වල ළමුන් වෙත ක්‍රියාකාරී ලෙස ළඟා විය යුතුය. ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනවල නීති සම්පාදනයේදී සියලුම ආකාරයේ විකල්ප රැකවරණය ලබන ළමුන් හා ළමුන් ඇතුළත් සියලුම ආයතනවල පෞද්ගලික අවශ්‍යතා සම්බන්ධව ප්‍රවේශවිය හැකි අයිතීන් ඇතුළත් කළ යුතුය.

16. සම්මුතියෙහි 12 වන ව්‍යවස්ථාවෙහි දක්වා ඇති පරිදි ළමුන් තමන් කෙරෙහි බලපාන සියලුම කරුණු වලදී දරන අදහස්වලට ගෞරව කිරීම ප්‍රවර්ධනය කිරීම ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනයන්හි ප්‍රධාන කාර්යයකි. මෙම පොදු මූලධර්මය ජාතික මානව හිමිකම් ආයතන ස්ථාපනය කිරීම, සංවිධානය හා ඒවායේ ක්‍රියාකාරකම් කෙරෙහි අදාළ කරගත යුතුය. ළමුන් සමඟ තම ආයතන සෘජු සම්බන්ධතා පවත්වන බවටත් ළමුන් සුදුසු පරිදි සම්බන්ධ වන බවටත් උපදෙස් ලබා ගන්නා බවටත් ජාතික මානව හිමිකම් ආයතන සහතික කර ගැනීම අනිවාර්ය වේ. උදාහරණයක් ලෙස ළමුන් සම්බන්ධ කරුණුවලදී ළමුන්ට සහභාගීවීම සඳහා පහසුකම් සැලැස්වීම ජාතික මානව හිමිකම් ආයතන සඳහා උපදේශන ආයතන පිහිටුවිය යුතුය.

17. සම්මුතියේ 12 වන ව්‍යවස්ථාවට පූර්ණ අනුකූලතාවය දැක්වීම සඳහා ජාතික මානව හිමිකම් ආයතන විශේෂයෙන් සකසන ලද උපදේශන වැඩසටහන් සහ පරිකල්පනීය සන්නිවේදන ක්‍රමෝපායන් සැලසුම් කළ යුතුය. ළමුන්ට ආයතනය සමඟ සන්නිවේදනය කළ හැකි සුදුසු ක්‍රම මාලාවක් සංස්ථාපනය කළ යුතුය.

18. ළමුන්ගේ අයිතිවාසිකම්වල තත්ත්වය පිළිබඳව සෘජුවම, ස්වාධීනව සහ වෙන් වශයෙන් රජයේ ආයතන හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමේ අයිතිය ජාතික මානව හිමිකම් ආයතන වෙත පැවතිය යුතුය. මෙම කාර්යයේදී, ළමා අයිතිවාසිකම් හා සම්මුතිය සමඟ රාජ්‍යයේ අනුකූලතාව සම්බන්ධයෙන් ජාතික මානව හිමිකම් ආයතනයේ කාර්යයභාරය සාකච්ඡා කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අවස්ථාව ලබා දෙමින් වාර්ෂික විවාදයක් පවත්වන බව රාජ්‍ය පාර්ශ්වකරුවන් සහතික වීම අත්‍යවශ්‍ය වේ.

නිර්දේශිත ක්‍රියාකාරකම්

19. සම්මුතියේ පොදු මූලධර්ම අනුසාරයෙන් ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික මානව හිමිකම් ආයතන ක්‍රියාත්මක කළ යුතු යැයි හැඟවෙන නමුත් සම්පූර්ණ නොවන ක්‍රියාකාරකම් ලැයිස්තුවක් පහත සඳහන් පරිදි දැක්විය හැකිය. එම ක්‍රියාමාර්ග වන්නේ:

පුනරුත්ථාපනය හෝ දඬුවම් ලබා දීම සඳහා ළමුන්ගේ රැඳවුම් මධ්‍යස්ථාන), රැකවරණ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීමට යාම, එම ස්ථානවල තත්ත්වය වාර්තා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දීම;

* ඉහත කාර්යයන්ට ආනුශංගික වන වෙනත් කාර්යයක් ඉටු කිරීම;

ළමා අයිතිවාසිකම් පිළිබඳව කමිටුවට වාර්තා කිරීම සහ ජාතික මානව හිමිකම් ආයතන සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අතර සහයෝගීතව හා මානව හිමිකම් යාන්ත්‍රණ.

20. ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ පූර්ව සැසි කාර්ය කණ්ඩායම සහ වෙනත් අදාළ ගිවිසුම් ආයතන සමඟ සංවාදය ඇතුළුව ළමා අයිතිවාසිකම් හා සම්බන්ධ ජාත්‍යන්තර ගිවිසුම් ආයතන වෙත ජාතික මානව හිමිකම් ආයතන සම්මුතිය සහ වෙනත් අදාළ ජාත්‍යන්තර නෛතික ලේඛන ප්‍රකාරව වාර්තාකරණ ක්‍රියාවලියට ස්වාධීනව සහයෝගය දැක්විය යුතු අතර රජයේ වාර්තාවල ඒකීයත්වය නිරීක්ෂණය කළ යුතුය.

21. නීති සම්පාදන පදනම මත විස්තරාත්මක තොරතුරු, බලය පැවරීම හා ජාතික මානව හිමිකම් ආයතනවල ප්‍රධාන අදාළ ක්‍රියාකාරකම් ඒවායේ වාර්තාවල ඇතුළත් කරන ලෙසද කමිටුව රාජ්‍ය පාර්ශ්වකරුවන් වෙතින් ඉල්ලුම් කරයි. කමිටු වාර්තා සකසන අවස්ථාවේදී රාජ්‍ය පාර්ශ්වකරුවන් ජාතික මානව හිමිකම් ආයතනවල උපදෙස් ලබා ගැනීම සුදුසු වේ. නමුත්, රාජ්‍ය පාර්ශ්වකරුවන් මෙම ආයතනවල ස්වාධීනත්වයට සහ කමිටුව වෙත තොරතුරු සැපයීමේ ස්වාධීන කාර්යභාරයට ගරු කළ යුතුය. කමිටුව විසින් වාර්තා පරීක්ෂා කිරීමේදී වාර්තා කෙටුම්පත්කරණය ජාතික මානව හිමිකම් ආයතනවලට පැවරීම එය රජයේ පැවරීම් වලට අන්තර්ගත කිරීම කිරීම සුදුසු නොවේ.

22. මානව හිමිකම් පිළිබඳ ජාතික ආයතන, විශේෂයෙන්ම ළමුන් අලෙවි කිරීම, ළමා ගණිකා වෘත්තිය, සහ ළමා කාමුක දර්ශන පිළිබඳ විශේෂ වාර්තාකරුවකු ලෙස මෙන්ම ළමුන් හා සන්නද්ධ අරගලය සඳහා වන මහලේකම්වරයාගේ විශේෂ නියෝජිතයා වශයෙන් රට සහ තේමාන්විත යාන්ත්‍රණය ඇතුළත්ව මානව හිමිකම් කොමිෂන් සභාවේ විශේෂ ක්‍රියාවලිය සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කළ යුතුය.

23. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ජාතික මානව හිමිකම් ආයතන පිහිටුවීමේ සහයෝගය දැක්වීමේ දීර්ඝකාලීන වැඩසටහනක් පවතියි. මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය මූලික කරගෙන සැකසුනු මෙම වැඩසටහන කලාපීය සහ ගෝලීය සහයෝගීතාව උදෙසා තාක්ෂණික සහාය සපයමින් පහසුකම් සලසන අතර ජාතික මානව හිමිකම් ආයතන අතර හුවමාරුකිරීම් සිදු කරයි. අවශ්‍ය අවස්ථාවන්හිදී රාජ්‍ය පාර්ශ්වකරුවන් මේ සඳහා සහාය දැක්විය යුතුය. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මෙම ක්ෂේත්‍රය සඳහා විශේෂඥ සහ තාක්ෂණික සහයෝගීතාව ලබාදෙයි.

24. සම්මුතියේ 43 වන ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා ඇති පරිදි, ජාතික මානව හිමිකම් ආයතන ස්ථාපනය කිරීමේදී තාක්ෂණික උපදෙස් හෝ සහාය සඳහා ඉල්ලීමක් හෝ ඇතුළත් හෝ සාක්ෂිකරුවන් දැක්වෙන රාජ්‍ය පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරන ඕනෑම වාර්තාවක් කමිටුව සුදුසු සැම සලකන ආකාරයට (මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය) එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයට හෝ මානව හිමිකම් සඳහා වන මහා කොමසාරිස්වරයා හෝ කාර්යාලය සහ වෙනත් ඕනෑම නිසි බලය සහිත ආයතනවලට සම්ප්‍රේෂණය කළ හැකිය.

ජාතික මානව හිමිකම් ආයතන සහ රාජ්‍ය පාර්ශ්වකරුවන්

25. රාජ්‍යය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අනුමත කරනු ලබන අතර එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ වගකීම බාර ගනියි. ජාතික මානව හිමිකම් ආයතනවල කාර්යභාරය වන්නේ රාජ්‍යයේ අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය ස්වාධීනව නිරීක්ෂණය කිරීම සහ මානව හිමිකම් සඳහා පූර්ණ ගෞරවය දැක්වීමට රාජ්‍යයට හැකි සියලු දේ ඉටු කිරීමයි. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන ව්‍යාපෘති ආයතනය විසින් සංවර්ධනය කිරීම මෙහිදී අපේක්ෂා කෙරෙන අතර එමගින් රාජ්‍යය විසින් එහි නිරීක්ෂණ වගකීම ජාතික ආයතනයට පැවරීමට මඟ පෑදිය යුතු නොවේ. ආයතන වෙත තම න්‍යාය පත්‍රය තමන් විසින්ම සකසා ගැනීමට හැකිවන සහ තම ක්‍රියාකාරකම් තීරණය කිරීමට හැකි වන පරිදි එම ආයතන සම්පූර්ණයෙන් නිදහස් කිරීම අත්‍යවශ්‍ය වේ.

26. ජාතික මානව හිමිකම් ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන මානව හිමිකම් හා ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන භූමිකාවක නිරතව සිටියි. ජාතික මානව හිමිකම් ආයතනවල ව්‍යවස්ථාදායක පදනම සහ සුවිශේෂී බලතල ඇතුළත්ව එහි කාර්යභාරය අනුපූරක වේ. රාජ්‍ය නොවන සංවිධාන සහ රජයන් සමඟ සමීපව කටයුතු කරන ආයතන ජාතික මානව හිමිකම් ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල ස්වාධීනත්වයට ගරු කළ යුතුය.

කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව

27. ජාතික මානව හිමිකම් ආයතනය තමන්ට අදාළ රටවල් තුළ මානව හිමිකම් ප්‍රවර්ධනයේදී හා ආරක්ෂා කිරීමේදී පොදු ගැටළු සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කරගන්නා බැවින් හුවමාරු කරගත් අත්දැකීම් තුළින් කලාපීය හා ජාත්‍යන්තර ක්‍රියාවලි හා යාන්ත්‍රණ භාවිතයෙන් ජාතික මානව හිමිකම් ආයතන ශක්තිමත් කිරීම හා ඒකාබද්ධ කිරීම කල හැකිය.

28.මෙහිදී මානව හිමිකම් පිළිබඳ ජාතික ආයතන, ජාතික, කලාපීය හෝ ජාත්‍යන්තර ආයතන සහ ළමා අයිතිවාසිකම් සම්බන්ධ ගැටළු පිළිබඳව කටයුතු කරන ආයතන වෙතින් උපදෙස් ලබාගෙන එම ආයතන සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කළ යුතුය.

29. ළමුන්ගේ මානව හිමිකම් සම්බන්ධ ගැටළු ජාතික මායිම් මඟින් පවරා නොමැති අතර ළමා අයිතිවාසිකම් සම්බන්ධ විවිධ ගැටළු සඳහා සුදුසු කලාපීය හා අන්තර්ජාතික ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය ඉහළ ගොස් තිබේ. (ගැහැණු සහ ළමුන් ජාවාරම, ළමුන් ලිංගික කාර්යයන්හි යෙදවීම , ළමා සොල්දාදුවන්, ළමා

ශ්‍රමය, ළමුන් අයුතු ලෙස භාවිතය, සරණාගතයන් හා සංක්‍රමණික ළමුන්ද ඇතුළත්වන අතර ඊට පමණක් සීමා නොවේ). ජාතික මානව හිමිකම් ආයතන වෙත එක් එක් ආයතනයේ අත්දැකීම් තුළින් ඉගෙනීමට අවස්ථාව සැලසීම, එකිනෙකාගේ තත්වයන් සාමූහිකව ශක්තිමත් කිරීම සහ රටවල් සහ කලාපවලට බලපාන මානව හිමිකම් ගැටළු විසඳීම සඳහා සහයෝගය දැක්වීම සඳහා උනන්දු කිරීම.

සටහන්

1. සම්මුතියේ 18 වන ජේදයේ 44 වන ව්‍යවස්ථාවේ 1ඃ ආ ජේදය ප්‍රකාරව විධිමත්ව වරින වර ඉදිරිපත් කළ යුතු වාර්තාවල ආකෘතිය සහ සංයුතිය පිළිබඳ පොදු මාර්ගෝපදේශ

2. මානව හිමිකම් පවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වන ජාතික ආයතනවල ස්ථිත්‍යයන් හා සම්බන්ධ මූලධර්මඃ පැරිස් මූලධර්ම 1993 දෙසැම්බර් මස 20 වන දිනැති 48 ර134 දරන මහා සම්මේලන සම්මතකිරීම; ඇමුණුම

3. 1992 මාර්තු මස 3 වන දිනැති 1992ර54 දරන මානව හිමිකම් කොමිෂන් සභා සම්මතිය; ඇමුණුම

පොදු ප්‍රකාශය අංක 5 (2003) - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර (4, 42 හා 44 (6) වැනි ව්‍යවස්ථා)

(මෙය අසංෂිප්ත පරිවර්තනයකි)

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

බෙදා හැරීම: පොදු
CRC/GC/2003/5
2003 නොවැම්බර් 27
මුල් පිටපත: ඉංග්‍රීසි භාෂාවෙනි

ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව
තිස් හතර වැනි සැසිවාරය
2003 සැප්තැම්බර් 19 - ඔක්තෝබර් 03

පොදු ප්‍රකාශය අංක 5 (2003)
ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර
(4, 42 හා 44 (6) වැනි ව්‍යවස්ථා)

පෙරවදන

රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ බැඳීම් සංක්ෂේප කරමින්, "ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර" යනුවෙන් හඳුන්වා දී තිබෙන පියවර සකස් කිරීම සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් මෙම පොදු ප්‍රකාශය කෙටුම්පත් කරන ලදී. මෙම සංකල්පයේ විවිධ වූ අංග සංකීර්ණ වන අතර, මෙම සංක්ෂේපය පුළුල් කරමින් එක් එක් අංග සම්බන්ධයෙන් වඩාත් විස්තරාත්මක වූ පොදු ප්‍රකාශයක් නියමිත කාල සීමාව තුළ නිකුත් කිරීම සිදුකරන බවට කමිටුව විසින් අවධාරණය කරනු ලැබේ. මෙම කමිටුවේ "ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ දී ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතනවල කාර්යභාරය" මැයෙන් වූ පොදු ප්‍රකාශ අංක 2 (2002) දැනටමත් මෙම සංකල්පය මත පුළුල් කර තිබේ.

4 වැනි ව්‍යවස්ථාව

> "වර්තමානයේ ක්‍රියාත්මක වන සම්මුතියෙහි හඳුනාගෙන ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වන සියලු ව්‍යවස්ථාදායක, පරිපාලන, සහ අනෙකුත් පියවර රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ගනු ලැබිය යුතු ය. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සැලකීමේ දී, රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සිය පවතින සම්පත්වල උපරිම ප්‍රමාණය අනුව ද, අවශ්‍ය අවස්ථාවන්හි දී ජාත්‍යන්තර සහයෝගීතාවයේ රාමුව ඇතුළත ද එම පියවරවල් ගනු ලැබිය යුතු ය."

I. හැඳින්වීම

1. රාජ්‍යයක් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීමේ දී, ජාත්‍යන්තර නීතිය යටතේ මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ දී වන බැඳීම් සඳහා එකඟවනු ලැබේ. ක්‍රියාත්මක කිරීම යනු සිය අධිකරණ බල සීමාව තුළ සියලු දරුවන් සඳහා සම්මුතියේ අන්තර්ගත සියලු අයිතිවාසිකම් ඉටුවීම සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් පියවර ගැනීම සිදුවන ක්‍රියාවලියයි.1 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 4 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, එහි සඳහන් වන සියලු අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් "සියලු යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සහ අනෙකුත් පියවර" ගැනීම අවශ්‍ය වේ. සම්මුතිය යටතේ වන බැඳීම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලබන්නේ රාජ්‍යයක් විසින් වන අතර, ළමා අයිතිවාසිකම් යථාර්ථයක් කරගැනීම සඳහා සමාජයේ සියලු අංශවල නිරතවීම, සැබැවින්ම ළමුන් ද තමා වෙනුවෙන් කටයුතු කිරීමක් අවශ්‍ය වේ . සියලු දේශීය නීති මෙම සම්මුතිය සමඟ අනුකූලබවට සහතිකවීම සහ සම්මුතියේ මූලධර්ම සහ විධිවිධාන ඍජුවම අදාළ කරගත හැකිබව සහ යෝග්‍ය පරිදි බලාත්මක කිරීම මූලික වේ. මීට අමතරව, රජය, පාර්ලිමේන්තුව සහ අධිකරණයට අදාළව සියලු මට්ටම්වලදී විශේෂ ව්‍යුහයන් සහ අධීක්ෂණ, පුහුණු සහ වෙනත් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම ඇතුළුව ඵලදායි ක්‍රියාත්මක කිරීමක් සඳහා අවශ්‍ය කරන පුළුල් පරාසයක වූ පියවර ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් හඳුනාගෙන තිබේ.2

2. කමිටුව විසින් නියමිත කාලාන්තරවල දී සම්මුතිය යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ වාර්තා පිරික්සුමට භාජනය කිරීමේ දී, "ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර" යනුවෙන් නම්කර ඇති කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කෙරේ. මෙසේ කරුණු පිරික්සීමෙන් අනතුරුව කමිටුව විසින් නිකුත් කරනු ලබන සමාප්ති නිරීක්ෂණවල දී, කමිටුව විසින් පොදු පියවරවලට අදාළව විශේෂිත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කරනු ලබන සිය පසු වාර්තා මගින් රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් මෙම නිර්දේශවලට ප්‍රතිචාර වශයෙන් ගනු ලැබූ පියවර විස්තර කිරීම අපේක්ෂා කෙරේ. කමිටුවේ වාර්තා කිරීමේ මාර්ගෝපදේශ ඔස්සේ සම්මුතියේ ව්‍යවස්ථා එක් එක් කාණ්ඩ වශයෙන් වර්ගීකරණය කෙරෙන අතර,3 මෙහිදී "ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර" පළමුව පවතින අතර එහිදී 4 වන ව්‍යවස්ථාව 42 වැනි ව්‍යවස්ථාව සමඟ කාණ්ඩගත කිරීමක් (සම්මුතියේ අන්තර්ගතය පිළිබඳව ළමුන් සහ වැඩිහිටියන් විසින් පුළුල්ව දැනුවත්ව සිටීම සම්බන්ධයෙන් වන බැඳීම; පහත 66 ඡේදය බලන්න) සහ 44 වැනි ව්‍යවස්ථාවේ 6 වැනි ඡේදය (රාජ්‍යයක් තුළ වාර්තා සුලභව පැවතීම සඳහා වන බැඳීම; පහත 71 ඡේදය බලන්න) වශයෙන් පවතියි .

3. මෙම විධිවිධානවලට අමතරව, අනෙකුත් පොදු ක්‍රියාත්මක කිරීමේ බැඳීම් 2 වැනි ව්‍යවස්ථාවේ දැක්වේ: "කවර හෝ ආකාරයෙන් වූ වෙනස් කොට සැලකීමක් නොමැතිව සිය අධිකරණ බල සීමාව තුළ දී සෑම දරුවෙකු සම්බන්ධයෙන්ම මෙම සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ සහතික වීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සියලු යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලන, සහ අනෙකුත් පියවර ගැනීම අවශ්‍ය වේ".

4. එසේම 3 වැනි ව්‍යවස්ථාවේ, 2 වැනි ඡේදයේ "ළමුන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව වගකිවයුතු වන ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ගේ, නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ වෙනත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් ද සැලකිල්ලට ගනිමින්, ඔහුගේ හෝ ඇයගේ මනා පැවැත්ම උදෙසා අවශ්‍ය කෙරෙන ආරක්ෂාව සහ රැකවරණය ළමයාට ලැබෙන බව සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් වගකීමට බැඳෙන අතර, මේ අරමුණ උදෙසා සියලු යෝග්‍ය ව්‍යවස්ථාදායක සහ පරිපාලනමය පියවරවල් ගනු ලැබිය යුතු ය." වශයෙන් දැක්වේ.

5. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2 වැනි ව්‍යවස්ථාව සහ ආර්ථික, සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 2 වැනි ව්‍යවස්ථාව ආදී වශයෙන් සමස්ත ක්‍රියාත්මක කිරීමේ බැඳීම් දක්වමින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය තුළ, මෙම සම්මුතියේ 4 වැනි ව්‍යවස්ථාවට සමාන ව්‍යවස්ථා පවතී. මානව අයිතිවාසිකම් කමිටුව සහ ආර්ථික, සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් මෙම විධිවිධානවලට අදාළව පොදු ප්‍රකාශ නිකුත් කර ඇති අතර, ඒවා මෙහි දැක්වෙන පොදු ප්‍රකාශයට අනුරූපී ආකාර වශයෙන් පවතින අතර ඒ සම්බන්ධයෙන් පහත අවධානය යොමු කර ඇත.4

6. 4 වැනි ව්‍යවස්ථාව මගින්, ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ සමස්ත බැඳීම පිළිබිඹු කරන අතරම, එහි දෙවන වාක්‍යය මගින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලින් ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වෙන්කොට හඳුනාගැනීමක් යෝජනා කෙරේ: "ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සැලකීමේ දී, පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් සිය පවතින සම්පත්වල උපරිම සීමාව දක්වා සහ අවශ්‍ය අවස්ථාවන්හි දී, ජාත්‍යන්තර සහයෝගිතා රාමුව තුළ එවැනි පියවර ගත යුතු ය." පොදුවේ හෝ සම්මුති අයිතිවාසිකම් කාණ්ඩ දෙකක් යටතේ බෙදීම සඳහා මානව අයිතිවාසිකම්වල සරල හෝ බලාත්මක බෙදීමක් නොමැත. කමිටුවේ වාර්තාකරණ මාර්ගෝපදේශ ඔස්සේ 7, 8, 13-17 සහ 37 (අ) යන ව්‍යවස්ථා "සිවිල් අයිතිවාසිකම් සහ නිදහස" යන මාතෘකාව යටතේ කාණ්ඩගත කෙරෙන නමුදු සංදර්භය යටතේ ඒවා සම්මුතියේ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පමණක් නොවන බව ද දැක්වේ. සත්‍ය වශයෙන්ම, සම්මුතියේ 2, 3, 6 සහ 12 යන ව්‍යවස්ථා ඇතුළුව තවත් බොහෝ ව්‍යවස්ථාවල, සිවිල්/ දේශපාලනික අයිතිවාසිකම්වල අංග ඇතුළත් වන බව පැහැදිලි අතර, සියලුම මානව අයිතිවාසිකම්වල අන්‍යෝන්‍ය වශයෙන් පවතින පරායත්තබව සහ එකිනෙකින් වෙන්කළ නොහැකි බව මෙයින් පිළිබිඹු කෙරේ. ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීම සහ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් භුක්ති විඳීම එකිනෙක වෙන්කළ නොහැකි ලෙස බැඳී පවතී. පහත 25 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් මෙන්ම සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් ද විනිශ්චය විෂයක බව කමිටුවේ හැඟීම යි.

7. ඇතැම් රාජ්‍යයන් තුළ පවතින සම්පත් ඌනතාවය, එනම් මූල්‍ය සහ අනෙකුත් සම්පත් ඌනතාවය හේතුවෙන් ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා බාධා එල්ල විය හැකිය යන යථාර්ථවාදී පිළිගැනීම 4 වැනි ව්‍යවස්ථාවේ 2 වැනි වගන්තිය මගින් පිළිබිඹු වේ; එවැනි අයිතිවාසිකම්වලට අදාළ "ප්‍රගාමී සාක්ෂාත්කරණය" එනම්, එක් එක් රටවල් සතුව පවතිනුයේ වෙනස් ආර්ථික ධාරිතාවයන් බැවින් නිශ්චිත කාල රාමුවක් තුළ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් රටවල් සතු හැකියා මට්ටම් එකිනෙකට වෙනස් බව මෙම සංකල්පය මගින් හඳුන්වා දෙනු ලැබේ: "ස්වකීය පවතින සම්පත් ආශ්‍රිතව උපරිම මට්ටමට" එම අයිතිවාසිකම් තමා විසින් ක්‍රියාත්මක කළබව ඔප්පු කර සිටීමේ හැකියාව රටවල්වලට තිබීම අවශ්‍ය කරන අතර, අවශ්‍ය වුවහොත් ජාත්‍යන්තර සහයෝගීතාවය ද ඉල්ලා සිටිය හැකි ය. රටවල් විසින් සම්මුතිය අපරානුමත කරනු ලැබූ විට, සම්මුතිය සිය අධිකරණ බල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට පමණක් නොව, ජාත්‍යන්තර සහයෝගීතාවය හරහා ගෝලීය වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුහු වගකීමට බැඳී සිටිතිග (පහත 60 වැනි ඡේදය බලන්න).

8. ආර්ථික, සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ යොදා ගෙන ඇති වචන පෙළ - ගැස්මට මෙම වාක්‍යය සමාන අතර "පවතින සම්පත් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිව පෙන්නුම් කරනු ලබන විටදීත්, පවතින තත්ත්වයන් යටතේ අදාළ අයිතිවාසිකම් හැකි උපරිම මට්ටමට භුක්ති විඳීම සහතික කිරීම සඳහා ප්‍රයත්න දැරීම සඳහා රාජ්‍ය පාර්ශවකරුවකු වෙත බැඳීමක් පවතී ..." 5 යන මතය අවධාරණය කිරීමේ දී ආර්ථික, සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව සමඟ මෙම කමිටුව පූර්ණ වශයෙන් එකඟ වේ. රාජ්‍යයන්ගේ ආර්ථික වාතාවරණය කුමන ආකාරයකට පැවතිය ද, වරප්‍රසාද ලැබීම අතින් වඩාත් අවම තත්ත්වයක පසුවන කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ළමුන්ගේ අයිතිවාසිකම් යථාර්ථයක් බවට පත්කරලීම උදෙසා ගත හැකි සියලුම ක්‍රියාමාර්ග රාජ්‍යයන් විසින් ගැනීම අවශ්‍ය කෙරේ.

9. කමිටුව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් සහ වර්තමාන පොදු ප්‍රකාශය තුළ විස්තර කරන පොදු පියවර නීති සම්පාදනය, සම්බන්ධීකරණ සහ අධීක්ෂණය සඳහා රාජ්‍යය සහ ස්වාධීන ආයතන ස්ථාපිත කිරීම, සවිස්තරාත්මක දත්ත රැස් කිරීම, දැනුවත්බව වැඩිකිරීම හා පුහුණුව සහ යෝග්‍ය ප්‍රතිපත්ති, සේවා සහ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම හරහා සියලු දරුවන් විසින් සම්මුතියේ දක්වා ඇති සියලු අයිතිවාසිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීම ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. රජයන් තුළ කේන්ද්‍රීය වශයෙන් ළමා අයිතිවාසිකම් ඒකක, ළමුන් සඳහා අමාත්‍යවරුන්, ළමුන් සම්බන්ධයෙන් අන්තර් අමාත්‍ය කමිටු, පාර්ලිමේන්තු කමිටු, ළමා බලපෑම් විශ්ලේෂණය, ළමුන්ගේ අයවැය සහ "ළමුන්ගේ තත්ත්වය පිළිබඳ වාර්තා", ළමා අයිතිවාසිකම් පිළිබඳ රාජ්‍ය නොවන සංවිධානවල හවුල්කාරිත්වයන්, ළමුන් සඳහා ඔම්බුඩ්ස්වරුන් සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ කොමසාරිස්වරු ආදී වශයෙන් වූ ළමා කේන්ද්‍රීය සහ ළමුන් සම්බන්ධයෙන් සංවේදී වන නව ආයතන, ව්‍යුහයන් සහ ක්‍රියාකාරකම් පරාසයක් ජාතික මට්ටමින් වැඩිදියුණුවීම යනු සම්මුතිය පිළිගැනීම සහ බොහෝ දුරට ගෝලීය වශයෙන් වූ සම්මුතිය අපරානුමත කිරීම ඔස්සේ ඇති වූ සතුටුදායක ප්‍රතිඵල අතුරින් එකකි.

10. මෙවැනි ආකාර වැඩිදියුණුවීම්වලින් ඇතැම් ඒවා හුදු මතුපිටින් පමණක් දියුණුවක් පෙන්නුම්කරන ආකාරයේ ඒවා වුව ද, අවම වශයෙන් ඒවා එසේ ආරම්භවීම පවා සමාජය තුළ ළමුන්ගේ මට්ටම සම්බන්ධයෙන් වූ පිළිගැනීමේ ඇතිවී ඇති වෙනස, ළමුන් සඳහා ඉහළ දේශපාලන ප්‍රමුඛතාවයක් ලබාදීම සඳහා ඇති කැමැත්ත සහ ළමුන් සහ ඔවුන්ගේ මානව අයිතිවාසිකම් පාලනයේ බලපෑම සම්බන්ධයෙන් ඉහළයන සංවේදිතාවය පෙන්නුම් කරයි.

11. සම්මුතියේ සංදර්භය තුළ, එක් එක් ළමයා වශයෙන් සහ සියලුම ළමුන් සම්බන්ධයෙන් ඇති පැහැදිලි නීතිමය බැඳීම් සම්පූර්ණ කිරීම වශයෙන් වූ සිය භූමිකාව රාජ්‍යයන් විසින් අනිවාර්යෙන් වටහා ගතයුතු බව කමිටුව විසින් අවධාරණය කෙරේ. ළමුන්ගේ මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම යනු ළමුන් සඳහා අනුග්‍රහයක් පිරිනැමීම සිදුකරන පුණ්‍ය ක්‍රියාවලියක් වශයෙන් වටහා නොගැනීම අනිවාර්යය වේ.

12. සමස්ත සම්මුතිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා, විශේෂයෙන්ම පොදු ප්‍රතිපත්ති වශයෙන් කමිටුව විසින් හඳුනාගෙන ඇති පහත ව්‍යවස්ථාවන් සම්බන්ධයෙන් රජය, පාර්ලිමේන්තුව සහ අධිකරණය හරහා ළමා අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ යථා දර්ශනයක් අවශ්‍ය වේ.

2 වැනි ව්‍යවස්ථාව: සිය අධිකරණ සීමාව තුළ දී කිසිදු ආකාරයක වෙනස් ආකාරයේ සැලකීම්වලින් තොරව, සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් සෑම ළමයෙකු වෙතම හිමිවීම සම්බන්ධයෙන් ගරු කිරීමට සහ ඒ සම්බන්ධයෙන් සහතික වීම සඳහා රාජ්‍යයන් වෙත ඇති බැඳීම. මෙසේ කිසිදු ආකාරයක වෙනස් ආකාරයේ සැලකීම්වලින් තොරව සැලකීම සඳහා ඇති බැඳීම සඳහා රාජ්‍යයන් විසින් තනි තනි ළමුන් සහ ළමුන් කණ්ඩායම් හඳුනාගැනීම අවශ්‍ය වන අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම සහ යථාර්ථයක් බවට පත්කිරීම සඳහා විශේෂ පියවර අවශ්‍ය කරනු ඇත. නිදසුනක් ලෙස, වෙනස්ව සැලකීම හෝ විභව්‍ය වෙනස්ව සැලකීම් හඳුනාගැනීමට හැකිවීම සඳහා දත්ත රැස්කිරීම කොටස්වලට වෙන්කර සිදුකිරීම කමිටුව විසින් විශේෂයෙන් අවධානයට ලක් කෙරේ. වෙනස් ආකාරයේ සැලකීම්වලට විසඳුම් සෙවීම සඳහා නීති සම්පාදන කටයුතුවල, පරිපාලනයේ සහ සම්පත් වෙන්කිරීමේ වෙනස්කම් සිදුකිරීම මෙන්ම, ආකල්පමය වෙනසක් සඳහා අධ්‍යාපනික පියවර ද අවශ්‍ය වේ. කිසිදු ආකාරයක වෙනස් ආකාරයේ සැලකීම්වලින් තොර සමානාත්මතා ප්‍රවේශ මූලධර්මය යොදා ගැනීම යනු සියලු දෙනාටම සර්වසම ආකාරයෙන් සැලකීමක් නොවන බව ද අවධාරණය කළ යුතු ය. වෙනස් ආකාරයේ සැලකීම්වලට හේතුවන තත්ත්වයන් අවම කිරීම හෝ ඉවත් කිරීම පිණිස විශේෂ පියවර ගැනීමේ වැදගත්කම මානව හිමිකම් කමිටුව විසින් සිදුකල පොදු ප්‍රකාශයක දී අවධාරණය කර තිබේ.6

3 (1) වැනි ව්‍යවස්ථාව: ළමුන් සම්බන්ධ සියලුම ක්‍රියාමාර්ග දී ළමයාගේ උපරිම යහපත මූලික වශයෙන්ම සැලකිය යුතු කරුණ බව. "රාජ්‍ය හෝ පුද්ගලික සමාජ සුභසාධන ආයතනය, අධිකරණය, පරිපාලන අධිකාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල" විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව මෙම ව්‍යවස්ථාව මගින් අවධානය යොමු කෙරේ. රජය, පාර්ලිමේන්තුව සහ අධිකරණය යන සියලු මට්ටම් හරහා සක්‍රිය පියවර ගැනීම මෙහිදී අවශ්‍ය වේ. සෑම ව්‍යවස්ථාදායක, පරිපාලන හෝ අධිකරණ මණ්ඩලයක් හෝ ආයතනයක් විසින්ම ස්වකීය තීරණ හෝ ක්‍රියාමාර්ග ළමුන්ගේ අයිතිවාසිකම් සහ යහපත මත බලපාන්නේ කෙසේ ද හෝ ඉදිරියේ දී බලපානුයේ කෙසේ ද යන්න ක්‍රමානුකූලව සැලකිල්ලට ගෙන උපරිම යහපත මූලධර්මය යොදා ගැනීම අවශ්‍ය වේ. නිදසුනක් වශයෙන්, ළමුන් සඳහා කෙලින්ම බලනොපාන, නමුත් වක්‍රාකාරයෙන් ළමුන් සඳහා බලපෑමක් ඇතිකරන යෝජිත හෝ දැනට ක්‍රියාත්මක නීතියක් හෝ ප්‍රතිපත්තියක් හෝ පරිපාලන ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ තීන්දුවක් මඟිනි .

6 වැනි ව්‍යවස්ථාව: ස්වකීය ජීවිතය සඳහා සෑම ළමයෙකුටම ඇති නෛසර්ගික අයිතිය සහ ළමයාගේ නොනැසී ජීවත්වීම සහ වර්ධනය හැකි උපරිම ආකාරයට සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ බැඳීම. ළමයෙකුගේ කායික, මානසික, ආධ්‍යාත්මික, මනෝ විද්‍යාත්මක සහ සාමාජයීය වර්ධනය ඇතුළත්වන සාකල්‍ය සංකල්පයක් ලෙස එහි පුළුල්ම ආකාරයෙන් "වර්ධනය" යන්න රාජ්‍යයන් විසින් අර්ථ නිරූපණය කිරීම කමිටුව විසින් අපේක්ෂා කෙරේ. සියලුම ළමුන් සඳහා ප්‍රශස්තතම වර්ධනයන් සාක්ෂාත් කරගැනීම උදෙසා ක්‍රියාත්මක කිරීමේ පියවර අරමුණු කරගත යුතු ය.

12 වැනි ව්‍යවස්ථාව: "ළමයා සඳහා බලපාන සියලු කරුණු" සම්බන්ධයෙන් ඔහුගේ හෝ ඇයගේ මතයන් නිදහසේ ප්‍රකාශ කිරීම සඳහා ළමයෙකු සතු අයිතිය. සිය අයිතිවාසිකම් ප්‍රවර්ධනය, ආරක්ෂා කරගැනීම සහ අධීක්ෂණය සඳහා සක්‍රීය සහභාගිකරුවෙකු ලෙස ළමයෙකු සතු භූමිකාව අවධාරණය කරන මෙම මූලධර්මය, සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍යයන් විසින් අනුගමනය කරන සියලු පියවරවල දී සමාන ආකාරයෙන් අදාළ වේ.

රජයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ළමුන් සඳහා විවෘත කිරීම ධනාත්මක අභියෝගයක් වන අතර, මේ සඳහා රාජ්‍යයන්ගේ වැඩිවශයෙන් පවතින ප්‍රතිචාරාත්මක බව කමිටුව විසින් හඳුනාගෙන තිබේ. තවමත් සුළු රාජ්‍යයන් සංඛ්‍යාවක් පමණක් ඡන්දය ප්‍රකාශ කිරීමේ වයස අවුරුදු 18 න් පහළට අඩු කර ඇති බැවින්, රජයේ සහ පාර්ලිමේන්තුව තුළ එකී සර්වජන ඡන්දබලය නොමැති දරුවන්ගේ අදහස් සඳහා යොමුකිරීමක් ලබාදීම සහතික කිරීම සඳහා මෙය හේතුවකි. උපදේශනය වඩාත් අර්ථාන්විත වීමට නම්, ලේඛන මෙන්ම ක්‍රියාවලීන් සඳහා ප්‍රවේශයක් ඇතිකිරීම අවශ්‍ය වේ. නමුත් ළමුන් සඳහා "සවන් දීම" පෙන්නුම් කිරීම සාපේක්ෂව අභියෝගාත්මක නොවුව ද; ඔවුන්ගේ අදහස් සඳහා ඇවසි වැදගත්කම ලබාදීම සැබැවින්ම අභියෝගාත්මක ය. ළමුන් සඳහා සවන්දීම එයින් අවසන් වන කරුණක් ලෙස නොසැලකිය යුතු නමුදු, ළමුන් සමඟ රජයක් අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාකාරී වන ක්‍රමයක් ලෙස සැලකිය යුතු අතර ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා ළමුන් වෙනුවෙන් වූ ඔවුන්ගේ ක්‍රියාකාරකම් කවර කාලයකටත් වඩා සංවේදී වී තිබේ.

එක් වරක් පමණක් සිදුකරන හෝ ළමා පාර්ලිමේන්තුව වැනි නියමිත කාලාන්තරවලදී සිදුකරන සිද්ධි ඔස්සේ උත්තේජනයක් ඇති කරනු ලැබිය හැකි අතර එයින් පොදු දැනුවත්භාවය ඉහළ නංවයි. එනමුත්, 12 වැනි ව්‍යවස්ථාව යටතේ සංගත සහ කෙරීගෙන යමින් පවතින වැඩපිළිවෙළක් අවශ්‍ය වේ. හුදු විවේචන වැළැක්වීමට සහ සමාන ආකාරයෙන් සැලකීම සිදුකරන බවට පෙන්නුම් කෙරන ළමුන්ගේ සහභාගිත්වය සහිත සහ ළමුන්ගේ අදහස් විමසීම් අනිවාර්යෙන් වැළැක්විය යුතු අතර නියෝජනාත්මක මත නිශ්චිතව දැන ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතු ය. 12 (1) වැනි ව්‍යවස්ථාවේ අවධාරණය කර ඇති "ඔවුන් වෙත බලපාන කරුණු" යන්නෙන් අදහස් වනුයේ යම් විශේෂිත ගැටලු සම්බන්ධයෙන් විශේෂිත ළමා කණ්ඩායම්වල අදහස් නිශ්චිතව දැන ගැනීම වන අතර, මීට නිදසුනක් වනුයේ බාලාපරාධ අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් අත්දැකීම් ඇති ළමුන් එකී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ නීති ප්‍රතිසංස්කරණය සඳහා කරන යෝජනා, හෝ දරුකමට හදා ගන්නා දරුවන් හෝ දරුකමට හදා ගන්නා දරුවන් සහිත පවුල්වල දරුවන් විසින් දරුකමට හදා ගැනීම පිළිබඳ නීති හා ප්‍රතිපත්තිය සඳහා කරන යෝජනා වේ. රජය විසින් ළමුන් සමග සෘජු සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම වැදගත් වන අතර මෙය රාජ්‍ය නොවන සංවිධාන හෝ මානව හිමිකම් ආයතනවල මැදිහත්වීම හරහා සිදුවන සරල සම්බන්ධතාවයක් නොවිය යුතු ය. සම්මුතියේ මුල් වසර කිහිපය තුළ දී, රාජ්‍ය නොවන සංවිධාන විසින් ළමුන් සමග සහභාගිත්ව ප්‍රවේශ සඳහා මූලිකත්වය ගනිමින් වැදගත් භූමිකාවක් ඉටු කරන ලද නමුදු, යෝග්‍ය සෘජු සබඳතාවයක් පැවතීම රජයන්ගේ මෙන්ම ළමුන්ගේ ද යහපත සඳහා හේතු වේ.

II. සම්මුතියේ එකඟ නොවන කරුණු ඇතොත් සමාලෝචනය කිරීම

13. රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සිදුකරන ලද සම්මුතියේ එකඟ නොවන කරුණු ඇතොත් ඒවා එසේ පවත්වා ගැනීම අවශ්‍ය යැයි හැඟෙන්නේ ද, හෝ ඒවා ඉවත් කරගැනීමේ අදහසක් පවතින්නේ ද යන්න දක්වා සිටින ලෙස රාජ්‍ය පාර්ශ්වකරුවන්ට ආරාධනා කරමින් ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර සම්බන්ධයෙන් වූ සිය වාර්තාකරණ මාර්ගෝපදේශ කමිටුව විසින් ආරම්භ කර තිබේ.7 සම්මුතිය සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් විසින් එම සම්මුතිය අපරානුමත කරන හෝ සම්මුතිය වෙත ප්‍රවේශවීම සිදුකරන අවස්ථාවේ දී ඔවුන් විසින් සම්මුතියේ එකඟ නොවන කරුණු ඉදිරිපත් කිරීමට එකී රාජ්‍යයන් වෙත හිමිකමක් ලැබේ (51 වැනි ව්‍යවස්ථාව). රාජ්‍යයන් විසින් සම්මුතියේ එකඟ නොවන කරුණු ඉවත් කරගන්නේ නම් පමණක්, කමිටුවේ අරමුණ වන ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා වන පරිපූර්ණ සහ සීමාරහිත ගරුත්වය සහතික කිරීම සාක්ෂාත් කරගත හැකිවනු ඇත. සම්මුතියේ එකඟ නොවන කරුණු සමාලෝචනය කිරීම සහ ඉවත්කරගැනීම සිදුකළ හැකිබව කමිටුව විසින් වාර්තා පරීක්ෂා කිරීමේ දී නිරන්තරයෙන් නිර්දේශ කරනු ලැබේ. රාජ්‍යයක් විසින් සමාලෝචනයෙන් අනතුරුව සම්මුතියේ එකඟ නොවන කරුණක් එලෙසම පවත්වා ගැනීමට තීරණය කළහොත්, ඊළඟ නියමිත අවස්ථාවේ දී නිකුත් කරන වාර්තාවේ දී ඒ සම්බන්ධ පූර්ණ පැහැදිලි කිරීමක් සිදුකරන ලෙස කමිටුව විසින් ඉල්ලා සිටිනු ලැබේ. එකඟ නොවන කරුණු සමාලෝචනය කිරීම සහ ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය විසින් ලබාදී ඇති දිරිගැන්වීම කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ අවධානයට යොමුකරනු ලැබේ.8

14. ගිවිසුම් සම්බන්ධිත නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 2 වැනි ව්‍යවස්ථාවේ "සම්මුතියේ එකඟ නොවන කරුණු" අර්ථ නිරූපණය කර ඇත්තේ මෙසේය "ගිවිසුමක් අත්සන් කිරීමේ දී, අපරානුමත කිරීමේ දී, පිළිගැනීමේ දී, අනුමත කිරීමේ දී හෝ ප්‍රවේශවීමේ දී රාජ්‍යයක් විසින් සකස් කරන වාක්‍යාංශය හෝ නම් කර ඇති කරුණුවලින් යුතු ඒකපාර්ශවික ප්‍රකාශයක් වන අතර, එකී රාජ්‍යයට එය යොදා ගැනීමේ දී ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය ඇතැම් විධිවිධානවල නීතිමය බලපෑම එයින් අදහස් කෙරේ." ගිවිසුමක් අපරානුමත කිරීමේ දී හෝ ප්‍රවේශවීමේ දී රාජ්‍යයන් වෙත "සම්මුතියේ අරමුණු සහ අපේක්ෂා සමග අසංගත" නොවන්නේ නම්, එකඟ නොවන කරුණක් ඉදිරිපත් කිරීමට හිමිකම පවතින බව වියානා සම්මුතියේ දක්වා ඇත (19 වැනි ව්‍යවස්ථාව).

15. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 51 වැනි ව්‍යවස්ථාවේ 2 වැනි ඡේදයේ මෙසේ දැක්වේ:"වර්තමාන සම්මුතියේ අරමුණු සහ අපේක්ෂා සමග අසංගත වන්නා වූ එකඟ නොවන කරුණක් ඉදිරිපත් කිරීමට අවසර නොමැත". නිදසුන් වශයෙන් ගතහොත් ආගමික නීති ඇතුළුව රාජ්‍යයක ක්‍රියාත්මක වන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ නීති අනුව මෙම සම්මුතියට ගරු කිරීම සීමාවෙන බව යනාදී වශයෙන් දක්වමින් ඇතැම් රාජ්‍යයන් සම්මුතියේ 51 (2) වැනි ව්‍යවස්ථාව පැහැදිලිව උල්ලංඝනය කරමින් එකඟ නොවන කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කමිටුව වඩාත් සැලකිලිමත් වේ. "රාජ්‍යයක් විසින් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම සාධාරණීකරණය කිරීම සඳහා හේතු වශයෙන් එකී රාජ්‍යයයේ අභ්‍යන්තර නීතිවල විධිවිධාන නොදැක්විය යුතුය" වශයෙන් ගිවිසුම් සම්බන්ධිත නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 27 වැනි ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලස්වා ඇත.

16. ඇතැම් සිද්ධීන්වලදී අනෙකුත් පාර්ශවකරුවන් වන රාජ්‍යයන් විසින් සිදුකර ඇති පුළුල් පරසායක විහිදෙන එකඟ නොවන කරුණු පිළිබඳව පාර්ශවකරුවන් වන රාජ්‍යයන් විසින් විධිමත් විරෝධතා ගොනු කරන බව කමිටුව විසින් අවධානයට ලක් කෙරේ. සියලුම රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සම්මුතිය සඳහා හැකි උපරිම අවනතභාවය ලබාදීම සහතික කිරීමට දායකවන ඕනෑම ක්‍රියාවක් කමිටුව විසින් පැසසීමට ලක් කෙරේ.

III. මානව හිමිකම් සම්බන්ධිත අනෙකුත් ප්‍රධාන ජාත්‍යන්තර නීතිමය ලියවිලි අපරානුමත කිරීම

17. රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් දැනට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විකල්ප සන්ධාන පත්‍ර දෙක (යුධ ගැටුම් සඳහා ළමුන් සහභාගි කරවීම හා ළමුන් අලෙවිකිරීම, ළමා ගණිකා කටයුතු සහ ළමුන් සම්බන්ධ කර සිදුකරන අසභ්‍ය චිත්‍රපට ආදී දෘශ්‍ය නිර්මාණ) සහ ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ තවත් ප්‍රධාන නෛතික ලියවිලි හයක් අපරානුමතකර නොමැති නම්, ක්‍රියාත්මක කිරීමේ පොදු පියවරවල ප්‍රතිෂ්ඨාවක් වශයෙන් සැලකිල්ලට ගෙන, සහ මානව හිමිකම් එකිනෙකින් වෙන්කළ නොහැකි බව සහ අන්‍යෝන්‍ය වශයෙන් පවතින පරායත්තබව සැලකිල්ලට ගෙන, එම විකල්ප සන්ධාන පත්‍ර අපරානුමත කරන ලෙස කමිටුව විසින් එකී රාජ්‍යයන් නිරන්තරයෙන් පොළඹවනු ලැබේ. රාජ්‍ය පාර්ශ්වකරුවන් සමඟ සිදුකරන සංවාදවල දී එකී අනෙකුත් අදාළ ජාත්‍යන්තර නෛතික ලියවිලි අපරානුමත කිරීම සලකා බලන ලෙස කමිටුව විසින් එකී රාජ්‍යයන් දිරිමත් කරනු ලැබේ. සවිස්තරාත්මක ආකාරයෙන් නොවන එකී නෛතික ලියවිලිවල ලැයිස්තුවක් මෙම පොදු ප්‍රකාශයට අමුණා ඇති අතර, කමිටුව විසින් මෙය වරින්වර යාවත්කාලීන කරනු ලැබේ.

IV. නීතිමය පියවර

18. සම්මුතිය සමඟ පූර්ණ අනුකූලත්වය සහතික කිරීම සඳහා සියලු දේශීය නීති සහ ආශ්‍රිත පරිපාලන මාර්ගෝපදේශ සම්බන්ධිත පරිපූර්ණ සමාලෝචනයක් කිරීම බැඳීමක් ලෙසට කමිටුව විසින් විශ්වාස තබනු ලැබේ. සම්මුතිය යටතේ වන මුල් වාර්තාව පමණක් නොව දැනට පවතින දෙවැනි සහ තෙවැනි නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කළ වාර්තා පරීක්ෂා කිරීමට අදාළ කමිටුවේ අත්දැකීම් අනුව, ජාතික මට්ටමින් සමාලෝචන ක්‍රියාවලිය බොහෝ දුරට දැනට ආරම්භ වී පවතින නමුදු, වඩාත් නිරවද්‍ය හා දැඩි විය යුතු බවට යෝජනා කෙරේ. මානව හිමිකම්වල අන්‍යෝන්‍ය වශයෙන් පවතින පරායත්තබව සහ එකිනෙකින් වෙන්කළ නොහැකිබව හඳුනාගෙන සම්මුතිය ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාවට පමණක් නොව, සාකල්‍යවාදී ආකාරයෙන් ද සමාලෝචනය කිරීම අවශ්‍ය කෙරේ. තවද යෝජිත සේම පවතින නීති ද සමාලෝචනය කරමින් අදාළ සමාලෝචන එක් වරක් සිදුකිරීම යන ආකාරයෙන් නොව අඛණ්ඩව සිදුකළ යුතු ය. අදාළ සියලු රජයේ දෙපාර්තමේන්තුවල යාන්ත්‍රණය තුළට මෙම සමාලෝචන ක්‍රියාවලිය ඇතුළත් කිරීම වැදගත් වන අතර, නිදසුන් වශයෙන් පාර්ලිමේන්තු කාරක සභා සහ විභාග කිරීම්, ජාතික මානව හිමිකම් ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, විද්වතුන්, බලපෑමට ලක් වූ දරුවන් සහ තරුණ පිරිස් හා අනෙකුත් පිරිස් විසින් සිදුකරන ස්වාධීන සමාලෝචන ද පැවතීම වාසිදායකය .

19. සිය දේශීය නීති පද්ධතිය තුළ සම්මුතියේ විධිවිධාන සඳහා නීතිමය බලපෑම ලැබී ඇති බවට, සියලු යෝග්‍ය ආකාරවලින් රාජ්‍යයන් විසින් සහතික කිරීම අවශ්‍ය කෙරේ. මෙය බොහෝ රාජ්‍ය පාර්ශ්වකරුවන්ට අභියෝගයක් වශයෙන් පවතී. රාජ්‍යයන් තුළ සම්මුතිය උපයෝගී කරගත හැකි සීමාව පැහැදිලි කරගැනීමේ අවශ්‍යතාවය සුවිශේෂී වැදගත්කමක් දරන අතර, "ස්වයං ක්‍රියාත්මක කිරීම"

නැමති මූලධර්මය අදාළ වන අතර, ඇතැම් අවස්ථාවල දී "ව්‍යවස්ථාමය තත්ත්වය" පවතින බවට ප්‍රකාශවීම හෝ දේශීය නීතියට ඇතුළත් කිරීමක් ද සිදුවිය හැකි ය.

20. දේශීය නීතිය තුළට සම්මුතිය අන්තර්ගත කිරීම කමිටුව විසින් සතුටින් පිළිගැනෙන අතර, සියලුම රටවල්වල නොවූව ද ඇතැම් රටවල් වලදී ජාත්‍යන්තර මානව හිමිකම් නෛතික ලියවිලි ක්‍රියාත්මක කිරීමේ සාම්ප්‍රදායික ප්‍රවේශය මෙය යි. සම්මුතියේ විධිවිධානවලට අදාළව අධිකරණය ඉදිරියේ සෘජුව පිහිට පැතීමට හැකිවීම සහ ජාතික අධිකාරීන් විසින් එම විධිවිධාන යොදා ගැනීමත් මෙයින් අදහස් වන අතර, දේශීය නීතිය හෝ පොදු ව්‍යවහාරයන් සමඟ මතභේදකාරී අවස්ථාවක් ඇති වන අවස්ථාවක දී සම්මුතිය බලපැවැත්වෙනු ඇත. යම් දේශීය හෝ චාරිත්‍රානුකූල නීතියක් ද ඇතුළුව සියලු අදාළ දේශීය නීති සම්මුතිය සමඟ අනුකූලබවට සහතික කිරීමේ අවශ්‍යතාවය, දේශීය නීතිය තුළට සම්මුතිය අන්තර්ගත කිරීමෙන් පමණක් මඟ නොහැරෙනු ඇත. නීතිවල යම්කිසි මතභේදකාරී අවස්ථාවක් උද්ගත වුවහොත්, ගිවිසුම් සම්බන්ධිත නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 27 වැනි ව්‍යවස්ථාව සැලකිල්ලට ගෙන සම්මුතිය සඳහා ප්‍රමුඛතාවය දිය යුතු ය. යම් රාජ්‍යයක් විසින් නීති සම්පාදන බලතල ෆෙඩරල් කලාපීය හෝ ප්‍රාදේශික රජයන් වෙත පවරනු ලබන අවස්ථාවක දී, මෙම සහායක රජයන් විසින් ද සම්මුතියේ රාමුව තුළ නීති සම්පාදනය කිරීම සහ ඵලදායි ක්‍රියාත්මක කිරීමක් සහතික කිරීම අවශ්‍යවීම අනිවාර්ය වේ (පහත 40 වැනි ඡේදය ඉන් අනතුරුව ඇති ඡේද බලන්න).

21. ඔවුන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ "සියලුදෙනා" සඳහා අයිතිවාසිකම් ඉටුවන බව සහතික වීම ළමුන් සඳහා වන මෙම අයිතිවාසිකම් සඳහා ගරු කිරීම සහතික කිරීමට ප්‍රමාණවත් බව ඇතැම් රාජ්‍යයන් විසින් කමිටුව වෙත යෝජනා කර තිබේ. පිරික්සා බැලීම විය යුත්තේ අදාළ අයිතිවාසිකම් සත්‍ය වශයෙන්ම ළමුන් සම්බන්ධයෙන් යථාර්ථයක් වන්නේ ද සහ අධිකරණය ඉදිරියේ සෘජුව පිහිට අයැද සිටිය හැකි ද යන්න වේ. සම්මුතියේ ප්‍රධාන ප්‍රතිපත්ති පිළිබිඹු කරමින් ජාතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ඡේද ඇතුළත් වීම කමිටුව විසින් සතුටින් පිළිගැනෙන අතර මෙය සම්මුතියේ ප්‍රධාන පණිවිඩය, එනම් වැඩිහිටියන් සමඟින් ළමුන් ද මානව හිමිකම් දරන්නන් බව අවධාරණය කිරීමට උපකාරී වේ. එනමුත්, මෙම ඇතුළත් කිරීම ඔස්සේ ස්වයංක්‍රීයව ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා ගරු කිරීම සහතික කිරීමක් සිදුනොවේ. මෙම අයිතිවාසිකම් පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවීම ප්‍රවර්ධනය කිරීම සඳහා, යෝග්‍ය පරිද්දෙන්, ළමුන් විසින්ම සිය අයිතිවාසිකම් භුක්ති විඳීම ඇතුළුව, අතිරේක නීතිරීති සහ අනෙකුත් පියවර අවශ්‍ය විය හැකි ය.

22. සම්මුතියේ හඳුනාගත් පොදු මූලධර්ම (2, 3, 6 සහ 12 වැනි ව්‍යවස්ථා (ඉහත 12 වැනි ඡේදය බලන්න) විශේෂයෙන්ම දේශීය නීතිය මඟින් පිළිඹිබු වන බව සහතික කිරීමේ වැදගත්කම කමිටුව විසින් අවධාරණය කෙරේ. සම්මුතියේ ප්‍රතිපත්ති විශේෂයෙන් මතු කර දැක්විය හැකි හා අවධාරණය කළ හැකි ඒකාබද්ධ කළ ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රඥප්ති සකස් කිරීම් කමිටුව විසින් සතුටින් පිළිගැනේ. නමුත් සියලු අදාළ ආංශික නීති (අධ්‍යාපනය, සෞඛ්‍ය, නීතිය ආදී වශයෙන් වූ) සම්මුතියේ මූලධර්ම හා ප්‍රමිත සමඟ සංගතබව පිළිබිඹුවීමට අමතරව මෙය තීරණාත්මක බව කමිටුව විසින් අවධාරණය කෙරේ.

23. 41 වැනි ව්‍යවස්ථාව සැලකිල්ලට ගෙන, සම්මුතියේ අන්තර්ගත විධිවිධානවලට වඩා, පාර්ශ්වකරුවන් වන සියලු රාජ්‍යයන් විසින් ළමුන්ගේ අයිතිවාසිකම් යථාර්ථයක් බවට පත්කරලීම සඳහා වඩාත් හිතකර නෛතික විධිවිධාන සිය අධිකරණ සීමා තුළ පැනවීමට සහ ක්‍රියාත්මක කිරීමට කමිටුව විසින් දිරිමත් කෙරේ. අනෙකුත් ජාත්‍යන්තර මානව හිමිකම් නෛතික ලේඛන වයස අවුරුදු 18ට අඩු සියලු තැනැත්තන් සඳහා අදාළ බව කමිටුව විසින් අවධාරණය කෙරේ.

V. හිමිකම් අධිකරණය මගින් නිශ්චය කිරීමේ හැකියාව

24. අයිතිවාසිකම් සඳහා අර්ථයක් පැවතීම සඳහා, උල්ලංඝනය කිරීම් නිරවද්‍ය කිරීම සඳහා ඵලදායි ප්‍රතිකර්ම පැවතිය යුතු ය. මෙම අවශ්‍යතාවය සම්මුතිය තුළ ගම්‍ය වන අතර, අනෙකුත් ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් හයෙහි ද සංගත ආකාරයෙන් අවධානය යොමු කර තිබේ. ළමුන්ගේ විශේෂ සහ යැපීමේ තත්ත්වය ඔස්සේ සිය අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සඳහා විසඳුම් සෙවීමේ දී ඔවුන් වෙත සැබැවින්ම අසීරුතා ඇතිකරනු ලැබේ. එබැවින්, ළමුන් සහ ඔවුන්ගේ නියෝජිතයන් සඳහා

ඵලදායි, සංවේදී ක්‍රියා පටිපාටි පැවතීම සහතික කිරීම සඳහා රාජ්‍යයන් විසින් විශේෂ අවධානය යොමුකළ යුතු ය. අවශ්‍ය නෛතික සහ අනෙකුත් සහාය සමඟින් මේවා ළමා-හිතකාමී තොරතුරු, උපදෙස්, ස්වයං පෙනීසිටීම සඳහා සහාය ඇතුළුව ළමුන් වෙනුවෙන් පෙනී සිටීම, සහ ස්වාධීන පැමිණිලි ක්‍රියා පටිපාටි සහ අධිකරණ වෙත ප්‍රවේශය යන විධිවිධානවල ඇතුළත් විය යුතු ය. අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇති අවස්ථාවක දී, ඒ සඳහා වන්දි ගෙවීම ඇතුළුව යෝග්‍ය හානි පූරණයක් පැවතිය යුතු අතර 39 වැනි ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අවශ්‍ය වූ විටක, කායික හා මානසික වශයෙන් යථා තත්ත්වයට පැමිණීම, පුනරුත්ථාපනය සහ නැවත සමාජය වෙත ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය සඳහා පියවර ගත යුතු ය.

25. ඉහත 6 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සේම සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් අධිකරණය මගින් නිශ්චය කිරීමේ හැකියාව පැවතිය යුතු බව අනිවාර්යයෙන් සැලකිය යුතු බවට කමිටුව විසින් අවධාරණය කරනු ලැබේ. අනුකූල නොවන තත්ත්වයන් සඳහා වන ප්‍රතිකර්ම බල ගැන්වීම ඵලදායි කිරීම සඳහා දේශීය නීතිය තුළ අදාළ හිමිකම් ප්‍රමාණවත් ආකාරයෙන් දැක්වීම අත්‍යවශ්‍ය වේ.

VI. පරිපාලන සහ අනෙකුත් පියවර

26. සම්මුතිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සෑම සහ සියලු රටවල් සඳහා යෝග්‍ය වන පියවර සවිස්තරාත්මක ආකාරයෙන් නිර්දේශ කිරීම කමිටුවට සිදුකළ නොහැක. නමුත්, රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ වාර්තා පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් එහි පළමු දශකයේ අත්දැකීම් සහ රජයන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සම්බන්ධිත අනෙකුත් නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් නිසි බලධාරී මණ්ඩල සමඟ දැනට කෙරී ගෙන යමින් පවතින සංවාදවල අත්දැකීම් ඔස්සේ, කමිටුව විසින් රාජ්‍යයන් සඳහා යම් මූලික උපදෙස් ලබාදී තිබේ.

27. සම්මුතිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ළමුන් සහ තරුණ පිරිස් සැලකුවිට ඔවුන් අතර සම්බන්ධීකරණය ඇතුළුව, රජය, රජයේ විවිධ මට්ටම්වල, රජය සහ සිවිල් සංවිධාන අතර - ළමුන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීම සහ සාක්ෂාත් කරගැනීම ප්‍රත්‍යක්ෂ අයුරින් සියලු අංශවල මනා සම්බන්ධීකරණයක් අවශ්‍ය බව කමිටුව විසින් විශ්වාස කෙරේ. නිත්‍ය වශයෙන්ම, බොහෝ එකිනෙකට වෙනස් රජයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ හෝ ක්වාසි මණ්ඩල ළමුන්ගේ ජීවිත සහ ළමුන් සිය අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් බලපායි. ඉතාමත් සුළු දෙපාර්තමේන්තු සංඛ්‍යාවක්, ඇතැම් විට පවතී නම් පමණක්, සෘජුව හෝ වක්‍රව ළමුන්ගේ ජීවිත මත බලපෑමක් ඇති නොකෙරේ. ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැඩි අධීක්ෂණයක් අවශ්‍ය කරන අතර, සියලු මට්ටම්වල දී රජයේ ක්‍රියාවලියට මෙය ඇතුළත් කළ යුතු අතර, එසේ වුව ද, ජාතික මානව හිමිකම් ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් ආයතන විසින් ද ස්වාධීන අධීක්ෂණ සිදුකළ යුතු ය.

අ. සම්මුතිය තුළ මුල් බැසගත් සවිස්තරාත්මක ජාතික ක්‍රමෝපායක් සකස් කිරීම

28. රජය සමස්තයක් වශයෙන් සහ සියලු මට්ටම්වල දී ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ගරු කිරීම සිදුකිරීම සඳහා කැපවී සිටීනම්, රජය විසින් සම්මුතිය තුළ මුල් බැසගත් ඒකීය, සවිස්තරාත්මක සහ අයිතිවාසිකම් මත පාදක ජාතික ක්‍රමෝපායක් යන පදනමින් කටයුතු කිරීම අවශ්‍ය වේ.

29. සම්මුතියේ රාමුව තුළ ගොඩනැගුනු ළමුන් සඳහා වූ සවිස්තරාත්මක ජාතික ක්‍රමෝපායක් හෝ ජාතික ක්‍රියාත්මක සැලසුමක් කමිටුව විසින් අගය කරනු ලැබේ. සිය ජාතික ක්‍රමෝපායන් සකස් කිරීමේ දී සහ/හෝ සමාලෝචනය කිරීමේ දී නියමිත කාලාන්තර තුළ ඉදිරිපත් කරන වාර්තාවල සමාප්ත කිරීමේ නිරීක්ෂණවල දක්වා ඇති නිර්දේශ සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් අවධානය යොමුකිරීම කමිටුව විසින් අපේක්ෂා කෙරේ. එවැනි ක්‍රමෝපායක් ඵලදායිවීමට නම් සියලු ළමුන් සිටින වාතාවරණය, සහ සම්මුතියේ දක්වා ඇති සියලු අයිතිවාසිකම්වලට අදාළවීම අවශ්‍ය වේ. ළමුන් සහ තරුණ පිරිස් සහ ඔවුන් සමඟ ජීවත්වන සහ ඔවුන් සමඟ කටයුතු කරන පිරිස් ද ඇතුළත්වන සාකච්ඡා ක්‍රියාවලියක් ඔස්සේ මෙම ක්‍රමෝපාය සකස් කළ යුතු ය. ඉහත සඳහන් කළ පරිදි (12 වැනි ඡේදය), ළමුන් සමඟ සිදුකරන සාකච්ඡා අර්ථාන්විතවීමට නම් ළමුන් සඳහා සංවේදී විශේෂ ද්‍රව්‍ය සහ ක්‍රියාවලි

අවශ්‍ය කෙරේ; මෙය වැඩිහිටියන්ගේ ක්‍රියාවලි සඳහා ළමුන්ට ප්‍රවේශවීමට ඉඩ සැලැස්වීමක් වැනි සරල ආකාරයක් නොවේ.

30. වෙනස්ව සැලකීමට බඳුන්වෙන සහ අඩු වරප්‍රසාදලාභී ළමුන් කණ්ඩායම් හඳුනාගැනීමට සහ ප්‍රමුඛතාවය ලබාදීම සඳහා විශේෂ අවධානය යොමුකළ යුතු ය. සම්මුතියේ දැක්වෙන වෙනස් ආකාරවලින් සැලකීම සිදු නොකිරීමේ මූලධර්මයට අනුව රාජ්‍යයන්ගේ අධිකරණ සීමාව තුළ දී සම්මුතිය මගින් තහවුරු කර ඇති සියලු අයිතිවාසිකම් සියලු දරුවන් සඳහා හඳුනාගත යුතු ය. ඉහත සඳහන් කළ පරිදි (12 වැනි ඡේදය), වෙනස් ආකාරවලින් සැලකීම අවම කිරීම සඳහා විශේෂ පියවර ගැනීම, වෙනස් ආකාරවලින් සැලකීම සිදු නොකිරීමේ මූලධර්මය ඔස්සේ වළක්වාලීමක් සිදුනොවේ.

31. ක්‍රමෝපාය සඳහා බලය ලබාදීම පිණිස, එම ක්‍රමෝපාය රජයේ ඉහළම මට්ටමේ දී අනුමතවීම අවශ්‍ය වේ. තව ද, මෙය ජාතික සංවර්ධන සැලසුම්කරණයට සම්බන්ධවිය යුතු අතර, ජාතික අයවැයකරණය තුළ අන්තර්ගත විය යුතු ය; එසේ නැතහොත්, මෙම ක්‍රමෝපාය ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් බැහැරව නොවැදගත් ආකරයෙන් පැවතිය හැකි ය.

32. මෙම ක්‍රමෝපාය යනු හුදෙක් යහපත් පරමාර්ථ ලැයිස්තුවක් නොවිය යුතු ය; රාජ්‍යය මුළුල්ලේ ළමුන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කරගැනීම සඳහා වූ තිරසර ක්‍රියාවලියක් පිළිබඳ විස්තර මෙහි අනිවාර්යෙන් අන්තර්ගත විය යුතු ය; සියලු ළමුන් සඳහා පූර්ණ පරාසයක වූ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික සහ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම්වලට අදාළ තත්‍ය හා ළඟාකර ගත හැකි ඉලක්ක නියම කළ හැකිවන ප්‍රතිපත්ති සහ මූලධර්ම පිළිබඳ ප්‍රකාශයකින් ඔබ්බට යා යුතු ය. සවිස්තරාත්මක ජාතික ක්‍රමෝපාය ආංශික ජාතික ක්‍රියාකාරී සැලසුම් ඔස්සේ විස්තරාත්මකව සකස් කළ හැකි ය - නිදසුනක් ලෙස අධ්‍යාපනය සහ සෞඛ්‍යය - සුවිශේෂි ඉලක්ක, ඉලක්කගත ක්‍රියාත්මක කිරීමේ පියවර සහ මූල්‍ය සහ මානව සම්පත් වෙන් කිරීම ආදිය නියම කිරීම ඔස්සේ එසේ සිදුකළ හැකි ය. මෙම ක්‍රමෝපාය ඔස්සේ අනිවාර්යෙන් ප්‍රමුඛතා නියම කළ යුතු නමුදු සම්මුතිය යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් පිළිගනු ලැබූ විස්තරාත්මකව දක්වා ඇති බැඳීම් කිසිදු ආකාරයකින් නොසලකා හැරීම හෝ ඒවා කෙරෙහි සැලකිල්ල අඩු කිරීම නොවිය යුතු ය. මෙම ක්‍රමෝපාය සඳහා මානව සම්පත් සහ මූල්‍ය සම්පත් යන ආකාරයන් ප්‍රමාණවත් ආකාරයෙන් ලබාදීම අවශ්‍ය කෙරේ.

33. ජාතික ක්‍රමෝපායක් සකස් කිරීම යනු එක්වරක් සිදුකර අවසන් වන කාර්යයක් නොවේ. එසේ කෙටුම්පත් කරනු ලබන ක්‍රමෝපාය රජය සහ ළමුන් ඇතුළු පොදු ජනතාව හරහා පුළුල් වශයෙන් බෙදාහැරිය යුතු ය (ළමුන් සඳහා ආකර්ෂණීය වන ආකාර සේම යෝග්‍ය භාෂා සහ ආකෘතිවලට පරිවර්තනය විය යුතු ය). පාර්ලිමේන්තුව සහ පොදු ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලාන්තර තුළ සිදුකළ යුතු යාවත්කාලීන කිරීම් සහ වාර්තා සඳහා මෙම ක්‍රමෝපාය තුළ අධීක්ෂණය සහ අඛණ්ඩ සමාලෝචනය සඳහා වූ වැඩපිළිවෙලක් ද ඇතුළත් වීම අවශ්‍ය කෙරේ.

34. 1990 වර්ෂයේ දී පැවති ළමුන් සඳහා පැවති පළමු අන්තර්ජාතික සමුළුවෙන් අනතුරුව "ජාතික ක්‍රියාකාරී සැලසුම්" සකස් කිරීම සඳහා රාජ්‍යයන් දිරිමත් කළ අතර, සමුළුව සඳහා සහභාගී වූ ජාතීන් විසින් සකස් කළ සුවිශේෂී බැඳීම් මෙම ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ වේ.9 1993 වර්ෂයේ දී පැවති මානව හිමිකම් පිළිබඳ සම්මන්ත්‍රණයේ දී අනුමත කරනු ලැබූ වියානා ප්‍රකාශනය සහ ක්‍රියාකාරි වැඩසටහන ඔස්සේ රටවල්වල ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම් සමඟ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ඒකාබද්ධ කරන ලෙස රාජ්‍යයන් වෙතින් ඉල්ලා සිටී .10

35. 2002 වර්ෂයේ දී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ළමුන් සඳහා වූ විශේෂ සැසිවාරයට අදාළ ලේඛනයේ ද "2003 වර්ෂය අවසානය වන විට හැකියාවක් පවතී නම් ප්‍රමුඛතා කාර්යයක් ලෙස සලකා මෙම ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව නිශ්චිත කාල සීමාවක් සඳහා සහ මිනිය හැකි අරමුණු සහ ඉලක්ක සමූහයක් සමඟින් ජාතික සහ අදාළ පරිදි කලාපීය ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හෝ සවිමත් කිරීම ..."11 වශයෙන් රාජ්‍යයන් වෙත පවරා ඇත. ළමුන් සඳහා වූ විශේෂ සැසිවාරයේ දී නියම කරගනු ලැබූ සහ ළමුන් සඳහා හිතකර ලෝකයක් (A World Fit for Children) නැමති ලේඛනයේ හඳුනාගන්නා ලද අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා රාජ්‍යයන් විසින් සිදුකරන ලද

කැපවීම් කමිටුව සතුටින් පිළිගනියි. නමුත් ගෝලීය වශයෙන් පැවැත්වෙන සමුළුවල දී විශේෂිත බැඳීම් ඇතිකර ගැනීම ඔස්සේ සම්මුතිය යටතේ පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් වෙත පැවරී ඇති නෛතික බැඳීම් කිසිදු ආකාරයකින් අඩු නොවන බව ද කමිටුව විසින් අවධාරණය කෙරේ. එමෙන්ම, විශේෂ සැසිවාරයන් සඳහා ප්‍රතිචාරාත්මක වශයෙන් නිශ්චිත ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීම ඔස්සේ සම්මුතිය යටතේ සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායක් සඳහා වන අවශ්‍යතාවයේ අවම වීමක් සිදුනොවේ. රාජ්‍යයන් විසින් 2002 විශේෂ සැසිවාරය සහ අනෙකුත් අදාළ ගෝලීය සම්මන්ත්‍රණ සඳහා වූ සිය ප්‍රතිචාර පූර්ණ වශයෙන් සම්මුතිය යටතේ වන සමස්ත ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායට ඒකාබද්ධ කළ යුතු ය.

36. "වර්තමාන ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර සහ අත්පත් කරගනු ලැබූ ප්‍රතිඵල සම්බන්ධිත තොරතුරු ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත ඉදිරිපත් කරන සිය වාර්තාවලට ඇතුළත් කිරීම සලකා බලන ලෙසට"12 යථෝක්තව සඳහන් කළ ලේඛනය ඔස්සේ රාජ්‍යය පාර්ශ්වකරුවන් දිරිමත් කෙරේ. කමිටුව විසින් මෙම යෝජනාව අනුමත කර තිබේ; විශේෂ සැසිවාරයේ දී සිදුකළ බැඳීම් සපුරාලීම සම්බන්ධයෙන් ප්‍රගතිය අධීක්ෂණය සඳහා කමිටුව කැපවී සිටින අතර, සම්මුතිය යටතේ නියමිත කාලාන්තර තුළ දී සිදුකරන වාර්තාකරණය සඳහා සිය සංශෝධිත මාර්ගෝපදේශ ඔස්සේ තවදුරටත් මඟපෙන්වීම සිදුකරනු ලැබේ.

ආ. ළමුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය

37. රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ වාර්තා පරීක්ෂා කිරීමේ දී, ඵලදායි ත්‍රියාත්මක කිරීමක් සහතික කිරීම සඳහා රජයේ සම්බන්ධීකරණය තවදුරටත් දිරිමත් කිරීම අවශ්‍ය බව කමිටුව විසින් නිත්‍ය වශයෙන්ම හඳුනාගෙන තිබේ: මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු අතර, විවිධ පළාත් සහ කලාප අතර, මධ්‍යම සහ අනෙකුත් මට්ටම්වල රජයන් අතර සහ රජය සහ සිවිල් සංවිධාන අතර සම්බන්ධීකරණය යි. සම්බන්ධීකරණයේ අරමුණ වනුයේ රාජ්‍යයේ අධිකරණ බල සීමාව තුළ සියලුම දරුවන් සඳහා සම්මුතියේ මූලධර්ම සහ ප්‍රමිතවලට ගරු කිරීම සහතික කිරීම; සම්මුතිය අපරානුමත කිරීමේ දී හෝ සම්මුතිය වෙත ප්‍රවේශ වීමේ දී ඒ තුළ පැවරී ඇති බැඳීම් අධ්‍යාපනය, සෞඛ්‍යය හෝ සුබසාධනය වැනි ළමුන් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති විශාල දෙපාර්තමේන්තු පමණක් නොව සමස්ත රජය ඔස්සේම ව්‍යාප්ත වී ඇති නිදසුන් ලෙස මුදල්, සැලසුම්, රැකියා සහ ආරක්ෂක වැනි විෂයයන්ට අදාළ දෙපාර්තමේන්තු, සහ සියලු මට්ටම්වල දී හඳුනාගැනීම සහතික කිරීම දැක්විය හැකිය.

38. රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ එකිනෙකට වෙනස් රජයේ පද්ධතිවලට යෝග්‍ය සවිස්තරාත්මක වැඩපිළිවෙලවල් නිර්ණය කිරීම සඳහා ප්‍රයත්න දැරීම උචිත නොවන බව ගිවිසුම් මණ්ඩලය වශයෙන් කමිටුව විසින් විශ්වාස කරනු ලැබේ. නිදසුන් ලෙස ළමුන් සඳහා වන අන්තර් අමාත්‍යාංශ සහ අන්තර් දෙපාර්තමේන්තු ඇතුළුව, ඵලදායි සම්බන්ධීකරණයක් සාක්ෂාත් කරගැනීම සඳහා විධිමත් හා අවිධිමත් ආකාර ගණනාවකි. රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් දැනට එසේ සිදුකර නොමැති නම්, ඔවුන් විසින් සම්මුතිය ක්‍රියාත්මක කිරීම යන පැතිකඩින් සලකා රජයේ යාන්ත්‍රණය සහ පොදු මූලධර්ම වශයෙන් හඳුනාගෙන ඇති ව්‍යවස්ථා හතර සමාලෝචනය කළ යුතු බව කමිටුව විසින් යෝජනා කෙරේ. (ඉහත 12 වැනි ඡේදය බලන්න).

39. ළමුන්ගේ ප්‍රතිපත්තිය සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වාසි සහගත තත්ත්වයන් සහිත බොහෝ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් විශේෂිත දෙපාර්තමේන්තු හෝ රජය වෙත, ඇතැම් අවස්ථාවල දී ජනාධිපති හෝ අග්‍රාමාත්‍ය හෝ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත කේන්ද්‍රිය ඒකකයක් සකස් කර තිබේ. යථෝක්තව සඳහන් කළ පරිදි, සැබැවින්ම සියලු රජයේ දෙපාර්තමේන්තුවල ක්‍රියාවන් ළමුන්ගේ ජීවිත මත බලපෑමක් ඇති කරයි. ළමුන්ගේ සේවා සියල්ල ඒකරාශී කර තනි දෙපාර්තමේන්තුවකට වගකීම පැවරීම ප්‍රායෝගික නොවන අතර එසේ සිදුකරන ඕනෑම අවස්ථාවක රජය තුළ ළමුන් තවදුරටත් කොන් කිරීමකට ලක්වීමේ අවදානමක් පවතී. එනමුත්, විශේෂිත ඒකකයක් සඳහා ඉහළ මට්ටමේ ප්‍රමුඛතාවයක් ලබාදුන හොත් සහ නිදසුනක් ලෙස අග්‍රාමාත්‍යවරයා, ජනාධිපති හෝ ළමුන් සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල කමිටුවකට සෘජුවම වාර්තා කරන්නේ නම්, එබඳු ඒකකයකට රජය තුළ කටයුතුවලදී ළමුන් වැඩිවශයෙන් දෘශ්‍යමාන වීම යන සමස්ත අරමුණ සහ රජයේ

සියලු කටයුතු හරහා සහ රජයේ සියලු මට්ටම්වල දී ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා ගරුත්වය සහතික කිරීම සම්බන්ධීකරණය යන කාර්යයන් දෙක සඳහා ම දායකත්වය සැපයේ. සවිස්තරාත්මක ළමා ක්‍රමෝපායක් සකස් කිරීම සහ එහි ක්‍රියාත්මකවීම අධීක්ෂණය මෙන්ම සම්මුතිය යටතේ වාර්තාකරණය සම්බන්ධීකරණය සඳහා වගකීම මෙවැනි ඒකකයකට පැවරිය හැකි ය.

ඇ. විමධ්‍යගතකරණය, ෆෙඩරල්කරණය සහ බලය බෙදීම

40. විමධ්‍යගත කිරීම හෝ බලය බෙදීම ඔස්සේ බලය විමධ්‍යගතකරණය කරන බොහෝ රාජ්‍යයන් වෙත එකී කාර්යය තුළින් රාජ්‍ය ව්‍යුහය කෙසේ පැවතිය ද පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්ගේ රජයන් වෙත පවතින සිය අධිකරණ බල සීමාව තුළ සියලු දරුවන් වෙනුවෙන් පවතින බැඳීම් ඉටුකරලීම සඳහා පවතින සෘජු වගකීම කිසිදු ආකාරයකින් අඩු නොවන බව අවධාරණය කිරීම අවශ්‍ය බව කමිටුවට පෙනී ගොස් ඇත.

41. සියලුම තත්ත්ව යටතේ දී සිය අධිකරණ බල සීමාව යටතේ පවතින භෞමික ප්‍රදේශ හරහා සම්මුතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වගකීම දරනුයේ සම්මුතිය අපරානුමත කරනු ලැබූ හෝ සම්මුතිය වෙත ප්‍රවේශ වූ රාජ්‍යය විසින් බව කමිටුව විසින් අවධාරණය කරනු ලැබේ. බලය විමධ්‍යගත කිරීමේ ඕනෑම ක්‍රියාවලියක දී, සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම් ඵලදායි අයුරින් දැරීම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව සහ අනෙකුත් සම්පත් විමධ්‍යගත බලය සහිත අධිකාරීන් වෙත පවතින බවට රාජ්‍ය පාර්ශවකරුවන් විසින් තහවුරු කළ යුතු ය. සම්මුතිය සඳහා බලය පවරනු ලැබූ පරිපාලනයන්ගේ හෝ ප්‍රාදේශීය බලාධිකාරීන් විසින් පූර්ණ අනුකූලතාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සඳහා රාජ්‍ය පාර්ශවකරුවන්ගේ රජයන් විසින් බලතල තබාගත යුතු අතර වෙනස්ව සැලකීමෙන් තොරව සිය අධිකරණ බල ප්‍රදේශය තුළ සියලු දරුවන්ට අදාළව සම්මුතිය සඳහා ගරු කෙරෙන බව සහ යොදාගන්නා බව සහතික කිරීම සඳහා ස්ථාවර අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම ද අත්‍යවශ්‍ය වේ. තව ද, විමධ්‍යගතකරණය හෝ බලය බෙදීම විවිධ කලාපවල ළමුන් විසින් භුක්ති විඳින අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙනස්ව සැලකීමට තුඩු නොදෙන බව සහතික කිරීම සඳහා ආරක්ෂක පියවර අනිවාර්යෙන් පැවතිය යුතු ය.

ඈ. පුද්ගලීකරණය

42. සේවා පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය මගින් ළමුන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීම හා සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් බරපතල බලපෑමක් ඇතිකළ හැකි ය. ලාභ ලබන සහ ලාභ අපේක්ෂාවෙන් නොවන යන දෙයාකාරයේම ව්‍යාපාර, රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් පුද්ගලික ආයතන ඇතුළත්ව පුද්ගලික අංශය අර්ථ දක්වමින් කමිටුව විසින් එහි 2002 වර්ෂයේ පොදු සාකච්ඡා සඳහා දිනය "සේවා සැපයුම්කරුවෙකු වශයෙන් පුද්ගලික අංශය සහ ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එහි භූමිකාව" මැයෙන් වෙන් කරන ලදී. එම පොදු සාකච්ඡාව පැවති දිනයෙන් අනතුරුව, කමිටුව විසින් සවිස්තරාත්මක නිර්දේශ අනුමත කළ අතර ඒ සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ අවධානය යොමු කරවන ලදී.13

43. සම්මුතියේ දක්වා ඇති පරිදි ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා ගරු කිරීම සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිණිස සම්මුතිය සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් සතුව නෛතික බැඳීමක් පවතින බව කමිටුව විසින් අවධාරණය කෙරෙන අතර රාජ්‍ය නොවන සේවා සැපයුම්කරුවන් සම්මුතියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මකවීම සහතික කිරීමේ බැඳීම ද මීට ඇතුළත් අතර එමඟින් එවැනි ක්‍රියාකාරකම් කෙරෙහි වක්‍ර බැඳීමක් ද ඇති කෙරේ.

44. සේවා සැපයීම, ආයතන ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික අංශය වෙත අවස්ථාව ලබාදීම ඔස්සේ සම්මුතියේ දක්වා ඇති සියලු අයිතිවාසිකම් රාජ්‍යයක අධිකරණ බල ප්‍රදේශය තුළ දී සියලු දරුවන් සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් හඳුනාගැනීම සහ සාක්ෂාත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍යයක් සතු බැඳීම කිසිදු ආකාරයකින් අඩු නොකරන බව කමිටුව විසින් අවධාරණය කෙරේ. (2(1) ව්‍යවස්ථාව සහ 3 (2) ව්‍යවස්ථාව). ළමුන් සම්බන්ධ සියලු ක්‍රියාකාරකම්වල දී, ඒවා රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ

ආයතන මගින් සිදුකරනු ලැබුව ද, ළමයාගේ උපරිම යහපත මූලිකවම සැලකිය යුතු කරුණ බව 3(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කෙරේ. 3(3) වැනි ව්‍යවස්ථාව මගින් නිසි බලධාරී ආයතන (යෝග්‍ය නෛතික ශක්‍යතාවය) විසින් යෝග්‍ය ප්‍රමිති, විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ යෝග්‍යතාවය පිළිබඳ ප්‍රමිති ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය දැක්වේ. මෙහිදී සම්මුතිය සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා දැඩි පිරික්සුමක් අවශ්‍ය වේ. සම්මුතිය සඳහා සියලු රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන සේවා සැපයුම්කරුවන් ගරු කරන බව සහතික කිරීම අරමුණු කරගත් ස්ථිර අධීක්ෂණ යාන්ත්‍රණයක් හෝ ක්‍රියාවලියක් කමිටුව විසින් යෝජනා කරනු ලැබේ.

ඉ. අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම - ළමුන් කෙරෙහි බලපෑම් තක්සේරු කිරීම සහ ඇගයීම

45. ළමුන් හා අදාළ සියලුම කාර්යයන්වල දී මූලික අවධානය ළමයෙකුගේ උපරිම යහපත බව (3(1) ව්‍යවස්ථාව) සහ රජයේ සියලු මට්ටම්වල නීති සම්පාදනය සහ ප්‍රතිපත්ති සංවර්ධනය සහ සේවා සැපයුම යන කටයුතුවල දී සම්මුතියේ සියලු විධිවිධානවලට ගරු කිරීම සහතික කිරීම සඳහා ළමුන් කෙරෙහි බලපෑම් තක්සේරු කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් (ළමුන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීම කෙරෙහි බලපාන ඕනෑම යෝජිත නීතියක්, ප්‍රතිපත්තියක් හෝ අයවැය ප්‍රතිපාදනයක්) සහ ළමුන් කෙරෙහි බලපෑම් ඇගයීමක් අවශ්‍ය වේ . මෙම ක්‍රියාවලිය රජයේ සියලු මට්ටම්වලට සහ ප්‍රතිපත්ති සංවර්ධනයේ දී හැකි උපරිම ඉක්මනින් ඇතුළත් විය යුතු ය.

46. ස්වයං අධීක්ෂණය සහ ඇගයීම යනු රජයන් සඳහා වන බැඳීමකි. නමුත් පාර්ලිමේන්තු කමිටු, රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපනික ආයතන, වෘත්තීයමය සංවිධාන, තරුණ කණ්ඩායම් සහ ස්වාධීන මානව හිමිකම් ආයතන විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධිත ප්‍රගතිය පිළිබඳ ස්වාධීන අධීක්ෂණය ද අත්‍යවශ්‍ය බව කමිටුව විසින් අවධානය යොමු කෙරේ (පහත 65 වැනි ඡේදය බලන්න).

47. විධිමත් ආකාරයෙන් සකස් කළ බලපෑම් විශ්ලේෂණ ප්‍රකාශන සකස් කිරීම සහ පාර්ලිමේන්තුව සහ/ හෝ පොදු ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා නීති සම්පාදනය කරගනු ලැබූ ඇතැම් රාජ්‍යයන් පිළිබඳව කමිටුව විසින් ප්‍රශංසා කරනු ලැබේ. 3(1) ව්‍යවස්ථාව සඳහා අනුකූලතාවය සහතික කිරීම කෙසේ සිදුකළ හැකි ද යන්න සෑම රාජ්‍යයක් විසින්ම සලකා බැලිය යුතු අතර ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ළමුන් ඒකාබද්ධ වීමේ දෘශ්‍ය ආකාරය සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා සංවේදීභාවය තවදුරටත් ප්‍රවර්ධනය වන ආකාරයෙන් එය සිදුකළ යුතු ය.

ඊ. දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සහ දර්ශක සකස් කිරීම

48. අයිතිවාසිකම් සාක්ෂාත් ළමුන් පිළිබඳ ප්‍රමාණවත් සහ විශ්වාසනීය දත්ත රැස්කිරීම, ඒවා කොටස්වලට වෙන් කිරීම ඔස්සේ අයිතිවාසිකම් සාක්ෂාත් කරගැනීමේ දී වෙනස්ව සැලකීමට බඳුන්වීම සහ/හෝ අසමානතා හඳුනාගැනීමට හැකිවීම වනාහී ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍ය අංගයකි. ළමා කාලයට අදාළ සමස්ත කාල පරිච්ඡේද පුරා, එනම් වයස අවුරුදු 18 දක්වා දත්ත රැස්කිරීම ව්‍යාප්තවීම අවශ්‍ය බව, කමිටුව විසින් රාජ්‍ය පාර්ශවකරුවන් වෙත සිහි කැඳවනු ලැබේ. ජාතික වශයෙන් අදාළ වන දර්ශක සහතික කරමින්, අධිකරණ බල ප්‍රදේශය පුරා මෙය සම්බන්ධීකරණය කිරීම අවශ්‍ය වේ . රාජ්‍යය විසින් යෝග්‍ය පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම අවශ්‍ය අතර, ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක අධ්‍යයන සමගින් ක්‍රියාත්මක කිරීම දක්වා ප්‍රගතිය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් ගොඩ නැංවිය යුතු ය. නියමිත කාලාන්තරවල නිකුත් කළ යුතු වාර්තා සඳහා වන වාර්තා කිරීමේ මාර්ගෝපදේශ මගින් සම්මුතියේ සියලු ක්ෂේත්‍ර ආවරණය වන සවිස්තරාත්මක එකිනෙකින් වෙන්කළ සංඛ්‍යාත්මක සහ අනෙකුත් තොරතුරු ඉල්ලුම් කෙරේ. හුදෙක් දත්ත රැස්කිරීම සඳහා ඵලදායි පද්ධති ස්ථාපනය පමණක් නොව, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීම, ගැටලු හඳුනාගැනීම හඳුනාගැනීම සහ ළමුන් සඳහා වන සියලු ප්‍රතිපත්තිමය සකස් කිරීම් අත්‍යවශ්‍ය වේ. සම්මුතිය මගින් ලබාදී ඇති සියලු අයිතිවාසිකම්වලට අදාළව සංවර්ධන දර්ශක පිළියෙල කිරීම ඇගයීමේ දී අවශ්‍ය වේ .

49. සිය අධිකරණ සීමාව මුළුල්ලේ ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය සම්බන්ධිත සවිස්තරාත්මක

වාර්තා වාර්ෂික ප්‍රකාශන වශයෙන් හඳුන්වාදුන් රාජ්‍ය පාර්ශ්වකරුවන් වෙත කමිටුව විසින් ප්‍රංශසාව පිරිනැමේ. එවැනි වාර්තා ප්‍රකාශයට පත්කිරීම සහ පුළුල් බෙදාහැරීම සහ පාර්ලිමේන්තුව තුළ ද ඇතුළුව එවැනි වාර්තා සම්බන්ධයෙන් විවාද ඔස්සේ ක්‍රියාත්ම කිරීමට අදාළව කේන්ද්‍රීය පුළුල් මහජන සහභාගිත්වයක් ඇතිකළ හැකි ය. මෙම ක්‍රියාවලිය තුළ ළමුන් සහ සුළු ජන කණ්ඩායම් නිරත කරවීම පිණිස ළමුන් සඳහා හිතකාමී සංස්කරණ ද ඇතුළුව පරිවර්තන අත්‍යවශ්‍ය වේ.

50. සිය අයිතිවාසිකම් පූර්ණ වශයෙන් හඳුනාගනු ලැබුවේ ද සහ සාක්ෂාත් කරගනු ලැබුවේ ද යන්න දැක්වීම සිදුකළ හැකි තත්ත්වයක බොහෝ අවස්ථාවන්හි දී පසුවන්නේ ළමුන් විසින් ඔවුන්ම පමණක් බව බවට කමිටුව විසින් අවධාරණය කරනු ලැබේ. ළමුන් සම්මුඛ පරීක්ෂණයට බඳුන් කිරීම සහ ඔවුන් පර්යේෂකයන් ලෙස යොදා ගැනීම (යෝග්‍ය ආරක්ෂක පියවර සමඟින්) බොහෝවිට, නිදසුනක් ලෙස 12 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති ඉතා වැදගත් අයිතිවාසිකම් ඇතුළුව සිය සිවිල් අයිතිවාසිකම් පවුල තුළ, පාසැල තුළ ආදී වශයෙන් වූ ස්ථානවලදී ඇහුම්කම්දෙන සහ නිසි අවධානය ලබාදීම ආදිය අනාවරණය කරගැනීමේ වැදගත් ආකාරයක් විය හැකි ය.

උ. අයවැය තුළ ළමුන් දෘශ්‍යමාන කරවීම

51. කමිටුවේ වාර්තාකරණ මාර්ගෝපදේශ සහ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ වාර්තා සැලකිල්ලට ගැනීමේ දී, ජාතික සහ අනෙකුත් අයවැයවල දී ළමුන් සඳහා වන සම්පත් හඳුනාගැනීම සහ විශ්ලේෂණය සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.14 4 වැනි ව්‍යවස්ථාව යටතේ රාජ්‍යයක් විසින් අවශ්‍ය පියවර ගතයුතු හෙයින් රාජ්‍යයක් විසින් ජාතික සහ අනෙකුත් අයවැයවලදී සමාජීය අංශය සඳහා වෙන්කරන ප්‍රතිපාදන හඳුනාගත හැකිනම් සහ ඒ තුළ ළමුන් සඳහා ඍජුව හෝ වක්‍රව යන ආකාර දෙකින්ම වෙන්කරන ප්‍රතිපාදන හඳුනාගත හැක්කේ නම් මිස, "...පවතින සම්පත්වල හැකි උපරිම මට්ටම දක්වා" ළමුන්ගේ ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් සපුරාලන්නේ ද බවට කිසිදු රාජ්‍යයකට පැවසිය නොහැක. ජාතික අයවැයවල් මේ ආකාරයෙන් විශ්ලේෂණය කිරීම සිදුකිරීමේ හැකියාවක් නොමැති බවට ඇතැම් රාජ්‍යයන් විසින් ප්‍රකාශ කෙරේ. නමුත් අනෙකුත් රාජ්‍යයන් විසින් එය සිදුකර වාර්ෂික "ළමුන්ගේ අයවැයවල්" ප්‍රකාශයට පත්කර තිබේ. මූලික ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ළමුන්ගේ උපරිම යහපත සැලැස්වෙන පරිද්දෙන් ආර්ථික හා සාමාජීය සැලසුම් සහ තීරණ ගැනීම් සහ අයවැය තීරණ ගැනීම සහ ආර්ථික ප්‍රතිපත්ති හෝ ආර්ථික අවපීඩනවල අහිතකර බලපෑම්වලින් විශේෂයෙන් නොවැදගත් සේ සලකන හා වරප්‍රසාද නොලත් ළමා කණ්ඩායම් ඇතුළුව ළමුන් ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා රජයේ සියලු මට්ටම්වල දී කුමන පියවර ගෙන තිබේ ද යන්න දැනගැනීම කමිටුවට අවශ්‍ය වේ .

52. ආර්ථික ප්‍රතිපත්ති කිසිදු විටක ළමුන්ගේ අයිතිවාසිකම් මත එයින් සිදුවන බලපෑමේ දී උදාසීන ආකාරයක් නොගන්නා බැවින්, ව්‍යුහාත්මක ගැලපුම් වැඩසටහන් සහ වෙළඳපොළ ආර්ථිකයක් කරා සිදුවන සංක්‍රමණයක දී ඒවායින් ළමුන් මත ඇතිකරන ඍණාත්මක බලපෑම් සම්බන්ධයෙන් කමිටුව වඩාත් ගැඹුරින් අවධානය යොමු කරනු ලැබේ. සම්මුතියේ 4 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සහ අනෙකුත් විධිවිධානවලට අදාළ රාජකාරි ඉටුකිරීමේ දී එවැනි වෙනස්කම්වල බලපෑම් සහ ළමුන්ගේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකහම් ආරක්ෂා කිරීම සඳහා වන ගැලපුම් ප්‍රතිපත්ති දැඩි අයුරින් අධීක්ෂණය කිරීමක් අවශ්‍ය වේ.

ඌ. පුහුණුව සහ ධාරිතා සංවර්ධනය

53. ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ නියුතු සියලු දෙනාගේ - රජයේ නිලධාරීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අධිකරණ සාමාජිකයන්ගේ සහ ළමුන් සමඟ කටයුතු කරන හා ළමුන් වෙනුවෙන් කටයුතු කරන සියලු දෙනාගේ පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍යන්ගේ බැඳීම් කමිටුව විසින් අවධාරණය කෙරේ. නිදසුනක් වශයෙන් ආගමික නායකයන්, ගුරුවරුන්, සමාජ සේවකයන් සහ ආයතන සහ රැඳවුම් ස්ථානවල ළමුන් සමඟ කටයුතු කරන පිරිස් ඇතුළුව අනෙකුත් වෘත්තිකයන්, සාමසාධක හමුදා ඇතුළුව පොලිස් හා හමුදා පිරිස්, මාධ්‍යවල වැඩකරන පිරිස් සහ තවත් බොහෝ පිරිස් මීට ඇතුළත් වේ. පුහුණුව ක්‍රමානුකූල සහ දිගටම කෙරීගෙන යමින් පවතින ආකාරයෙන් පැවතීම අවශ්‍ය වේ - මුල් පුහුණුව සහ නැවත සිදුකරන පුහුණු. මානව

හිමිකම්ලාභියෙකු වශයෙන් ළමයෙකුගේ තත්ත්වය, සම්මුතිය පිළිබඳ දැනුම සහ අවබෝධය වැඩිදියුණු කිරීම සහ සම්මුතියේ සියලු විධිවිධානවලට සක්‍රිය ගරුත්වය දිරිමත් කිරීම අවධාරණය කිරීම පුහුණුවේ අරමුණ වේ. සියලු මට්ටම්වල වෘත්තීය පුහුණු විෂයමාලා, චර්යා ධර්ම සංග්‍රහ සහ අධ්‍යාපනික විෂයමාලාවල දී සම්මුතිය පිළිබිඹුවීම කමිටුව විසින් අපේක්ෂා කෙරේ. පාසැල් විෂයමාලා සහ අනෙකුත් ආකාරවලින් මානව හිමිකම් පිළිබඳ අවබෝධය සහ දැනුම නියත වශයෙන්ම ළමුන් අතර ළමුන් විසින්ම ප්‍රවර්ධනය කළ යුතු ය. (පහත 69 වැනි ඡේදය සහ අධ්‍යාපනයේ පරමාර්ථ මැයෙන් වූ කමිටුවේ පොදු ප්‍රකාශ අංක 1(2001) බලන්න).

54. සියලු ළමුන් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සැලසීමට නම්, ඒ සඳහා අත්‍යවශ්‍ය කරන විශේෂඥ පුහුණු ඇතුළු පුහුණුවල විවිධ පැතිකඩ නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කළ යුතු වාර්තා පිළිබඳව වන කමිටුවේ මාර්ගෝපදේශවල සඳහන් කර ඇත. සම්මුතිය තුළ එහි පෙරවදනේ සහ තවත් බොහෝ ව්‍යවස්ථාවල පවුලේ වැදගත්කම අවධානයට ලක්කර තිබේ. මව්පියභාවය සඳහා සූදානම්වීම සහ මව්පිය කටයුතු පිළිබඳ අධ්‍යාපනය සඳහා ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම ඒකාබද්ධ කිරීම විශේෂයෙන් වැදගත් වේ.

55. පුහුණුවල ඵලදායිතාවය පිළිබඳ නියමිත කාලාන්තරවල දී සිදුකරන ඇගයීම්, සම්මුතිය සහ එහි විධිවිධාන පිළිබඳ දැනුම පමණක් නොව, ළමුන් විසින් සිය අයිතිවාසිකම් භුක්ති විඳීම සක්‍රිය ආකාරයෙන් ප්‍රවර්ධනය සඳහා ආකල්ප සහ පරිචයන් වැඩිදියුණු කිරීම උදෙසා එකී දැනුම දායක වූ මට්ටම ද සමාලෝචනය කිරීම් පැවතිය යුතුය.

එ. සිවිල් සමාජය සමඟ සහයෝගිතාවය

56. මෙය ක්‍රියාත්මක කිරීම රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ බැඳීමක් නමුදු, ළමුන් ද ඇතුළුව සමාජයේ සියලුම ස්තර එහි නිරතවීම අවශ්‍ය වේ . ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා ගරු කිරීමේ සහ සහතික කිරීමේ වගකීම ප්‍රායෝගික වශයෙන් ගත්විට රාජ්‍යය සහ රාජ්‍ය පාලනය යටතේ වූ සේවා සහ ආයතනවලින් ඔබ්බට ගොස් ද ළමුන්, දෙමාපියන් සහ පුළුල් වශයෙන් ගත්කළ පවුල්, අනෙකුත් වැඩිහිටියන්, සහ රාජ්‍ය නොවන සේවා සහ සංවිධාන ද ඇතුළත් කිරීම දක්වා ව්‍යාප්ත වන බව කමිටුව විසින් හඳුනාගනී. නිදසුනක් ලෙස, "සම්මුතිය සඳහා රාජ්‍යයන් පමණක් පාර්ශ්වකරුවන් වන අතර අවසාන වශයෙන් ඒ සඳහා අනුකූල විය යුතු අතර, සමාජයේ සියලු සාමාජියන් - සෞඛ්‍ය වෘත්තිකයන් ද ඇතුළුව තනි පුද්ගලයන්, පවුල්, ප්‍රාදේශීය ප්‍රජාවන්, අන්තර්රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සේම පුද්ගලික ව්‍යාපාරික අංශය - සතුව සෞඛ්‍ය සඳහා වන අයිතිවාසිකම සාක්ෂාත් කරගැනීමට අදාළ වගකීම් සතු බවට සඳහන් වන ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවෙහි 42 වැනි ඡේදය වන සෞඛ්‍ය සම්බන්ධයෙන් එළඹිය හැකි ඉහළතම ප්‍රමිතිය සඳහා ඇති අයිතිවාසිකම පිළිබඳ පොදු ප්‍රකාශ අංක 14 (2000) සමඟ කමිටුව ද එකඟ වේ. එබැවින් රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් මෙම වගකීම් ඉටු කරලීම සඳහා පහසුකම් සලසන පරිසරයක් ලබාදිය යුතු ය."

57. සම්මුතියේ 12 වැනි ව්‍යවස්ථාවට අනුව, දැනටමත් අවධාරණය කළ පරිදි (ඉහත 12 වැනි ඡේදය බලන්න), ළමුන් සඳහා බලපාන සියලු කරුණුවල දී ළමුන්ගේ මතයන් සඳහා නිසි බරක් ලබාදීම අවශ්‍ය කෙරෙන අතර, එමඟින් "ඔවුන්ගේ" සම්මුතිය ක්‍රියාත්මක කිරීමක් පැහැදිලිව ඇතුළත් වේ.

58. රාජ්‍ය නොවන සංවිධානවල ස්වයං පාලනය සඳහා ඇති අයිතියට ගරුකරන අතරම, පුළුල්තම අවබෝධයෙන් යුක්තව රාජ්‍යයන් විසින් රාජ්‍ය නොවන සංවිධාන සමඟ සමීපව කටයුතු කිරීම අවශ්‍ය කෙරේ. නිදසුන් ලෙස මානව හිමිකම් පිළිබඳ රාජ්‍ය නොවන සංවිධාන, ළමුන් හා තරුණයන් විසින් නායකත්වය ලබාදෙන සංවිධාන සහ තරුණ කණ්ඩායම්, මවුපිය සහ පවුල් කණ්ඩායම්, හිතෛෂී කණ්ඩායම්, අධ්‍යයන ආයතන, සහ වෘත්තීය සංවිධාන මීට ඇතුළත් වේ. රාජ්‍ය නොවන සංවිධාන විසින් සම්මුතිය කෙටුම්පත් කිරීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකළ අතර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වේ.

59. ළමුන්ගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ අධීක්ෂණය සඳහා කැප වූ රාජ්‍ය

නොවන සංවිධානවල හවුල් සහ සන්ධානයන් අලුතින් මතුවීම කමිටුව විසින් සතුටින් පිළිගන්නා අතර ඔවුන් වෙත වක්‍ර සහායන් ලබාදීම සහ ඔවුන් සමඟින් ධනාත්මක විධිමත් සේම අවිධිමත් ධනාත්මක සබඳතා ගොඩනංවා ගැනීම සඳහා රජයන් වෙත ආයාචනා කර සිටී. 45(අ) ව්‍යවස්ථාව යටතේ "නිසි බල අධිකාරීන්" යන අර්ථ නිරූපණය යටතේ සැලකෙන සම්මුතිය යටතේ වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වය, බොහෝ අවස්ථාවල දී ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සේම වාර්තාකරණය සඳහා ද තත්‍ය ගාමක බලයක් ලබා දේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා වන රාජ්‍ය නොවන සංවිධාන සමූහය සඳහා වාර්තාකරණ ක්‍රියාවලිය සහ කමිටුවේ කාර්යය සම්බන්ධ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් වඩාත් පිළිගැනීමක් සහිත, බලවත් සහ සහයෝගාත්මක බලපෑමක් සතු ය. වාර්තාවක් සකස් කිරීමේ ක්‍රියාවලියේ දී "ජනප්‍රියත්ව සහභාගිත්වය හා රජයේ ප්‍රතිපත්ති සම්බන්ධ පොදු විචක්ෂණශීලීභාවය සඳහා දිරිමත් කිරීමක් හා පහසුකම් සැලසීමක් සිදුවිය යුතුබව"15 කමිටුව විසින් එහි වාර්තාකරණ මාර්ගෝපදේශවල දී අවධාරණය කර තිබේ. ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ මාධ්‍ය අගනා පාර්ශවකරුවන් විය හැකි ය (70 වැනි ඡේදය ද බලන්න).

ඒ. ජාත්‍යන්තර සහයෝගිතාවය

60. සම්මුතිය ක්‍රියාත්මක කිරීම යනු ලෝකයේ රාජ්‍යයන් සඳහා සහයෝගිතා ප්‍රයත්නයක් බව 4 වැනි ව්‍යවස්ථාව මඟින් අවධාරණය කෙරේ. මෙම ව්‍යවස්ථාව සහ සම්මුතියේ අනෙකුත් ව්‍යවස්ථා ඔස්සේ ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා අවශ්‍යතාවය මතු කර දැක්වේ.16 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (55 සහ 56) වැනි ව්‍යවස්ථා) මඟින් ජාත්‍යන්ත ආර්ථික සහ සාමාජීය සහයෝගිතාවයේ සමස්ත අරමුණ හඳුනාගන්නා අතර ප්‍රඥප්තිය යටතේ එහි සාමාජිකයන් විසින් එම අරමුණු සාක්ෂාත් කරගැනීමට "සංවිධානය සමඟ සහයෝගිතාවයෙන් සාමූහික සහ තනි තනි ක්‍රියාමාර්ග ගැනීම සඳහා" ප්‍රතිඥා දී තිබේ. ළමුන් සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ විශේෂ සැසිය ඇතුළුව ඇතුළුව එක්සත් ජාතීන්ගේ සහශ්‍ර ප්‍රකාශය සහ අනෙකුත් ගෝලීය රැස්වීම්වල දී විශේෂයෙන්, දුගීබව දුරුලීම සඳහා වූ ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා රාජ්‍යයන් විසින් ප්‍රතිඥා දී ඇත.

61. ළමුන් සඳහා සෘජුව හෝ වක්‍රව සම්බන්ධිත ජාත්‍යන්තර සංවර්ධන සහාය සඳහා රාමුවක් සම්මුතියෙන් ගොඩනැංවිය යුතු බව සහ ආධාර ප්‍රදානය කරනු ලබන රාජ්‍යයන්ගේ වැඩසටහන් අයිතිවාසිකම් මත පදනම් විය යුතු බව කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වයන් සඳහා උපදෙස් දෙනු ලැබේ. දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.7ක් ජාත්‍යන්තර සංවර්ධන සහාය සඳහා ලබාදීමේ එක්සත් ජාතීන්ගේ ඉලක්කය ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් එකඟවී ඇති ඉලක්කයන් සපුරාලන ලෙස කමිටුව විසින් රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. 2002 වර්ෂයේ දී පැවති සංවර්ධනය සඳහා මූල්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී පැන නැඟුනු මොන්ටෙරි එකඟතාවයෙහි මෙම ඉලක්කය අනෙකුත් ඉලක්ක සමඟින් අවධාරණය කර තිබේ.17 ජාත්‍යන්තර ආධාර සහ සහාය ලබාගැනීමටත් එසේ ලබාගන්නා ආධාරවලින් සැලකිය යුතු කොටසක් නිශ්චිතවම ළමුන් සඳහා වෙන් කිරීමටත් කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන් දිරිමත් කෙරේ. ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කරනු ලබන ජාත්‍යන්තර සහායේ මූල්‍යමය වටිනාකම සහ එහි පංගුව, රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් වාර්ෂික වශයෙන් හඳුනා ගැනීමට හැකිවනු ඇතැයි කමිටුව අපේක්ෂා කරයි.

62. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් සහ ආධාර ලබාදෙන රාජ්‍යයන්ගේ හවුල් වගකීමක් ලෙසින් තිරසර ආකාරයෙන් ගුණාත්මක තත්ත්වයේ මූලික සමාජ සේවා සඳහා විශ්වීය ප්‍රවේශය සාක්ෂාත් කරගැනීමේ (20/20) ප්‍රයත්නයේ අරමුණු කමිටුව අනුමත කරයි. අතිරේක සම්පත් වෙන් නොකළහොත් සහ සම්පත් වෙන්කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි නොකළහොත් මූලික ආර්ථික සහ සාමාජීය අයිතිවාසිකම් සපුරාලීමේ දී බොහෝ රාජ්‍යයන් අසීරුතාවලට මුහුණ දෙන බව ප්‍රගතිය සමාලෝචනය සඳහා පැවති ජාත්‍යන්තර රැස්වීම්වල දී නිගමනය කළ බව කමිටුව විසින් අවධාරණය කෙරේ. දුගීභාවය අවම කිරීමේ ක්‍රමෝපායික පත්‍රය (PRSP) හරහා බොහෝ වශයෙන් ණය බරින් යුක්ත රටවල්වල දුගීබව අඩුකිරීම සඳහා ගනු ලැබූ පියවරවල් සම්බන්ධයෙන් කමිටුව අවධානය යොමුකරන අතර ඒවා දිරිමත් කරනු ලැබේ. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කේන්ද්‍රීය සහ රට මූලික කරගත් ක්‍රමෝපාය වශයෙන් දුගීභාවය අවම කිරීමේ ක්‍රමෝපායික පත්‍රයෙහි ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රබල වශයෙන් අවධානය යොමුවීමක් ඇතුළත් විය යුතු ය. දුගීභාවය අවම කිරීමේ ක්‍රමෝපායික පත්‍රය (PRSP) සහ සංවර්ධනය සඳහා ආංශිය වශයෙන් වූ ප්‍රවේශ (SWAps)

සකස් කිරීමේ දී ළමුන් ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස සහතික කිරීම සඳහා කමිටුව විසින් රජයන්, ආධාර ප්‍රදානකරුවන් සහ සිවිල් සමාජය වෙතින් ඉල්ලා සිටී. ළමුන් අයිතිවාසිකම් දරන්නන් වශයෙන් හඳුනාගනිමින් සහ ළමුන් සඳහා අදාළ වන සංවර්ධන අභිමතාර්ථ සහ අරමුණු ඇතුළත් කරමින් සාකල්‍ය, ළමා කේන්ද්‍රීය ප්‍රවේශයක් සමගින් දුගීභාවය අවම කිරීමේ ක්‍රමෝපායික පත්‍රය ꞉ඡඍීඡ* සහ සංවර්ධනය සඳහා ආංශිය වශයෙන් වූ ප්‍රවේශ꞉ුළ්ව්* යන ද්විත්වයේදීම ළමුන්ගේ අයිතිවාසිකම් මූලධර්ම පිළිබිඹු විය යුතු ය.

63. සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ රාජ්‍යයන් විසින් තාක්ෂණික සහාය අදාළ පරිද්දෙන් සැපයීම සහ යොදා ගැනීම කමිටුව විසින් දිරිමත් කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ꞉ඔභෂකෑ*ල මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය ꞉ධ්‍යකාසෂ* සහ අනෙකුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ආශ්‍රිත නියෝජිතායතනවලට ක්‍රියාත්මක කිරීමේ බොහෝ කරුණුවලට අදාළව තාක්ෂණික සහාය සැපයිය හැකි ය. සම්මුතිය යටතේ වන සිය වාර්තාවලදී තාක්ෂණික සහාය සම්බන්ධිත සිය නැඹුරුව හඳුනාගැනීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් දිරිමත් කරනු ලැබේ.

64. ජාත්‍යන්තර සහයෝගිතාවය සහ තාක්ෂණික සහාය ප්‍රවර්ධනය කිරීමේ දී, සියලු එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන ආශ්‍රිත නියෝජිතායතන සඳහා සම්මුතිය මගින් මඟ පෙන්විය යුතු අතර ඔවුන්ගේ සියලු ක්‍රියාකාරකම්වල දී ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රධාන ප්‍රවණතාවය වශයෙන් සැලකිය යුතු ය. සම්මුතිය යටතේ වන සිය බැඳීම් ඉටුකිරීම සඳහා රාජ්‍යයන්ට සහාය වීම ජාත්‍යන්තර සහයෝගිතාවය තුළ ඉලක්කගත කිරීම සිය බලපෑම් තුළ සහතික කිරීම සඳහා ඔවුන් විසින් උත්සාහ ගත යුතු ය. එමෙන්ම, ලෝක බැංකු කණ්ඩායම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානය විසින් ජාත්‍යන්තර සහයෝගිතාවය සහ ආර්ථික සංවර්ධනයට අදාළ සිය ක්‍රියාකාරකම්වල දී ළමුන්ගේ උපරිම යහපත සඳහා සිය මූලික අවධානය ලබාදීම සහ සම්මුතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතු ය.

ඔ. ස්වාධීන මානව හිමිකම් ආයතන

65. "ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වාධීන මානව හිමිකම් ආයතනවල කාර්යභාරය" මැයෙන් වූ පොදු ප්‍රකාශ අංක 2 (2002) හි, "සම්මුතිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට සහ ළමුන්ගේ අයිතිවාසිකම් ගෝලීය වශයෙන් යථාර්ථයක් බවට ඉදිරියට පමුණුවාලීම සඳහා සම්මුතිය අපරානුමත කිරීමෙන් අනතුරුව, රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් සිදුකරන බැඳීම යටතට වැටෙන එවැනි ආයතන ස්ථාපනය කිරීම කෙරෙහි සැලකිල්ල යොමු කිරීම" කමිටුව විසින් අවධාරණය කර ඇත. ස්වාධීන මානව හිමිකම් ආයතන ළමුන් සඳහා වන ඵලදායි රජයේ ව්‍යුහයන්ට අනුපූරක වේ; අත්‍යවශ්‍ය අංගය වනුයේ ස්වාධීනත්වය යි꞉ "ජාතික මානව හිමිකම් ආයතනවල භූමිකාව වනුයේ රාජ්‍යයේ අනුකූලතාවය හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ස්වාධීනව අධීක්ෂණය කිරීමත් ළමුන්ගේ අයිතිවාසිකම් සඳහා පූර්ණ ගරු කිරීමක් සහතික කිරීම සඳහා සිදුකළ හැකි සියලු කාර්යයන් සිදුකිරීම යි. මේ සඳහා මෙම ආයතනවලට ළමුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති සකස් කිරීම අවශ්‍ය විය හැකි අතර, මේ ඔස්සේ රජය විසින් සිය අධීක්ෂණ බැඳීම් ජාතික ආයතනය වෙත පැවරීමක් නොවිය යුතු ය. තමාට අනන්‍ය වැඩසටහනක් සකස් කරගැනීම සඳහා සහ ඔවුන්ට අනන්‍ය ක්‍රියාකාරකම් නිශ්චය කරගැනීම සඳහා ආයතන පූර්ණ වශයෙන් ස්වාධීනව පැවතිය යුතු ය."18 ළමුන් සඳහා ස්වාධීන මානව හිමිකම් ආයතන ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ විස්තරාත්මක මඟපෙන්වීමක් පොදු ප්‍රකාශ අංක 2 මගින් සැපයේ.

42 වැනි ව්‍යවස්ථාව꞉ වැඩිහිටියන් සහ ළමුන් අතර සම්මුතිය ප්‍රචලිත කිරීම

"වැඩිහිටියන් සහ ළමුන් අතර එකසමාන ආකාරයෙන් සම්මුතියේ මූලධර්ම සහ විධිවිධාන පුළුල් වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් යෝග්‍ය සහ සක්‍රිය ආකාරවලින් කටයුතු කළ යුතු ය."

66. තනි තනි පුද්ගලයන් විසින් තමාගේ අයිතිවාසිකම් කවරේ ද යන්න දැනගැනීම අවශ්‍ය කෙරේ. පොදුවේ සියල්ලගේම නොවූව ද, සාම්ප්‍රායික වශයෙන් බොහෝ සමාජවලදී ළමුන් අයිතිවාසිකම් දරන්නන් ලෙස නොසැලකේ. එබැවින්, 42 වැනි ව්‍යවස්ථාව සුවිශේෂී වැදගත්කමක් හිමිකරගෙන ඇත. ළමුන් වටා

සිටින වැඩිහිටියන්, ඔවුන්ගේ දෙමාපියන් සහ අනෙකුත් පවුලේ සාමාජිකයන්, ගුරුවරු සහ අනෙකුත් රැකබලා ගන්නන් වෙත සම්මුතියෙන් ගම්‍ය වන දෑ, සහ ඊටත් වඩා අයිතිවාසිකම් දරන්නන් වශයෙන් ළමුන් සඳහා ඇති සම අයිතිය සම්මුතිය මගින් තහවුරු වීම අවබෝධ නොවන්නේ නම්, බොහෝ දරුවන් සඳහා සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් සාක්ෂාත්වීම සම්බන්ධයෙන් අපේක්ෂා තැබිය නොහැකි ය.

67. රාජ්‍යයන් විසින් සම්මුතිය පිළිබඳ දැනුම සමස්ත සමාජය පුරා ව්‍යාප්ත කිරීම සඳහා පරිපූර්ණ සැලැස්මක් සකස් කළ යුතුබව කමිටුව විසින් යෝජනා කෙරේ. මෙම සැලැස්මට සම්මුතිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා යෙදී සිටින රාජ්‍ය සහ ස්වාධීන මණ්ඩල සම්බන්ධ තොරතුරු ඇතුළත් විය යුතු අතර ඔවුන් කෙසේ සම්බන්ධ කරගත හැකි ද යන්න ද ඇතුළත් විය යුතු ය. වඩාත් මූලික මට්ටමේ දී, සම්මුතියේ අන්තර්ගත පාඨ සියලු භාෂාවලින් පුළුල්ව ව්‍යාප්ත කළ යුතු අතර (මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය ːධ්‍යක්‍යසෂ* විසින් සිදුකළ නිල සහ නොනිල මට්ටමේ පරිවර්තන එකතුව සම්බන්ධයෙන් කමිටුවේ ප්‍රශංසාව පිරිනැමේ). සාක්ෂරතාවය, එනම් ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති පුද්ගලයන් අතර සම්මුතිය ප්‍රචලිත කිරීම සඳහා ක්‍රමෝපායක් ද තිබිය යුතු ය. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ːඹභෂක්‍ෂ* සහ බොහෝ රාජ්‍යයන්වල රාජ්‍ය නොවන සංවිධාන විසින් ළමුන් සඳහා යෝග්‍ය ආකාරයෙන් විවිධ වයස්වල සිටින ළමා කාණ්ඩ සඳහා සම්මුතියේ සංස්කරණ සකස් කර තිබේ - මෙය කමිටුව විසින් සතුටින් පිළිගන්නා සහ දිරිමත් කරන ක්‍රියාවලියකි; මේ ඔස්සේ ළමුන්ට උපකාර සහ උපදෙස් ලබාගත හැකි මූලාශ්‍ර සම්බන්ධයෙන් ද ළමුන් දැනුවත් කළ යුතු ය.

68. ළමුන් විසින් සිය අයිතිවාසිකම් පිළිබඳ දැනුම ලබාගත යුතු අතර සියලු මට්ටම්වල දී පාසැල් විෂය මාලාවන් තුළට සම්මුතිය පිළිබඳව හා පොදුවේ මානව හිමිකම් පිළිබඳ ඉගෙනුම් කරුණු ඇතුළත් කිරීම සම්බන්ධයෙන් කමිටුව විසින් විශේෂ අවධානයක් තබා ඇත. 29 වැනි ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදය සමඟ කියවිය යුතු "අධ්‍යාපනයේ අරමුණු" මැයෙන් වූ කමිටුවේ පොදු ප්‍රකාශ අංක 1 (2001) ඔස්සේ "... මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස සම්බන්ධයෙන් ගරුත්වයක් ඇති කිරීම..." සඳහා දරුවාගේ අධ්‍යාපනය යොමුවීම අවශ්‍ය වේ . "මානව අයිතිවාසිකම් අධ්‍යාපනය මගින් මානව හිමිකම් ගිවිසුම්වල අන්තර්ගතය පිළිබඳ තොරතුරු ලබාදිය යුතු ය. නමුත් නිවසේ දී, පාසැලේ දී හෝ ප්‍රජාව තුළ හෝ ක්‍රියාත්මක වී ඇති මානව හිමිකම් ප්‍රමිති දර්ශනය වී ඒ ඔස්සේ මානව හිමිකම් සම්බන්ධයෙන් ඉගෙන ගැනීම ද ළමුන් විසින් සිදුකළ යුතු ය. මානව හිමිකම් අධ්‍යාපනය සවිස්තරාත්මක, මුළු ජීවිත කාලය පුරා දිවෙන ක්‍රියාවලියක් විය යුතු අතර දෛනික ජීවිතයේ සහ ළමුන්ගේ අත්දැකීම් තුළින් පිළිබිඹු වන මානව හිමිකම් අගයන් ඔස්සේ එය ආරම්භ වේ" වශයෙන් පොදු ප්‍රකාශයේ අවධාරණය කර ඇත.19

69. එසේම, ළමුන් සමඟ කටයුතු කරන සහ ළමුන් සඳහා සේවය කරන තැනැත්තන්ගේ ආරම්භ පුහුණු හෝ සේවයේ යෙදී සිටින අතර පැවැත්වෙන පුහුණු සඳහා සම්මුතිය පිළිබඳ ඉගෙනුම් ඒකාබද්ධ කිරීම අවශ්‍ය කෙරේ (ඉහත 53 වැනි ඡේදය බලන්න). සම්මුතිය ක්‍රියාත්මකවීම ආරම්භ වී දස වසරක් සම්පූර්ණ වීම වෙනුවෙන් පැවැති සැමරුම සඳහා පැවති ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර පිළිබඳ රැස්වීමේ නිර්දේශ රාජ්‍ය පාර්ශ්වයන් වෙත කමිටුව විසින් නැවත සිහි කැඳවනු ලැබේ. එහිදී "ළමුන්ගේ අයිතිවාසිකම් ව්‍යාප්ත කිරීම සහ දැනුවත්බව වැඩිකිරීම වඩාත් ඵලදායි වනුයේ එය හුදෙක් දේශනවලට වඩා සමාජයීය පරිවර්තන ක්‍රියාවලියක් හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරී සහ සංවාදයක් ලෙස පරිකල්පනය කළ විට ය. ළමුන් සහ තරුණ පිරිස ද ඇතුළුව සමාජයේ සියලු කොටස් දැනුවත්බව වැඩිකිරීම සඳහා සහභාගීවිය යුතු ය. යෞවන පිරිස් ද ඇතුළත්ව ළමුන් සඳහා ඔවුන්ගේ උපරිම විකසන ධාරිතාවය දක්වා සිය අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්බව වැඩිකිරීම් සඳහා සහභාගීවීමේ අයිතිය ඇත".20 "ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ලබාදෙන පුහුණු ලබාදීම සඳහා සිදුකරන සියලු ප්‍රයත්නයන් ප්‍රායෝගික, ක්‍රමානුකූල විය යුතු අතර එහි බලපෑම සහ තිරසරබව වැඩි කිරීම සඳහා විධිමත් වෘත්තීමය පුහුණුතුළට අන්තර්ගත විය යුතු බව කමිටුව විසින් නිර්දේශ කෙරේ. මානව හිමිකම් පුහුණු සඳහා සහභාගිත්ව ක්‍රමවේද භාවිතා කළ යුතු අතර, එම වෘත්තිකයන් නිසි පුහුණු හා ආකල්පවලින් යුතුබවට වගබලා ගත යුතු අතර එමගින් ළමුන්ගේ අයිතිවාසිකම්, අභිමානය සහ ස්වයං- ගරුත්වය සඳහා ගරුකරන ආකාරයෙන් ළමුන් සහ තරුණ පිරිස් සමඟ කටයුතු කිරීම සඳහා එමගින් ඔවුන්ට හැකිවෙනු ඇති බවට කමිටුව විසින් නිර්දේශ කෙරේ."21

70. සම්මුතිය පිළිබඳව සහ ඒ සම්බන්ධිත දැනුම හා අවබෝධය ව්‍යාප්ත කිරීම සඳහා මාධ්‍ය වෙත ඉතා වැදගත් භූමිකාවක් සිදුකළ හැකි අතර මෙම ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ ස්වේච්ඡා සහභාගිත්වය ලබාදීම කමිටුව විසින් දිරිමත් කෙරේ. මෙය රජයන් සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් ද වඩාත් උනන්දු කරවනු ඇත.22

44 (6) වැනි ව්‍යවස්ථාවː සම්මුතිය යටතේ වන වාර්තා පුළුල් වශයෙන් ව්‍යාප්ත කිරීම
"... රාජ්‍ය පාර්ශ්වයන් විසින් සිය රටවල්වල සිටින පොදු ජනතාව වෙත සම්මුතිය යටතේ වන වාර්තා පුළුල් වශයෙන් ව්‍යාප්ත කිරීම"

71. සම්මුතිය යටතේ වන වාර්තාකරණය ඔස්සේ වැදගත් කාර්යයක් ඉටුවීමට නම්, එය ජාතික මට්ටමින් සිදුවන ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ පැවතිය යුතු අතර, රාජ්‍ය පාර්ශ්වයන්ගේ වැඩිහිටි සහ ළමුන් යන සියලු කොටස් විසින් දැනගෙන සිටීම ද අවශ්‍ය වේ. රාජ්‍යයන් විසින් ළමුන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා කෙසේ සලකන්නේ ද යන්න පිළිබඳ ජාත්‍යන්තර වගවීමක් ලබාදීමේ අනන්‍ය ආකාරයක් මෙම වාර්තාකරණ ක්‍රියාවලිය ඔස්සේ සැපයේ. එනමුත්, වාර්තා ප්‍රචලිත කිරීම සහ සාධනීය අන්දමින් විවාද කිරීමක් සිදුනොවේ නම්, ළමුන්ගේ ජීවිත මත සැලකිය යුතු බලපෑමක් මෙම ක්‍රියාවලියෙන් ඇති නොවේ.

72. රාජ්‍යයන් විසින් සිය වාර්තා පොදු ජනතාව සඳහා පුළුල්ව ලබාගත හැකි ආකාරයට පැවතීම සම්මුතිය තුළින් පැහැදිලිව අවශ්‍ය කෙරේ; කමිටුව වෙත වාර්තා ලබාදීමේ දී මෙය සිදුකළ හැකි ය. වාර්තා සත්‍ය වශයෙන්ම ලබාගත හැකි පරිදි පැවතිය යුතු ය. නිදසුනක් ලෙස සියලු භාෂාවලට පරිවර්තනය වී තිබීම, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා යෝග්‍ය ආකාරවලට පැවතීම ආදී වශයෙන් මෙය දැක්විය හැකි ය. වාර්තා ප්‍රචලිත කිරීම සඳහා අන්තර්ජාලය ඔස්සේ පුළුල් රුකුලක් ලැබෙනු ඇත. එවැනි වාර්තා සිය වෙබ් අඩවි තුළ පළ කරන ලෙස රජයන් සහ පාර්ලිමේන්තු වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

73. සාධනීය සංවාදයක් ප්‍රවර්ධනය කිරීමට සහ සියලු මට්ටම්වල ක්‍රියාත්මක වීමේ ක්‍රියාවලිය දන්වා සිටීම සඳහා සිය වාර්තාවලට අදාළ පරීක්ෂා කිරීමේ අනෙකුත් සියලු ලේඛන ද පුළුල්ව ලබාගත හැකි ආකාරයට පවත්වා ගන්නා ලෙස රාජ්‍යයන් වෙතින් කමිටුව විසින් ඉල්ලා සිටිනු ලැබේ. විශේෂයෙන් කමිටුවේ සමාප්ති සටහන් ළමුන් ද ඇතුළු පොදු ජනතාව වෙත ව්‍යාප්ත කළ යුතු අතර පාර්ලිමේන්තු සවිස්තරාත්මක විවාදයක් සඳහා ද මෙය විෂයය විය යුතු ය. පුළුල් වශයෙන් ව්‍යාප්ත විවාදයක් සහතික කිරීමේ රුකුලක් වශයෙන් ස්වාධීන මානව හිමිකම් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධානවලට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකළ හැකි ය. කමිටුව විසින් සිදුකරන රජයේ නියෝජනය පරීක්ෂා කිරීමේ සාරාංශ වාර්තා ඔස්සේ ක්‍රියාවලිය සහ කමිටුවේ අවශ්‍යතා අවබෝධකරගැනීමට උපකාරී වන අතර ඒවා ද ලබාගත හැකි ආකාරයට පවත්වා ගතයුතු අතර සාකච්ඡා ද කළ යුතු ය.

සටහන්

1 මෙම සම්මුතියේ කාර්යයන් සඳහා "ළමුන් සඳහා අදාළ වන නීතිය යටතේ බහුතරයක් වැඩිහිටිබවට වයස අවුරුදු 18ට පෙර එළඹේ නම් මිස, වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙකුම" වශයෙන් ළමයා යන්න නිර්වචනය කර ඇති බවට මෙම කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ අවධානය යොමු කෙරේ (1 වැනි ව්‍යවස්ථාව).

2 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්මත කරගැනීම පිළිබඳ දසවැනි සංවත්සරය සැමරීම සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් 1999 වර්ෂයේ දී දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවේ දී ක්‍රියාත්මක කිරීමේ පොදු පියවර සම්බන්ධයෙන් අවධානය යොමුකළ අතර, ඉන් අනතුරුව කමිටුව විසින් සවිස්තරාත්මක අවසාන නිගමනයන් සහ නිර්දේශ සම්මත කරන ලදී (CRC/C/90, 291 වැනි ඡේදය බලන්න)

3 සම්මුතියේ 44 වැනි ව්‍යවස්ථාවේ 1(අ) වැනි ඡේදය යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු මූලික වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතය සම්බන්ධයෙන් පොදු මාර්ගෝපදේශ, CRC/C/5, 1991 ඔක්තෝබර් 15; ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 44 වැනි ව්‍යවස්ථාවේ 1(ආ) වැනි ඡේදය යටතේ රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කළ යුතු වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතය සම්බන්ධයෙන් පොදු මාර්ගෝපදේශ, CRC/C/58, 1996 නොවැම්බර් 20.

4 මානව අයිතිවාසිකම් කමිටුව, පොදු ප්‍රකාශය අංක 3 (දහතුන් වැනි සැසිවාරය, 1981), 2 වැනි ව්‍යවස්ථාව: ජාතික මට්ටමේ දී ක්‍රියාත්මක කිරීම; ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව, පොදු ප්‍රකාශය අංක 3 (පස්වැනි සැසිය, 1990), රාජ්‍ය පාර්ශවකරුවන්ගේ බැඳීම්වල ස්වභාවය (සම්මුතියේ 2 වැනි ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදය); තව ද පොදු ප්‍රකාශ අංක 9 (දහනව වැනි සැසිය, 1998), සම්මුතිය දේශීය වශයෙන් යොදා ගැනීම, පොදු ප්‍රකාශ අංක 3 හි අන්තර්ගත ඇතැම් කොටස් පිළිබඳ වැඩිදුරටත් විමසීම. මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් නියමිත කාලාන්තරවල දී සම්මුතිවල පොදු ප්‍රකාශන සහ නිර්දේශවලට අදාළව සංක්ෂිප්ත සංග්‍රහයක් ප්‍රකාශයට පත්කරනු ලැබේ (HRI/GEN/1/ Rev'6).

5 පොදු ප්‍රකාශය අංක 3, HRI/GEN/1/Rev.6, para. 11, p. 16.

6 මානව හිමිකම් කමිටුව, පොදු ප්‍රකාශය අංක 18 (1989), HRI/GEN/1/Rev.6, pp. 147 et seq.

7 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 44 වැනි ව්‍යවස්ථාවේ 1(ආ) ඡේදය යටතේ නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කළ යුතු වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතයට අදාළ පොදු මාර්ගෝපදේශ, CRC/C/58, 1996 නොවැම්බර් 20, 11 වැනි පරිච්ඡේදය.

8 මානව හිමිකම් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය, වියානා, 1993 ජූනි 14-25, "වියානා ප්‍රකාශය සහ ක්‍රියාකාරී වැඩසටහන" A/CONF'157/23'

9 ළමුන් සඳහා ගෝලීය සමුළුව, "ළමුන් නොනැසී පැවැත්ම, ආරක්ෂාව සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය ප්‍රකාශනය සහ ළමුන් නොනැසී පැවැත්ම, ආරක්ෂාව සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය ප්‍රකාශනය 1990 දශකයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම", CF/ WSC/1990/ WS-001 එක්සත් ජාතීන්ගේ සංවිධානය, නිව්යෝක්, 1990 සැප්තැම්බර් 30

10 මානව හිමිකම් පිළිබඳ ගෝලීය සම්මන්ත්‍රණය, වියානා, 1993 ජූනි 14-25, "වියානා ප්‍රකාශය සහ ක්‍රියාකාරී වැඩසටහන" A/CONF'157/23'

11 2002 වර්ෂයේ දී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ළමුන් සඳහා වූ විශේෂ සැසිවාරයට අදාළ ලේඛනයේ ළමුන් සඳහා හිතකර ලෝකයක් (A World Fit for Children)" 59 වැනි පරිච්ඡේදය.

12 Ibid., පරිච්ඡේද 61 (a)'

13 ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් එහි තිස්එක් වැනි සැසිවාරයේ දී "සේවා සැපයුම්කරුවෙකු වශයෙන් පුද්ගලික අංශය සහ ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එහි භූමිකාව" මැයෙන් පොදු සාකච්ඡාවක් පවත්වන ලද, 630-653 දක්වා පරිච්ඡේද.

14 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 44 වැනි ව්‍යවස්ථාවේ 1(ආ) ඡේදය යටතේ නියමිත කාලාන්තරවල දී ඉදිරිපත් කළ යුතු වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතයට අදාළ පොදු මාර්ගෝපදේශ, CRC/C/58, 1996 නොවැම්බර් 20, 20 වැනි පරිච්ඡේදය.

15 Ibid., 3 වැනි පරිච්ඡේදය 3.

16 ජාත්‍යන්තර සහයෝගීතාවයට අදාළ සම්මුතියේ පහත ව්‍යවස්ථා 7 (2); 11 (2); 17 (b); 21 (e); 22 (2); 23 (4); 24 (4); 27 (4); 28 (3); 34 සහ 35 වැනි ව්‍යවස්ථාග

17 2002 මාර්තු 18-22 වැනි දින දක්වා මෙක්සිකෝවේ, මොන්ටර්රේහි දී පැවති සංවර්ධනය සඳහා මූල්‍යයනය මැයෙන් වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ වාර්තාව (A/Conf.198/11)'

18 HRI/GEN/1/Rev. 6, පරිච්ඡේදය 25ල පිටුව 295.

19 Ibid., පරිච්ඡේදය 15ල පිටුව 286.

20 CRC/C/90, පරිච්ඡේදය 291 (k) බලන්න.

21 Ibid., 291 ඃක* පරිච්ඡේදය

22 විස්තරාත්මක නිර්දේශ අනුමත කරමින් කමිටුව විසින් "දරුවා සහ මාධ්‍ය" මැයෙන් පොදු සාකච්ඡා දිනයක් 1996 වර්ෂයේ දී පවත්වන ලදී (CRC/C/57, පරිච්ඡේද 242 et seq. බලන්න).

ඇමුණුම I

අනෙකුත් ප්‍රධාන මානව හිමිකම් පිළිබඳ නෛතික ලේඛන අපරානුමත කිරීම

වර්තමාන පොදු ප්‍රකාශයේ 17 වැනි පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිදි, රාජ්‍ය පාර්ශවකරුවන් විසින් දැනට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විකල්ප සන්ධාන පත්‍ර දෙක (යුධ ගැටුම් සඳහා ළමුන් සහභාගි කරවීම හා ළමුන් අලෙවිකිරීම, ළමා ගණිකා කටයුතු සහ ළමුන් සම්බන්ධ කර සිදුකරන අසභ්‍ය චිත්‍රපට ආදී දෘශ්‍ය නිර්මාණ) සහ ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ තවත් ප්‍රධාන නෛතික ලියවිලි හය අපරානුමත කර නොමැති නම්, ක්‍රියාත්මක කිරීමේ පොදු පියවරවල කොටසක් වශයෙන් සැලකිල්ලට ගෙන, සහ මානව හිමිකම් එකිනෙකින් වෙන්කළ නොහැකි බව සහ අන්‍යෝන්‍ය වශයෙන් පවතින පරායත්තබව සැලකිල්ලට ගෙන, එම විකල්ප සන්ධාන පත්‍ර අපරානුමත කරන ලෙස කමිටුව විසින් එකී රාජ්‍යයන් නිරන්තරයෙන් පොළඹවාලනු ලැබේ. රාජ්‍ය පාර්ශවකරුවන් සමඟ සිදුකරන සංවාදවල දී එකී අනෙකුත් අදාළ ජාත්‍යන්තර නෛතික ලියවිලි අපරානුමත කිරීම සලකා බලන ලෙස කමිටුව විසින් එකී රාජ්‍යයන් දිරිමත් කරනු ලැබේ. සවිස්තරාත්මක ආකාරයෙන් නොවන එකී නෛතික ලියවිලිවල ලැයිස්තුවක් මෙම පොදු ප්‍රකාශයට අමුණා ඇත. කමිටුව විසින් මෙය වරින්වර යාවත්කාලීන කරනු ඇත.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සඳහා විකල්ප සන්ධාන පත්‍රය;
- මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සඳහා දෙවන විකල්ප සන්ධාන පත්‍රය;

- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස්ව සැලකීම් පිටුදැකීම පිළිබඳ සම්මුතිය සඳහා විකල්ප සන්ධාන පත්‍රය;
- වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතියසඳහා විකල්ප සන්ධාන පත්‍රය;
- අධ්‍යාපනයේ දී වෙනස් කොට සැලකීමට එරෙහි සම්මුතියත
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 1930 අංක 30 දරන බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම පිළිබඳ සම්මුතියත
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 105 දරන බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම අහෝසි කිරීම පිළිබඳ සම්මුතිය,1957;
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 138 දරන සේවා නියුක්තිය සඳහා වූ අවම වයසට අදාළ සම්මුතිය, 1973;
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 182 දරන ළමා ශ්‍රමයේ වඩාත් අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ සම්මුතිය, 1999;
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 183 දරන මාතෘත්වය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය, 2000;
- සරණාගතයන්ගේ තත්ත්වය පිළිබඳ 1967 සම්මුතියට අදාළ සන්ධාන පත්‍රය මඟින් සංශෝධනය කළ සරණාගතයන්ගේ තත්ත්වය පිළිබඳ 1951 සම්මුතිය;
- තැනැත්තන් ජාවාරම් කිරීම සහ අන්‍යයන් වෛශ්‍යා වෘත්තිය සඳහා යොදවා ගැනීම මැඩ පැවත්වීම සඳහා සම්මුතිය (1949);
- වහල්බව පිළිබඳ සම්මුතිය (1926);
- වහල්බව පිළිබඳ සම්මුතිය සංශෝධනය කිරීමේ සන්ධාන පත්‍රය (1953);
- වහල්බව, වහල් වෙළඳාම සහ වහල්බවට සමාන ආයතන සහ පරිචයන් අහෝසි කිරීම සඳහා වූ අතිරේක සම්මුතිය (1956);
- අන්තර්ජාතීය සැලසුම්ගත අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුපූරක වූ තැනැත්තන් විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මැඩ පැවත්වීම සහ දඬුවම් පැමිණවීම සඳහා වූ සන්ධාන පත්‍රය;
- යුද සමයේ දී සිවිල් පුද්ගලයන් ආරක්ෂා කිරීමට අදාළ ජිනීවා සම්මුතිය;
- 1949 අගෝස්තු 12 දිනැති ජිනිවා සම්මුතිවලට සහ ජාත්‍යන්තර නොවන යුද ගැටුම්වල වින්දිතයන් ආරක්ෂා කිරීමට අදාළ අතිරේක සන්ධාන පත්‍රය (සන්ධාන පත්‍රය ෂ);
- 1949 අගෝස්තු 12 දිනැති ජිනිවා සම්මුතිවලට සහ ජාත්‍යන්තර නොවන යුද ගැටුම්වල වින්දිතයන් ආරක්ෂා කිරීමට අදාළ අතිරේක සන්ධාන පත්‍රය (සන්ධාන පත්‍රය ෂෂ);
- පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතා කිරීම, තොග රැස් කිරීම, නිපදවීම සහ පැවරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය;
- ජාත්‍යන්තර අපරාධ අධිකරණ ආඥා පනත;
- ළමුන් ආරක්ෂා කිරීම සහ රටවල් අතර සිදුවන ළමුන් දරුකමට හදාගැනීමේ දී සහයෝගීතාවය පිළිබඳ හේග් සම්මුතිය;
- ජාත්‍යන්තර ළමා පැහැරගෙන යෑම් පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ හේග් සම්මුතිය;
- දෙමාපියන්ගේ වගකීම සහ ළමුන් ආරක්ෂා කිරීම සඳහා පියවරවලට අදාළ අධිකරණ බල සීමාව, අදාළ නීති, හඳුනාගැනීම, බලාත්මක කිරීම සහ සහයෝගිතාවය පිළිබඳ හේග් සම්මුතිය, 1996.

ලිපිනය: නො: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04 | දුරකතන: 011 2 505569 |
ඊමේල්: **cru.hrcsl@gmail.com** | වෙබ්: **www.hrcsl.lk**